269 වන කාණ්ඩය - 7 වන කලාපය
தொகுதி 269 - இல. 7
Volume 269 - No. 7

2019 මාර්තු 12වන අඟහරුවාදා
2019 மார்ச் 12, செவ்வாய்க்கிழமை
Tuesday, 12th March, 2019

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය, අන්තර් පාර්ලිමේන්තු සංගමය සහ 'සාර්ක්"පාර්ලිමේන්තු සංගමයේ ඒකාබද්ධ වාර්ෂික මහා සභා රැස්වීම

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**

ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය ස්ථාපිත කිරීම ප්‍රමාදවීම

**වරප්‍රසාද යෝජනා:**

2018 නොවැම්බර් මස 14, 15 සහ 16 යන දිනයන්හි සභා ගර්භය තුළ ඇති වූ නොසන්සුන් වාතාවරණය සහ ඒ අවස්ථාවන්හිදී ගරු මන්ත්‍රීවරුන්ගේ ක්‍රියා පිළිබඳව සොයා බලා වාර්තා කිරීමට ගරු කථානායකතුමා විසින් පත් කරන ලද කමිටුවේ වාර්තාව

**පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්:**

සමාගම් (සංශෝධන)- [ගරු තාරක බාලසූරිය මහතා] - පළමු වන වර කියවන ලදී.

**විසර්ජන පනත් කෙටුම්පත, 2019 –[හයවන වෙන් කළ දිනය]:**

දෙවන වර කියවීම - විවාදය අවසන් කරන ලදී.

පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී.

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

பொதுநலவாயப் பாராளுமன்றச் சங்கம், அனைத்துப் பாராளுமன்ற ஒன்றியம், 'சார்க்' பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் ஆகியவற்றின் இணைந்த வருடாந்தப் பொதுக்கூட்டம்

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**

இலங்கை ஆசிரிய ஆலோசகர் சேவையைத் தாபிப்பதிலுள்ள தாமதம்

**சிறப்புரிமைப் பிரேரணைகள்:**

2018 நவெம்பர் மாதம் 14, 15 மற்றும் 16ஆந் திகதிகளில் சபை மண்டபத்தில் ஏற்பட்ட அமைதியின்மைச் சூழல் மற்றும் அச்சந்தர்ப்பங்களில் கௌரவ பாராளுமன்ற உறுப்பினர்களின் நடவடிக்கைகள் பற்றி விசாரித்து அறிக்கை சமர்ப்பிப்பதற்காக கௌரவ சபாநாயகரால் நியமிக்கப்பட்ட குழுவின் அறிக்கை

**தனி உறுப்பினர் சட்டமூலங்கள்:**

கம்பெனிகள் (திருத்தம்) - [மாண்புமிகு தாரக்க பாலசூரிய] – முதன்முறை மதிப்பிடப்பட்டது

**ஒதுக்கீட்டுச் சட்டமூலம் , 2019 - [ஒதுக்கப்பட்ட ஆறாம் நாள்]:**

இரண்டாம் மதிப்பு - விவாதம் முடிவுற்றது

சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப் பட்டது.

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Joint Annual General Meeting of Commonwealth Parliamentary Association, Inter-Parliamentary Union and SAARC Parliamentarians' Association

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:

Delay in Establishment of Sri Lanka Teacher Instructors' Service

PRIVILEGE MOTIONS:

Report of the Special Committee Appointed by the Hon. Speaker to Look into the Matters Pertaining to the Incidents that Took Place on the Floor of the House on 14th, 15th and 16th November 2018 During the Sittings of Parliament and the Conduct of Hon. Members of Parliament During Such Times.

PRIVATE MEMBERS' BILLS:

Companies (Amendment) - [The Hon. Tharaka Balasuriya] - Read the First time

APPROPRIATION BILL, 2019 - [Sixth Allotted Day]:

Second Reading - Debate Concluded

Bill Committed to a Committee of the Whole Parliament

# පාර්ලිමේන්තුව
## பாராளுமன்றம்
## PARLIAMENT

***2019 මාර්තු 12වන අඟහරුවාදා***
*2019 மார்ச் 12, செவ்வாய்க்கிழமை*
*Tuesday, 12th March, 2019*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப.9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. KARU JAYASURIYA] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය, අන්තර් පාර්ලිමේන්තු සංගමය සහ "සාර්ක්" පාර්ලිමේන්තු සංගමයේ ඒකාබද්ධ වාර්ෂික මහා සභා රැස්වීම
### பொதுநலவாயப் பாராளுமன்றச் சங்கம், அனைத்துப் பாராளுமன்ற ஒன்றியம், 'சார்க்' பாராளுமன்ற உறுப்பினர்கள் சங்கம் ஆகியவற்றின் இணைந்த வருடாந்தப் பொதுக்கூட்டம்
### JOINT ANNUAL GENERAL MEETING OF COMMONWEALTH PARLIAMENTARY ASSOCIATION, INTER-PARLIAMENTARY UNION AND SAARC PARLIAMENTARIANS' ASSOCIATION

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීවරුනි, අද දින පාර්ලිමේන්තුවේ රැස්වීම අවසන් වීමෙන් පසුව පොදු රාජ්‍ය මණ්ඩලීය පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව), අන්තර් පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා කණ්ඩායම) සහ "සාර්ක්" පාර්ලිමේන්තු සංගමය (ශ්‍රී ලංකා ශාඛාව) යන සංගම්වල ඒකාබද්ධ වාර්ෂික මහා සභා රැස්වීම පාර්ලිමේන්තු සංකීර්ණයේ අංක 1 දරන කාරක සභා කාමරයේ දී පැවැත්වීමට නියමිත බැවින් ඊට පැමිණ සහභාගි වන ලෙස කාරුණිකව දන්වා සිටිමි.



## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු ලකී ජයවර්ධන මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்கி ஜயவர்தன - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Lucky Jayawardana - State Minister of City Planning and Water Supply)

ගරු කථානායකතුමනි, උඩතලවින්න, උඩතලවින්න මඩිහේ, අංක 10/1 දරන ස්ථානයෙහි පදිංචි එම්.ජේ.එම්. හුසේන් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා - *[සභා ගර්භය තුළ නැත.]*
ගරු බිමල් රත්නායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු සුජිත් සංජය පෙරේරා මහතා**
(மாண்புமிகு சுஜித் சஞ்ஜய பெரேரா)
(The Hon. Sujith Sanjaya Perera)

ගරු කථානායකතුමනි, කෑගල්ල, රංවල, අංක 343/13 දරන ස්ථානයෙහි පදිංචි ඩී.ජී. ගාමිණී කරුණාරත්න මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### නීතිපති දෙපාර්තමේන්තුව: පුරප්පාඩු
### சட்டமாஅதிபர் திணைக்களம்: வெற்றிடங்கள்
### ATTORNEY GENERAL'S DEPARTMENT: VACANCIES

16/'18

**1. ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමියගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) නීතිපති දෙපාර්තමේන්තුවේ සිටින රජයේ අධිනීතිඥවරුන් සංඛ්‍යාව සහ රජයේ නීතිඥවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) නීතිපති දෙපාර්තමේන්තුවේ වගකීම් ප්‍රමාදයකින් තොරව කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා අවශ්‍ය රජයේ අධිනීතිඥවරුන් සහ රජයේ නීතිඥවරුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීතිපති දෙපාර්තමේන්තුවේ පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

[ගරු හේෂා විතානගේ මහතා]

நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) சட்டமாஅதிபர் திணைக்களத்திலுள்ள அரசாங்க சட்டவாதிகளின் எண்ணிக்கை மற்றும் அரசாங்க சட்டத்தரணிகளின் எண்ணிக்கை தனித்தனியே எவ்வளவென்பதையும்;

(ii) சட்டமாஅதிபர் திணைக்களத்தின் பொறுப்புக்களை தாமதமின்றி வினைத்திறனுடன் நிறைவேற்றிக்கொள்வதற்கு தேவையான அரசாங்க சட்டவாதிகள் மற்றும் அரசாங்க சட்டத்தரணிகளின் எண்ணிக்கை தனித்தனியே எவ்வளவென்பதையும்;

(iii) சட்டமாஅதிபர் திணைக்களத்தில் நிலவும் வெற்றிடங்களை நிரப்புவதற்கு மேற்கொள்ளப்படும் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Justice and Prison Reforms:

(a) Will she inform this House -

(i) the number of State Counsels and State Attorneys in the Attorney General's Department, separately;

(ii) Separately, of the requisite number of State Counsels and the State Attorneys for the efficient execution of the duties of the Attorney General's Department; and

(iii) the measures that will be taken to fill the vacancies in the Attorney General's Department?

(b) If not, why?

**ගරු තලතා අතුකෝරල මහත්මිය (අධිකරණ හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல - நீதி மற்றும் சிறைச்சாலைகள் மறுசீரமைப்பு அமைச்சர்)
(The Hon. (Mrs.) Thalatha Atukorale - Minister of Justice and Prison Reforms)

ගරු කථානායකතුමනි, (අ) ප්‍රශ්නයේ (i) වන සහ (ii) වන කොටසට පිළිතුර එකටයි තිබෙන්නේ. ඒක කියවන්නද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

අවශ්‍ය දේ දැනගත්තාම ඇති නේද, ගරු මන්ත්‍රීතුමනි?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ඔව්, ගරු කථානායකතුමනි. සභාගත කළාට කමක් නැහැ.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)

ගරු කථානායකතුමනි, (අ) ප්‍රශ්නයේ (i) වන සහ (ii) වන පිළිතුර මම **සභාගත*** කරනවා.

(iii) 01. රජයේ අධිනීතිඥ තනතුරට නිලධාරීන් 50දෙනෙකු බඳවා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

02. සහකාර රජයේ අධිනීතිඥ පරිවාස තනතුර සඳහා නිලධාරීන් 30දෙනෙකු බඳවා ගැනීම සඳහාද අවශ්‍ය පියවර ගෙන ඇත.

03. රාජ්‍ය නීතිඥ තනතුරට හා සහකාර රාජ්‍ය නීතිඥ තනතුරට උසස් කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණ මණ්ඩල රාජ්‍ය සේවා කොමිෂන් සභාව මඟින් අනුමත කරගෙන ඇති අතර, ඉදිරි කටයුතු කිරීමට පියවර ගෙන ඇත.

(ආ) අදාළ නොවේ.

**** සභාමේසය මත තබන ලද, පිළිතුරේ (අ) (i) සහ (ii) කොටස:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட (அ) விடையின் (i) மற்றும் (ii) பிரிவுகள் :*
** Answer tabled for (a) (i) and (ii) :*

| තනතුර | අනුමත කාර්ය මණ්ඩලය | දැනට සිටින කාර්ය මණ්ඩලය | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| නීතිපති | 01 | 01 | - |
| සොලිසිටර් ජනරාල් | 01 | 01 | - |
| ජ්‍යෙෂ්ඨ අතිරේක සොලිසිටර් ජනරාල් | 02 | 02 | - |
| අතිරේක සොලිසිටර් ජනරාල් | 09 | 09 | - |
| ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 09 | 09 | - |
| නියෝජ්‍ය සොලිසිටර් ජනරාල් | 19 | 17 | 02 |
| ජ්‍යෙෂ්ඨ රජයේ අධිනීතිඥ | 56 | 36 | 20 |
| රජයේ අධිනීතිඥ | 218 | 140 | 78 |
| සහකාර රජයේ අධිනීතිඥ(පරිවාස) | 130 | 07 | 123 |
| ජ්‍යෙෂ්ඨ රජයේ නීතිඥ | 01 | 01 | - |
| රාජ්‍ය නීතිඥ | 02 | 01 | 01 |
| ජ්‍යෙෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ | 06 | 06 | - |
| සහකාර රාජ්‍ය නීතිඥ | 18 | 06 | 12 |
| කනිෂ්ඨ සහකාර රාජ්‍ය නීතිඥ | 28 | 12 | 16 |

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, සාර්ථක පිළිතුරක් ලබා දීම සම්බන්ධයෙන් මම මුලින්ම ගරු ඇමතිතුමියට ස්තුතිවන්ත වෙනවා. මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මම එතුමියට යොමු කරනවා. අපි දන්නවා, නීතිපති මතය විමසීම සඳහා රටේ විවිධ අධිකරණවලින් නීතිපති දෙපාර්තමේන්තුවට නඩු හරවා එවනවා. එසේ එවන නඩුවලට අදාළ නීතිපති මතය දෙන්න සමහර අවස්ථාවලදී අවුරුදු 2, 3, 5, 6 වගේ දීර්ඝ කාලයක් යනවා. සාමාන්‍යයෙන් එය අපි ප්‍රායෝගිකව දකින දෙයක්. ගරු කථානායකතුමනි, එම නිසා මම ගරු ඇමතිතුමියගෙන් දැන ගන්න කැමැතියි, විරාත් කාලයක් සිදු වන මේ සිදු වීමට යම්

පිළිතුරක් සොයන්න අමාත්‍යාංශය සතුව කඩිනම් ක්‍රමවේදයක් තිබෙනවාද? එහෙම ක්‍රමවේදයක් තිබෙනවා නම්, එය කොතැනින්ද හිරවෙලා තිබෙන්නේ? මෙම ප්‍රායෝගිකත්වයෙන් මිදිලා නීතිපති දෙපාර්තමේන්තුවේ මතය අඩුම තරමින් මාස 6ක්, අවුරුද්දක් ඇතුළත ලංකාවේ ගොඩ ගැසී තිබෙන නඩුවලට පිළිතුරක් දෙන තත්ත්වයකට අරගන්න පුළුවන් ක්‍රමවේදයක් තිබෙනවාද කියා මම දැන ගන්න කැමැතියි.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, ඇත්තටම අපි මේ දවස්වල ඒ සම්බන්ධයෙන් කටයුතු කරගෙන යනවා. උදාහරණයක් හැටියට කිව්වොත්, පොලිස් දෙපාර්තමේන්තුවට වෙනම නීති අංශයක් තිබියදීත් හැම පොඩි දෙයක්ම පවා නීතිපති දෙපාර්තමේන්තුවට එවනවා.

ඊට අමතරව රජයේ නොයෙකුත් දෙපාර්තමේන්තු මඟින් විසඳාගත හැකි දේවලුත් නීතිපති දෙපාර්තමේන්තුවට එවනවා. නීතිපති දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතු කරුණු පමණක් තීරණය කර එවන ලෙසට එම දෙපාර්තමේන්තු දැනුවත් කරන්නයි අපි සූදානම් වෙන්නේ.

විශේෂයෙන් පොලිස් දෙපාර්තමේන්තුව ගත්තොත්, රස පරීක්ෂක වාර්තාවක් ලබා ගන්න කියලා අධිකරණයෙන් නියෝග කළාම මාස ගණන් ඒ නියෝග පොලීසියේ තියාගෙන ඉඳලා, ඒ ගොල්ලන්ට හිතුණාම එවනවා. අපි දැන් ඒ සඳහා කාල වකවානුවක් දෙන්නයි හදන්නේ. අධිකරණය නියෝග කරලා පළමුවැනි සතිය තුළම ඒ කටයුතු කරන ලෙසට. රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කිසිම ප්‍රශ්නයක් නැහැ. ඒ වාගේ දෙපාර්තමේන්තු මට්ටමින් ගැටලු ගණනාවක් තිබෙනවා. ඒවා අවබෝධ කරගෙන අපි මේ දවස්වල අවශ්‍ය පිළියම් කිරීමට කටයුතු කරගෙන යනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, දෙවැනි අතුරු ප්‍රශ්නයක් තිබෙනවාද?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙසේයි. මම අහන මේ කරුණ සම්බන්ධයෙන් ගරු ඇමතිතුමියත් එකඟ වෙයි. අපට ජාත්‍යන්තර නමක් තිබෙන අධිකරණයක් තිබෙන්නේ. ජාත්‍යන්තර කීර්තියක් දිනාගෙන, ස්වාධීනත්වය සුරකින අධිකරණය, සමහර විට නීතිපතිවරයා, අධිකරණයේ ප්‍රධාන විනිසුරුවරු මේ උත්තරීතර ආයතනයේ අමු අමුවේ විවේචනය කරන අයුරු අපි දකිනවා. මේ තුළින් අධිකරණයේ ස්වාධීනත්වයට, කීර්තියට යම් හානියක් වෙනවා. පාර්ලිමේන්තු වරප්‍රසාදවලට මුවා වී මේ කටයුත්තේ යෙදෙනවා. පසුගිය දිනවල මේ පාර්ලිමේන්තුවේ කල් තැබීමේ විවාදයක් පවා සිදු වුණා අපි දැක්කා. අධිකරණමය ක්‍රියා මාර්ගවලට යොමු වී සිටින සමහර පාර්ලිමේන්තු මන්ත්‍රීවරු පවා අධිකරණයේ තමන්ට විරුද්ධව තිබෙන චෝදනාවලින් වැහෙන්න, ඒවායින් ආරක්ෂා වෙන්න මේ වාගේ ක්‍රියා මාර්ග අනුගමනය කරනවා.

මට මේ කාරණය පැහැදිලි කර ගන්න අවශ්‍යයි. මේ තුළින් අධිකරණයට යම් හානියක් වෙනවා. අධිකරණය විවේචනය කිරීම සම්බන්ධයෙන් යම් සීමාවක් ඇති කළ යුතුයි. පාර්ලිමේන්තුවේ තිබෙන වරප්‍රසාද සීමා කරන්න කියන කාරණාව නොවෙයි මම කියන්නේ. ගරු කථානායකතුමනි, අධිකරණ විනිසුරුවන්ගේ නම කියලා ප්‍රසිද්ධියේ විවේචනය කරනවා. එවැනි තත්ත්වයට පත් වීම හොඳ නැහැ. මේක, දීර්ඝ කාලීනව ඉස්සරහට යන එක හොඳ දෙයක් නොවෙයි. මේ රටේ බැරෑරුම් අවස්ථාවලදී, තීරණාත්මක අවස්ථාවලදී තීන්දු - තීරණ දීලා, රට යම් තැනකට අරගෙන යන්න කටයුතු කළ අධිකරණය අපහසුතාවට පත් වෙන එකෙන් වළක්වා ගන්න පාර්ලිමේන්තුව තුළ යම් සංහිඳියාවක් ඇති කරගන්න අපට ක්‍රමවේදයක් නැද්ද?

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
ගරු කථානායකතුමනි, එයට දීර්ඝ පිළිතුරක් දෙන්න වෙනවා. අවුරුදු ගණනාවකට පස්සේ මේ යහ පාලන රජයෙන් තමයි, අධිකරණය ස්වාධීන තත්ත්වයකට පත් කරලා -විශේෂයෙන් ව්‍යවස්ථාදායක සභාව පිහිටෙව්වාට පස්සේ- එහි කටයුතු විධිමත්ව කරගෙන යන්න කටයුතු කළේ. විධායකය, ව්‍යවස්ථාදායකය සහ අධිකරණය කියන ආයතන තුන වෙන වෙනම තමන්ගේ බලය පාවිච්චි කරනවා නම් හොඳයි. අධිකරණයට නොයෙකුත් විධියේ බලපෑම් කරන්න උත්සාහ කළොත්, අපි බලාපොරොත්තු වෙච්ච යහ පාලනය හරි, අධිකරණයේ ස්වාධීනත්වය ගැන හරි අපට කථා කරන්න වෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමාට ඒ සම්බන්ධයෙන් අපට උත්තරයක් දෙන්න පුළුවන්. එය මේ ප්‍රශ්නයට අදාළද, නැද්ද කියන්න දන්නේත් නැහැ. අවශ්‍ය නම්, ඒ ගැන දීර්ඝ වශයෙන් උත්තරයක් දෙන්නත් පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රමාණවත් නේද, ගරු මන්ත්‍රීතුමා?

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
හොඳයි. බොහොම ස්තුතියි.

**ගරු තලතා අතුකෝරල මහත්මිය**
(மாண்புமிகு (திருமதி) தலதா அத்துகோரல)
(The Hon. (Mrs.) Thalatha Atukorale)
බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 2 - 77/'18 - (1), ගරු දයාසිරි ජයසේකර මහතා -
*[සභා ගර්භය තුළ නැත.]*

## ඩෙංගු රෝගය පැතිරීම වැළැක්වීම: පළාත් පාලන ආයතනවල කාර්යභාරය

## டெங்கு நோய் பரவுவதைத் தடுத்தல்: உள்ளூராட்சி நிறுவனங்களின் பங்கு

## PREVENT SPREAD OF DENGUE: ROLE OF LOCAL GOVERNMENT AUTHORITIES

128/'18

**3. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

[ගරු චමින්ද විජේසිරි මහතා]

(අ) (i) ඩෙංගු රෝගය රට පුරා ව්‍යාප්ත බව දන්නේද;

(ii) එසේ නම්, 2015 වර්ෂයේ සිට මේ දක්වා ඩෙංගු රෝගයෙන් මියගිය සංඛ්‍යාව, එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) පළාත් පාලන ආයතන නිසි පරිදි සිය කටයුතු ඉටු නොකිරීම නිසා ඩෙංගු රෝගය ව්‍යාප්ත වන බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඩෙංගු රෝගය ව්‍යාප්ත වීම වැළැක්වීම සඳහා පළාත් පාලන ආයතන බල ගැන්වීම සඳහා අමාත්‍යාංශය ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) டெங்கு நோய் நாடுபூராவும் பரவியுள்ளதை அறிவாரா என்பதையும்;

(ii) ஆமெனின், 2015 ஆம் ஆண்டு தொடக்கம் இன்று வரையில் டெங்கு நோயினால் மரணமடைந்தவர்களின் எண்ணிக்கை ஒவ்வொரு உள்ளூராட்சி நிறுவன அடிப்படையில் தனித்தனியே எவ்வளவென் பதையும்;

(iii) உள்ளூராட்சி நிறுவனங்கள் உரிய வகையில் தமது பணிகளைச் செய்யத் தவறுகின்றமையால் டெங்கு நோய் பரவுகின்றதென்பதை ஏற்றுக் கொள்வாரா என்பதையும்;

(iv) ஆமெனின், டெங்கு நோய் பரவுவதை தடுப்பதற்கு உள்ளூராட்சி நிறுவனங்களை வலுவூட்டுவதற்காக அமைச்சு மேற்கொண்டுள்ள நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House-

(i) whether he is aware that the dengue fever has spread throughout the country;

(ii) if so, separately, in respect of each local government authority, the number of people died of dengue fever from the year 2015 to date;

(iii) whether he acknowledges that the spread of dengue fever was due to the failure of the local government authorities to discharge their duties; and

(iv) if so, the measures initiated by the Ministry to empower local government authorities to prevent the spread of dengue fever?

(b) If not, why?

**ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**

(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ இராஜாங்க அமைச்சர்)

(The Hon. Faizal Cassim - State Minister of Health, Nutrition and Indigenous Medicine)

Sir, on behalf of the Minister of Health, Nutrition and Indigenous Medicine, I answer the Question.

(a) (i) Yes.

(ii) Data of dengue patients are not collected at the level of local government institutions and the data collected at district level are given in the Annex. I **table*** the Annex.

(iii) Yes.

(iv)
- Providing technical advice and guidance jointly by the Ministry of Health, Nutrition and Indigenous Medicine and Ministry of Provincial Councils and Local Government to collect, dispose and recycle the waste properly.
- Taking action to coordinate with the relevant stakeholders to commence a waste management project in each province.
- Launching waste management projects in urban councils and Pradeshiya Sabhas.
- Newly appointed Members of the Western Provincial Council were educated on the current status of the dengue fever and the expected role of the local government institutions by the Dengue Control Unit of Health Ministry.
- Ministry of Provincial Councils and Local Government is one of the main stakeholders of the Presidential Task Force on Dengue Prevention. The responsibility and role of the above Ministry have been clearly stated in the Intensive Intersectorial Programme for the Prevention and Control of Dengue. Participation of the stakeholders concerned for prevention of dengue is monitored by the Presidential Task Force at national level and by the programme review meetings held daily at provincial, district and regional level. The relevant stakeholders directly responsible for the issues identified at each level are called and necessary solutions are provided.

(b) Does not arise

---

** පිළිතුර අවසානයේ පළ කර ඇත.*

** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*

** Produced at end of Answer.*

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

ඇමුණුම

(ii) දිස්ත්‍රික් මට්ටමින් ඩෙංගු රෝගයෙන් මියගිය සංඛ්‍යාව

| දිස්ත්‍රික්කය | 2015 | 2016 | 2017 | 2018 | 2019 |
|---|---|---|---|---|---|
| කොළඹ | 27 | 25 | 95 | 18 | 2 |
| ගම්පහ | 6 | 18 | 92 | 5 | 1 |
| කළුතර | 1 | 11 | 23 | 2 | 1 |
| නුවර | 2 | 16 | 26 | 1 | 0 |
| මාතලේ | 0 | 1 | 10 | 0 | 0 |
| නුවරඑළිය | 0 | 1 | 1 | 0 | 0 |
| ගාල්ල | 3 | 7 | 21 | 1 | 0 |
| හම්බන්තොට | 1 | 2 | 3 | 1 | 0 |
| මාතර | 1 | 2 | 14 | 1 | 0 |
| යාපනය | 2 | 2 | 4 | 2 | 0 |
| කිලිනොච්චිය | 0 | 0 | 1 | 0 | 0 |
| මන්නාරම | 0 | 0 | 0 | 0 | 0 |
| වවුනියාව | 0 | 0 | 3 | 1 | 0 |
| මුලතිව් | 0 | 0 | 0 | 0 | 0 |
| මඩකලපුව | 4 | 0 | 10 | 7 | 0 |
| අම්පාර | 1 | 1 | 0 | 0 | 0 |
| ත්‍රිකුණාමලය | 0 | 0 | 17 | 1 | 0 |
| කුරුණෑගල | 1 | 4 | 22 | 1 | 1 |
| පුත්තලම | 1 | 3 | 26 | 2 | 0 |
| අනුරාධපුර | 2 | 0 | 7 | 5 | 0 |
| පොළොන්නරුව | 0 | 1 | 3 | 0 | 0 |
| බදුල්ල | 0 | 0 | 6 | 1 | 1 |
| මොණරාගල | 0 | 0 | 5 | 1 | 0 |
| රත්නපුර | 2 | 1 | 13 | 3 | 0 |
| කෑගල්ල | 1 | 0 | 34 | 2 | 1 |
| කල්මුණේ | 1 | 2 | 4 | 3 | 0 |

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ස්තුතියි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා ප්‍රකාශ කරන විධියට කසළ බැහැර කිරීමට - dispose කිරීමට - යම් වැඩ පිළිවෙළක් හදලා තිබෙනවා. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණය ඒ කටයුතු සියල්ල කරලා තිබෙනවා. නමුත්, ඩෙංගු මර්දනය ක්‍රියාත්මක වෙන්නේ ඩෙංගු තිබෙන කාලයට පමණයි. මේ හේතුව නිසා තමයි අපට ඩෙංගු සහමුලින්ම මර්දනය කරන්නට බැරිවෙලා තිබෙන්නේ. අපේ රටේ මැලේරියාව තිබුණා. ඒක යම්තාක් දුරට රටින් බැහැර කිරීමට කටයුතු කරලා තිබෙන බව අපි දන්නවා. අපට තිබෙන අවශ්‍යතාව තමයි සියයට 100ක්ම ඩෙංගු රටින් තුරන් කිරීම. එහෙම කළ රටවල් තිබෙනවා. මේ සඳහා සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ඇතුළු රාජ්‍ය ආයතන සියල්ල එකතු වුණත් ඒ රටවලින් සියයට 100ක්ම ඩෙංගු තුරන් කළ ක්‍රමවේදය අපි අනුගමනය කරලා නැහැ. ඒක තමයි යථාර්ථය.

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මේ සඳහා අපි වියදම් කරනවා; ඔබතුමා කියන විධියට සාකච්ඡා පවත්වනවා; දීර්ඝ විමර්ශන කරනවා; ඒ ආයතනවලට විවිධ උපකරණ ලබාදෙනවා. ඒ කාරණාවලට වඩා වැදගත් වෙන්නේ මේ ඩෙංගු රෝගය පැවති රටවලින් එය සියයට 100ක් තුරන් කළ ක්‍රමවේදය මේ රටට ගෙන ඒමයි. මම හිතනවා ඒ සඳහා කොපමණ පිරිවැයක් ගියත් කමක් නැහැ කියලා. මොකද, ඒක එක වැඩ පිළිවෙළකින් අවසන් කරන්නට පුළුවන්. හිටපු සභාපතිවරයෙක් හැටියට මම දන්නවා, ප්‍රායෝගිකව යම් දෙයක් කරන්නට පුළුවන් බව. ඩෙංගු රෝගියෙකු දැක්කාම තමයි කාටත් ඩෙංගු මර්දනය මතක් වෙන්නේ. ජනාධිපති කාර්ය සාධන බලකාය ඇතුළු සියලු දෙනාගේ අවධානය යොමු වෙන්නේ එතකොට තමයි. මම හිතනවා නිරන්තරයෙන්ම මේ සඳහා යම් වැඩ පිළිවෙළක්, ඩෙංගු රෝගය සියයට 100ක් තුරන් කළ රටවලින් වැඩ පිළිවෙළක් ගෙනැත් ක්‍රියාත්මක කරන්නට පුළුවන් නම් හොඳයි කියලා. අමාත්‍යාංශයට ඒ සඳහා ක්‍රියාත්මක කරන්නට එහෙම වැඩ පිළිවෙළක් තිබෙනවාද ගරු රාජ්‍ය අමාත්‍යතුමනි?

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைஸால் காசிம்)
(The Hon. Faizal Cassim)
ගරු මන්ත්‍රීතුමා, පළමුවෙන්ම මේ ගැන අපේ ජනතාව දැනුවත් වෙන්න ඕනෑ. අපි කොච්චර කිව්වත්, ජනතාවගේ හැසිරීම මීට බලපානවා. ගෙවල්වල වතුර පිරෙන ස්ථාන ගැන, වතුර පිරුණු ප්ලාස්ටික් භාජන ගැන බලන්න කිව්වාට, ඒ අය තවම ඒවා ගැන බලන්නේ නැතුව ඉන්නවා. අපේ ඩෙංගු ටීම් එක ගිහිල්ලා සමහර තැන් වෙක් කරලා fine කරලා තිබෙනවා. ජනතාව හැදෙන්නේ නැතුව මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ජනතාව හරි ආකාරයට කටයුතු කළොත් තමයි සෞඛ්‍ය අමාත්‍යාංශයට හෝ පළාත් අමාත්‍යාංශයට මේ වැඩ කරන්න පුළුවන් වන්නේ. ඒ නිසා පළමුවෙන්ම මේ ප්‍රශ්නයට විසඳුම ජනතාවගේ පැත්තෙන් හදාගෙන එන්න ඕනෑ. ඊට පස්සේ විකල්ප වශයෙන් මොනවාද කරන්න පුළුවන් කියලා බලන්න පුළුවන්. ළඟදී මට ඇවිල්ලා තිබුණා, ඉන්දියාවෙන් මැෂින් එකක්. ඒක මදුරුවන් අල්ලන උපකරණයක්. ඒක post boxes වාගේ සවි කරන්නයි තිබෙන්නේ. ඒකට බෙහෙත් දානවා. එතකොට spray වෙනවා. නමුත් තවම ඒ ගැන පරීක්ෂණ කරලා නැහැ. මම බැලුවා. ඒක හොඳ වැඩක් කියලා හිතෙනවා. ඒ වාගේ මැෂින් සවි කළොත් සාමාන්‍යයෙන් මීටර් 50ක් ඇතුළත ඉන්න මදුරුවන් ඒකට හසු වෙනවා. නමුත් තවම අපි ඒ ගැන පරීක්ෂා කරලා නැහැ. අපි ඒ ගැන තවදුරටත් කල්පනා කරනවා. ඔබතුමා කියන විධියට නම්, ඒ වාගේ මැෂින් සවි කරලා තමයි මේ ප්‍රශ්නය විසඳන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
තව අතුරු ප්‍රශ්නයක් තිබෙනවා ද?

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
තව අතුරු ප්‍රශ්නයක් තිබෙනවා, ගරු කථානායකතුමනි.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, මහජනතාවගේ නොසැලකිල්ලත් මූලික වෙලා තිබෙනවාය කියන කාරණය අපි පිළිගන්නවා. හැබැයි, අපට ඒ පිටම මේ ප්‍රශ්නය පටවන්න බැහැ, ගරු රාජ්‍ය ඇමතිතුමා. ඩෙංගු මදුරුවා සහ කීටයා සහමුලින්ම මර්දනය කරලා දැමීමට අවශ්‍ය වැඩ පිළිවෙළ සකස් කරන්න කියලා තමයි ඔබතුමාට යෝජනා කරන්නේ. මේ මදුරුවා වතුරේ බිත්තර දැම්මාට පස්සේ තමයි, ඒ මදුරුවාගේ ජීවන චක්‍රය සක්‍රිය වෙන්නේ. මාස දෙකක්, තුනක්, හතරක් වියළි කාලගුණය තිබිලා වර්ෂාව පටන් ගත්තාම, ඒ මදුරු කීටයාගේ ජීවන චක්‍රය නැවත සක්‍රිය වෙන්න පටන් ගන්නවා. මාස තුනක්, හතරක් වියළි කාලගුණය තිබෙන කොට මේ කාරණය කෙරෙහි අපේ අවධානය යොමු නොවෙනවා කියන එකයි මම මේ කියන්නේ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, වියළි කාලගුණය තිබෙන කාලය තුළ සක්‍රිය නොවන ඒ බිත්තර ටික මර්දනය කරලා දමන්න පුළුවන් නම්, අපේ රට තුළ ඩෙංගු බෝවීමට තිත තියන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

ගරු කථානායකතුමනි, නුවරඑළිය සහ බණ්ඩාරවෙල ප්‍රදේශවල මේ ඩෙංගු මදුරුවා හිටියේ නැහැ. නමුත් දැන් ශීත

[ගරු චමින්ද විජේසිරි මහතා]

කාලගුණය තිබුණත් මේ මදුරුවා ඒ ප්‍රදේශවලටත් ව්‍යාප්ත වෙලා තිබෙනවා. ඒ මදුරුවා විවිධ පළාත්වලට අනුවර්තනය වෙනවා. ඒක වළක්වා ගැනීමට අමාත්‍යාංශය තුළින් ක්‍රියාත්මක වෙන විශේෂ වැඩ පිළිවෙළක් අපි දකින්නේ නැහැ. දැන් අපේ ප්‍රදේශයේත් ඩෙංගු මදුරුවා ඉන්නවා. පසුගිය කාලයේ මේ මදුරුවා අපේ ප්‍රදේශයේ හිටියේ නැහැ. අපේ ප්‍රදේශ ශීතල නිසා බිත්තර දැමීමට සුදුසු පරිසරයක් ඒ මදුරුවාට තිබුණේ නැහැ. වාසස්ථානයට නුසුදුසු පරිසරයක් නිසා ඒ සතා පසුගිය කාලයේ අපේ ප්‍රදේශවල හිටියේ නැහැ. ගරු රාජ්‍ය ඇමතිතුමනි, එම නිසා නුවරඑළිය වැනි ප්‍රදේශවලට තවත් ව්‍යාප්ත වෙන්න කලින්, මේ මදුරුවාගේ බෝවීම වළක්වා ගැනීමට අමාත්‍යාංශය තුළ යම්කිසි වැඩ පිළිවෙළක් නැද්ද?

**ගරු ෆයිසාල් කාසිම් මහතා**
(மாண்புமிகு பைசால் காசிம்)
(The Hon. Faizal Cassim)

මේ ඩෙංගු මදුරුවාගේ ප්‍රශ්නය මුලින්ම ඇති වුණේ කොළඹ දිස්ත්‍රික්කයේ. සාමාන්‍යයෙන් ඩෙංගු මදුරුවා බිත්තර දමන්නේ පිරිසිදු අලුත් වතුරේ. කිළිටි වතුරේ ඩෙංගු මදුරුවා බිත්තර දමන්නේ නැහැ. අපි අලුතින් සොයා ගත්ත කාරණා අනුව මේ ඩෙංගු මදුරුවා වැඩිපුරම බෝ වෙන්න පටන් අරගෙන තිබෙන්නේ අලුතින් බිල්ඩින් හදන තැන්වල. ඒ තැන්වලින් තමයි මේ මදුරුවා ගොඩක් බෝ වෙන්න පටන් අරගෙන තිබෙන්නේ. නුවරඑළිය දිස්ත්‍රික්කයේත්, ගරු මන්ත්‍රීතුමා නියෝජනය කරන බණ්ඩාරවෙල ප්‍රදේශයේත් දැන් අලුතින් බිල්ඩින් ගොඩක් හැදෙමින් තිබෙනවා. ඒ තැන් පරීක්ෂා කිරීමට අපි නිලධාරින් යවන්න ඕනෑ. ඒ දිස්ත්‍රික්කවල ඉන්න අපේ නිලධාරින්ට මේ ගැන සොයා බලන්න කියලා මම කියන්නම්.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

මේක ප්‍රායෝගික ප්‍රශ්නයක්, ගරු කථානායකතුමනි.

හැම තැනම buildings හදනවා නේ. මෙතැන තිබෙන ප්‍රශ්නය ඒක නොවෙයි. මේ මදුරුවා දැන් හැම ප්‍රදේශයකටම ව්‍යාප්ත වෙමින් යනවා. ඒක වළක්වන්න කියන කාරණයයි මම කියන්නේ. Buildings හදන කොට අනුමැතිය ගන්නා වූ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක වනවා, ගරු ඇමතිතුමනි. අලුත් පිරිසිදු වතුරේ තමයි මේ මදුරුවා බෝ වන්නේ. එම නිසා ඒක වළක්වන වැඩ පිළිවෙළක් හදන්න. එහෙම නැතිව, buildings හදන එක නවත්වන්න කියලාද ඔබතුමා කියන්නේ?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමා ඒ සම්බන්ධයෙන් අවධානය යොමු කරන්න. ඒක වැදගත් point එකක්. බොහොම ස්තුතියි.

ප්‍රශ්න අංක 4 - 204/'18 - (1), ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 5 - 239/'18 - (1), ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 6 - 261/'18 - (1), ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 7 - 334/'18 - (1), ගරු ඉෂාක් රහුමාන් මහතා.

**ගරු ඉෂාක් රහුමාන් මහතා**
(மாண்புமிகு இஷாக் ரஹுமான்)
(The Hon. Ishak Rahuman)

ගරු කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, ප්‍රාථමික කර්මාන්ත හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ප්‍රශ්න අංක 8 - 362/'18 - (1), ගරු වේලු කුමාර් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## වැව්වලට අයත් භූමිවල අනවසර පදිංචිකරුවන්: පුත්තලම දිස්ත්‍රික්කය
## குளங்களுக்குரிய காணிகளில் அனுமதியில்லாமல் தங்கியிருப்போர்: புத்தளம் மாவட்டம்
## UNAUTHORIZED SETTLERS OF LANDS BELONGING TO TANKS: PUTTALAM DISTRICT

463/'19

**9.** **ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ පිහිටි වැව් සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව්වල නම් කවරේද;

(iii) එම එක් එක් වැවට අයත් භූමිවල දැනට අනවසරයෙන් රැඳී සිටින හා වගා කටයුතුවල නිරත වන පවුල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම වැව් සතු භූමිවල අනවසරයෙන් රැඳී සිටින හා වගා කටයුතුවල නිරත පවුල් ඉවත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) புத்தளம் மாவட்டத்தில் உள்ள குளங்களின் எண்ணிக்கை எவ்வளவு;

(ii) அந்த குளங்களின் பெயர்கள் யாவை;

(iii) அந்த ஒவ்வொரு குளங்களுக்குரிய காணிகளில் அனுமதியில்லாமல் தங்கி யிருக்கும் மற்றும் பயிர்செய்கை நடவடிக்கை களில் ஈடுபட்டுள்ள குடும்பங்களின் எண்ணிக்கை வெவ்வேறாக எவ்வளவு;

(iv) இந்த குளங்களுக்குரிய காணிகளில் அனுமதி யில்லாமல் தங்கியிருக்கும் மற்றும் பயிர்ச் செய்கையில் ஈடுபட்டுள்ள குடும்பங்களை அகற்ற அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development:

(a) Will he inform this House-

(i) the number of tanks in Puttalam district;

(ii) the names of those tanks;

(iii) the number of families that occupies without permission and engages in agricultural activities at present in the lands that belong to each of the aforesaid tanks, separately; and

(iv) the steps that will be taken by the Ministry to evict the families that occupy without permission and engaging in agricultural activities in the lands that belong to the aforesaid tanks ?

(b) If not, why?

**ගරු පී. හැරිසන් මහතා (කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு பீ. ஹரிசன் - கமத்தொழில், கிராமியப் பொருளாதார அலுவல்கள், கால்நடை வளங்கள் அபிவிருத்தி, நீர்ப்பாசனம், கடற்றொழில் மற்றும் நீரகவள மூலங்கள் அபிவிருத்தி அமைச்சர்)
(The Hon. P. Harrison - Minister of Agriculture, Rural Economic Affairs, Livestock Development, Irrigation and Fisheries and Aquatic Resources Development)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේය.

(අ) (i) වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් වැව් සංඛ්‍යාව 23කි.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් සුළු වැව් සංඛ්‍යාව 1,203කි.

(ii) වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අදාළ වැව් පිළිබඳ විස්තර ඇමුණුම 01 මඟින් දක්වා ඇත.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාළ වැව් පිළිබඳ විස්තර ඇමුණුම 02 මඟින් දක්වා ඇත.

ඇමුණුම් **සභාගත*** කරමි.

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

(iii) වාරිමාර්ග දෙපාර්තමේන්තුව - ඇමුණුම 03 මඟින් දක්වා ඇත.

| අනවසර පදිංචිකරුවන් | අනවසර වගාකරුවන් |
|---|---|
| 13 | 225 |

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - ඇමුණුම 04 මඟින් දක්වා ඇත. ඇමුණුම් **සභාගත*** කරමි.

(iv) වාරිමාර්ග දෙපාර්තමේන්තුව - අනවසර පදිංචිකරුවන් දැනුන්දෙනා ඉවත් කිරීම සඳහා නීතිමය පියවර ගැනීම හෝ ඔවුන් වෙනත් ස්ථානයක පදිංචි කිරීමට අනෙකුත් අදාළ ආයතන සමඟ එකඟතාවට එළඹ කටයුතු කිරීමට නියමිතය.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව - 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත අනුව නීතිමය ක්‍රියා මාර්ග ආරම්භ කර ඇත.

(ආ) අදාළ නොවේ.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)

ගරු කථානායකතුමනි, අපේ ගරු අමාත්‍යතුමාට ගොඩක් ස්තුතිවන්ත වෙනවා, අවශ්‍ය තොරතුරු සහිතව සාධාරණ පිළිතුරක් ලබා දීම පිළිබඳව. ගරු අමාත්‍යතුමනි, පුත්තලම දිස්ත්‍රික්කය කියන්නේ, එනසාල්, කරාබුනැටි ආදි බෝග හැරුණු කොට අපට දෛනිකව පරිභෝජනයට අවශ්‍ය වන කෘෂි කාර්මික බෝග බොහොමයක් වැවෙන ප්‍රදේශයක්. එම ප්‍රදේශයේ වැව් විශාල ප්‍රමාණයක්, වැව් 2,225ක් විතර තිබෙනවා.

වර්තමානයේ තිබෙන ගැටලුව මෙයයි. මේ වැව් ප්‍රතිසංස්කරණය කිරීම සහ වැව්වල තිබෙන රොන් මඩ ඉවත් කිරීමේ කටයුතුවලට ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් හා පළාත් සභාවෙන් මුදල් ප්‍රතිපාදන වෙන් කළත්, එම මුදල් ප්‍රතිපාදන වියදම් කරන තැනට එද්දි මේ වැවේ සීමාව, මායිම සහ වපසරිය හඳුනා ගැනීමේ ප්‍රශ්නය මතු වනවා. මගේ මේ ප්‍රශ්නය ඇසීමේ අරමුණුවෙලා තිබෙන්නේ මේ වැව් තාවලුවල පදිංචිවෙලා ඉන්න අය ඉවත් කිරීම නොවෙයි. වර්තමානයේ තිබෙන භූමි ප්‍රමාණයවත් නියමානුකූලව මැනුම් කටයුතු කරලා, ලැයිස්තුගත කරන්න ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් වැඩ පිළිවෙළක් යොදනවාද කියලා මම ඔබතුමාගෙන් අහන්න කැමතියි.

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)

ගරු කථානායකතුමනි, එතුමා හොඳ ප්‍රශ්නයක් ඇහුවේ. ප්‍රායෝගිකව මේ කටයුත්ත කිරීමේ දී ජනතාව ලොකු අපහසුතාවකට පත් වනවා. මොකද, අපි වාගේ දේශපාලනඥයන්ම තමයි ඒවා ආක්‍රමණය කරන්න ඒ අයට අවසර ලබා දීලා තිබෙන්නේ. ඒ නිසා සමහර වැව් රක්ෂිතවල අඩු ගණනේ මිනුම් කටයුතු කරද්දිත් ඒවාට බාධා පමුණුවලා තිබෙනවා. එතුමා කියපු කාරණා අනුව ඒ වැව්වල වපසරිය නීත්‍යානුකූලව මැනුම් කටයුතු කරන්න ඕනෑ. ඒ කටයුත්ත කරන්න අපි පුළුවන් තරම් උත්සාහ කරන්නම්. අපි දැනට තිබෙන වැව්

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු පී. හැරිසන් මහතා]

ප්‍රමාණයේ මිනුම් කටයුතු කළොත් ඒ ආශ්‍රිතව පදිංචිවෙලා ඉන්න අයට ස්ථිර බලපත්‍ර ලබා දෙන්න වෙනවා, ගරු කථානායකතුමනි. එහෙම වුණොත් අපි වැරදි ක්‍රියාමාර්ගයකට යොමු වනවා. ඒ නිසා දැනට නීත්‍යානුකූලව තිබෙන වැව් රක්ෂිතයන් මොනවාද කියලා හඳුනාගෙන, ඒ අනුව අපි ක්‍රියා කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු අශෝක ප්‍රියන්ත මහතා**
(மாண்புமிகு அசோக்க பிரியந்த)
(The Hon. Ashoka Priyantha)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ලබා දුන් පිළිතුරේම මගේ දෙවැනි අතුරු ප්‍රශ්නයට ලැබිය යුතු උත්තරයේ භාගයක් තිබුණා. ඔබතුමන්ලා, අපි ඇතුළු දේශපාලනඥයන් විසින් මේ වැව් තාවලුවල පදිංචිවෙලා, ගෙවල් හදන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. "වැව් දහස", "වැවයි - ගමයි" කියන ජාතික වැඩ පිළිවෙළවල් ක්‍රියාත්මක කළත්, අවසානයේ දී ප්‍රායෝගිකව නතර වන තැනක් තිබෙනවා. ඒක තමයි, මුදල් ප්‍රතිපාදන ලැබුණත්, නියම විධියට වැව හඳුනාගෙන නොතිබීම නිසා නිසියාකාරව මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න බැහැයි කියන කාරණය.

වර්තමානයේ තිබෙන තත්ත්වය අවබෝධ කරගෙන ඉදිරියේ දී මෙතැනින් එහාට කටයුතු කළ යුතුව තිබෙනවා. මොකද, ඔබතුමා ලබා දුන් උත්තරයේ සඳහන් වුණා, මැනුම් කටයුතු කරලා අවසන් වුණොත් ඒ අයට නීත්‍යානුකූල අයිතියක් ලබා දෙනවා කියලා. ඒ නිසාවෙන්ම මැනුම් කටයුතු නවත්වා ගෙන සිටියොත්, ඉදිරියේ දී අපි මොන වැඩ පිළිවෙළක් ජාතික වශයෙන් ගෙනාවත් අපට නීත්‍යානුකූල විධියට මුදල් ප්‍රතිපාදන වෙන් කරගන්න බැරිවෙනවා, ගරු ඇමතිතුමනි. වර්තමානයේ තිබෙන තත්ත්වය තුළ රාජ්‍ය නිලධාරියා බොහොම බයයි. ඒ වාගේම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අදාළ නිලධාරීන් පවා බයයි. පිරිසිදුව එම මැනුම් කටයුතු කළත්, හැමදාම ප්‍රතිපාදන වෙන් වුණේ රජය යටතේ නඩත්තු වෙන වැව්වලට විතරයි. මම බොහොම පැහැදිලිවයි කියන්නේ. පසුගිය වසරේ අපි වෙන් කරපු මුදල් ප්‍රතිපාදන අවස්ථා කිහිපයකදී අත්‍යවශ්‍ය වාරිමාර්ගවලට වෙන් කරගන්න බැරිව ගියා.

ඒ නිසා මේ තත්ත්වය හඳුනාගෙන, ඒ කියන්නේ පදිංචි වෙලා ස්ථිර කාලයක් සිටින අයගේ දේවල් නීත්‍යානුකූල නොවන විධියට ක්‍රමවේදයක් හදලා, ඒ වැව් සංවර්ධනය කරන්න වැඩ පිළිවෙළක් ඇති කරන්න බැරිද?

**ගරු පී. හැරිසන් මහතා**
(மாண்புமிகு பீ. ஹரிசன்)
(The Hon. P. Harrison)
ගරු කථානායකතුමනි, එතුමා හොඳ අදහසක් ඉදිරිපත් කළේ. නමුත් ඒවා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමේදී අපට ගැටලු ගණනාවකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. හැබැයි, ඒ හැම වැවකටම අදාළව ගොවි සංවිධාන තිබෙනවා. ඒ ගොවි සංවිධාන තමයි හුඟාක් වේලාවට අභ්‍යන්තර පරිපාලන කටයුතුවල යෙදී සිටින්නේ. "අපි මෙන්න මේ වැඩ කටයුත්ත කරලා දෙන්නම්" කියලා ඒ අය අපට නිර්දේශයක් ලබා දෙනවා නම්, මහජන සහායත් ඇතිව අපට ඒ කටයුතු කරන්න පුළුවන්. මොකද, මේවා නීත්‍යානුකූලව පොත්පත්වල තිබෙන විධියටම කරන්න අමාරුයි. හැබැයි, ප්‍රායෝගිකව ගොවි සංවිධාන මඟින් අපට ඒ සහයෝගය ලබා දෙනවා නම්, ඒ අනුව අපට කටයුතු කරන්න පුළුවන්.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු කථානායකතුමනි, මේ සම්බන්ධව මට ප්‍රශ්නයක් මතු කරන්න අවසරද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමනි, අපි තීරණයක් ගෙන තිබෙනවා. ඒ නිසා මෙතැනින් පිට යන්න බැහැ, වේලාව මදි නිසා. [බාධා කිරීමක්] ගරු මන්ත්‍රීතුමනි, අපි ඒ සම්බන්ධව පෙරේදා තීරණයක් ගත්තා. ඒ නිසා අපි අය වැය කාල සීමාවේ දී විතරක් මෙහෙම කරගෙන යමු.

## මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන පාසල් : මහනුවර දිස්ත්‍රික්කය
## மத்திய மாகாண சபையின்கீழ் நிருவகிக்கப்படும் பாடசாலைகள்: கண்டி மாவட்டம்
## SCHOOLS ADMINISTERED BY CENTRAL PROVINCIAL COUNCIL: KANDY DISTRICT

489/'19

**10.** **ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වන මහනුවර දිස්ත්‍රික්කයේ පිහිටි පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් එක් එක් අධ්‍යාපන කොට්ඨාසය අනුව කවරේද;

(iii) 2010 වර්ෂයේ සිට මේ දක්වා මධ්‍යම පළාත් සභාව යටතේ පාලනය වූ පාසල් වැසීගොස් තිබේ නම්, එම පාසල්වල නම් කවරේද;

(iv) එම පාසල් නැවත විවෘත කිරීමට හෝ වැසීගිය පාසල්වල සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට අමාත්‍යාංශය අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) மத்திய மாகாண சபையின் கீழ் நிருவகிக்கப் படுகின்ற கண்டி மாவட்டத்தில் அமைந்துள்ள பாடசாலைகளின் எண்ணிக்கை யாது;

(ii) அப்பாடசாலைகளின் பெயர்கள் ஒவ்வொரு கல்விக் கோட்டத்தின் அடிப்படையில் யாவை;

(iii) 2010 ஆம் ஆண்டு தொடக்கம் இன்றுவரை மத்திய மாகாண சபையின் கீழ் நிருவகிக்கப் பட்ட பாடசாலைகள் மூடப்பட்டிருப்பின் அப்பாடசாலைகளின் பெயர்கள் யாவை;

(iv) அப்பாடசாலைகளை மீளத் திறப்பதற்கோ அல்லது மூடப்பட்டுள்ள பாடசாலைகளின் வளங்களின் மூலம் உச்சமட்டப் பயன்களைப் பெற்றுக் கொள்வதற்கோ அமைச்சினால் பின்பற்றப்படுகின்ற முறையியல் யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல் ஏன்?

ask the Minister of Education:

(a) Will he inform this House -

(i) the number of schools in the Kandy District which are under the administration of the Central Province;

(ii) the names of the aforesaid schools separately on the basis of the Education Division;

(iii) out of the schools coming under the administration of the Central Province, the names of schools which were closed down between year 2010 to date; and

(iv) methodology adopted by the Ministry to re-open the schools closed down, or to ensure the optimum utilization of the resources of such schools?

( b) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අධ්‍යාපන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර දෙනවා.

(අ) (i) පාසල් සංඛ්‍යාව 615කි.

(ii) ඇමුණුම 01හි දක්වා ඇත.

(iii) ඇමුණුම 02හි දක්වා ඇත. .

(iv) ඔව්.

වැසී ගිය පාසල් අතරින් නැවත විවෘත කළ හැකි තත්ත්වයේ පවතින පාසල් විවෘත කිරීම සඳහා ඒ අවට පදිංචිකරුවන්ගේ දරුවන් ප්‍රාථමික අංශය වෙත ඇතුළත් කිරීම ධෛර්යවත් කිරීම සඳහා දෙමව්පියන් දැනුවත් කිරීම හා පාසල් සඳහා අවශ්‍ය ගුරු මණ්ඩලය ලබා දීමට කටයුතු කිරීමත්, විවෘත කළ නොහැකි පාසල්වල සම්පත් අනෙක් පාසල්වලට බෙදා දීමටත්, ගොඩනැඟිලි ප්‍රයෝජනවත් කාර්යයක් සඳහා යෙදවීමට ප්‍රාදේශීය ලේකම් වෙත භාර දීමටත් අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව මධ්‍යම පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් විසින් වාර්තා කර ඇත.

(ආ) අදාළ නොවේ.

ඇමුණුම් **සභාගත*** කරමි.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මගේ පළමුවන අතුරු ප්‍රශ්නය මෙයයි.

"ළඟම පාසල - හොඳම පාසල" ව්‍යාපෘතිය යටතේ මධ්‍යම පළාතේ පාසල් විශාල සංඛ්‍යාවක් සංවර්ධනය කිරීම සඳහා පියවර ගත්තා. නමුත්, කොන්ත්‍රාත්කරුවන්ට මුදල් ගෙවීමට අපොහොසත් වීම නිසා ඒ අය බැංකුවට ණය වෙලා තිබෙනවා. එහි ඵල විපාකයක් හැටියටත් ඍජුව සහ වක්‍රව රැකියාවල නියුතුවූ කම්කරුවන් ඇතුළු 30,000කට ආසන්න සංඛ්‍යාවකට රැකියා අහිමි වෙලා තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, මේ පිළිබඳව විශේෂ අවධානයක් යොමු කළ යුතුයි. මොකද, අවුරුදු දෙකක් තිස්සේ මුදල් නොලැබුණු කොන්ත්‍රාත්කරුවනුත් ඉන්නවා. මේ පිළිබඳව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය කුමක්ද කියා මා අහන්න කැමැතියි.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු මන්ත්‍රීතුමනි, මෙම අතුරු ප්‍රශ්නය අධ්‍යාපන ඇමතිතුමාට යොමු කරලා ඔබතුමාට පිළිතුරක් ලබා දෙන්නම්.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

දැනට අප රටේ තිබෙන පාසල් ළමුන් ඇතුළත් කර ගැනීමේ ක්‍රියාදාමය තුළ, සමහර අය ළමයා ඉපදෙන්නත් කලින් ජනප්‍රිය පාසල් ආසන්නයෙන් නිවාස අරගෙන අදාළ සියලු ලිපි ලේඛන සකස් කර ගන්නවා. හැබැයි, ඒ ගොල්ලන් කරන ඒ දෙය නිසා, පාසල ආසන්නයේ ස්ථිර වශයෙන් පදිංචි වී සිටින අයගේ දරුවන්ට ඒ පාසල අහිමි වෙනවා. එම නිසා විනිවිදභාවයෙන් යුතුව මෙම කටයුත්ත කිරීම අවශ්‍යයි. එහෙම කරලා, සමහර අය තමන්ගේ ළමයින් මෙවැනි පාසල්වලට ඇතුළත් කර ගන්නවා. ඊට පස්සේ, ඉතා දුෂ්කර ප්‍රදේශයක ඉඳලා තමයි ඒ ළමයා ඉස්කෝලෙට එන්නේ. ඒ අය එම නිවසේ පදිංචි වෙලා ඉන්නෙත් නැහැ. ගරු ඇමතිතුමනි, මේ කාරණය ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගේ විශේෂ අවධානයට යොමු කර පිළිතුරක් ලබාදෙන මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11 - 515/'19- (1), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ප්‍රශ්න අංක 12 - 526/'19- (1), ගරු මයන්ත දිසානායක මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## කොරියානු රැකියා සඳහා යන ශ්‍රමිකයන් : ආරක්ෂිත තැන්පතු
## கொரியாவுக்குத் தொழிலுக்குச் செல்லும் ஊழியர்கள்: பாதுகாப்பு வைப்பு
## WORKERS MIGRATING FOR EMPLOYMENT IN KOREA : SECURITY DEPOSIT

532/'19

**13.** **ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කොරියානු රැකියා සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා පිටත්ව යන ශ්‍රමිකයන්ගෙන් රුපියල් ලක්ෂ පහක මුදලක් ආරක්ෂිත තැන්පතුවක් ලෙස භාරගන්නා බවත්;

---

* *පුස්තකාලයේ තබා ඇත.*
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු බිමල් රත්නායක මහතා]

(ii) ඒ හේතුවෙන් කොරියානු රජයේ රැකියා සඳහා යන ආර්ථික දුෂ්කරතාවලින් පෙළෙන තරුණ තරුණියන් විශාල අපහසුවකට පත්වී ඇති බවත්;

එතුමා දන්වන්නේද?

(ආ) මෙම නීතිය අහෝසි කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

தொலைத்தொடர்புகள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் விளையாட்டுத்துறை அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கொரியாவில் தொழில் வாய்ப்புகளைப் பெறுவதற்காக வெளிநாட்டு வேலைவாய்ப்பு பணியகத்தினூடாக செல்லும் ஊழியர்களிட மிருந்து ரூபா ஐந்து இலட்சம் பணத் தொகை பாதுகாப்பு வைப்பாக பெற்றுக் கொள்ளப்படு கின்றதென்பதையும்;

(ii) இதன் காரணத்தினால் கொரியா நாட்டில் தொழில் வாய்ப்புகளுக்காக செல்லும் பொருளா தார கஷ்டங்களினால் பாதிக்கப்பட்டுள்ள இளைஞர் யுவதிகள் பெரும் அசௌகரியத்துக்கு உள்ளாகியுள்ளனர் என்பதையும்;

அவர் அறிவாரா?

(ஆ) இச்சட்டத்தை இரத்துச் செய்ய நடவடிக்கை மேற்கொள்வாரா என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Telecommunication, Foreign Employment and Sports:

(a) Is he aware that -

(i) a security deposit of Rs. 500,000/- is obtained from workers migrating for employment in Korea through the Foreign Employment Bureau; and

(ii) it poses a major problem to young men and women with economic difficulties when they migrate to Korea for employment?

(b) Will he inform this House whether steps will be taken to repeal this law?

(c) If not, why?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication, Foreign Employment and Sports)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ශ්‍රමිකයන්ගෙන් රුපියල් ලක්ෂ පහක (රුපියල් 500,000) මුදලක් ආරක්ෂිත තැන්පතුවක් ලෙස කාර්යාංශය අය
කරන්නේ නැත.

(ii) අදාළ නැත.

(ආ) අදාළ නැත.

(ඇ) පැන නොනඟී.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, කොරියාවට ගිය සහ එහි යාමට අපේක්ෂාවෙන් සිටින තරුණ කණ්ඩායමක් ඉදිරිපත් කළ ලේඛනයක් අනුව තමයි මම මේ ප්‍රශ්නය ඉදිරිපත් කළේ. එම ලේඛන දැන් මා සතුව නැහැ. රුපියල් ලක්ෂ පහක් නොවෙයි නම්, කුමන හෝ මුදලක් ඔබතුමන්ලා අය කරනවාද?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු මන්ත්‍රීතුමනි, රැකියාවක් සඳහා කොරියාවට යනකොට ඒ ගොල්ලන්ට වෙන වියදම් ඇති.

මූලික වශයෙන්, ඒ විභාගය ලියන්න පන්ති යන්න ඕනෑ. ඒවාට වියදම් ඇති. ඊට අමතරව, මා හිතන විධියට ටිකට් එකේ ගාස්තුව ඒ අය Foreign Employment Bureau එකට ගෙවන්න ඕනෑ. ඒ, වියදම විතරයි. ඒක සම්බන්ධයෙන් ටෙන්ඩර් පටිපාටියක් තිබෙනවා. Quotations තුනක් අරගෙන, අඩුම ටිකට් එක තමයි ගන්නේ. ඒ ගොල්ලන් කියන Airlines කිහිපයක් තිබෙනවා. ඒවායින් යන්න ඕනෑ ප්‍රමාණයට ගන්නවා හැරෙන්න මම දන්නා තරමින් වෙනත් අය කිරීමක් නැහැ. හැබැයි, ඔබතුමා ඒ ලේඛනය ලබා දුන්නොත්, ඒ ගැන සොයා බලා අනිවාර්යයෙන් සතියක් ඇතුළත පිළිතුරක් ලබාදෙන්නම්.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මම ඔබතුමාට ඒ ලේඛන ලබා දෙන්නම්. මගේ දෙවන අතුරු ප්‍රශ්නය මෙයයි.

ගරු ඇමතිතුමනි, විදේශ රැකියාවල නියුතු වූවන්ට දිගු කාලයක සිට තිබෙන ගැටලුවක් තිබෙනවා. සයිප්‍රස්වල විශේෂයෙන් මේ ගැටලුව තිබෙනවා. අනෙක් රටවලත් තිබෙනවා. විශේෂයෙන් සයිප්‍රස්වල සේවය කරන ලංකාවේ සේවක සේවිකාවන්ට ඒ හාම්පුතුන් විසින් දායක මුදලක් ලබා දෙනවා, social security fund එකකට. නමුත්, ඔවුන් අවුරුදු හතරක් හෝ අටක් සේවය කරලා ලංකාවට එනකොට ඒ social security fund එකේ මුදල් අපේ රටේ අයට ගන්න බැහැ. මමත් එක අවස්ථාවකදී එහි අභ්‍යන්තර කටයුතු ඇමතිවරයා සමඟ මේක ගැන සාකච්ඡා කළා. ඔහු කිව්වා, මේ සම්බන්ධව ගිවිසුමක් අත්සන් කළ යුතුයි කියා. ගරු ඇමතිතුමනි, මම ඒ ගිවිසුමේ පිටපත් ඔබතුමාට කලින් සිටි විදේශ රැකියා කටයුතු භාර ඇමතිවරු තුන්දෙනකුට සයිප්‍රස්වලින් ගෙන්වා ගෙන භාර දීලා තිබෙනවා. ඒ තුන්දෙනාම අවුරුදු 10ක්, 12ක් තිස්සේ මොනවත් කරලා නැහැ. අවශ්‍ය නම් ඔබතුමාටත් එහි පිටපතක් දෙන්න පුළුවන්. ඔබතුමාට ඒක අවශ්‍යයි කියා මම හිතන්නේ නැහැ. මේ ප්‍රශ්නය විසඳන්න ඔබතුමා මොනවාද කරන්නේ?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, එතුමා ඇහුවේ හොඳ ප්‍රශ්නයක්. මේ වනකොට ඇත්තටම සයිප්‍රස් රාජ්‍යය තුළින් අපට යුරෝපයට සම්බන්ධව බොහොම හොඳ අවස්ථා කිහිපයක්ම ලැබී තිබෙනවා.

දැනට රටවල් 14ක තානාපති කාර්යාල ඇතුළත අපේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්යාලයක් තිබෙනවා. හැබැයි,

සයිප්‍රස් රාජ්‍ය තුළ තවම ඒක පටන් ගෙන නැහැ. නමුත්, විදේශ කටයුතු අමාත්‍යාංශය මේ වන විට අලුතින් අපේ cadre එකක්, එහෙම නැත්නම් විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් කණ්ඩායමක්,- [බාධා කිරීමක්]

දැනට සයිප්‍රසය පාලනය වෙන්නේ ඉතාලියෙන්. ඉතාලියේ ශ්‍රී ලංකා තානාපතිතුමා වන දයා පැල්පොල මහත්මයාට තමයි සයිප්‍රස් රාජ්‍යයේ කටයුතුත් බලන්න වෙලා තිබෙන්නේ. සයිප්‍රස් රාජ්‍යයේ සම්පූර්ණ කටයුතු සිදු වෙලා නැහැ. ඒ නිසා එතැන ගැටලුවක් තිබෙනවා. අපි දන්නා තරමින් තව මාසයක් ඇතුළත ඒ ප්‍රශ්නය විසඳනවා, ගරු මන්ත්‍රීතුමනි. එතැන අපේ representation එකක් තිබුණොත් තමයි අපට ගිහිල්ලා ඒ අමාත්‍යාංශත් සමඟ, ඒ රටේ සිටින රාජ්‍ය නිලධාරින් සමඟ සාකච්ඡා කිරීමේ සම්පූර්ණ වපසරිය සකස් වෙන්නේ. ඔබතුමා කියන ඒ ප්‍රශ්නය පිළිබඳව මටත් දෙවතාවක් විතර වාර්තා වුණා. ඒ තුළින් බොහෝ ඉක්මනින් විසඳුමක් ලැබෙයි කියා අපි විශ්වාස කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 - 550/'19 (1), ගරු එස්. ශ්‍රීතරන් මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

## 2011 අංක 43 දරන පනත මඟින් අපහසුතාවට පත් වූ ආයෝජකයන් සහ ව්‍යාපාර: සහන
## 2011 இன் 43 ஆம் இலக்கச் சட்டத்தினால் அசௌகரியத்துக்குள்ளான முதலீட்டாளர்கள் மற்றும் தொழில்முயற்சியாளர்கள்: நிவாரணம்
## INVESTORS AND ENTERPRISES SUBJECTED TO DIFFICULTY BY ACT, NO. 43 OF 2011: RELIEF

584/'19

**15. ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
රාජ්‍ය ව්‍යවසාය, කන්ද උඩරට උරුමය සහ මහනුවර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2016 අය වැය යෝජනා අංක 206ට අනුව, 2011 අංක 43 දරන ඌන ක්‍රියාකාරී ව්‍යවසායන් හෝ ඌන උපයෝජිත වත්කම් පුනරුදය කිරීම පනත මඟින් අපහසුතාවයට පත් කරන ලද ආයෝජකයන්ගේ සහ ව්‍යාපාරවල නාමලේඛනයක් ඉදිරිපත් කරන්නේද;

(ii) 2011 අංක 43 දරන පනත මඟින් අපහසුතාවයන්ට පත් වූ ව්‍යාපාරවලට සහන ලබාදීමට හෝ පහසුකම් ලබාදීමට රජය විසින් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

(iii) උක්ත අය වැය යෝජනාව අනුව, දේශීය හා ගෝලීය ආයෝජකයන් ආරක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කළ හෝ ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන නව නීති රීති කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

அரச தொழில் முயற்சிகள், மலைநாட்டு மரபுரிமைகள் மற்றும் கண்டி அபிவிருத்தி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2016 ஆம் ஆண்டுக்கான வரவு செலவு திட்டப் பிரேரணை இலக்கம் 206 இன் படி, 2011 ஆம் ஆண்டின் 43 ஆம் இலக்க, செயற்பாடு குறைவா கவுள்ள தொழில்முயற்சிகளுக்கும் அல்லது குறைவாகப் பயன்படுத்தப்படுகின்ற சொத்துக் களுக்கும் புத்துயிரளித்தல் சட்டத்தின் மூலம் அசௌகரியத்திற்கு உள்ளாக்கப்பட்ட முதலீட் டாளர்கள் மற்றும் தொழில்முயற்சிகளின் பெயர் பட்டியலொன்றை சமர்ப்பிப்பாரா என்பதையும்;

(ii) 2011 ஆம் ஆண்டின் 43 ஆம் இலக்க சட்டத்தின் மூலம் அசௌகரியத்துக்கு உள்ளான தொழில் முயற்சிகளுக்கு நிவாரணங்களை பெற்றுக் கொடுப்பதற்கு அல்லது வசதியளிப் பதற்கு அரசாங்கத்தினால் பின்பற்றப்பட்ட செயன் முறைகள் யாவை என்பதையும்;

(iii) மேற்படி வரவு செலவுத் திட்ட பிரேரணைக்கு அமைவாக, உள்நாட்டு மற்றும் உலகளாவிய முதலீட்டாளர்களை பாதுகாப்பதற்காக சமர்ப்பிக் கப்பட்ட அல்லது சமர்ப்பிக்க எதிர்பார்க்கப்படும் புதிய சட்ட விதிகள் யாவை என்பதையும்;

அவர் இச்சபையில் அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Enterprise, Kandyan Heritage and Kandy Development:

(a) Will he inform this House-

(i) whether he will table a list of investors and enterprises subjected to difficulty by the Revival of Underperforming Enterprises or Underutilized Assets Act, No. 43 of 2011 as per Budget Proposal No. 206 of the Budget, 2016;

(ii) what courses of action were taken by the Government to give relief or facilitate the enterprises which were put to difficulties by Act, No. 43 of 2011; and

(iii) what new laws have been introduced or are intended to be presented to protect local and global investors as per the aforesaid Budget Proposal?

(b) If not, why?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) ඔව්.

ඇමුණුම **සභාගත*** කරමි.

(ii) 2011 අංක 43 දරන පනතේ 4 (3) වගන්තිය ප්‍රකාරව ඌන ක්‍රියාකාරී කොටස් හිමිකරු සහ එම වත්කම අයත් හිමිකරුට වන්දි මුදල ලබා ගැනීමට අවස්ථාව සලසා දී තිබුණි.

අමුණා ඇති පනතේ පිටපත **සභාගත**** කරමි.

---

*** පුස්තකාලයේ තබා ඇත.*
*** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
*** Placed in the Library.*

[ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා]

(iii) මෙම පනතේ විධිවිධාන අනුව වත්කම් හෝ ව්‍යවසායන් රජය සතුකර ගැනීම තුළින් ආයෝජනයන්ට අහිතකර ක්‍රියාවන් ඇතිවීමට ඉඩ කඩ ඇති බැවින් හා දේශපාලන අගතිගාමී ක්‍රියාවන් සිදුවීමට ඉඩ ඇති හෙයින්, ආයෝජකයින් ආරක්ෂා කිරීම සඳහා වන නව නීතියක් ගෙන ඒමට අදහස් කර ඇත. ඒ සඳහා නීතිපති හා නීති කෙටුම්පත් සම්පාදක සමග සාකච්ඡා කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

ඇමුණුම

I වන උපලේඛනය යටතේ

1. හොටෙල් ඩිවලපර්ස් (ලංකා) ලිමිටඩ්

II වන උපලේඛනය යටතේ

1. වාමර්ස් ධාන්‍යාගාරය- පිටකොටුවේ පිහිටා ඇති දේපල
2. කළම්බු කොමර්ෂල් -බඳුල්ලේ පිහිටි දේපල
3. ලංකා ට්‍රැක්ටර්ස් ලිමිටඩ්- පිටකොටුව සහ නරාහේන්පිට
4. සී/ස පැලවත්ත සීනි සමාගම
5. සී/ස සෙවනගල සීනි සමාගම
6. සිනෝටෙක්ස් ලංකා ලිමිටඩ්
7. ජැකා ලංකා ලිමිටඩ්
8. ජ්ලයිමත් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට් ලිමිටඩ්)
9. කොස්මෝස් මැකි ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ්
10. කාබුල් ලේස් (ප්‍රයිවට් ලිමිටඩ්)
11. කජු සංස්ථාව කලින් පිහිටි ඉඩම
12. ඉන්ටර්ට්‍රේඩ් ලංකා ප්‍රයිවට් ලිමිටඩ්
13. සුවීර් නෙබ් ප්‍රජෙක්ට්ස් ප්‍රයිවට් ලිමිටඩ්
14. සෙලින්කෝ ලෙෂර් ප්‍රොපටීස් ලිමිටඩ්
15. සීතා පැෂන් ප්‍රයිවට් ලිමිටඩ්
16. ඩී සී ඇපරල් ප්‍රයිවට් ලිමිටඩ්
17. නිඩල් ක්‍රාෆ්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
18. හයි ෆැෂන් ගාමන්ට් ප්‍රයිවට් ලිමිටඩ්
19. කොලින්ස් ගාමන්ට් ප්‍රයිවට් ලිමිටඩ්
20. රුහුණු පුතා ඇපරල් ප්‍රයිවට් ලිමිටඩ්
21. සන්ජය ගාමන්ට් ප්‍රයිවට් ලිමිටඩ්
22. මැක්ෆා ඇපරල් ප්‍රයිවට් ලිමිටඩ්
23. යොහීදා ඇසෝසියේට්ස් (ප්‍රයිවට් ලිමිටඩ්)
24. ඩයනමික් ක්ලෝතින් (ප්‍රයිවට් ලිමිටඩ්)
25. 609 පොලිමර්ස් එක්ස්පෝට්ස් ප්‍රයිවට් ලිමිටඩ්)
26. කොස්කෝ පොලිමර් ලංකා (ප්‍රයිවට් ලිමිටඩ්)
27. ග්‍රේට් වෝල් ත්‍රෙඩ් මැනුෆැකිචරින්(ප්‍රයිවට් ලිමිටඩ්)
28. ආදම්ජී එක්ස්ට්‍රැක්ෂන්ස් (ප්‍රයිවට් ලිමිටඩ්)
29. ඩාටා ෆූඩ් (ප්‍රයිවට් ලිමිටඩ්)
30. ටෙන්ඩන් ලංකා (ප්‍රයිවට් ලිමිටඩ්)
31. රිකාන් ලංකා (ප්‍රයිවට් ලිමිටඩ්)
32. කොම්පොසිට් ටවර් සොලියුෂන්ස් (ප්‍රයිවට් ලිමිටඩ්)
33. හෙල්ත් ෆූඩ් ප්‍රඩක්ට්ස් (ප්‍රයිවට් ලිමිටඩ්)
34. ශ්‍රී ඩිරාග් (ප්‍රයිවට් ලිමිටඩ්)
35. රෝයලි එක්ස්පෝට්ස් (ප්‍රයිවට් ලිමිටඩ්)
36. කොන්ටිනෙන්ටල් වනස්පති (ප්‍රයිවට් ලිමිටඩ්)

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මගේ පළමු අතුරු ප්‍රශ්නය මෙයයි. මෙවර අය වැය යෝජනාවල මෙලෙසින් තිබෙනවා. "නව ආයෝජනයන්ට උපාය මාර්ගික සංවර්ධන ව්‍යාපෘති පනත වෙනුවට නව ආයෝජන පනත හඳුන්වා දෙනු ඇත. ගරු කථානායකතුමනි, රටේ ආර්ථික භූමිකාවට දැඩි බලපෑමක් එල්ල කරන විශ්ව සංවර්ධන ව්‍යාපෘති සඳහා ආයෝජනය කිරීමට එකී සමාගම් සඳහා බදු අනුග්‍රහය ලබා දීමට මා යෝජනා කරනවා. කෙසේ වුවද, නව රෙගුලාසි පනවන තෙක් දැනටමත් සහන සඳහා අයදුම් කර ඇති සමාගම් සඳහා අතරමැදි කාලයේදී මෙම සහන තවදුරටත් ලබා දෙනු ඇත. ගරු කථානායකතුමනි, පසුගිය රජය යටතේ නොමනා අනුග්‍රහය ලබමින් අධික ලාභ ලැබූ අතලොස්සක් සමාගම් සඳහා අපි සුපිරි වාසි බද්දක් පැනවූයෙමු." කියා.

මේ අනුව 2016දී තමයි ගරු ඇමතිතුමා නව පනතක් ගෙනෙනවා කියන්නේ. දැන් අපි ඉන්නේ 2019 වසරේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ අවසාන අය වැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේයි ඉන්නේ.

එතකොට, 2016දී මේ රටේ ආයෝජනය ආරක්ෂා කර - ආයෝජනය සුරක්ෂිත කර- ආයෝජනය ප්‍රවර්ධනය කිරීම සඳහා අලුත් පනත් කෙටුම්පතක් ගෙනෙනවා කියන ඉලක්කය කරා තමුන්නාන්සේලාට යන්න බැරි වුණාය කියන එක ඔබතුමා අවංකව පිළිගන්නවාද කියා මම දැන ගන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒ පිළිබඳව මේ වන විට නීතිපති දෙපාර්තමේන්තුවත් සමඟ සාකච්ඡා කරමින් සිටිනවා. යම් කිසි ප්‍රමාදයක් තිබෙන බව මම පිළිගන්නවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මන්ත්‍රීතුමා, දෙවැනි අතුරු ප්‍රශ්නය අහන්න.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)

ගරු කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. අපේ රටේ ඉතිහාසයේ කිසිම රජයක් නොකළ පරිදි අතීතයට බලපාන පරිද්දෙන් මේ රටේ පෞද්ගලික ආයෝජකයෝ අධෛර්යවත් වන ලෙස සුපිරි වාසි බද්දක් පනවලා මේ රජය රුපියල් බිලියන 50කට අධික මුදලක් ලබා ගත්තා. ඒ තුළින් ඇති වුණු අසාධාරණය එලෙසින්ම තිබියදී, ආයෝජකයන්ට තිබුණු බදු සහන සියල්ල නව දේශීය ආදායම් පනත මඟින් ඉවත් කළා. මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, දේශීය ආදායම් පනත අනුව තමුන්නාන්සේලාගේ ප්‍රතිපත්තිය වන්නේ, ආයෝජන ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය බදු සානුබල, බදු සහන, බදු විරාම යනාදී සියල්ල තවදුරටත් ප්‍රදානය නොකර තබා ගැනීමද කියා. එහෙම නැත්නම් මේ රටේ මිනිස්සු ගැන විශ්වාසය තියලා, ස්වජාතිකයන්ට නැඟිටින්නට පුළුවන් ලෙස එවැනි සහනයක් දෙන්න හිතනවාද කියන එක පිළිබඳව මම ඔබතුමාගෙන් දැනගන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)

ඇත්ත වශයෙන්ම බදු සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමාගෙන් ප්‍රශ්න කරන්න ඕනෑ. හැබැයි, මෙතුමාට මගේ දැනුමේ හැටියට කියන්න පුළුවන්, හැමදාම බදු සහන දෙන්නේ නැහැ. It is only given for a short period of time. ටික කාලයකටයි දෙන්නේ. ඒ කාලය තුළ ඒකෙන් ප්‍රයෝජන අරගෙන තමන්ගේ ව්‍යාපාරය දියුණු කරගන්න ඕනෑ. එසේ දියුණු කර නැත්නම් රජයට පියවරක් ගන්න සිද්ධ වෙනවා. ඒකයි අදහස් කළේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. තවදුරටත් පැහැදිලි කිරීමක් අවශ්‍ය නම් මෙම ප්‍රශ්නය මුදල් ඇමතිතුමාට refer කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
Sir, the people who have been given tax concessions for a long time, if they have not showed any improvement in their business enterprises, cannot have those forever. So, those concessions are normally removed. අලුත් ව්‍යාපාරවලට - for new businesses - ඒක දෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, අපි ඊළඟ ප්‍රශ්නයට යමු.

**ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (கலாநிதி) பந்துல குணவர்தன)
(The Hon. (Dr.) Bandula Gunawardane)
ගරු කථානායකතුමනි, මේ වන විට ඔක්කෝම ව්‍යාපාර කඩා වැටිලා තමයි තිබෙන්නේ. ඔබතුමා ව්‍යාපාරික ක්ෂේත්‍රය පිළිබඳව විශාල අවබෝධයක් තිබෙන කෙනෙක්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
මෙතුමා අවුරුදු 4ක් තිස්සේ කියනවා, මේ රටේ ව්‍යාපාර ඇද වැටිලා කියා. ඔබතුමා හැමදාම ඔය කථාව කියනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 14 -550/'19- (1), ගරු එස්. ශ්‍රීතරන් මන්ත්‍රීතුමා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් අහලා තිබුණාට, මෙම ප්‍රශ්නය අයත් වන්නේ ක්‍රීඩා අමාත්‍යාංශයට. එම නිසා ඒ ප්‍රශ්නය නැවත අහන්න සිද්ධ වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Member, then you have to refer that Question to the Ministry of Telecommunication, Foreign Employment and Sports.

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, நான் விளையாட்டுத் துறை அமைச்சிடம்தான் இந்தக் கேள்வியைக் கேட்டேன். ஆனால், குறித்த உத்தியோகத்தர்கள் ஏன் இதை உள்நாட்டலுவல்கள் அமைச்சிடம் சமர்ப்பித்தார்கள் என்று தெரியவில்லை. நான் மரக்கறிக்கடையில் போய் 'ஐஸ் கிறீம்' கேட்கமாட்டேன்.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication, Foreign Employment and Sports)
අනෙක් ප්‍රශ්න එක්ක මම මේ ප්‍රශ්නය දැක්කා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට පිළිතුරු දෙන්න පුළුවන්ද?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු කථානායකතුමනි, මට මේ සඳහා සතියක කාලයක් ලබා දෙන්න. මෙහි අහලා තිබෙන්නේ ක්‍රීඩා සංගමයක් නැත්තේ ඇයි කියලායි. මෙය ඇත්තටම අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් පාලන අමාත්‍යාංශයට අයිති වෙන්නේ නැහැ. අහලා තිබෙන ප්‍රශ්නය අනුව ක්‍රිකට් සංගම් පිළිබඳ ප්‍රශ්නයක් තිබෙන්නේ. ලංකාවේ දිස්ත්‍රික්ක 25ම සංගම් පිහිටුවලා නැහැ. ක්‍රිකට් සංගම් නැති දිස්ත්‍රික්කත් තිබෙනවා. ඒක පටන් ගන්න ඕනෑ ඒ ප්‍රදේශයෙන්මයි. මේ ප්‍රශ්නයට සම්පූර්ණ විස්තර ඇතුළත් පිළිතුරක් ලබන සතියේ ලබා දෙන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Is that okay, Hon. Member?

**ගරු එස්. ශ්‍රීතරන් මහතා**
(மாண்புமிகு சி. சிறீதரன்)
(The Hon. S. Shritharan)
கௌரவ சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சர் ஹரின் பர்னாந்து அவர்கள் அண்மையில்தான் இந்த அமைச்சைப் பொறுப்பேற்றிருக்கிறார். ஆனால், 2010இற்குப் பிறகு சம்பந்தப்பட்டவர்கள் பல தடவை இதற்காக முயற்சித்திருக்கிறார்கள். கிரிக்கட் சபைத் தேர்தல்களில் வெற்றி பெறுவதற்காகத் திட்டமிட்டு கிளிநொச்சி, முல்லைத்தீவு போன்ற மாவட்டங்கள் முன்பிருந்த அமைச்சர்களால் ஓரங்கட்டப்பட்டு, ஒதுக்கப்பட்டிருக்கின்றன. இதற்கு ஓர் நியாயம் கிடைக்க வேண்டும். ஒரு வாரத்தில் கௌரவ அமைச்சர் அவர்கள் தரவிருக்கின்ற பதில் நியாயமானதாக இருக்குமென நான் எதிர்பார்க்கின்றேன்.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
Hon. Member, I completely agree with the Question raised by you. So I will definitely get the right Answer for that by next week. Also, I believe that there are two cricketers who have come from Jaffna or the Northern Province for the Under-19 World Cup We have really been looking at how to sort out this issue. Please give me one week. I will give you an Answer and a solution as well.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Thank you very much. That is fine.

දෙවැනි වටය.

## ශ්‍රී ලංකාවේ පොල් නිෂ්පාදනය: විස්තර
## இலங்கையில் தேங்காய் உற்பத்தி: விபரம்
## DECLINE IN COCONUT YIELD : SOLUTIONS

77/'18

**2. ගරු සී.බී. රත්නායක මහතා (ගරු දයාසිරි ජයසේකර මහතා වෙනුවට )**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க - மாண்புமிகு தயாசிறி ஜயசேகர சார்பாக)
(The Hon. C.B. Rathnayake on behalf of the Hon. Dayasiri Jayasekara)

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2015 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්තාගත පොල් නිෂ්පාදනය;

(ii) එකී කාලසීමාව තුළ වාර්ෂිකව අපනයනය කළ පොල් ප්‍රමාණය;

(iii) එම කාලසීමාව තුළ වාර්ෂිකව ආනයනය කළ පොල් ප්‍රමාණය;

එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නේද ?

(ආ) (i) පසුගිය කාලයේදී අයහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් පොල් ඵලදාව අඩුවීම සම්බන්ධයෙන් පිළියම් යෙදීම සඳහා රජය ගෙන ඇති පියවර කවරේද;

(ii) ගොවීන් වෙත සහනාධාර පදනම යටතේ පොහොර ලබා දී තිබේද;

(iii) එසේ නම්, ලබා දුන් පොහොර ප්‍රමාණය සහ පොහොර ලබා දුන් ගොවීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ යටතේ ආවරණය වන පොල් අක්කර ප්‍රමාණය කොපමණද;

(v) මෙතෙක්, පොහොර සහනාධාරය ලබා දී නොමැති නම්, ඒවා ලබා දෙනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2015 ஆம் ஆண்டு முதல் இன்று வரை இலங்கையில் அறிக்கையிடப்பட்டுள்ள தேங்காய் உற்பத்தி;

(ii) மேற்படி காலப்பகுதியில் வருடாந்தம் ஏற்றுமதி செய்யப்பட்ட தேங்காய் எண்ணிக்கை;

(iii) மேற்படி காலப்பகுதியில் வருடாந்தம் இறக்குமதி செய்யப்பட்ட தேங்காய் எண்ணிக்கை;

ஒவ்வொரு ஆண்டின் அடிப்படையில் வெவ்வேறாக யாது என்பதை அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) கடந்த காலத்தில் சீரற்ற காலநிலை காரணமாக தென்னை விளைச்சல் குறைவடைந்தமை தொடர்பில் தீர்வு வழங்குவதற்கு அரசாங்கம் மேற்கொண்டுள்ள நடவடிக்கை யாது என்பதையும்;

(ii) விவசாயிகளுக்கு நிவாரண உதவி அடிப்படையில் உரம் வழங்கப்பட்டுள்ளதா என்பதையும்;

(iii) ஆமெனில், வழங்கப்பட்ட உரத்தின் அளவு மற்றும் உரம் வழங்கப்பட்டுள்ள விவசாயிகளின் எண்ணிக்கை யாது என்பதையும்;

(iv) இதன் கீழ் உள்ளடங்கும் தென்னை ஏக்கர்களின் அளவு யாது என்பதையும்;

(v) இதுவரை, உர நிவாரணம் வழங்கப்படவில்லை எனின், அவை வழங்கப்படும் திகதி யாது என்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Plantation Industries:

(a) Will he state separately -

(i) the annual coconut production recorded in Sri Lanka from year 2015 to date;

(ii) the annual export volume of coconut during the aforementioned period; and

(iii) the annual import volume of coconut during the aforementioned period?

(b) Will he inform this House -

(i) the steps taken by the government to remedy the decline in the coconut yield due to unfavorable weather conditions that prevailed in the recent past;

(ii) whether the farmers were provided with fertilizer at concessionary prices;

(iii) if so, the quantity of fertilizer provided and the number of farmers that received fertilizer;

(iv) the number of acres of coconut cultivation that is covered under the above; and

(v) if fertilizer subsidy has not been granted up to now, the date on which it will be granted?

(c) If not, why?

**ගරු වඩිවේල් සුරේෂ් මහතා (වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வடிவேல் சுரேஷ்- பெருந்தோட்டக் கைத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vadivel Suresh - State Minister of Plantation Industries)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| වර්ෂය | පොල් නිෂ්පාදනය (ගෙඩි මිලියන) |
|---|---|
| 2015 | 3,056 (තුන්දහස් පනස්හය) |
| 2016 | 3,011 (තුන්දහස් එකොළහ) |
| 2017 | 2,450 (දෙදහස් හාරසිය පනහ) |
| 2018 | 2,736 (දෙදහස් හත්සිය තිස්හය) |

(ii)

| වර්ෂය | අපනයනය කළ පොල් (ගෙඩි) |
|---|---|
| 2015 | 13,204,000 (එක්කෝටි තිස්දෙලක්ෂ හාරදහස) |
| 2016 | 30,433,000 (තුන්කෝටි හාරලක්ෂ තිස්තුන්දහස) |
| 2017 | 10,232,000 (එක්කෝටි දෙලක්ෂ තිස්දෙදහස) |
| 2018 | 1,433,000 (දාහතර ලක්ෂ තිස්තුන්දහස) |

(iii) ගෙඩි පොල් ආනයනය කර නොමැත. (2018 වර්ෂයේ පමණක් අධිශීතකරණය කරන ලද පොල් මද මෙ. ටො. 2,582 (දෙදහස් පන්සිය අසූදෙක)ක් ආනයනය කර ඇත.

(ආ) (i) අයහපත් කාලගුණික තත්ත්වය යටතේ පවතින පොල් වගාව ආරක්ෂා කර ගැනීම උදෙසා පොල් වගා කිරීමේ මණ්ඩලය මඟින් ප්‍රධාන වැඩසටහන් 3ක් ක්‍රියාත්මක කරන ලදී.

පොල් වගාව අයහපත් කාලගුණික තත්ත්වවලින් ආරක්ෂා කර ගැනීමේ ක්‍රමවේද පිළිබඳව වගාකරුවන් දැනුවත් කිරීම සඳහා ව්‍යාප්ති වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

තෙතමන සහ පාංශු සංරක්ෂණ ක්‍රම අනුගමනය කරමින් පොල් ඉඩම් පුනරුත්ථාපනය කිරීම සඳහා සහනාධාර ලබා දීම. (පොල් ඉඩම්වල ලෙලි වළවල් සැකසීම, පොහොර කවය වසුන් කිරීම, කාබනික පොහොර යෙදීම යනාදී කටයුතු)

පොල් ඉඩමේ ජල සම්පාදන පද්ධති ඉදිකිරීම සඳහා සහනාධාර ලබා දීම.

(ii) 2016 සහ 2017 වසරවලදී පොල් ගස් 8 සිට ගස් 160 දක්වා ඇති පොල් ඉඩම් සහිත ගොවීන් වෙත පොල් පොහොර මිලදී ගෙන පොල් වගාවට යෙදීම සඳහා සහනාධාර ලබා දී තිබේ.

(iii) පොහොර ලබා දී නොමැත. පොහොර සඳහා මූල්‍ය සහනාධාර ලබා දී ඇත.

| වර්ෂය | පොහොර යෙදූ ගස් සංඛ්‍යාව | ගොවීන් ගණන | සහනාධාර මුදල රු.මි. |
|---|---|---|---|
| 2016 | 8,839,272 (අසූඅටලක්ෂ තිස්නවදහස් දෙසිය හැත්තෑදෙක | 82,384 (අසූදෙදහස් තුන්සිය අසූහතර) | 495.00 (හාරසිය අනූපහ) |
| 2017 | 8,571,413 (අසූපන්ලක්ෂ හැත්තෑඑක්දහ ස් හාරසිය දහතුන) | 79,852 (හැත්තෑනවද හස් අටසිය පනස්දෙක) | 480.00 (හාරසිය අසූව) |

(iv)

| වර්ෂය | අක්කර ගණන (ගණනය කරන ලද) |
|---|---|
| 2016 | 138,113 (එක්ලක්ෂ තිස්අටදහස් එකසිය දහතුන) |
| 2017 | 133,928 (එක්ලක්ෂ තිස්තුන්දහස් නවසිය විසිඅට) |

(v) මේ වන විට රජයේ පොදු පොහොර සහනාධාරය ක්‍රියාත්මක වන බැවින් නැවත පොල් වගාව සඳහා පොහොර සහනාධාරයක් ලබා දීම අවශ්‍ය නොවේ.

(ඇ) අදාළ නොවේ.

## සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය : 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන
## சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சு: 2017ஆம் ஆண்டுக்கான ஒதுக்கீடு
## MINISTRY OF HEALTH, NUTRITION AND INDIGENOUS MEDICINE : FINANCIAL ALLOCATIONS FOR 2017

204 /'18

**4. ගරු නිහාල් ගලප්පත්ති මහතා (ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා වෙනුවට)**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி - மாண்புமிகு (வைத்திய கலாநிதி) நளிந்த ஜயதிஸ்ஸ சார்பாக)
(The Hon. Nihal Galappaththi on behalf of the Hon. (Dr.) Nalinda Jayathissa)

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2017 වර්ෂයේ විසර්ජන පනත පරිපූරක ඇස්තමේන්තු හා වෙනත් අතිරේක ප්‍රතිපාදන මඟින් සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය වෙත වෙන් කළ මුදල් ප්‍රතිපාදන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) 2017 වර්ෂය තුළ එම අමාත්‍යාංශය මඟින් වියදම් කළ මුළු මුදල කොපමණද;

(iii) එය වෙන් කළමුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

(iv) ඉතිරි වූ මුදල් ප්‍රතිපාදනය කොපමණද;

(v) එය වෙන් කළමුළු ප්‍රතිපාදනවල ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2017 ஆம் ஆண்டுக்கான ஒதுக்கீட்டு சட்டத்தின் குறைநிரப்பு மதிப்பீடுகள் மற்றும் வேறு மேலதிக நிதி ஒதுக்கங்கள் மூலம் சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சுக்கு ஒதுக்கப்பட்ட நிதி ஏற்பாடுகள் வெவ்வேறாக யாவை என்பதையும்;

(ii) 2017 ஆம் ஆண்டு அந்த அமைச்சினால் செலவிடப்பட்ட மொத்தத் தொகை எவ்வளவு என்பதையும்;

(iii) இது ஒதுக்கப்பட்ட மொத்த நிதி ஏற்பாடுகளில் எத்தனை வீதமென்பதையும்;

(iv) மீதியாகவுள்ள நிதி ஏற்பாடுகள் எவ்வளவென் பதையும்;

(v) இது ஒதுக்கப்பட்ட மொத்த நிதி ஏற்பாடுகளில் எத்தனை வீதமென்பதையும்;

அவர் இச் சபையில் அறிவிப்பாரா ?

(ஆ) இன்றேல் ஏன்?

[ගරු නිහාල් ගලප්පත්ති මහතා]

asked the Minister Health, Nutrition and Indigenous Medicine:

(a) Will he inform this House-

(i) separately, the financial allocations made for the Ministry of Health, Nutrition and Indigenous Medicine pertaining to the year 2017, by way of the Budget, supplementary estimates and the other additional provisions ;

(ii) the total amount of money spent by the aforesaid Ministry in year 2017;

(iii) the percentage of the aforesaid sum as against the total allocations made;

(iv) the balance amount of financial allocations; and

(v) the percentage of the aforesaid sum as against the total allocations made?

(b) If not, why?

**ගරු ෆයිසාල් කාසිම් මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பைஸால் காசிம் - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ இராஜாங்க அமைச்சர்)
(The Hon. Faizal Cassim - State Minister of Health, Nutrition and Indigenous Medicine)

ගරු කථානායකතුමනි, සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

** සභාමේසය මත තබන ලද පිළිතුර:*
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i)

| | ඇස්තමේන්තු වෙන් කිරීම රුපියල් මිලියන | පරිපූරක ඇස්තමේන්තු රුපියල් මිලියන |
|---|---|---|
| පුනරාවර්තන ප්‍රතිපාදන | 119,450.00 | 5,177.00 |
| මූලධන ප්‍රතිපාදන | 39,598.00 | 5,996.00 |
| මුළු ප්‍රතිපාදන | 159,048.00 | 11,173.00 |

(ii) රුපියල් මිලියන 144,296 (එක්ලක්ෂ හතළිස්හතරදහස් දෙසිය අනූහය)කි.

(iii) 84.77%කි.

(iv) රුපියල් මිලියන 25,925.45 (විසිපන්දහස් නවසිය විසිපහයි දශම හතරයි පහ)කි.

(v) 15.23%කි.

(ආ) පැන නොනඟී.

## "විසල් දඹුල්ල" ජල යෝජනා ක්‍රමය: විස්තර
## "விசல் தம்புல்ல" நீர் விநியோகத்திட்டம்: விபரம்
## "VISAL DAMBULLA" PROJECT : DETAILS

239/'18

**5. ගරු චමින්ද විජේසිරි මහතා (ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය වෙනුවට)**
(மாண்புமிகு சமிந்த விஜேசிறி - மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன சார்பாக)
(The Hon. Chaminda Wijesiri on behalf of the Hon. (Mrs) Rohini Kumari Wijerathna)

නගර සැලසුම්, ජලසම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1) :

(අ) (i) "විසල් දඹුල්ල" ජල යෝජනා ක්‍රමය ආරම්භ කළ හා අවසන් කළ දින කවරේද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iii) ඒ යටතේ ලබා දී ඇති ජල සම්බන්ධතා සංඛ්‍යාව කොපමණද;

(iv) එම ජල සම්බන්ධතා ලබා දී ඇති ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව හා ඒවායේ නම් කවරේද;

(v) ජල දුෂ්කරතාවයන්ට මුහුණපාන මාතලේ දිස්ත්‍රික්කයේ සෙසු ජනතාවටද ජල සම්බන්ධතා ලබා දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේ ද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

நகரத் திட்டமிடல், நீர்வழங்கல் மற்றும் உயர்கல்வி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) "விசல் தம்புல்ல" நீர் விநியோகத்திட்டம் ஆரம்பிக்கப்பட்ட மற்றும் நிறைவுசெய்யப்பட்ட திகதிகள் யாவை;

(ii) அதற்காக செலவிடப்பட்ட பணத்தொகை எவ்வளவு;

(iii) அதன் கீழ் வழங்கப்பட்டுள்ள நீர் இணைப்புகளின் எண்ணிக்கை எவ்வளவு;

(iv) மேற்படி நீர் இணைப்புகள் வழங்கப்பட்டுள்ள கிராம அலுவலர் பிரிவுகளின் எண்ணிக்கை மற்றும் அவற்றின் பெயர்கள் யாவை;

(v) நீர் வசதியீனங்களை எதிர்நோக்குகின்ற மாத்தளை மாவட்டத்தின் ஏனைய மக்களுக்கும் நீர் இணைப்புகளை வழங்க அமைச்சு மேற்கொள்ளும் நடவடிக்கைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of City Planning, Water Supply and Higher Education:

(a) Will he inform this House-

(i) the dates on which the water project named "Visal Dambulla" was commenced and completed;

(ii) the amount of money spent for it;

(iii) the number of water connections given under the aforesaid project ;

(iv) the number of Grama Niladhari Divisions in which the aforesaid water connections have been given along with the names of those Grama Niladhari Divisions; and

(v) the steps that will be taken by the Ministry to provide water connections to the rest of the people in Matale district who are facing with difficulties in getting water?

(b) If not, why?

**ගරු ලකී ජයවර්ධන මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லக்கி ஜயவர்தன - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Lucky Jayawardana - State Minister of City Planning and Water Supply)

ගරු කථානායකතුමනි, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයටපිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) (i) ආරම්භ කළ දිනය 2012.03.06

අවසන් කළ දිනය 2018.03.31

(ii) විදේශීය හා දේශීය බැංකු ණය මුදල් සහ ශ්‍රී ලංකා රජයේ මුදල් ද ඇතුළත්ව රුපියල් මිලියන 11,216.50ක් වැය කර ඇත.

(iii) 2019.01.31 දින වන විට නව ජල සැපයුම් 3,126ක් ලබා දී ඇති අතර, දඹුල්ල, නාඋල සහ හබරණ යන ජල සම්පාදන ක්‍රමවල පැවැති පිළිවෙළින් 4,710ක්, 300ක් හා 966ක් වූ ජල සැපයුම් සංඛ්‍යාවක් සමඟ මුළු ජල සම්බන්ධතා 9,102ක් සඳහා මෙම ව්‍යාපෘතියෙන් ජලය සැපයේ.

(iv) ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව 54කි.

| දිස්ත්‍රික්කය | අංක | ග්‍රාම නිලධාරි වසම් |
|---|---|---|
| මාතලේ | 1 | යාපාගම |
| | 2 | දඹුල්ල නගරය |
| | 3 | රත්මල්ගහඇල |
| | 4 | පහළවැව |
| | 5 | අතුපාරයාය |
| | 6 | පොහොරන්වැව |
| | 7 | දඹුළුගම |
| | 8 | බුලාගල |
| | 9 | පැල්වෙහෙර |
| | 10 | ඇටවරාහේන |
| | 11 | ඉනාමළුව |
| | 12 | මොරගොල්ලෑව |
| | 13 | පුවක් අත්තාවල |
| | 14 | යක්කුරාගල දකුණ |
| | 15 | යක්කුරාගල උතුර |
| | 16 | කලෝගහ ඇල |
| | 17 | තල්කොටේ |
| | 18 | සීගිරිය |
| | 19 | මයිලන්තැව |
| | 20 | හලු හපුල්ලන වැව |
| | 21 | වැලිහේන |
| | 22 | කපුවත්ත |
| | 23 | පන්නම්පිටිය |
| | 24 | කිරලගොල්ල |
| | 25 | එගොඩවැව |
| | 26 | කිඹිස්ස |
| | 27 | ඇඹුල්අඹේ |
| | 28 | තිත්තවැල්ගොල්ල |
| | 29 | කණ්ඩලම |
| | 30 | රත්මල්කටුව |
| | 31 | පළුටාව |
| | 32 | පොල්අත්තාව |
| | 33 | අවුඩංගාව |
| | 34 | දිගම්පතහ |
| | 35 | සියඹලාවැව |
| | 36 | බොබැල්ල |
| | 37 | ලෙනදොර (උතුර) |
| | 38 | ලෙනදොර (දකුණ) |
| | 39 | ඇතාබැදිවැව |
| | 40 | සේරුදණ්ඩාපොල |
| | 41 | කීරලැස්ස |
| | 42 | හැරන්තැන්ගේ ගම |
| | 43 | මඩාටුගම |
| | 44 | දූනුමඩලාව |
| | 45 | කිතුල්හිටියාව |
| | 46 | කණ්ඩලම (බටහිර) |
| | 47 | කණ්ඩලම (නැගෙනහිර) |
| | 48 | ආනකට්ටාව |
| අනුරාධපුර | 49 | හබරණ |
| | 50 | කාශ්‍යපගම |
| | 51 | හිරිවඩුන්න / පින්සිරිගම |
| | 52 | වායා උල්පත |
| | 53 | කුඩාරඹාවැව |
| පොලොන්නරුව | 54 | මොරගස්වැව |

(v) ජල දුෂ්කරතාවයන්ට මුහුණපාන මාතලේ දිස්ත්‍රික්කයේ පොදු ජනතාවට ජල සම්බන්ධතා ලබා දීමට පහත සඳහන් පියවර ගෙන ඇත.

1. ආසියානු සංවර්ධන ආධාර යටතේ ක්‍රියාත්මක වන "පුරනැඟුම" ව්‍යාපෘතිය මඟින් දඹුල්ල සහ ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ ග්‍රාම නිලධාරි වසම් 72ක් ආවරණය කරමින් ජල සැපයුම් 10,500ක් පමණ ලබා දීමට අපේක්ෂිතය.

2. විසල් මාතලේ ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් මාතලේ, පල්ලේපොල, යටවත්ත, උකුවෙල, රත්තොට, අඹන්ගඟ සහ නාඋල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 07 තුළ ග්‍රාම නිලධාරි වසම් 255ක වෙසෙන 353,000 පමණ පිරිසකට පානීය ජලය ලබා දීමට අපේක්ෂිතය.

3. විල්ගමුව කාලීක වකුගඩු අකරණ නිවාරණ (CKDU) ව්‍යාපෘතිය මඟින් කෙටි කාලීන විසඳුමක් ලෙස විල්ගමුව විහාරගම කලාපයේ නව ජල සැපයුම් 575ක් ලබා දීමට කටයුතු කර ඇත.

[ගරු ලකී ජයවර්ධන මහතා]

4. කෙටි කාලීන විසඳුමක් ලෙස විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 39ක ලීටර් 1,000ක ධාරිතාවයකින් යුත් ජල ටැංකි 515ක් ස්ථාපිත කර, ජල බවුසර් මඟින් ජලය ලබා දීමට කටයුතු කර ඇත.

5. දේශීය බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන විල්ගමුව ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් සියලුම ග්‍රාම නිලධාරි වසම් ආවරණය වන පරිදි ජල සම්බන්ධතා 7,500ක් ලබා දීමට කටයුතු කරමින් පවතී.

6. දේශීය බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන ලග්ගල ජල සම්පාදන ව්‍යාපෘතිය මඟින් ග්‍රාම නිලධාරි වසම් 17ක් ආවරණය වන පරිදි ජල සම්බන්ධතා 5,500ක් ලබා දීමට කටයුතු කරමින් පවතී.

7. දේශීය බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන නාඋල ජල සම්පාදන ක්‍රමයේ මිලියන 90 ව්‍යාපෘතිය මඟින් ග්‍රාම සේවා වසම් 21ක් තුළ නව ජල සැපයුම් 200ක් ලබා දීමට කටයුතු කර ඇත.

8. ගලේවෙල පිබිදුනුගම ආවරණය කිරීම සඳහා ග්‍රාමීය ජල ව්‍යාපෘතියක් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇත.

9. ගලේවෙල ඉහළබම්බාව ප්‍රදේශය ආවරණය කිරීම සඳහා නව ජල සම්පාදන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා මූලික ශක්‍යතා අධ්‍යයන කටයුතු මේ වන විට සිදු කරමින් පවතී.

(ආ) අදාළ නොවේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 6 - 261/'18-(1), ආර්.එම්. ගරු පද්ම උදයශාන්ත ගුණසේකර මහතා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු කථානායකතුමනි, ගරු ආර්.එම්. පද්ම උදයශාන්ත ගුණසේකර මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, පශු සම්පත් සංවර්ධන, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නට පිළිතුර දීම සඳහා මාසයක ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 8 - 362/'18-(1), ගරු වේලු කුමාර් මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු කථානායකතුමනි, ගරු වේලු කුමාර් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரியெல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා සති තුනක කාලයක් ඉල්ල සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රශ්න අංක 11- 515/'19-(1), ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු කථානායකතුමනි, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා වෙනුවෙන් මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)
ගරු කථානායකතුමනි, නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් එම ප්‍රශ්නට පිළිතුර දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

***ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.***
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

## උඩරට සංවර්ධන අධිකාරිය: විස්තර
## மலைநாட்டு அபிவிருத்தி அதிகாரசபை: விபரம்
## UPCOUNTRY DEVELOPMENT AUTHORITY : DETAILS

526/'19

**12.ගරු චමින්ද විජේසිරි මහතා (ගරු මයන්ත දිසානායක මහතා වෙනුවට)**
(மாண்புமிகு சமிந்த விஜேசிறி - மாண்புமிகு மயந்த திசாநாயக்க சார்பாக)
(The Hon. Chaminda Wijesiri on behalf of the Hon. Mayantha Dissanayake)
අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) උඩරට ප්‍රදේශ සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව පසුගිය රජය විසින් අහෝසි කිරීම හේතුවෙන් උඩරට ප්‍රදේශයේ ජනතාවට අසාධාරණයක් සිදු වූ බව එතුමා පිළිගන්නේද?

(ආ) (i) උඩරට සංවර්ධන අධිකාරියෙන් උඩරට ප්‍රදේශයට හිමි වූ සංවර්ධන ප්‍රතිලාභ කවරේද;

(ii) එම අධිකාරියට වෙන් කළ මුදල කොපමණද;

(iii) එම අධිකාරියෙන් සිදු කළ කාර්යයන් සහ ක්‍රියාත්මක කළ ව්‍යාපෘති කවරේද;

(iv) උඩරට සංවර්ධන අධිකාරියේ සභාපතිත්වය සහ ආයතනික වගකීම් දරන ලද පුද්ගලයන් කවුරුන්ද;

(v) උඩරට සංවර්ධන අධිකාරිය මඟින් උඩරට ප්‍රදේශයේ දිළිඳු ගම්මානවල ජනතාවට ලබා දුන් රැකියා සහ රැකියා සංඛ්‍යාව කවරේද;

(vi) උඩරට සංවර්ධන අධිකාරිය මඟින් දිළිඳු ගම්මානවල ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා ආරම්භ කළ ව්‍යාපෘතිවල නම් සහ ව්‍යාපෘති සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඇ) (i) උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුව නැවත ආරම්භ කිරීමට අදහස් කරන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள், பொருளாதார அலுவல்கள், மீள்குடியேற்றம், புனர்வாழ்வளிப்பு, வடக்கு மாகாண அபிவிருத்தி, தொழிற் பயிற்சி, திறன்கள் அபிவிருத்தி மற்றும் இளைஞர் அலுவல்கள் அமைச்சருமானவரைக் கேட்ட வினா:

(அ) மலைநாட்டுப் பிரதேசங்களை அபிவிருத்தி செய்வதற்காக ஆரம்பிக்கப்பட்ட மலைநாட்டுக் கிராமிய புனர்வாழ்வளிப்புத் திணைக்களம் கடந்த அரசாங்கத்தினால் ஒழிக்கப்பட்டமை காரணமாக மலைநாட்டுப் பிரதேச மக்களுக்கு அநீதி நேர்ந்துள் ளதென்பதை அவர் ஏற்றுக்கொள்கிறாரா?

(ஆ) (i) மலைநாட்டு அபிவிருத்தி அதிகாரசபையின் மூலம் மலைநாட்டுப் பிரதேசத்திற்கு உரித்தான அபிவிருத்தி நன்மைகள் யாவை;

(ii) மேற்படி அதிகாரசபைக்கு ஒதுக்கிய பணத்தொகை எவ்வளவு;

(iii) மேற்படி அதிகாரசபையினால் மேற்கொள் ளப்பட்ட பணிகள் மற்றும் அமுலாக்கப்பட்ட கருத்திட்டங்கள் யாவை ;

(iv) மலைநாட்டு அபிவிருத்தி அதிகாரசபையின் தலைமைத்துவம் மற்றும் தாபனப் பொறுப் பினை வகிக்கின்ற ஆட்கள் யார்;

(v) மலைநாட்டு அபிவிருத்தி அதிகாரசபை மூலமாக மலைநாட்டுப் பிரதேசத்தின் வறிய கிராமங்களின் மக்களுக்கு வழங்கிய தொழில்கள் மற்றும் தொழில்களின் எண்ணிக்கை யாது;

(vi) மலைநாட்டு அபிவிருத்தி அதிகாரசபையினால் வறிய கிராமங்களைச் சேர்ந்த மக்களின் வாழ்க்கைத் தரத்தை மேம்படுத்துவதற்காக ஆரம்பிக்கப்பட்ட கருத்திட்டங்களின் எண்ணிக்கை எவ்வளவு, மற்றும் கருத்திட்டங் களின் பெயர்கள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(இ) (i) மலைநாட்டுக் கிராமிய புனர்வாழ்வளிப்புத் திணைக்களத்தை மீண்டும் ஆரம்பிக்க கருதி யுள்ளாரா;

(ii) ஆமெனில், அத்திகதி யாது;

என்பதையும் அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஈ) இன்றேல், ஏன்?

asked the Prime Minister and Minister of National Policies, Economic Affairs, Resettlement and Rehabilitation, Northern Province Development, Vocational Training and Skills Development and Youth Affairs:

(a) Will he admit the fact that an injustice has been caused to the people living in the upcountry owing to the abolition of the Upcountry Peasantry Rehabilitation Department by the previous government that was established to develop the upcountry region?

(b) Will he inform this House-

(i) the development benefits accrued to the upcountry region by the Upcountry Development Authority;

(ii) the amount of money allocated to that Authority;

(iii) the functions performed and the projects implemented by that Authority;

(iv) the people held the post of Chairman and held institutional responsibilities of the upcountry Development Authority;

(v) the jobs and the number of jobs given to the people of the poor villages in the upcountry region by the Upcountry Development Authority; and

(vi) the number and the names of projects initiated by the Upcountry Development Authority to enhance the quality of life of the people in poor villages?

(c) Will he also inform this House-

(i) whether it is intended to recommence the Upcountry Peasantry Rehabilitation Department; and

(ii) if so, the date on which it will be done?

(d) If not, why?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatileka)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම් හා පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන, වෘත්තීය පුහුණු හා නිපුණතා සංවර්ධන සහ යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර **සභාගත*** කරනවා.

**** සභාමේසය මත තබන ලද පිළිතුර:***
** சபாபீடத்தில் வைக்கப்பட்ட விடை :*
** Answer tabled:*

(අ) නැත.

(ආ) (i) ලාහුගල, මහඔය සහ පදියතලාව යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 03 ද ඇතුළත්ව මහනුවර, මාතලේ, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, බදුල්ල, මොනරාගල සහ අම්පාර දිස්ත්‍රික්කයන්ගේ බල ප්‍රදේශවල යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති, සමාජ හා ආධ්‍යාත්මික ව්‍යාපෘති ක්‍රියාවට නංවා ඇත.

(ii) 2006 වසරේ සිට 2013 වසර දක්වා රුපියල් බිලියන 1.45ක මුදලක් වෙන් කර ඇත.

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

(iii) යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති, ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති සහ සමාජ හා ආධ්‍යාත්මික ව්‍යාපෘති.

(iv) ඇමුණුම 01හි දක්වා ඇත.

(v) සෘජු රැකියා ලබාදීමක් මෙම අධිකාරියෙන් සිදුවී නොමැත. නමුත් ජීවනෝපාය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක බල ප්‍ර දේශ තුළ පවුල් 26,087ක් සවිබලගැන්වීම සඳහා ස්වයං රැකියා අවස්ථාවන් ලබාදී ඇත.

(vi) ඇමුණුම 02හි දක්වා ඇත.

(ඈ) (i) නැත.

(ii) අදාළ නොවේ.

(ඇ) පැන නොනඟී.

ඇමුණුම 01

| අනු අංකය | නම | තනතුර | කාල පරිච්ඡේදය |
|---|---|---|---|
| 01 | එස්.එම්.ආර්.බී. සමරකෝන් මහතා | සභාපති | 2006.03.01 - 2008.12.26 |
| 02 | අමරනන්ද වීරසිංහ මහතා | සභාපති | 2009.01.01 - 2014.01.02 |
| 03 | නීතිඥ ඩී .කරුණාරත්න මහතා | පත්කල සාමාජික | 2006.03.01 - 2010.06.04 |
| 04 | නීතිඥ ඩබ්.එම්. ප්‍රේමරත්න මහතා | පත්කල සාමාජික | 2006.03.01 - 2008 |
| 05 | එස්. කේ දසනායක මහතා | පත්කල සාමාජික | 2006.05.10 - 2008.12.30 |
| 06 | සුනිල් විජේවර්ධන මහතා | නිල බලයෙන් පවත්වන | 2006.04.04 - 2006.11.16 |
| 07 | ඒ.එම්.එල්.බී.පොල්ගොල්ල මහතා | නිල බලයෙන් පවත්වන | 2006.03.01 - 2006.12.01 |
| 08 | ආනන්ද වීරරත්න මහතා | නිල බලයෙන් පවත්වන | 2006.12.11 - 2007.01.30 |
| 09 | උදය රංජිත් සෙනවිරත්නමහතා | නිල බලයෙන් පවත්වන | 2007.04.10 - 2010.06.04 |
| 10 | ආර්. තර්ම කුලසිංහම් මහතා | නිල බලයෙන් පවත්වන | 2007.04.10 - 2009.12.15 |
| 11 | එස්. ඒ. නාගනන්ද මහතා | නිල බලයෙන් පවත්වන | 2007.05.25 - 2008.05.11 |
| 12 | ආර්.පී. පියදාස රත්නායක මහතා | පත්කල සාමාජික | 2008.01.09 - 2010.06.04 |
| 13 | නීතිඥ ඕවන් සී මීගස්තැන්න මහතා | පත්කල සාමාජික | 2008.02.06 - 2010.06.04 |
| 14 | ගාමිණී රාජකරුණා මහතා | පත්කල සාමාජික | 2008.02.23 - 2009.07.01 |
| 15 | එස්. ආර්. කරුණාරත්න මහතා | පත්කල සාමාජික | 2009.01.20 - 2010.06.04 |
| 16 | කේ.ජී.කේ. විමලවීර මහත්මිය | නිල බලයෙන් පවත්වන | 2010.09.15 - 2014.01.02 |
| 17 | අසංක බණ්ඩාර දොඩම්වල මහතා | පත්කල සාමාජික | 2010.08.19 - 2012.01.09 |
| 18 | අබ්දුල් රහීඩ් මොහොමඩ් මහතා | පත්කල සාමාජික | 2010.08.09 - 2014.01.02 |
| 19 | වොල්ටර් රණසිංහ මහතා | පත්කල සාමාජික | 2010.08.19 - 2014.01.02 |
| 20 | ශීතා සෙනවිරත්න මහත්මිය | නිල බලයෙන් පවත්වන | 2011.02.09 - 2011.12.02 |
| 21 | එච්.එම්.ගාමිණී සෙනවිරත්න මහතා | පත්කල සාමාජික | 2012.07.16 - 2014.01.02 |
| 22 | එච්. සනත් සේනාධීර මහතා | පත්කල සාමාජික | 2012.07.16 - 2014.01.02 |

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ සේවය කල අධ්‍යක්ෂ ජනරාල්වරු

| අනු අංකය | නම |
|---|---|
| 01 | පී.බී.වීරසේකර මහතා |
| 02 | එච්. සුමනපාල මහතා |
| 03 | ඩී.අයි.ඩී.ජේ. අබේසේකර මහතා |
| 04 | එස්.එම්.එස්.පී. සමරසේකර මහතා |
| 05 | ජී.ඩී. ආර්.කේ පෙරේරා මහතා(වැ.බ) |
| 06 | අමරනන්ද වීරසිංහ මහතා |

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ සේවය කල අධ්‍යක්ෂ (සංවර්ධන)

| අනු අංකය | නම |
|---|---|
| 01 | ඩී. අයි.ඩී. ජේ. අබේසේකර මහතා |
| 02 | ආචාර්ය ගිරාගම මහතා |
| 03 | ප්‍රේමලාල් වේරවැල්ල මහතා |

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ සේවය කල නියෝජ්‍ය අධ්‍යක්ෂවරු

| අනු අංකය | නම |
|---|---|
| 01 | ඩබ්. එම්.ටී. වනිගරත්න මහතා (සැලසුම්) |
| 02 | ජේ.එම්. ආරියරත්න මහතා (සැලසුම්) |
| 03 | ටී.එම්. ඩබ්. එන්.එස්. ඒකනායක මහතා (සැලසුම්) (වැ.බ) |
| 04 | බී.ජී.එල්..ආර්. එන්. එස්. බණ්ඩාර මහතා (සැලසුම්) (වැ.බ) |
| 05 | ආර්.එම්. එල්. ඩබ්..එල්.රත්නායක මිය (වැ.බ)( වැ.අ) මුදල් හා පාලන |
| 06 | ජී.ඩී.ආර්.කේ පේරේරා මහතා (වැ.බ) |
| 07 | ඩබ්.ජී.එස්.වික්‍රමසිංහ මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ (පාලන) |
| 08 | බී.ජී.එල්.ආර්.එන්.එස්.බණ්ඩාර මහතා නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන/ජීවනෝපාය) ස්ථිර |
| 09 | ආර්.එම්.එල්.ඩබ්.එල්. රත්නායක මිය නියෝජ්‍ය අධ්‍යක්ෂ ( පාලන සහ මුදල් ) ස්ථිර |

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ සේවය කල ඉංජිනේරුවරු

| අනු අංකය | නම |
|---|---|
| 01 | අයි.කේ බණ්ඩාර මහතා |
| 02 | එන්.රූපස්වර මහතා |
| 03 | ජගත් ධර්මප්‍රිය මහතා |

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ සේවය කල සහකාර අධ්‍යක්ෂවරු

| අනු අංකය | නම |
|---|---|
| 01 | ඩී.එස්. රත්නනායක මහතා |
| 02 | ඒ.පී. දසනායක මහතා |
| 03 | බී.ජී.එල්. ආර්. එන්. එස්. බණ්ඩාර මහතා |
| 04 | නාලක ඒකනායක මහතා |
| 05 | ජී.ඩී.ආර්.කේ.පෙරේරා මහතා |
| 06 | ඩබ්.ජී.එස්.වික්‍රමසිංහ මිය |
| | |

ශ්‍රී ලංකා උඩරට සංවර්ධන අධිකාරියේ සේවය කල ගණකාධිකාරිවරු

| අනු අංකය | නම |
|---|---|
| 01 | පී.එච්.මානවඩු මහතා |
| 02 | කපිල අවිරප්පොල මහතා |
| 03 | පී.මුතුමාල මහතා |
| 04 | ඩබ්.එම්.ටී. බණ්ඩාර මහතා |

ඇමුණුම 02

2008 වර්ෂයේ සිට ජාතික සවිය ගම නැගුම වැඩසටහන යටතේ ක්‍රියාත්මක බල ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘති වල නම් හා සංඛ්‍යාව

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ව්‍යාපෘති සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ගෙවතු වගා සංවර්ධන | 13314 |
| 2 | තේ පැල ලබා දීම | 82 |
| 3 | පොල් පැල ලබා දීම | 3470 |
| 4 | රබර් වගාව | 364 |
| 5 | බිම්මල් වගාව | 193 |
| 6 | පළතුරු වගාව | 346 |
| 7 | කිරි අල වගාව | 03 |
| 8 | සුළු අපනයන බෝග වගාව | 697 |
| 9 | එළවළු වගාව | 40 |
| 10 | පැල ලබා දීම (සාදික්කා/කෙසෙල්) | 39 |
| 11 | මී මැසි පාලන | 293 |
| 12 | විසිතුරු පත්‍ර වගාව | 160 |
| 13 | කහ/ඉඟුරු වගාව | 2467 |
| 14 | පුරන් කුඹුරු අස්වැද්දීම | 588 |
| 15 | පැරශූට් වී වගාව | 10 |
| 16 | බිත්තර වී වගාව | 05 |
| 17 | කාබනික පොහොර නිෂ්පාදන | 05 |
| 18 | ස්ප්‍රේ යන්ත්‍ර ලබා දීම | 650 |
| 19 | වගා හානි වැලැක්වීමට රිලා කූඩු ලබා දීම | 04 |
| 20 | මහන මැෂින් ලබා දීම | 238 |
| 21 | කරාබු නැටි විජලන යන්ත්‍රයක් ලබා දීම | 27 |
| 22 | කොස් විජලන යන්ත්‍රයක් ලබා දීම | 01 |
| 23 | තලකොල හස්ත කර්මාන්තය | 33 |
| 24 | අත් යන්ත්‍ර රෙදි පිළි | 04 |
| 25 | හස්ත කර්මාන්ත | 07 |
| 26 | සහල් පිටි/තුනපහ නිෂ්පාදන | 124 |
| 27 | නිමි ඇඳුම් නිෂ්පාදන | 08 |
| 28 | බෑග් නිෂ්පාදන | 40 |
| 29 | රෙදි පාපිසි නිෂ්පාදන | 20 |
| 30 | බෙහෙත් පෙති කවර නිෂ්පාදන | 101 |
| 31 | කොසු ඉදල් නිෂ්පාදන | 29 |
| 32 | හඳුන්කූරු නිෂ්පාදන | 155 |
| 33 | සබන් නිෂ්පාදන | 03 |
| 34 | ඉටිපන්දම් නිෂ්පාදන | 10 |
| 35 | වාද්‍ය භාණ්ඩ නිෂ්පාදන | 02 |
| 36 | වඩු කර්මාන්ත | 107 |
| 37 | රූපලාවන්‍යාගාර | 61 |

| | | |
|---|---|---|
| 38 | කරණවැමි උපකරණ ලබා දීම | 13 |
| 39 | ෂීට් රබර් නිෂ්පාදන. | 80 |
| 40 | පාවහන් නිෂ්පාදන | 01 |
| 41 | ඇලුමිනියම් කර්මාන්ත | 05 |
| 42 | රස කැවිලි නිෂ්පාදන | 22 |
| 43 | කිරි ආශ්‍රිත නිෂ්පාදන | 08 |
| 44 | බැදපු කඩල නිෂ්පාදන | 10 |
| 45 | ජංගම අලෙවි රථ | 10 |
| 46 | අලෙවිපොල ආවරණ කට්ටල | 56 |
| 47 | සිල්ලර වෙළදාම | 12 |
| 48 | කිරි අලෙවි මධ්‍යස්ථාන | 04 |
| 49 | මාළු අලෙවි කුටි | 04 |
| 50 | ඔසු සල් පිහිටුවීම | 05 |
| 51 | විසිතුරු මත්ස්‍ය වගාව | 10 |
| 52 | කිකිළි පැටවුන් ලබා දීම | 809 |
| 53 | එළු පාලනය | 83 |
| 54 | මී ගව පාලනය | 12 |
| 55 | කිරි භාජන ලබාදීම | 176 |
| 56 | කිරි ගව පාලනය | 54 |
| 57 | වටු කුරුළු පාලනය | 01 |
| 58 | ගවගාල් සංවර්ධනය | 288 |
| 59 | බර වාහන රියදුරු පුහුණුව | 364 |
| 60 | පරිගණක | 300 |
| 61 | මැහුම් පුහුණුව | 33 |
| 62 | ස්වයං රැකියා පුහුණුව | 24 |
| 63 | හොටෙල් පුහුණුව | 03 |
| | එකතුව | 26087 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මීළඟට, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 27.(2) යටතේ අසනු ලබන ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
What is your point of Order?

**ගරු එස්. සී. මුතුකුමාරණ මහතා**
(மாண்புமிகு எஸ்.சீ. முத்துகுமாரண)
(The Hon. S.C. Mutukumarana)
ගරු කථානායකතුමනි, අපි පාර්ලිමේන්තුවට එන්නේත් හරි අමාරුවෙන්. අපි ග්‍රාමීය ජනතාවත් එක්ක සමාජයේ නිතර ගැවසෙන පුද්ගලයෝ. ඒ නිසා ඒ ගොල්ලන්ගේ ප්‍රශ්න අපි හොඳට අවබෝධ කරගෙන ඉන්නේ. අපට ඒ ප්‍රශ්න කථා කරන්න එක තැනක් තිබුණා. ඒ තමයි, උපදේශක කාරක සභාව. මේ පාර්ලිමේන්තුවේ ඔබතුමන්ලා බලයට පත් වුණාට පස්සේ ඒක නැති කරලා, ආයෙත් ඇති කළා. නමුත්, ආයෙත් ඒක පවත්වපු දිනයක් නැහැ. ඒක තමයි මගේ පළමුවන කාරණය.

** ඇමුණුම් 01 සහ 02 පුස්තකාලයේ ද තබා ඇත.*
** இணைப்பு 01 மற்றும் 02 நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Annex 01 and 02 are also placed in the Library.*

දෙවන කාරණය වන්නේ, දැන් අපේ මන්ත්‍රීවරු දෙපළක් අතුරු ප්‍රශ්න දෙකක් ඇහුවා. ඒවා අත්‍යවශ්‍යම ප්‍රශ්න. ඒවා අපේ සමාජයේ තිබෙන ප්‍රශ්න. අපි අදාළ ඇමතිවරයාගෙන් ප්‍රශ්නයක් අහනකොට, කාලය මදි කියලා පාර්ලිමේන්තුව private bus එකක සෙනඟ load කරලා ඉක්මනට යනවා වාගේ යනවා නම්, මේ සභාවෙන් වැඩක් වෙන්නේ නැහැ. අපට ජනතාවගේ ප්‍රශ්න අහන්න තැනක් හදලා දෙන්න.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි, ගරු මන්ත්‍රීතුමා. උපදේශක කාරක සභාව ක්‍රියාත්මක කරන්න අපි දැනටමත් පියවර ගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් උපදෙස් දීලා තිබෙන්නේ. ඒ වාගේම, පක්ෂ නායකයන්ගේ රැස්වීමේදී ඔබතුමන්ලාගේ නායකයන්ගේද එකඟත්වයෙන් තීරණය කළා, ප්‍රශ්න ඇසීමේදී සමහර විට දෙපක්ෂයටම කථා කරන්න අවශ්‍ය වේලාව ලැබෙන්නේ නැති නිසා අතුරු ප්‍රශ්න ඇසීම ප්‍රශ්න දෙකකට සීමා කරන්න. පක්ෂ නායක රැස්වීමේදියි ඒ තීරණය ගත්තේ. එහෙම නැතිව ඔබතුමන්ලාට වෙනසක් කරන්න නොවෙයි. ඔබතුමාට අවස්ථාව දෙන්න බැරිවීම ගැන මම කනගාටු වෙනවා. මේ එකඟත්වය ගත්තේ පාර්ලිමේන්තුව තුළදී සියලු දෙනාගේම සහභාගිත්වයෙන්.

මීළඟට, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 27.(2) යටතේ අසනු ලබන ප්‍රශ්නය, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභානායකතුමනි, මම අසන ප්‍රශ්නයට පිළිතුර ලබා දෙන්නේ කවුද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු ඇමතිතුමා තවම නැහැ. ඒ පිළිතුර මට කියවන්න පුළුවන්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු මංගල සමරවීර ඇමතිතුමා ජනමාධ්‍ය ඇමතිවරයා විධියට කටයුතු කරපු කාලයේදී මම එතුමාගෙන් ජාතික රූපවාහිනිය ගැන අහපු ප්‍රශ්නයක් තිබෙනවා. ඒකට තවම පිළිතුරක් ලබා දුන්නේ නැහැ. ඒ වාගේම, මුදල් අමාත්‍යාංශයට අදාළ වාහන permit ගැනත් මම ප්‍රශ්නයක් ඇහුවා. ඒකට පිළිතුරක් ලබා දුන්නේත් නැහැ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු මන්ත්‍රීතුමනි, අපි අමාත්‍යවරුන්ට ඒ පිළිබඳව දන්වලා තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු ඇමතිතුමනි, මේ ප්‍රශ්න අහලා දැන් මාසයකට ආසන්නයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සභානායකතුමා ඒ කෙරෙහි අවධානය යොමු කරන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ජාතික රූපවාහිනියේ ඇතිවී තිබෙන අර්බුදය පිළිබඳව ඒ අර්බුදය තිබෙන වේලාවේදීම, සමහර අයගේ වැඩ තහනම් කරලා තිබෙන විටදීයි ඒ ප්‍රශ්නය අසා තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා කියන එකේ ඇත්තක් තිබෙනවා. අපි ඒ ගැන ගරු අමාත්‍යවරුන්ට දන්වා තිබෙනවා. අද ඔබතුමා අහන්න ඉන්න ප්‍රශ්නයට ගරු අකිල විරාජ් කාරියවසම් ඇමතිතුමා පිළිතුර එවලා තිබෙනවා. මම ඒ පිළිතුර කියවන්න ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

මම තවම ප්‍රශ්නය ඇසුවේ නැහැ නේ, ගරු ඇමතිතුමා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමා ප්‍රශ්නය ඇසුවාට පස්සේ මම පිළිතුර කියවන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ප්‍රශ්නය ඇසුවාට පස්සේ ඔබතුමා පිළිතුර කියවන්න. ඒකට කමක් නැහැ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

හොඳයි, අනුර දිසානායක මන්ත්‍රීතුමා 27.(2) යටතේ අසනු ලබන ප්‍රශ්නය ඉදිරිපත් කරන්න.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය ස්ථාපිත කිරීම ප්‍රමාදවීම
### இலங்கை ஆசிரிய ஆலோசகர் சேவையைத் தாபிப்பதிலுள்ள தாமதம்
### DELAY IN ESTABLISHMENT OF SRI LANKA TEACHER INSTRUCTORS' SERVICE

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27.(2) යටතේ මෙම ප්‍රශ්නය ඇසීමට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය ස්ථාපිත නොකිරීම හේතුවෙන් අධ්‍යාපන ක්ෂේත්‍ර යේ පැන නැඟී ඇති ගැටලුකාරී තත්ත්වය පිළිබඳව මෙම සභාවේ අවධානය යොමු කරනු කැමැත්තෙමි.

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ගුණාත්මක බව ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවයක් ස්ථාපිත කළ යුතු බව අධ්‍යාපන වෘත්තිකයන්ගේ බොහෝ කාලයක සිට ඉල්ලීමක් වී තිබුණා. 1960 දශකයේ සිට ගුරු උපදේශ තනතුර ආරම්භ වූ අතර, 1971 දක්වා ගුරු විද්‍යාලවල කථිකාචාර්යවරුන්ට පවා ගුරු උපදේශක සේවයට ඇතුළත්වීමට අවස්ථාව ලැබුණා.

1984 තෙක් අධ්‍යාපන ක්ෂේත්‍රයේ විෂය අධ්‍යක්ෂවරුන් ලෙස බඳවා ගනු ලැබුවේද ගුරු උපදේශකවරුන් වූ නමුත් පසු කාලයක එම උසස්වීම් පටිපාටිය පවා ක්‍රියාත්මක වුණේ නැහැ. එබඳු තත්ත්වයක් පැවති මෙම සේවාවේ අදාළ වැටුප් පරිමාණයක් හා උසස්වීම් පටිපාටියක් සහිතව විධිමත්ව ස්ථාපිත නොවීම නිසා ගුරු උපදේශකවරුන් ලෙස කටයුතු කළ අයට හිමි වූයේ ගුරු සේවයට අදාළ වැටුපයි. මේ තත්ත්වය තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ දක්ෂතා ඇති බොහෝ දෙනෙකුගේ දැනුම හා හැකියාව එම ක්ෂේත්‍රයට ලබා ගැනීමට නොහැකිව තිබෙනවා.

2000 වසරේ අධ්‍යාපන කොමිසමේ නිර්දේශ සහ 2007 කැබිනට් තීරණය අනුව ගුරු උපදේශක සේවය ස්ථාපිත කළ යුතු බව අවධාරණය කෙරී තිබූ නමුත්, එය ක්‍රියාවේ යෙදවීම දිගින් දිගටම ප්‍රමාද වුණා. කැබිනට් මණ්ඩලය 2007දී තීරණයක් ගන්නවා, මේ සේවය ස්ථාපිත කරන්න ඕනෑ කියලා. ඒ දැනට අවුරුදු 12කට පමණ පෙරයි. මෙම අසාධාරණයට එරෙහිව ගුරු උපදේශකවරුන් විසින් 2009දී අධිකරණයේ නඩුවක් ගොනු කළ අතර, 2013දී ලැබුණු අධිකරණ තීන්දුව මඟින්ද, 2007 කැබිනට් තීරණයට අනුව ගුරු උපදේශක සේවය ස්ථාපිත කළ යුතු බවට ප්‍රකාශ කළා. ගරු කථානායකතුමනි, ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු තීන්දුවක් පවා ලැබී තිබෙනවා, මෙම ගුරු උපදේශක සේවාවට සේවා ව්‍යවස්ථාවක් ඇති කොට ස්ථාවර සේවයක් බවට පත් කරන ලෙසට.

කෙසේ නමුත් එම තීරණයද ක්‍රියාත්මක වීම තවදුරටත් ප්‍රමාද වෙමින් පැමිණ මේ වන විට ගුරු උපදේශක සේවය පිහිටුවීමට අදාළ සියලු නෛතික තත්ත්වයන් සම්පූර්ණ වී පවතිනවා. එහෙත් එම සේවය ස්ථාපිත කිරීමට ආණ්ඩුව පාර්ශ්වයෙන් මෙතෙක් ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බවට 4,500ක් පමණ වන ගුරු උපදේශකවරුන් චෝදනා කරනවා. එසේම මෙම සේවය ස්ථාපිත කරන බවට වූ විවිධ පොරොන්දු මත තාවකාලිකව අත්හිටුවන ලද ගුරු උපදේශකවරුන්ගේ වෘත්තීය ක්‍රියාමාර්ගය පසු ගිය පෙබරවාරි 21වැනි දින සිට ඔවුන් විසින් නැවතත් ආරම්භ කර තිබෙනවා. ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය විසඳා ගැනීම වෙනුවෙන් දැන් ඔවුන් වෘත්තීය ක්‍රියාමාර්ගවලට අවතීරණ වෙලායි තිබෙන්නේ.

මේ තත්ත්වය තුළ පැන නඟින පහත ගැටලුවලට අදාළ අමාත්‍යවරයා විසින් පිළිතුරු ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වෙනවා.

(1) ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය ස්ථාපිත කිරීම මෙතෙක් ප්‍රමාද වී ඇත්තේ ඇයි? ඊට බාධා වී ඇත්තේ කුමක්ද?

(2) ගුරු උපදේශකවරුන් දැනට වෘත්තීය ක්‍රියාමාර්ගයක නියැලී සිටින බව දන්නේද? ඒ හේතුවෙන් පාසල් පද්ධතියට බරපතළ පාඩුවක් සිදුවන බව පිළිගන්නේද?

(3) ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය කඩිනමින් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද? ඒ සඳහා කවර කාල රාමුවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකිද?

බොහොම ස්තුතියි, ගරු කථානායකතුමනි.

**ගරු අකිල විරාජ් කාරියවසම් මහතා (අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அக்கில விராஜ் காரியவசம் - கல்வி அமைச்சர்)
(The Hon. Akila Viraj Kariyawasam - Minister of Education)

ගරු කථානායකතුමනි, මම මීට පෙරත් මේකට උත්තරය දෙන්න ආවා. ගරු මන්ත්‍රීතුමනි, එදා ඔබතුමා හිටියේ නැහැ. මේ ප්‍රශ්නයට පිළිතුරු දීමට පෙර කියන්න ඕනෑ, මේ ගුරු උපදේශක සේවය අතීතයේ විධිමත්ව ඇති කරපු එකකුත් නොවෙයි කියලා.

ඒ වාගේම එය ඇති කරපු අමාත්‍යවරුන්ගෙනුත් මේ සම්බන්ධයෙන් සෑහෙන කාලයක් ඉල්ලීම් කරලා තිබුණත්, එතුමන්ලා කරලා තිබුණේ නැහැ. නමුත් මා මේ ගුරු උපදේශකවරුන්ගේ ඉල්ලීම මත ඔවුන්ව සේවයේ ස්ථාපිත කරන්න අවශ්‍ය කටයුතු කළා. ඊට අමතරව වැටුප් පිළිබඳ ප්‍රශ්නයකදී තමයි මේ කටයුත්ත පොඩ්ඩක් ප්‍රමාද වුණේ.

ගරු කථානායකතුමනි, ස්ථාවර නියෝග 27(2) යටතේ ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා විසින් නඟන ලද ප්‍රශ්නයට පිළිතුරු මෙසේයි:

(1) ගුරු උපදේශක සේවය ස්ථාපනය කිරීම සඳහා ඉදිරිපත් කර ඇති අංක 2017/ED/E/N/01 හා 2017.01.11 දිනැති අමාත්‍ය මණ්ඩල සන්දේශයේ ගුරු උපදේශකවරුන් සඳහා වැටුප් ක්‍රමයක් යෝජනා කර ඇති අතර එහි පරස්පරතාවක් ඇති බව නිරීක්ෂණය වීම හේතුවෙන් ගුරු උපදේශක සේවය සඳහා වැටුපක් තීරණය කිරීම සම්බන්ධයෙන් 2018.04.19 දින රේඛීය අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම්ගේද සහභාගිත්වයෙන් යුතුව සාකච්ඡාවක් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභා ලේකම්ගේ මූලිකත්වයෙන් පවත්වන ලදී.

අනතුරුව උක්ත අමාත්‍ය මණ්ඩල සන්දේශයේ 2.4 ඡේදය (ඇමුණුම 01) අනුව ගුරු උපදේශකවරුන් සඳහා වැටුප් තීරණය කළ යුතු වන්නේ නම් GE 3-2016 වැටුප් පරිමාණය වන රුපියල් 34,615 - 680 x 3 - 1335 x 7 - 1400 x 20 = 74,000 අදාළ කරගෙන අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගැනීම සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක NSCC/05/38/SM - 5 හා 2018.06.20 දිනැති ලිපියෙන් නිර්දේශය ලබාදී ඇත.

එහෙත් ඒ සඳහා ගුරු උපදේශක සංගමය විසින් එම වැටුප් පරිමාණය සඳහා අකැමැත්ත ප්‍රකාශ කර අධ්‍යාපන ලේකම් වෙත 2018.07.12 දිනැතිව ලිපියක් ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම 02)

නමුත් 2018.08.07 දිනැතිව පාර්ලිමේන්තුවේ පැවති අධ්‍යාපනය හා මානව සම්පත් සංවර්ධනය සම්බන්ධයෙන් වන ආංශික කමිටු සාකච්ඡාවේදී ගුරු උපදේශක වෘත්තීය සංගමය, උක්ත යෝජිත වැටුප් පරිමාණය සඳහා කැමැත්ත ප්‍රකාශ කරන ලදී.

ඒ අනුව ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ ලේකම්ගේ අංක NSCC/05/38/SM - 5 හා 2018.08.24 දිනැති ලිපිය මඟින් ගුරු උපදේශක සේවය සඳහා උක්ත වැටුප් පරිමාණයම ආදේශ කර ගන්නා ලෙසට උපදෙස් ලබා දී ඇත. එම වැටුප් පරිමාණය අදාළ කරගෙන ගුරු උපදේශක සේවය ස්ථාපනය කිරීමට අමාත්‍ය මණ්ඩල සටහනක් ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. [බාධා කිරීමක්] යවලා තිබෙන්නේ. දැන් යවලා සෑහෙන කාලයක් වෙනවා.

(2) 2019.02.21 දින සිට වෘත්තීය ක්‍රියාමාර්ග ගන්නා බව 2019.02.09 දිනැති ලිපියෙන් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙත දැනුම් දී ඇත. එම ක්‍රියාමාර්ග නිසා පාසල් පද්ධතියට බලපෑමක් වී ඇති බවක් වාර්තා වී නැත.

(3) අමාත්‍ය මණ්ඩල සටහන ඉදිරිපත්කොට ඒ සඳහා ලැබෙන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ඉදිරි පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ. ඇමුණුම් සභාගත* කරමි.

ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම අපි උපදේශන සේවය ස්ථාපිත කළා. ගුරු උපදේශක සේවයට අදාළ නිලධාරින් පළමුව කිව්වා, වැටුප පිළිබඳ ප්‍රශ්නයක් නැහැයි කියලා. ඒ අනුව තමයි සේවයේ ස්ථාපිත කළේ. ඊට පස්සේ වැටුප ගැන කථා කළා. ඒකත් අපි ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමට දැනුම් දුන්නාම එතැන ඇති වුණු ප්‍රශ්නය අනුව තමයි මෙය ප්‍රමාද වුණේ. ඊට පස්සේ ඔවුන් නැවතත් එකඟවෙලා තිබෙනවා, දීලා තිබෙන වැටුප් තලයට. ඒ අනුව අපි කටයුතු කළා. ඒ ලිපි එන කල් ඉන්න ඕනෑ. ඊට පස්සේ තමයි අපි කැබිනට් පත්‍රිකාවක් යවා තිබෙන්නේ. මේ සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැහැ. මා මේ සම්බන්ධයෙන් ඒ කණ්ඩායම්වලටත් දැනුම් දුන්නා. ඇත්ත වශයෙන්ම මුලදී ආපු ක්‍රමය පිළිබඳව මා සෑහීමකට පත් වෙන්නේ නැහැ. මොකද, අවිධිමත්ව තමයි ගුරු උපදේශන සේවය ඇති කරලා තිබෙන්නේ. ඇත්තටම මුල් කාලයේ ඒක දේශපාලන මුහුණුවරකින් තමයි ඇති කළේ. නමුත් අපට අවශ්‍ය වුණා, එය විධිමත් කරන්න සහ ස්ථාපන සේවයක් විධියට කටයුතු කරන්න. දැන් ඒ ගොල්ලෝ කටයුතු කරමින් යනවා, පද්ධතියට විශාල සේවයක් කරනවා. ඒ නිසා තමයි මෙය ප්‍රමාද වුණේ. මා ඒ හැම අවස්ථාවේදීම කිව්වා. මොකද, ඒ ක්‍රියාවලිය කරන්න යම් කාලයක් ගත වුණා, ගරු කථානායකතුමනි. ඒක තමයි මේකට හේතුව. මා මේ දින වකවානු අනුව තමයි කිව්වේ. මුල ඉඳලාම අවශ්‍ය පියවර ගෙන තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

යෝජනා පිළිබඳ දැනුම් දීම. අංක 1 යෝජනාව, ගරු සභානායකතුමා.

# පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, I move,

"That the proceedings on Item No. 1 of Public Business appearing on the Order Paper be exempted at this day's Sittings from the provisions of the Standing Order 8 of the Parliament and the motions agreed by Parliament on 21.02.2019."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අංක 2 යෝජනාව, ගරු සභානායකතුමා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### 2018 නොවැම්බර් මස 14,15 සහ 16 යන දිනයන්හි සභා ගර්භය තුළ ඇති වූ නොසන්සුන් වාතාවරණය සහ ඒ අවස්ථාවන්හිදී ගරු මන්ත්‍රීවරුන්ගේ ක්‍රියා පිළිබඳව සොයාබලා වාර්තා කිරීමට ගරු කථානායකතුමා විසින් පත් කරන ලද කමිටුවේ වාර්තාව
2018 நவெம்பர் மாதம் 14, 15 மற்றும் 16ஆந் திகதிகளில் சபை மண்டபத்தில் ஏற்பட்ட அமைதியின்மைச் சூழல் மற்றும் அச்சந்தர்ப்பங்களில் கௌரவ பாராளுமன்ற உறுப்பினர்களின் நடவடிக்கைகள் பற்றி விசாரித்து அறிக்கை சமர்ப்பிப்பதற்காகக் கௌரவ சபாநாயகரால் நியமிக்கப்பட்ட குழுவின் அறிக்கை
REPORT OF THE SPECIAL COMMITTEE APPOINTED BY THE HON. SPEAKER TO LOOK INTO THE MATTERS PERTAINING TO THE INCIDENTS THAT TOOK PLACE ON THE FLOOR OF THE HOUSE ON 14th, 15th AND 16th NOVEMBER 2018 DURING THE SITTINGS OF PARLIAMENT AND THE CONDUCT OF HON. MEMBERS OF PARLIAMENT DURING SUCH TIMES

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
Hon. Speaker, I move,

"That the Report submitted to the Hon. Speaker by the Committee appointed to look into the matters pertaining to the incidents that took place on the Floor of the House on 14th, 15th and 16th November, 2018 during the Sittings of Parliament and the conduct of Members of Parliament during such time and presented to Parliament on 22.02.2019, be referred to the Committee on Ethics and Privileges under Standing Order 118 of the Parliament."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෞද්ගලික මන්ත්‍රීන්ගේ පනත් කෙටුම්පත්
## தனி உறுப்பினர் சட்டமூலங்கள்
## PRIVATE MEMBERS' BILLS

### සමාගම් (සංශෝධන) පනත් කෙටුම්පත
கம்பெனிகள் (திருத்தம்) சட்டமூலம்
COMPANIES (AMENDMENT) BILL

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)
ගරු කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2007 අංක 07 දරන සමාගම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පත ඉදිරිපත් කිරීමට අවසර දිය යුතුය."

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

*විසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

*ප්‍රශ්නය විමසන ලදින් සභා සම්මත විය.*
*පනත් කෙටුම්පත ඊට අනුකූලව පළමුවන වර කියවන ලදින්, එය මුද්‍රණය කිරීමට නියෝග කරන ලදී.*

*වාර්තා කිරීම සඳහා 52(6) වන ස්ථාවර නියෝගය යටතේ පනත් කෙටුම්පත කර්මාන්ත හා වාණිජ කටයුතු, දිගුකාලීනව අවතැන් වූ පුද්ගලයන් නැවත පදිංචි කිරීම සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා වෙත පවරන ලදී.*

*வினா விடுக்கப்பட்டு, ஏற்றுக்கொள்ளப்பட்டது.*
*இதன்படி, சட்டமூலம் முதன்முறை மதிப்பிடப்பட்டு, அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*

*சட்டமூலம் நிலைக்கட்டளை இல. 52(6) இன்படி கைத்தொழில், வாணிப அலுவல்கள், நீண்டகாலமாக இடம்பெயர்ந்த நபர்களின் மீள்குடியேற்றம் மற்றும் கூட்டுறவுத்துறை அபிவிருத்தி அமைச்சருக்கு அறிக்கை செய்யப்படுதற்காகச் சாட்டப்பட்டது.*

*Question put, and agreed to.*
*Bill accordingly read the First time, and ordered to be printed.*

*The Bill stood referred, under Standing Order No. 52(6), to the Minister of Industry and Commerce, Resettlement of Protracted Displaced Persons and Co-operative Development for report.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අද දින න්‍යාය පත්‍රයේ විෂය අංක 1, විසර්ජන පනත් කෙටුම්පත - දෙවනවර කියවීම, 06වෙනි වෙන් කළ දිනය.

## විසර්ජන පනත් කෙටුම්පත, 2019
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2019
## APPROPRIATION BILL, 2019

*කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී*

*ඊට අදාළ ප්‍රශ්නය [මාර්තු 05]*

*" පනත් කෙටුම්පත දැන් දෙ වන වර කියවිය යුතු ය" [ගරු මංගල සමරවීර මහතා]*

*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*
*சம்பந்தப்பட்ட வினா - [ மார்ச் 05]*
*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப் படுமாக" [மாண்புமிகு மங்கள சமரவீர]*
*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [05th March]*
*"That the Bill be now read a Second time".- [The Hon. Mangala Samaraweera]*
*Question again proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රවි කරුණානායක මැතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 10.22]

**ගරු රවි කරුණානායක මහතා (විදුලිබල, බලශක්ති සහ ව්‍යාපාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரவி கருணாநாயக்க - மின்வலு, எரிசக்தி மற்றும் தொழில் துறை அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Ravi Karunanayake - Minister of Power, Energy and Business Development)

ගරු කථානායකතුමනි, මෙම අය වැය සම්බන්ධයෙන් වචන ස්වල්පයක් කථා කිරීමට ඉඩ ප්‍රස්ථාව ලබා දීම සම්බන්ධයෙන් මම ඔබතුමාට මගේ ස්තුතිය ප්‍රකාශ කරනවා. ඕනෑම මුදල් අමාත්‍යවරයෙකුට සීමිත සම්පත්වලින් අසීමිත ඉල්ලීම් සපුරන්නට හැකි වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීමට සිදු වෙනවා. රටේ සීමිත සම්පත්වලින් අසීමිත ඉල්ලීම් සඳහා මුදල් වෙන් කරන්නේ කොහොමද කියලා මේ අය වැය හරහා ඉදිරිපත් කරලා තිබෙනවා. රටේ මූල්‍ය විනයක් ඇති කිරීමේ මාර්ගයක් සකස් කරමින් යන බව අපට මේ අය වැයෙන් පෙනෙනවා. 2015දී අපි භාර ගත්ත ආර්ථිකයේ තිබුණු විෂමතා මහ හැරලා, ආදායම ඇති කරන මාර්ග හරියාකාරව ඇති කරමින්, වියදම පාලනය කරගෙන කටයුතු කිරීමක් තමයි එදා ආරම්භ වුණේ. එදා ආරම්භ වුණු ඒ කටයුත්ත මූල්‍ය විනයක් ඇතිව, පාලනයක් ඇතිව අදටත් ක්‍රියාත්මක වෙනවා කියන එක අපට ලොකු සතුටක්.

2014 වර්ෂයේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 10.4ට තිබුණු රාජ්‍ය ආදායම අපට 2015දී සියයට 13.4ට වැඩි කරන්නට පුළුවන් වුණා. 2015දී සියයට 13.4ට තිබුණු එම ආදායම 2016දී සියයට 14.8කට වැඩි කරන්නට අපට පුළුවන් වුණා. ඉන් පසුව 2017දී අපට එය සියයට 15.1කට වැඩි කරන්නට පුළුවන් වෙලා තිබෙනවා. අපි නැවත සතුටු වෙනවා අපේ මුදල් ඇමතිවරයා මේ ආදායම 2019 වර්ෂයේදී සියයට 15.1කට පමණ ඇස්තමේන්තු කරලා තිබීම ගැන.

නමුත් අපේ වියදම යම් ආකාරයකින් පරිපාලනය කළේ නැත්නම් රුපියලේ අවප්‍රමාණය වීමත් සමඟ ඒක අපේ අය වැය හිඟයට බලපාන්නට ඉඩ තිබෙනවා. එය පාලනය කිරීම අත්‍යවශ්‍යයි. මෙවන් දුෂ්කර අවස්ථාවක ප්‍රාග්ධන වියදම සඳහා රුපියල් බිලියන 734ක් වෙන් කිරීම තුළින් අපේ ආණ්ඩුවේ අවශ්‍යතාව සහ මූල්‍ය විනය ඔප්පු කරලා තිබෙනවා. ප්‍රාග්ධන වියදම් තමයි හෙට දින ආදායමක් උපයන්නට පුළුවන් මාර්ගයක් ඇති කරන්නේ. පුනරාවර්තන වියදමට කොතරම් සල්ලි දැම්මත් ප්‍රාග්ධන වියදම තුළින් තමයි හෙට දවසේ ආදායමක් ලබා ගන්නට පුළුවන් අඩිතාලම වැටෙන්නේ. මේ සඳහා රුපියල් බිලියන 734ක් වෙන් කිරීම තුළින් අපට පේනවා එවැනි වැඩ කටයුත්තකට අඩිතාලම දමා තිබෙන බව. ඒ වාගේම, අපේ GDP එක ට්‍රිලියන 15.6ක්, නැත්නම් යූඑස් ඩොලර් බිලියන 86.1කට ඇස්තමේන්තු කරලා තිබෙනවා.

බිලියන 156කට අපි මේ අවස්ථාවේදී ඇස්තමේන්තු කර තිබෙනවා. මේක තමයි තිබෙන වටිනාකම. රටේ සංවර්ධනය සියයට 5කට 6කට නංවන්න අවශ්‍යතාවක් තිබෙනවා නම්, ආයෝජන ප්‍රමාණය සියයට 30ක්, 45ක් වීම අත්‍යවශ්‍යයි. ඕනෑම රටක ඉදිරි ගමන තිබෙන්නේ ආයෝජන තුළින්. දේශීය ඉතිරි කිරීම් තුළින් අපට සියයට 30ක් 35ක් ලබා ගන්නට පුළුවන් නම්, ඉතිරි සියයට දහය, පහළොව ආයෝජන තුළින් තමයි ලබා ගන්න තිබෙන්නේ. නමුත් ආයෝජන කරනකොට ඒ ආයෝජන කරන්න අවශ්‍ය වන්නේ රටේ තිබෙන ප්‍රතිපත්ති අනුවයි; රටේ අවශ්‍යතාව අනුවයි.

මේ අවස්ථාවේදී සමබරතාවකින් යුතුව අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබීම ගැන අපි ආණ්ඩුවක් වශයෙන් සතුටු විය යුතුයි. අපි ආදායම රුපියල් බිලියන 2403කට ඇස්තමේන්තු කළාට, මේ සම්බන්ධයෙන් ප්‍රායෝගිකව කටයුතු කිරීමේ අපහසුතා තිබෙන බව මට පෙනෙනවා. නිදසුනක් වශයෙන් ගත්තොත්, රථවාහන සම්බන්ධයෙන් ඇස්තමේන්තු කර තිබෙනවා බිලියන 48ක්. ඒ කියන්නේ, මිලියන 48000ක්. මෙය නැවත ඇස්තමේන්තු කරන්න අවශ්‍යයි. මොකද, මෙවැනි බදු වැඩි කිරීමක් තුළින් ලැබෙන්න පුළුවන් ආදායම ප්‍රායෝගිකව ලබාගත හැකිද නැද්ද කියන එක ගැන හිතන්න වෙනවා. රාජ්‍ය නිලධාරීන් හරියාකාරව, ඉදිරි දැක්මක් සහිතව ඉදිරිපත් කරන්න අවශ්‍ය වන්නේ මේ කරුණු තමයි. මේ විධියට අය වැය හිඟය අඩු කරන්න යෝජනා කිරීමේ ප්‍රතිවිපාකය ඉදිරියට තමයි බලපාන්නේ. මම අත්දැකීම් තුළින් තමයි ඒ ගැන අදහසක් ඉදිරිපත් කරන්න හදන්නේ. මා හිතන විධියට Budget Proposals implement කිරීම තුළින් අපේ වියදම පරිපාලනය කරලා, ආදායම වැඩි කරන්න පුළුවන් මාර්ග සකස් කිරීම තමයි අවශ්‍ය වන්නේ.

අද සුරා බදු ආදායම අඩු වෙලා තිබෙනවා. අපි ඒ අඩු වීමේ හේතුව සොයා බැලීම අවශ්‍යයි. මේ අවස්ථාවේදී මේ තුළින් ආදායම වැඩි කරන්න පුළුවන් මාර්ගයක් ලේසියෙන් ඇති කරන්න පුළුවන් නිසා ගරු මුදල් ඇමතිතුමාට මේ අදහස් යොමු කරනවා. ඒ නිසා මීට වඩා විධිමත් ක්‍රියා පිළිවෙළක් සුරාබදු සම්බන්ධයෙන් ඇති කරන්න අවශ්‍යයි. තව බිලියන 70ක්, 80 ක් පමණ සොයා ගන්න පුළුවන් මාර්ගයක් තමයි තිබෙන්නේ. ඒ ආදායම ශීඝ්‍රයෙන් අඩු වීම පුළුවන්තරම් ඉක්මනට නැවැත්වීම අවශ්‍යයි. අනිසි ලෙස ඒ ආදායම පිටතට ගලා ගෙන යන එක තමයි තිබෙන ප්‍රශ්නය.

මේ අය වැයෙන් පාරවල්වලට, අධ්‍යාපනයට, සෞඛ්‍යයට සුපුරුදු පරිදි වෙන්කරන්න තිබෙන මුදල් වෙන් කර තිබෙනවා. නමුත් ඒ වෙන් කිරීම් උද්ධමනයත් සමඟ ගළපන අවස්ථාවේ අවශ්‍ය ප්‍රමාණයට ඒ වෙන් කිරීම් සිදු වෙලා තිබෙනවාද කියන ප්‍රශ්නය පැන නඟිනවා. අපට තිබෙන ලොකුම ප්‍රශ්නය තමයි මීට පෙර ගත් ණයත්, රුපියල අවප්‍රමාණය වීමත් නිසා වූ ඒ බර ජනතාවට පැටවීම. ජනතාවට අධික බදු බර පටවන්නට බැහැ. එක පැත්තකින් එහෙම වනකොට, අපි පුළුවන් තරම් සහනාධාර දෙන්න පුළුවන් තත්ත්වයක් ඇති කිරීම අවශ්‍යයි. අද මේ දෙපැත්තම සලකා බලා ඉදිරිපත් කර තිබෙන අය වැය තමයි මේ.

මේ අය වැය ක්‍රියාත්මක කරන්න යන අවස්ථාවේදී ඇතිවන ප්‍රශ්න තමයි මම උපයෝගී කරගන්නේ කථා කරන්න. ඕනෑම ආණ්ඩුවකට තිබෙන ප්‍රබලම ප්‍රශ්න දෙක තුනක් සම්බන්ධයෙන් මා කථා කරන්න කැමැතියි. එකක් තමයි මේ රටේ තිබෙන නීතිය. අද රටේ තිබෙන ලොකුම බාධකය තමයි මේ නීතිය. අපේ රටේ නීතියක් තිබෙනවා. එහි ස්වාධීනත්වයක් ඇති කර තිබෙනවා. අපි බොහොම සතුටුයි ඒ ස්වාධීනත්වය තුළින් මේ රටට සෙතක් ලැබී තිබීම ගැන. නමුත් එදිනෙදා පරිපාලනයට ලොකු ප්‍රශ්න පැන නැඟ තිබෙනවා. රටට ණයක් ගන්න ගියාම නීතිපති දෙපාර්තමේන්තුවෙන් මාස ගණන් ගතවන ප්‍රශ්න ඇති වෙලා තිබෙනවා. අපි ආණ්ඩු පක්ෂයත් විපක්ෂයත් සියලුදෙනාම එකතු වෙලා මේ සම්බන්ධයෙන් නිවැරදි ප්‍රතිපත්තියක් ඇති කරන්න පුළුවන් නම් එයින් රටට වෙන ප්‍රතිලාභය අතිවිශිෂ්ටයි. අද වෙන්නේ මොකක්ද? අපි හිතමු, හදිසියෙන් කොරියාවෙන්, ජපානයෙන්, ඉන්දියාවෙන්, චීනයෙන් ණයක් ලබා ගන්නට අවශ්‍ය නම්, ආණ්ඩුවට ඒ ණය හදිසියේ ලබා ගන්න අවශ්‍ය වුණත්, නීති පද්ධතිය තුළින් අවශ්‍ය කරුණු විසඳිලා එනකොට අවුරුදු දෙක තුනක් ගත වෙන්න පුළුවන්. ඒකට හොඳම නිදසුන තමයි නුවර අධිවේගී මාර්ගය. එහි දෙවන කොටසේ වැඩ පටන්ගන්න අවුරුදු තුනහමාරක් ගිහින් තිබෙනවා. ඒ සම්බන්ධ නීතිමය ගැටීමක් ඇති

[ගරු රවි කරුණානායක මහතා]

වෙලා ඒ මුදල් ගන්න එක තවම පරක්කු වෙලා තිබෙනවා. ඕනෑම ආණ්ඩුවක් මෙවැනි ප්‍රශ්න විසඳන්න අවශ්‍යයි. මේ රටට ණය දෙන්න වෙනත් රටකට අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කර තිබෙනවා නම්, එයට බාධක එනවා නම්, කැබිනට් මණ්ඩලය ඒ තිබෙන ගැටලු විසඳා නිවැරදි කිරීම අත්‍යවශ්‍යයි. එහෙම නැත්නම් වෙන්නේ අනවශ්‍ය ලෙස රටේ වැඩකටයුතු බාධාවට පත්වීමයි.

ඒ වාගේම තමයි ටෙන්ඩර් ක්‍රමය. මේ රටේ තිබෙන තවත් ලොකුම ප්‍රශ්නයක් තමයි ටෙන්ඩර් ක්‍රමය. අද ටෙන්ඩර් ක්‍රමය බොහොම විධිමත් කරලා තිබෙනවා; විවෘත කරලා තිබෙනවා. ඒ විවෘත කිරීම තුළින් අද තරගකාරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. නමුත් පරාජයට පත්වෙන පුද්ගලයා කෙළින්ම යනවා, උසාවියට. උසාවියට ගිහිල්ලා ඒ කටයුතු ඇනහිටුවන්න හදනවා. ඒ තුළින් වෙන්නේ රටේ අවශ්‍යතාව ඉටු කරන්න බැරි තත්ත්වයක් ඇති වීමයි. හොඳ නිදසුනක් තමයි 2015 වර්ෂයේ අපි රේගුවට scanners හඳුන්වා දුන්නා. මම හිතන හැටියට හිටපු ජනාධිපතිතුමාගේ කාලයේ තමයි මේක ආරම්භ කරලා තිබුණේ. හිටපු ජනාධිපතිතුමාත් මෙතැන සිටිනවා. අවුරුදු තුනක් ඒ ගැන කථා කළා. අපි ආ විගසම ඒක දැම්මා. ප්‍රසම්පාදන කමිටුව තුළින් ඒ කටයුතු කළා. ඒකට හය දෙනෙක් තරග කළා; එක්කෙනෙක් දිනුවා. නමුත් දිනුවාට පස්සේ දෙවන, තුන්වන, හතරවන අය උසාවියට ගියා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Order, please!

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. SPEAKER *left the Chair, and* DEPUTY SPEAKER [THE HON. J.M. ANANDA KUMARASIRI] *took the Chair.*

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මා කථා කරන අවස්ථාවේ ඔබතුමා මූලාසනයට පැමිණීම අගය කරනවා.

ඒ scanner එක හඳුන්වාදීලා අදට අවුරුදු හතරක් වෙනවා. නමුත් තවම ඒක ක්‍රියාත්මක කරන පාටක්වත් පෙනෙන්න නැහැ. මේ තත්ත්වය තමයි තිබෙන්නේ. මේ කටයුතු සම්බන්ධව එක පැත්තකින් රේගුව අකමැත්තක් දරනවා. තව පැත්තකින් රජයේ නිලධාරින් අකමැත්තක් දරනවා. හැබැයි, නීතිපති දෙපාර්තමේන්තුවේ සිටින සියලුදෙනා මේ කාර්යයට එකතු වෙන්න අවශ්‍යයි. අපට පුළුවන් නම්, මේ තීන්දුව ගන්න එය වැදගත්. මොකද, මේ කටයුතු අඩාළ නිසා අපට බිලියන ගණනින් නැති වෙනවා. මේක තමයි උපක්‍රමශීලී වැඩ පිළිවෙළ. රටේ ජනතාව නිසි ලෙස බදු ගෙවනවා. නමුත් ඒ බදු භාණ්ඩාගාරයට එන්නේ නැතුව වෙන තැන්වලට යනවා. ඒ කියන්නේ revenue leakages. මේක තමයි තිබෙන ප්‍රශ්නය. අඩු ගණනේ තව බිලියන 200ක් විතර මෙවැනි ක්‍රමයකින් ලබා ගන්න පුළුවන් කියන එක මට අත්දැකීමෙන් කියන්න පුළුවන්. ඒ නිසා මොකක්ද ගන්න පියවර? අපි මේ ටෙන්ඩර් ක්‍රමය නිවැරදි කරනවාද? නැත්නම් මේ නීති ක්‍රමය නිවැරදි කරනවාද? එහෙමත් නැත්නම් අපි නිකම් බලාගෙන ඉන්නවාද? මේ ඔක්කෝම කාරණා නිසා අපේ රටට ලැබෙන්න තියෙන ආදායම් මාර්ග නැති වෙන දෙස අපි නිකම් බලා සිටිනවා. මම හිතන විධියට මෙන්න මේවා තමයි රටේ ශීඝ්‍ර සංවර්ධනයට තිබෙන බාධක.

තුන්වෙනි බාධකය තමයි පොලීසිය. යම් ප්‍රශ්නයක් ගැ පොලීසියට ගියාම වෙලාවට තීරණ ලැබෙන්නේ නැති ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා තමයි අද නොයෙක් නොයෙක් කල්ලි ඇතිවෙලා තියෙන්නේ. පොලීසියට යනවාට වැඩිය වෙනත් තැනකට -පාතාල ලෝකයට- ගිහිල්ලා මේ ප්‍රශ්න විසඳා ගන්න තත්ත්වයක් අද ඇති වෙලා තිබෙනවා. මම නිදසුනක් වශයෙන් තමයි මේවා කියන්නේ. අපි අය වැය ගැන කථා කරනකොට ආදායම, වියදම සහ ප්‍රතිපත්ති ගැන කථා කරනවාට වැඩිය, ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නට තිබෙන බාධක මොනවාද කියන එක ගැන කථා කිරීමයි වැදගත් වන්නේ.

ඒ ප්‍රායෝගික අත්දැකීමත් තිබෙන නිසා තමයි මම මේ අවස්ථාවේදී මේ ඉල්ලීම කරන්නේ. 2019 අය වැය ඉදිරිපත් කර තිබෙන මේ අවස්ථාවේදීවත් අපි පක්ෂ පාට පැත්තකට දමලා එකට එකතු වෙලා, අඩු ගණනේ නීතිමය ප්‍රශ්න, පොලීසිය සම්බන්ධ ප්‍රශ්න සහ ටෙන්ඩර් ක්‍රමය යනාදිය නිශ්චිත ක්‍රමවේදයකට ගෙනෙන්න ඕනෑ. එහෙම කළේ නැත්නම් අපි අනාගතයේදී එන්න නියමිත ලොකු ප්‍රශ්නයකට තමයි අඩිතාලම දමන්නේ. දැන්වත් මේ රට ඒ නිවැරදි ගමන ගෙන යන්න ඕනෑය කියන මතය තමයි අපට තිබෙන්නේ.

ඊළඟට, අපේ යටිතල පහසුකම් සම්බන්ධයෙන් තිබෙන planning බලමු. ජලය, විදුලිය, ටෙලිකොම්, sewerage system කියන මේ ඔක්කෝම කටයුතු කරගෙන යන්නේ මහ පාරේ. එක දවසක් ටෙලිකොම් එකෙන් පාර කඩන කොට, තව දවසක් විදුලිබල මණ්ඩලයෙන් පාර කඩනවා. එහෙම නැත්නම්, වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් පාර කඩනවා. අන්තිමට වෙන්නේ මොකක්ද? අපි පාරවල් කඩ කඩා ඉන්නවා මිසක් කිසිසේත්ම සැලැස්මක් අනුව කටයුතු වෙන්නේ නැහැ. මේක අවුරුදු ගණනාවක් තිස්සේ කොළඹ ප්‍රදේශයේ ප්‍රායෝගිකව දකින්න තිබෙන දෙයක්. අපි "කොළඹට කිරි - ගමට කැකිරි" කිව්වාට අද වෙලා තිබෙන්නේ ඒකේ අනික් පැත්ත. අද කොළඹ පාරවල ගන්න දෙයක් නැහැ. ඒ ඇයි? එක පැත්තකින් අපේ පාර මැදින් ජලය ගෙන යෑමට නළ දමන්න හදනවා. අනික් පැත්තෙන් විදුලිය දීමට කණු දමනවා. අපේ රවුෆ් හකීම් ඇමතිතුමා මෙතැන ඉන්නවා. මම එතුමාත් එක්ක අවුරුදු හතරක් තිස්සේ මේ ගැන කථා කරලා තිබෙනවා. වැඩියෙන්ම කථා කරලා තිබෙන්නේ මගේ ආසනය වන උතුරු කොළඹ තිබෙන රජ මාවත ගැනයි. මේ පාර අවුරුදු හතරක් තිස්සේ තවම එහෙමම තිබෙනවා. මේ අවුරුදු හතර තුළ කිලෝමීටර් හතරක දුරකට පමණයි මෙහි කටයුතු වෙලා තිබෙන්නේ. මේවා කාට කියන්නද? මේවා තමයි රටේ සංවර්ධනය සම්බන්ධයෙන් තිබෙන ඇණහිටීම්. දැන්වත් මේ දේවල්වලට යම් කිසි විධියක ක්‍රමවත් වැඩ පිළිවෙළක් සකස් කරන්නේ නැත්නම්, ප්‍රායෝගික වශයෙන් අපට මේ ගැන කටයුතු කරන්න බැරි නම්, අපි සංවර්ධනය කිය කියා ලොකු බිල්ඩින් හැදුවාට වැඩක් නැහැ. මෙතැන රවුෆ් හකීම් ඇමතිතුමාත් සිටින නිසා මම මේ දේවල් කියන්නේ. මේ සඳහා අපි සියලුදෙනාම - ඔබතුමාගේ අමාත්‍යාංශය පමණක් නොවෙයි, මගේ

අමාත්‍යාංශයත්- එකතු වන්න ඕනෑ. අද එක පාරටම කියනවා, මෙතැන පාරක් හදනවා, එහෙම නැත්නම් Port City එකට විදුලිය දෙන්න කියලා line එකක් අදිනවා කියලා. රටේ සීමිත සම්පත් අසීමිත ඉල්ලීම් සපුරන්න යොමු කිරීම නිසා තමයි, සැබෑ සංවර්ධනය වෙනුවෙන් කටයුතු කරන්න පුළුවන් අවස්ථා මඟ හිටින්නේ.

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவூப் ஹகீம் - நகரத் திட்டமிடல், நீர் வழங்கல் மற்றும் உயர் கல்வி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning, Water Supply and Higher Education)
Hon. Deputy Speaker -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rauff Hakeem, please.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Only solution for this is to go for common service corridors. That, as a policy, we must accept. Otherwise every utility will be digging up roads. So, if we have common service corridors -[*Interruption.*] Yes, before the roads are built, we must have common service corridors. This is what is happening in Singapore and other places. What we are doing is the other way around. Every utility is going and digging up the roads.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
This is the problem that exists, Hon. Deputy Speaker. The common corridors -

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Not only that. The RDA is charging heavy amounts to repair the roads. So, none of the utilities can afford the rates they are charging .

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Minister, out of the four Ministries that we spoke of, you and I constitute two of them. We will get together and ensure that there is a policy on this. These have been spoken for many years, but we see only the negative aspects of it. We are spending monies on just filling the potholes and not getting the main job done. So I think, it is a step in the right direction. These are the biggest problems that we have. Otherwise, we will be talking - even when we are in 2025 - of a pothole that remains due to lack of visionary approach by politicians who have been there. All of them are thoroughly convinced by the officials who come and say, "If you do this, the ramifications are such that you will have to pay more in the future." But, unwittingly we have spent ten times more than what was said.

මා මෙය කිව්වේ මගේ අද්දැකීමක් තුළිනුයි. කොළඹින් වැඩි ඈතට යන්න ඕනෑ නැහැ. කොළඹ මගේම ආසනයේ තිබෙන ප්‍රශ්නයක් ගැන තමයි මං අද්දැකීමෙන් කිව්වේ. අපි ප්‍රශ්නය දන්නවා. නමුත් ඒක වටේ නටනවා. ප්‍රශ්නය විසඳන්නේ නැති ප්‍රශ්නය තමයි තිබෙන්නේ. ඉතින් මා මේ අවස්ථාවේ දී කාරුණිකව ඉල්ලා සිටිනවා, මේ ප්‍රශ්නය විසඳන්න සියලු පක්ෂ එක් වෙමු කියා. මේ ප්‍රශ්නයට පාටක් නැහැ. අපේ අහිංසක අනාගත පරපුර වෙනුවෙන් මුදල් හරියාකාරව වියදම් කිරීම තමයි අවශ්‍ය වන්නේ. බොහෝ අවස්ථාවල මේ ගැන කතා කරන්නේ නැහැ. නමුත් මා හිතුවා, ඒ සඳහා මේ අවස්ථාව උපයෝගි කර ගන්න.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ගරු අමාත්‍යතුමා, මට විනාඩියක් දෙන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම තමයි වැදගත් වන්නේ. ජාතික ආණ්ඩුවෙන් බලාපොරොත්තු වුණේත් එයයි. ජාතික ප්‍රතිපත්ති සකස් කළාම ඔය ගැටලුව හුඟක් දුරට නිවැරැදි වෙනවා. ප්‍රධාන වශයෙන්ම පාරවල් හදනකොට තේ මේ තත්ත්වය ඇති වන්නේ. පාරවල් හදනකොට ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය, ජාතික ජල සම්පාදන මණ්ඩලය, ලංකා විදුලි බල මණ්ඩලයට සපයන පහසුකම් එක්කම පාර හැදුවා නම් හරි. නමුත්, ඒක තමයි නොවුණේ. ගරු අමාත්‍යතුමනි, ඔබතුමා මේ ගැන හොඳින්ම දන්නවා ඇති. ඔබතුමා මේ පිළිබඳව කතා කරලාත් තිබෙන බව මම දන්නවා. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ලංකා විදුලි බල මණ්ඩලය, මාර්ග සංවර්ධන අධිකාරිය එක්ව සැදුම්ලත් කමිටුවක් හැම මාසයේම වාගේ රැස් වෙනවා. නමුත් ප්‍රතිඵලයක් ලැබුණේ නැහැ. දැන් හෝ ජාතික ප්‍රතිපත්ති ටික හැදුවොත්, මෙය සාර්ථක කර ගන්න පුළුවන් කියා මම හිතනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඔව්, ගරු මහින්ද අමරවීර හිටපු අමාත්‍යතුමනි. මේ සම්බන්ධයෙන් අපේ ජාතික ආණ්ඩුව පැවැති අවස්ථාවේ දීත් අප ක්‍රියාත්මක වුණා. ධීවර අමාත්‍යාංශය භාරව සිටි ඔබතුමාත්, අපිත් එකතු වෙලා ස්ථිරසාර ප්‍රතිපත්තියකට අනුව කටයුතු කළා. එම ජාතික ප්‍රතිපත්තිය තුළින් ලංකා ධීවර සංස්ථාව අද ලාභ ලබන තත්ත්වයට පරිවර්තනය වී තිබෙනවා .

**ගරු මහින්ද අමරවීර මහතා**
(மாண்புமிகு மஹிந்த அமரவீர)
(The Hon. Mahinda Amaraweera)
දැන් එහි ජාතික ප්‍රතිපත්තිය හදලා ඉවරයි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක තමයි. අපි එහෙම නොකළා නොවෙයි. නමුත්, කරන්න පුළුවන් දෙයට යම් විධියකින් බාධා ඇති කරන්නේත් නිලධාරින්මයි. මේ රටේ සංවර්ධනය ඇන හිට තිබෙන්නේ ඒකයි. මේ වැඩේ එක්කෝ දේශපාලනයට භාර දෙන්න ඕනෑ; එහෙම

[ගරු රවි කරුණානායක මහතා]

නැත්නම් රජයේ නිලධාරින්ට බාර දෙන්න ඕනෑ. ලෝකයේ රටවල් ගෙන බලන්න. යුරෝපීය රටවල, ඉතාලියේ, ප්‍රංශයේ දවසින් දවස ආණ්ඩු වෙනස් වෙනවා. නමුත් ජාතික ප්‍රතිපත්ති තිබෙන නිසා එයාකාරයෙන්ම ගමන් කරන්න පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හෙට දින රජ කරන තරුණ තරුණියන් දැන් මේ පාර්ලිමේන්තුවේ ගැලරියට ඇවිත් සිටිනවා. මේ අය තීරණය කරාවි, දේශපාලනඥයන් වශයෙන් අපට ඉදිරි අනාගතය වෙනුවෙන් නායකත්වයක් දෙන්න පුළුවන් වී තිබෙනවාද, නැද්ද කියන එක. එය මතක් කර ගැනීම තමයි අවශ්‍ය වන්නේ.

මම හිතන විධියට අපේ රට ඉදිරියට ගෙනි යන්න පුළුවන් වැදගත්ම ආදායම් මාර්ගය තමයි, සංචාරක කර්මාන්තය. සංචාරක කර්මාන්තය මේ වනකොට ඉතාම අනගි තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවාය කියලා මම හිතනවා. අද වනකොට විදේශ සංචාරකයන් ලක්ෂ 23ක්, ලක්ෂ 24ක් විතර අපේ රටට එන්න බලාගෙන ඉන්නවා. මේ අවුරුද්දේ සංචාරකයන් ලක්ෂ 30ක් විතර අපේ රටට ඒවි කියලා අපිට හිතෙනවා. මේකේ අපි උපරිම මට්ටම ලබා ගන්න අවශ්‍යයි. We call it, low-hanging fruit. නමුත් අපේ රටේ සංස්කෘතිය නැති කරලා, අපිට සංචාරකයන් ගෙනෙන්න අවශ්‍යතාවක් නැහැ. නමුත් අපි සංචාරක කර්මාන්තය තුළින් උපරිම ආදායමක් ලබා ගන්න අවශ්‍යයි. සංචාරකයන් අපේ රටට එනකොට, ඒ ඔබින විධියට රටේ තිබෙන සංස්කෘතිය ප්‍රදර්ශනය කරන එක තමයි අත්‍යවශ්‍යම දේ. සංචාරකයන් ඇවිල්ලා, දවස් තුන හතරක් අපේ රටේ ඉඳලා යන එක නොවෙයි අවශ්‍ය වන්නේ. ඒගොල්ලන්ට තිබෙන ඩොලර් ටික මේ රටට වියදම් කරවීම තමයි අවශ්‍ය වන්නේ. ඒ වෙනුවෙන් අපේ රටේ සංස්කෘතිය ප්‍රදර්ශනය කිරීම, ඔවුන් ලංකාවේ හැම තැනකටම ගෙනි යන්න පුළුවන් වන විධියේ මාර්ග අපි ඇති කිරීම අවශ්‍යයි. මේවා හරි විධියට, නිසි මුදලකට විකිණීම තමයි අවශ්‍ය වන්නේ.

හැබැයි, අපේ ලංකාවේ තිබෙන සිරිතක් තමයි සංචාරකයන් අපේ රටට එන්න පටන් ගන්නකොට, ඔන්න අපි කළු කඩ ව්‍යාපාරයක් පටන් ගන්නවා. එක් ක්ෂේත්‍රයක් දියුණු වීගෙන එනකොට මේ වාගේ බාධාවන් ඇති වීම තුළින් එහි කඩා වැටීමක් සිදුවනවා. ඒ නිසා එම කටයුත්ත වෙනුවෙන් හරියාකාරව නායකත්වය දෙන්න අවශ්‍යයි. ජෝන් අමරතුංග මැතිතුමා වුවමනාවෙන් යුතුව මේ කටයුත්තට නායකත්වය ලබා දෙන ආකාරය අපිට පෙනෙනවා. මම හිතන විධියට සංචාරක කර්මාන්තය නිසි මහට ගෙන යන එක අප සියලු දෙනාම සතු කාර්ය භාරයක්.

හැබැයි, මම මේ අවස්ථාවේදී මුදල් ඇමතිතුමාට මේ කාරණයත් මතක් කරන්න අවශ්‍යයි. බදු තුළින් තමයි රටට සංචාරක කර්මාන්තයේ ප්‍රතිලාභ ලබා ගන්න පුළුවන් වන්නේ. මෙහි formal sector එකයි, informal sector එකයි කියලා දෙපැත්තක් තිබෙනවා. මීට පෙර ඒජන්තවරුන් වශයෙන් ආපු සංචාරකයන් අද සෘජුවම Booking.com තුළින් තමයි අපේ රටට එන්නේ. එදා සියයට 23ක්, 24ක් බදු ගෙවන්න තිබුණු අවස්ථාව, අද වනකොට Booking.com ක්‍රමය තුළින් book කරන නිසා පැහැර හැරෙනවා. මම හිතන විධියට මේ සඳහා පරිපාලනයක් ගෙනෙන්න අවශ්‍යයි. ලියාපදිංචි කරලා තිබෙන hotelsවලට ආවාම ඒ වෙනුවෙන් ලබා ගන්න පුළුවන් බදු ප්‍රමාණය ලබා ගත යුතුමයි. මොකද, මේ නිසා අපට අවුරුද්දකට අඩු ගණනේ ඇමෙරිකානු ඩොලර් මිලියන 15ක්, 20ක් නැති වනවාය කියන කාරණය මේ අවස්ථාවේ දී මතක් කරන්න කැමතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු අමාත්‍යතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව විනාඩි 5ක්, විනාඩි 7ක් විතර කාලයක් ලබා දෙන්න පුළුවන් නම් මම එය අගය කරනවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල, සභානායකතුමාත් මේ අවස්ථාවේ ගරු සභාවේ ඉන්නවා. ගරු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමනි, මම තව විනාඩි 5ක්, විනාඩි 7ක් විතර ගත්තාට කමක් නැද්ද?

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

එතකොට අන්තිම එක් කෙනාගේ වේලාව තමයි අඩු වෙන්නේ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

මට විනාඩි 30ක් ලබා දෙනවාය කියලා කිව්වා. නමුත් ඒ වේලාව විනාඩි 20කට අඩුවෙලා තිබෙනවා. ඒ නිසා තමයි මම විනාඩි 5ක් හෝ ඉල්ලන්නේ. ඒ නිසා මම පුළුවන් තරම් ඉක්මනට මගේ කථාව අවසන් කරන්නම්.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

It is all right. You can take five more minutes.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Thank you. මම හිතන විධියට ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් ආයතනය දියුණු කිරීමේ ලොකු අවශ්‍යතාවක් තිබෙනවා. නමුත් තවම මේ කටයුත්තට හරියාකාරව නායකත්වය ලබා දෙන්න බැරිවෙලා තිබෙනවා.

මේ වනවිට බිලියන 55ක අලාභයක් තිබෙනවා. අපි මෙය ක්ෂණිකව විසඳුවේ නැත්නම්, අපේ බදු ගෙවන්නන්ගෙන් ලැබිය යුතු මුදල් ප්‍රමාණය නොලැබීම නිසා අනවශ්‍ය පාඩුවක් ලැබීමයි සිදුවන්නේ. අපිට පෙනෙන විධියට ඉදිරි දැක්මක් නැතුව, සැලැස්මක් නැතුව යන ගමනක් තමයි අද තිබෙන්නේ. ඒ නිසා මේ සම්බන්ධයෙන් අපි ක්ෂණිකව උත්තරයක් ලබා ගැනීම අත්‍යවශ්‍යයි.

Then comes shipping trade. I think this is one of the most important aspects that are there. නැව්ගත කිරීම සම්බන්ධයෙන් ශීඝ්‍ර සංවර්ධනයක් අපේ රට තුළ ඇති වෙලා තිබෙනවා. මගේ දේශපාලන ගුරුවරයා වන ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා එදා -1978දී- පටන් ගත් ඒ සටන තුළින් අද එහි ශීඝ්‍ර සංවර්ධනයක් ඇති වෙලා තිබෙනවා. අපට පෙනෙන විධියට එදා දැමූ ඒ අඩිතාලමට, අද ඊට වඩා වෙනසක් අද ඇති කරන්න අවශ්‍යයි. ජපානය අපට මේකට හුඟාක් උදව් වෙලා තිබෙනවා. ඒ නිසා අද කන්ටේනර් මිලියන හතක් විතර අපේ කොළඹ වරාය තුළින් නැව්ගත කිරීම සිදු වෙනවා. මෙය තව මිලියන තුන-

හතරකින් වැඩි කර ගැනීමට ඉදිරි අවුරුදු දෙක-තුනේදී කටයුතු කරන්න අවශ්‍යයි. මොකද, ලංකාවට එම පහසුකම සපයන්න බැරි වුණොත්, වෙනත් වරායකට ඒ නැව් ගමන් කරන්න පුළුවන්.

විදුලිබල හා බලශක්ති ඇමති වශයෙන් මා කියන්න කැමැතියි, Colombo South Harbour Phase I සංවර්ධනය තුළින් අද මේ රටේ යටිතල පහසුකම් දියුණු කිරීම සඳහා විශාල කාර්ය භාරයක් ඉටු කරන්න තිබෙන බව. විදුලිබලය ජනනය කිරීමේ වැඩ පිළිවෙළ තමයි අපේ අමාත්‍යාංශයට තිබෙන්නේ. නමුත් අපිට පෙනෙනවා, අද ගල් අඟුරුවලින් LNGවලට ගමන් කරලා තිබෙන බව. නමුත් LNGවලින් floating terminalsවලට බාධාවක් තිබෙනවා. වරාය මුදල් උපයන අවස්ථාවේ දී අපිට නිකරුණේ ගෙනැල්ලා floating LNG terminals ඇති කරන්න බැහැ. නමුත් අපේ Colombo South Harbour Phase I එකේ ECT-SAGT expansion එක පාවිච්චි කරලා, CICT expansion එක තුළින් අපට මේ අවස්ථාව ලබා දෙන්න පුළුවන් නම්, අවුරුදු පහ-හයකින් වරාය අධිකාරියට කරන ආයෝජනය, මාස තුනකින්, හතරකින්, පහකින් කරන්න පුළුවන් අවස්ථාව තිබෙනවා.

I will just mention this in passing, Sir, so that we will be able to take cognizance of the ability to develop this. While land availability in and around the Port of Colombo is very limited, and therefore, restrictive in its ability to expand marine engineering facilities, which is much needed, expansion of the existing breakwater in Phase II of the original Colombo Port expansion will allow the construction of a custom LNG bunkering facility in a compliant and easily accessible location of the West of the port entrance, to have a quick phase extension to the existing piers that are there, where the LNG storing and the bunkering facility could be easily brought in.

Phase II was originally expected to be constructed in 2025 in terms of the SLPA's long-term development plan. The advantage of rapid expansion will serve several purposes. The first is to fulfil the future SLPA development plans and the second is to expand the deep-water berthing facility of SLPA which is fast becoming important within this region. If you want to take advantage of the development that is taking place, this is the best way to attract those shipping lines that are there. Permitting unique ports in the future, by expansion of ECT-SAGT to become potentially the world's longest back to back deep water terminal position, to the Port of Colombo, it will be the major relay port when transhipment volumes are going to decline thus positioning the Port of Colombo to become one of the first ports to globally offer LNG bunkering facility. So, I guess these are the situations that are necessary in order to get things moving.

විදුලිබල ක්ෂේත්‍රයේ දියුණුව සඳහා අපේ ආණ්ඩුව ශීඝ්‍රයෙන් කටයුතු කරගෙන යනවා. පාරිභෝගිකයා ආරක්ෂා කරගනිමින් තමයි අපි මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යන්නේ. විදුලි ඒකකයක් ජනනය කිරීම සඳහා දළ වශයෙන් අපට රුපියල් 22ක් වැය වනවා. අපි විදුලි ඒකකයක් විකුණන්නේ රුපියල් 16කටයි. ඒ නිසා අපට පාඩුයි. අපට කරන්න පුළුවන් එකම දෙය, විදුලි ඒකකයක් ජනනය කිරීමේ වියදම අඩු කර, ඒකේ වාසිය අපේ පාරිභෝගිකයන්ට ලබා දෙන එකයි. විදුලි බිල වැඩි කරන්න කිසිසේත්ම ඉඩ නොදෙන බව අපි වග කීමකින් කියනවා.

යම් පැතිවලින්, -රාජ්‍ය අංශය වෙන්න පුළුවන්- අපනයනකරුවන් සඳහා එදා යූඑස් ඩොලර් ශත දහයකට වික්ක එක අද ශත හයකට අඩු වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් අපි සංශෝධන කරනවා. නමුත්, පාරිභෝගිකයාගේ විදුලි බිල වැඩි කරන්න අපි කිසිසේත්ම ඉඩ දෙන්නේ නැහැ. විදුලිය ජනනයට අපි පුළුවන් තරම් renewable energy මාර්ග අනුගමනය කළ යුතුයි. ඒ කියන්නේ, විදුලිය නිෂ්පාදනය කිරීමට ඉන්ධන වෙනුවට සූර්ය ආලෝකය හා ජල ශක්තිය වැනි විකල්ප මාර්ග අපි යොදා ගත යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි භාණ්ඩ ආනයනය කර වෙළඳාම් කිරීමට වඩා, අප රටේම නිෂ්පාදනය කර අපනයනය කරන මට්ටමට එන්න ඕනෑ. මේ අය වැය තුළින් අපට මීටත් වඩා දිරිගැන්වීම් දෙන්නට පුළුවන් වුණා නම්, අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 20කට ආසන්න වන මේ අවස්ථාවේදී මීට වඩා ශීඝ්‍ර සංවර්ධනයක් ඇති කරන්න පුළුවන්කම තිබෙනවා. අපේ රට දූපතක්. රට වටා මුහුද තිබෙනවා; මුහුදේ මසුන් ඉන්නවා. ඒත් අපි තවම මසුන් ආනයනය කරනවා. ටින් මාළු අපි නැවත ආනයනය කරන්න පටන්ගෙන තිබෙනවා. ඒ වාගේම තමයි, අපේ කෘෂිකර්මය. අතීතයේ සිටම "අපි වවමු - රට හදමු" කියලා අපි කිව්වාට, අද වන විටත් අපි ආනයනය සඳහා බිලියන 70ක් වැය කරනවා. අපනයන සඳහා දිරිගැන්වීම් දෙමින් කෘෂිකර්ම ක්ෂේත්‍රය සංවර්ධනය කරන්න පුළුවන් නම්, අපේ විදේශ විනිමයත් ආරක්ෂා කර ගනිමින්, රටේ කෘෂිකර්මයටත් හොඳ තත්ත්වයක් ළඟා කරදීමේ හැකියාව තිබෙනවා. මේක තමයි අවශ්‍ය වන්නේ.

ඊළඟට, අපේ රටේ ශ්‍රම සම්පත දිහා බලන්න. අපේ රටේ අහිංසක තරුණ, තරුණියන් රුපියල් 25,000ක හෝ 35,000ක වැටුපකට මැද පෙරදිග ගිහින් වැඩ කරනවා. ඒ අයට ඊට වඩා හොඳ වැටුපක් දීලා එම ශ්‍රම දායකත්වය මේ රටට ලබා ගැනීම කාලෝචිතයි. ඔවුන්ට මැද පෙරදිග නොගොස් එම මුදල මේ රටේදීම උපයා ගන්න පුළුවන් නම්, ඒ අයගේ දරු දැරියන් සමඟ එකට ජීවත් වීමේ අවස්ථාව ලැබෙනවා; පවුල් ජීවිතයත් සාර්ථක වනවා. මෙවැනි සැලැස්මක් ඇතිවයි අපි කටයුතු කළ යුත්තේ. අපට සූර්ය බලය තිබෙනවා; ජල ශක්තිය තිබෙනවා. නමුත් අපි තවම විදුලිය නිෂ්පාදනය කරන්නේ, ඩීසල්වලින්. මේවා තමයි අපි වෙනස් කළ යුත්තේ. අපට තිබෙන්නේ තව කෙටි කාලයයි. නමුත්, මෙවැනි අත්‍යවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කළ යුතුයි.

මම තව එක කාරණයක් ගැන විතරයි කථා කරන්නේ. ඒ අපේ මහ බැංකුව ගැනයි. මේ රටේ හදන්න පුළුවන් ගමන තව දීර්ඝ කරන්නේ මේ මහ බැංකුවේ ඉන්නා අයයි. එදා ඉඳන් මම කිව්වේ, මේ රට ඇනහිටින්න කටයුතු කරන එක ආයතනයක් වන්නේ අපේ මහ බැංකුව කියායි. රටේ තිබෙන මූල්‍ය සම්පතට උදව් කරන්න පුළුවන් වැඩ පිළිවෙළක්ද, මහ බැංකුවේ ප්‍රතිපත්ති තුළින් මේ ඇති කර තිබෙන්නේ? මෑතකදී යූඑස් ඩොලර් බිලියන තුනක විතර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කර තිබෙනවා. එවැනි මුදල් ප්‍රමාණයක් රටට ගෙන්වා ගන්න පුළුවන් වීම පිළිබඳව අපි බෙහෙවින් සතුටු වෙනවා. නමුත් ඒ අවස්ථාවේදී අපේ ආණ්ඩුව නොමඟ යවා තිබෙනවා. අද අවුරුදු දහයට, සියයට 7.85ක පොලී අනුපාතයකට ඒවා ලබා දී තිබෙනවා. අද මැලේසියාව එය සියයට 3.87කට අරගෙන තිබෙනවා. තායිලන්තය සියයට 2.51ක පොලියකට අරගෙන තිබෙනවා. වියට්නාමය අවුරුදු දහයට සියයට 4.78ක පොලී අනුපාතයට එය ලබාගෙන තිබෙනවා. ග්‍රීසිය සියයට 3.84ක පොලියකට අරගෙන තිබෙනවා. බොට්ස්වානා කියන රට සියයට 5.27ක පොලියකට අරගෙන තිබෙනවා. මීට අවුරුදු දෙක-තුනකට කලින් මේකම අපිට සියයට 5ක අඩු පොලී ප්‍රමාණයකට ගන්න පුළුවන් වුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ඇමතිතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඉදිරියේදී අපි රට දියුණු කරන්න,- [බාධා කිරීමක්]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එතුමාට බාධා කරන්න එපා, ගරු මන්ත්‍රීතුමනි. මොකද, දැන් විනාඩි 7ක් වැඩිපුර අරගෙන තිබෙනවා.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, පැහැදිලි කර ගැනීමක්ද?

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු අමාත්‍යතුමනි, ඔබතුමා ඉතාම වැදගත් තොරතුරක් ඉදිරිපත් කළේ. ඒ කියන්නේ, අවුරුදු 10කට ඩොලර් බිලියන 1.4ක ස්වෛරීත්ව බැඳුම්කරයක් මහ බැංකුව විසින් නිකුත් කර තිබෙනවා. ඔබතුමා කියූ පරිදි, එහි පොලී අනුපාතිකය 7.85යි. හැබැයි, මේ ආසන්න රාජ්‍යයන් එය සියයට 4කට වඩා අඩු පොලියකට අරගෙන තිබෙනවා. එවැනි බැඳුම්කරයක් -ඩොලර් බිලියන 1.4ක විශාල බැඳුම්කරයක්- සියයට 7.85ක් වැනි පොලී අනුපාතයකට නිකුත් කිරීම සඳහා මහ බැංකුව කටයුතු කළේ ඇයි කියන එකට කැබිනට් අමාත්‍යවරයෙක් හැටියට ඔබතුමා කරුණු ඉදිරිපත් කරනවාද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපි ඒ සම්බන්ධයෙන් අහලා තිබෙනවා. මේ රටේ මහ බැංකුව සමහර වෙලාවට රටේ සංවර්ධනය ඇනහිටවන ආකාරයෙන් කටයුතු කරනවාය කියා මා කිව්වේ ඒ නිසායි. මේවා කිව්වාම, ඒ සම්බන්ධව කටයුතු කරන්න ඒ ගොල්ලන් හදිස්සි වෙනවා. තවමත් අවුරුදු ගණනාවක පොලී ගෙවන්න තිබෙනවා; ණය ගෙවන්න තිබෙනවා. ඒ, අපේ ආණ්ඩුව ගත්තේ නැති ණය වෙන්න පුළුවන්. කවුරු ණය ගත්තත් අපි රටක් වශයෙන් ඉදිරියට යන්න අවශ්‍යයි. ඒ පරිපාලනය දන්නවා, අවුරුදු 5ක් තුළ මේවා ලබා ගන්න ඕනෑය කියා. අන්තිම පැය වෙනතුරු ඉඳලා ඊට පස්සේ කියනවා, "සල්ලි ගෙවන්න අවස්ථා නැහැ" කියා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල එක එක දේවල් කිව්වාට, අපේ රටේ ප්‍රතිපත්ති ඉදිරියට ගෙන යන්නේ අපියි. අපි තමයි ඒ සම්බන්ධයෙන් කටයුතු කරන්න ඕනෑ. අපේ රට ඉදිරියට ගෙන යන්න ඕනෑ මාර්ග ගැන සුද්දෝ ඇවිත් අපට කියන්න ඕනෑද? මේ සඳහා අපේම ශක්තියයි තිබෙන්න ඕනෑ. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙන්න පුළුවන්; ලෝක බැංකුව වෙන්න පුළුවන්; උතුරු කොරියාව වෙන්න පුළුවන්; කවුරු මොනවා කිව්වත්, අප නිවැරදි දෙයයි කළ යුත්තේ.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
පළමුවෙන්ම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ගිවිසුම අත්සන් කළේ ඔබතුමායි, මහ බැංකු අධිපතිතුමායි ,- [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ. ඒක වැරැදියි. ඔබතුමා නොදන්නා දේවල් ගැන කථා කරන්න එපා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමා අත්සන් කළේ නැද්ද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ හිටපු ජනාධිපතිතුමා දන්නවා, මොකද වෙලා තිබෙන්නේ කියා. ඔබතුමන්ලාගේ පව් තමයි අපට ගෙවන්න වෙලා තිබෙන්නේ. [බාධා කිරීමක්] නමුත්, ඒක අපි ඉතා හොඳ මට්ටමට අඩු කරලා අවශ්‍ය කටයුතු කර තිබෙනවා. ඉතින් මේ සම්බන්ධයෙන්- [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, එතුමාට බාධා කරන්න එපා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
අපේ කාලයේ ගත්ත ණයවල පොලිය සියයට 4.8යි, සියයට 5යි. ඒ සම්බන්ධයෙන් තිබෙන වෙනස තමයි අපට මේ පෙනෙන්න තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අමාත්‍යතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මීට වඩා වෙලාව ගන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ සියලුම ප්‍රශ්න තියෙද්දී, අපේ ආණ්ඩුව අද මේ රට නිවැරැදි මාර්ගයට ගෙනැවිත් තිබෙනවා. අපට බර පටවන්නේ නැතිව තමයි ගරු මුදල් ඇමතිතුමා මේ ගැන කථා කර තිබෙන්නේ. අපට අවශ්‍ය වන්නේ, නිවැරැදි මාර්ගයක් ඔස්සේ යමින් මේ රටේ අවශ්‍යතා ඉටු කරන්න පුළුවන් වැඩ පිළිවෙළක් ඇති කිරීමයි.

අපේ රුපියල අවප්‍රමාණය වෙලා තිබෙනවා. මේ සම්බන්ධයෙන් කටයුතු කළේ කවුද?

බලන්න, ඔක්තෝබර් 26වන දා වන විට අවප්‍රමාණය වෙලා තිබුණු රුපියලේ අගය දවස් 52ක කාලය තුළ අධි ප්‍රමාණය වුණා. මොකක්ද මේ තුළින් වෙන්නේ? රටේ අස්ථාවරභාවයක් තිබෙනවා නම් රුපියල ස්ථාවර වෙන්න පුළුවන්ද? මේවා තමයි මහ බැංකුවේ තිබෙන ප්‍රශ්න.

මේවා දේශපාලනීකරණය කරන්න ගිහිල්ලා රටේ ආර්ථික ප්‍රශ්නයක් ඇති වීමයි සිදු වෙන්නේ. අපි ශක්තිමත්ව මේ ප්‍රශ්නය

විසඳනවා. අපේ අහිංසක ජනතාව මුල් කොටගෙන අද ඒ තිබෙන ප්‍රශ්නවලට විසඳුම් දීලා තිබෙනවාය කියන එක සතුටින් ප්‍රකාශ කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, විපක්ෂ නායක ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා. ඔබතුමාට විනාඩි 20ක් තිබෙනවා.

[පූ.භා.10.53]

**ගරු මහින්ද රාජපක්ෂ මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Mahinda Rajapaksa - Leader of the Opposition)
මට ටිකක් වැඩියෙන් වේලාව දෙන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019 මාර්තු 5වන දා අපේ මුදල් ඇමතිතුමා 2019 වසර සඳහා අය වැයක් ඉදිරිපත් කළා. එහිදී මුදල් ඇමතිතුමා තම කථාව පටන් ගත්තේ, "අද අප රට සහ ආර්ථිකය වැටී තිබෙන අන්ත අසරණ තත්ත්වයට වග කිව යුත්තේ දින 52 රජය" කියමිනුයි. එසේ කියමින් එතුමා උත්සාහ කළේ, 2015 ජනවාරි 08වන දා සිට 2019 මාර්තු 05 දක්වා වූ දින 1,516න් දින 1,464ක්ම අගමැති වශයෙන් කටයුතු කළ, රනිල් වික්‍රමසිංහට නොව අගමැති හැටියට දින 52ක් වගකීම දැරුවා යැයි කියන මාගේ කර පිට ඒ බේදවාචකය පටවන්නයි.

2018 ඔක්තෝබර් 26වන දා එක්සත් ජනතා නිදහස් සන්ධානය ජාතික ආණ්ඩුවෙන් ඉවත් වීමත් සමඟම, පැවති ආණ්ඩුව කඩා වැටුණා. එවිට මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා මා අගමැති ලෙස පත්කොට නව රජයක් පිහිටවපු බව අපි හැමෝම දන්නවා. අගමැති රනිල් වික්‍රමසිංහ මුළු ආර්ථිකයටම කරගෙන යන හානිය නවත්වා ගැනීමට අවශ්‍ය වීම එසේ කරන්න එක් හේතුවක් බවයි ජනාධිපතිතුමා කියා සිටියේ. නව ආණ්ඩුව පත්වී දින 14කට පසු ජනාධිපතිතුමා 2018 නොවැම්බර් 09වන දින පාර්ලිමේන්තුව විසුරුවා හැර, 2019 ජනවාරි 05වන දිනට මහ මැතිවරණයක් කැඳෙව්වා. එහෙත්, ජනාධිපතිතුමාගේ පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ එම නියෝගය 2018 නොවැම්බර් 14වන දින ශ්‍රේෂ්ඨාධිකරණය අත්හිටවූ අතර, 2018 නොවැම්බර් 15වන දින කථානායක කරු ජයසූරිය මහතා පවසා සිටියේ, රජයට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් පාර්ලිමේන්තුවේදී සම්මත වූ බවයි. ඉන්පසුව 2018 දෙසැම්බර් 03වන දින අභියාචනාධිකරණය විසින් අපගේ කැබිනට් මණ්ඩලයේ වැඩ තහනම් කරනු ලැබුවා. එයින් ඕනෑම කෙනකුට පැහැදිලි වන්නේ, 2018 ඔක්තෝබර් 26වන දින ජනාධිපති සිරිසේන මැතිතුමා පත් කළ නව ආණ්ඩුවට නෛතික බාධාවක් නැතිව කටයුතු කරන්න හැකි වූයේ, 2018 නොවැම්බර් 14වන දා තෙක් පමණක් බවයි. එනම්, දින 19ක් පමණයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒ නිසා, 2006 සිට 2014 දක්වා කාලය තුළ අප ඉතා සාර්ථකව ආර්ථිකය මෙහෙයවූ ආකාරයට, අපේ සැලසුම් ක්‍රියාත්මක කරන්නට අපට හැකි වුණේ නැහැ. එසේ වුවත්, ජනතාවගේ වාසියට සහන කීපයක්ම ලබා දෙන්නටත්, බදු කීපයක්ම අඩු කරන්නටත් අපට හැකි වුණා. විශේෂයෙන්ම තෙල් මිල සැලකිය යුතු ප්‍රමාණයකින් දෙවරක් අඩු කරන්නට හැකිවීම නිසා, දරුණු ලෙස බැට කා සිටි ජනතාවට විශාල වාසියක් ලැබුණා. පොහොර සහනාධාරය නැවත ක්‍රියාත්මක කිරීමට හැකි වූ නිසා, අන්ත අසරණ මට්ටමට වැටී සිටි අපේ ගොවීන්ට සහනයක් ලැබුණා. වගා ණය කපා හැරීම ඇතුළු තවත් සහන රාශියක් අප දියත් කරන්නට සූදානම් කර තිබුණද, කථානායක කරු ජයසූරියගේ නායකත්වයෙන් එක්සත් ජාතික පක්ෂය සහ දෙමළ ජාතික සන්ධානය පාර්ලිමේන්තුවේ ඇති කළ දේශපාලනික අවිනිශ්චිතභාවය නිසා, මේ දින 19 තුළ අපට කළ හැකි වූයේ සීමිත වැඩ කොටසක් පමණක් බව අප කියන්නට අවශ්‍යයි.

එසේ වුණත්, ආයෝජකයින්ගේ විශ්වාසය නැවත තහවුරු කරමින් මේ දින 19 තුළ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000ක පමණ ආයෝජන රටට ගෙන ඒමට විදේශ ආයෝජකයින් කීපදෙනෙකුම එකඟ කරගන්නට අපට හැකි වුවද, 2018 නොවැම්බර් 14 දින සිට මතුවූ අවිනිශ්චිතභාවය නිසා එම ආයෝජන මල්ඵල ගැන්වීම සිදු නොවුණි. ඒ අතරම, මහ බැංකුවේ වෙනසක් කරන්නට අපට අවකාශයක් උදා නොවූ නිසා, රුපියල ශක්තිමත් කිරීමේ ප්‍රයත්නයට අත තබන්නට අපට අවස්ථාවක් උදා වූයේ නැහැ. සංචිත රැකගන්නට අපට නෛතික පදනමක් තිබුණේද නැහැ. ඒ නිසා, මුදල් ඇමති කියන ආකාරයට මහ බැංකුවේ සංචිත ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000කින් ක්ෂය වී ඇත්නම්, ඔහු එම චෝදනාව යොමු කළ යුත්තේ මේ රජය විසින් පත් කරන ලද මහ බැංකු අධිපති සහ මුදල් මණ්ඩලය වෙතටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපගේ ජනතා සංවේදී රජය විසින් දියත් කරන ලද වැඩසටහන හරහා, අප රටේ ආයෝජන නැවත ගෙන්වා ගැනීමට අපට තිබූ අවස්ථාව මේ මැතිවරණ භීතිකාවක් ඇති එජාප-ටීඑන්ඒ හවුල විසින් විනාශ කරන ලදී. වසර හතරක් තිස්සේ කාබාසිනියා වී තිබූ ආර්ථිකය ගොඩනැඟීමට තිබූ අවස්ථාවක් ප්‍රමාද වුණා. සියලුම ආර්ථික කොටස්කරුවන්ගේ මානසිකත්වය කඩා වැටීම නතර කිරීමට තිබූ අවස්ථාවක්ද අහිමි වුණා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2006 සිට 2015 අපේ පාලන කාලයේදී, අවුරුදු 9ක් ඔස්සේ යුද්ධයක් සමඟම සියයට 6.4ක ආර්ථික වර්ධන වේගයක් පවත්වා ගන්නට අපට හැකි වුණා. අප රටේ මුළු ඉතිහාසයේම සනිටුහන් වූ වැඩිම ආර්ථික වර්ධන වේගය එයයි. එහිදී මතක තබා ගතයුතු කරුණ තමයි, අපි එසේ වර්ධනයක් ඇතිකර ගන්නා විට, ඒ කාලයේ ලෝකයේ රටවලට මුහුණ දෙන්නට සිදුවූ දැවැන්තම ජාත්‍යන්තර ආර්ථික අභියෝග වන, භයානකම ආහාර අර්බුදය, උග්‍රතම තෙල් අර්බුදය, දරුණුම ආර්ථික අර්බුදය, තියුණුම බැංකු අර්බුදය සහ දැවැන්තම ණය අර්බුදය යන අර්බුදවලට මුහුණ දෙන්නට අපට සිදු වුණා. ඒ විතරක් නොව අප රටේ සම්පත් රාශියක් ගිලගත් අභ්‍යන්තර යුද්ධයකටත් අපට මුහුණ දෙන්න සිදු වුණා.

එහෙත් එම අභියෝගවලින් පැනනැඟුණු අයහපත් ආර්ථික ප්‍රතිවිපාක ජනතාවට ගලා යෑමට අපි ඉඩ තැබුවේ නැහැ. මේ රජයේ නායකයින් වාගේ, අපි ජනතාව ඉදිරියේ කෙඳිරිගෑවේ නැහැ, ඇඬුවේ නැහැ.

"පසුගිය ආණ්ඩුව තමයි මෙහෙම කළේ. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව තමයි මේකට වග කියන්න ඕනෑ." කියා අපි කිව්වේ නැහැ. අපි ප්‍රශ්න විසඳුවා. රට හැදුවා. මුළු රටම එකම වැඩබිමක් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය රජය වසර හතරක් මුළුල්ලේම, සෑම වසරකම වර්ධන වේගය ක්‍රමයෙන් අඩුකර ගනිමින්, 2018දී ආර්ථිකයේ වර්ධනය සියයට 3.0ක පමණ අඩු අගයකට අඩු කරගෙන තිබෙනවා. "Global Finance" විශ්ලේෂණයට අනුව, 2014දී වර්ධනය අතින් ශ්‍රී ලංකාව සිටියේ ආසියාවේ මුල්තැන. 2017දී ශ්‍රී ලංකාව යුද්ධයක් පවතින ඇෆ්ගනිස්තානය සමඟ අන්තිම තැනට පොරබදනවා. සමහරවිට, 2018දී ශ්‍රී ලංකාව දුර්වලම ආර්ථිකය ලෙස වාර්තාවත් සනිටුහන් කරන්නට බැරි නැහැ.

[ගරු මහින්ද රාජපක්ෂ මහතා]

අද ශ්‍රී ලංකාවේ විශාලතම සමාගමේ සිට කුඩාම ව්‍යාපාරය දක්වා මේ ආර්ථික සංකෝචනයෙන් බැට කනවා. සියලුදෙනාම පාහේ අපට කියා සිටින්නේ, "අපේ බිස්නස් දැන් වැටිලා." කියායි. "අපිට අපේ භාණ්ඩ සහ සේවා විකුණාගන්නට හෝ අළෙවි කරගන්නට දැන් බැහැ"යි කියායි. ඒ අය තවදුරටත් අපට කියා සිටින්නේ, "අපි බදු ගෙවලා, පඩි ගෙවලා, රජයේ අනෙකුත් ගාස්තු ගෙවලා, පොලී ගෙවලා හමාර වුවායින් පසුව අපට ඉතිරි වෙන්න දෙයක් නැහැ." කියා. "අපේ ව්‍යාපාර තව දින කීපයකින් වහන්න වේවි." කියායි.

ඒ අතරම, තවත් අය කියා සිටින්නේ බැංකු ණයක් හෝ කල්බදු ලීස් වාරිකයන් ගෙවා ගැනීමට නොහැකි වූ නිසා, ඔවුන්ට දැනටමත් විවිධ සම්පත් අහිමි වී ඇති බවයි. ඔවුන්ගේ නම් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයේ - CRIB එකේ - වාර්තා වී ඇති නිසා, මේ වන විට කිසිදු මූල්‍ය ආයතනයකින් ණයක්වත් ලබා ගත නොහැකි බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය වසර 4 තුළදී, මේ රජය බදු දෙගුණ කළා. ඒ මදිවාට 2019 වර්ෂයේදී තවත් බදු පනවනවා. නමුත්, දළ දේශීය නිෂ්පාදිතය එතැනමයි. මේ රජය ජනතාවගෙන් බදු අය කර ගන්නවා පමණක් නොව, බදු ආදායම වැඩි කර ගත්තා කියා පම්පෝරිත් ගහනවා.

ඒ අතරම, රට ණය උගුලක පසුගිය රජය කාලයේ තිබුණා කියා අගමැතිත්, මුදල් ඇමතිත් තවමත් කියනවා. එහෙත් ඇත්ත තත්ත්වය කුමක්ද? 2006 වර්ෂය ආරම්භයේදී අපි රජය භාර ගන්නාවිට, රාජ්‍ය ණය තොගය රුපියල් බිලියන 2,222යි.

එවිට, දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ණයබරතාවය සියයට 91ක ඉහළ අගයක පැවතුණා. 2014 අග දක්වා අවුරුදු 9ක කාලය තුළදී රාජ්‍ය ණය රුපියල් බිලියන 5169 කින් වැඩි වී, රුපියල් බිලියන 7391ක් බවට පත් වුණා. එහෙත් එලෙස එකතු වූ ණය හරහා දැවැන්ත යටිතල පහසුකම් අපේ රටේ ඉදි කෙරුණ බවත්, යුද්ධයට මුදල් වැය කළ බවත් උතුරු නැඟෙනහිර නැවත ගොඩ නැගූ බවත් හැමෝම දන්නවා. ඒ අතරම, එම කාලය තුළ, රටේ දළ දේශීය නිෂ්පාදිතය ශීඝ්‍ර ලෙස වර්ධනය වූ නිසා, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව රාජ්‍ය ණයබරතාවය සියයට 71 දක්වා අඩු වුණා. එහෙත් 2018 වර්ෂයේ අග වන විට මුළු ණය ප්‍රමාණය රුපියල් ට්‍රිලියන 12 දක්වා වැඩි වී ඇති බවට ඇස්තමේන්තු කර තිබෙනවා. ඒ අතර, අය වැය කථාවේ සටහන්වලට අනුව, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව ණයබරතාවය සියයට 91 දක්වා භයානක මට්ටමකට වැඩි වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටේ පවතින පොලී අනුපාතය ක්‍රමයෙන් අඩු කර ගැනීමට පසු ගිය රජය සමත් වූ නිසා, කිසිදු අපහසුතාවයකින් තොරව රටේ ණය කළමනාකරණය කර ගැනීමට අපට හැකි වුණා. එපමණක් නොව, ණය තොගයේ කල්පිරීමේ කාලය දෙගුණ කර ගැනීමටත් අප සමත් වුණා. ඒ සමඟම 2008 සිට 2014 කාලයේදී අපි ගෙවූ පොලී අනුපාතයන් ක්‍රම ක්‍රමයෙන් සියයට 50 කින් පමණ අඩු කර ගන්නට අපට හැකි වුණා.

එහෙත් පසු ගිය වසර තුළදී ශ්‍රී ලංකාවේ ණය ගෙවීමේ හැකියාව සැලකිය යුතු ප්‍රමාණයකින් අයහපත් අතට හැරී තිබෙනවා. පොලී අනුපාතය සියයට 60කින් පමණ වැඩි කර ගෙන අද රට ණය උගුලක හිර කරගෙන ඇති බව හැමෝම දන්නවා. අගමැතිතුමා කියන්නේ, "රජයට දැන් ණය ගෙවා ගැනීමට අපහසුයි." කියායි. මහ බැංකු අධිපති කියන්නේ, "අද අප පෙරට වඩා දරුණු අවපාතයක" සිටින බවයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ රටේ රැකියා බිහි වෙනවා වෙනුවට රටේ රැකියා කරමින් සිටි අයගේ රැකියා නැති වෙමින් යනවා. 2014 අවසානයේදී සේවා නියුක්තිය වාර්තා වූයේ අසූ හතරලක්ෂ විසිහතර දාහක් ලෙසයි. එහෙත්, 2018 ජූනි වන විට රැකියාවල යෙදී ඇති සංඛ්‍යාව හැත්තෑනවලක්ෂහැත්තෑදාහක් දක්වා අඩුවෙලා තිබෙනවා. ඒ අනුව අවුරුදු තුනහමාරක් තුළදී රැකියා අවස්ථා හාරලක්ෂපනස්හතරදාහක් අප ආර්ථිකයට අහිමි වෙලා. මේ ඛේදවාචකය පිළිබඳව එක වචනයක්වත් මේ මුදල් ඇමතිතුමාට කියන්නට පුළුවන් වුණේ නැහැ.

අපනයන වැඩි වුවා යයි අගමැතිතුමා දිගින් දිගටම කියන කතාවත් පදනම් රහිතයි. අපගේ රජය කාලයේදී ආර්ථික ඔස්තාර්ලා යයි පවසා ගත් දේශපාලනඥයින් කීප දෙනෙකු පුන පුනා කියා සිටියේ, ශ්‍රී ලංකාවේ අපනයන වර්ධනය පිළිබඳව ඔවුන් සෑහීමකට පත් නොවන බවයි. ඔවුන්ගේ රජයක් හරහා අපනයන දැවැන්ත ලෙස වර්ධනය කරන බවයි. ඒ අනුව ඒ අය බලය ලබා ගත් විගසම යුරෝපා සංගමයෙන් GSP plus සහනය ලබා ගැනීම සඳහා යුරෝපා සංගමය විසින් ඉදිරිපත් කරන ලද සියලුම කොන්දේසිවලටත් එකඟ වී ඒ සහනය ලබා ගත්තා. එහෙත් ඒ කොන්දේසි අතර භයානක කොන්දේසි රාශියක්ද තිබුණා. ශ්‍රී ලංකාවට විරුද්ධව එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේ ඉදිරිපත් කරනු ලැබූ යුද අපරාධ **සම්බන්ධව ගෙනෙන ලද යෝජනාවලට** පක්ෂ වෙන්න සිදු වුණා. අතුරුදහන් වූ අය පිළිබඳ කාර්යාලයක් පිහිටුවීමට කටයුතු කරන්න සිදු වුණා. විදේශීය විනිසුරුවරුන්ගෙන් සමන්විත අධිකරණ ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීමට එකඟ වෙන්න සිදු වුණා. අත්අඩංගුවට ගෙන තිබූ දරුණු එල්ටීටීඊ සාමාජිකයන් විශාල සංඛ්‍යාවක් නිදහස් කරන්නට සිදු වුණා.

කීර්තිමත් ජ්‍යෙෂ්ඨ යුද හමුදා නායකයින් බොහෝ දෙනෙකුට විරුද්ධව නඩු පවරා ඔවුන් හිරේ දමන්නට සිදු වුණා. මේ ආකාරයෙන් එම ඔස්තාර්වරු පැතූ ආර්ථික වාසි ලබා ගන්නට රට පාවා දුන් පසුවත්, 2015 සිට 2018 දක්වා වූ වසර 4 සඳහා අපනයන සාමාන්‍ය අගය විධියට ඇමෙරිකානු ඩොලර් බිලියන 10.9ක් පමණයි වාර්තා කරගෙන තිබෙන්නේ. එනම්, 2014 දී - අප රජය කාලයේ- වාර්තා වූ අපනයන අගය වන ඇමෙරිකානු ඩොලර් බිලියන 11.1ටත් අඩු අගයක්. එයින් පෙනී යන්නේ, දේශපාලනික අතින් දැවැන්ත ලෙස රට පාවා දුන්නද, GSP Plus හරහා වසර 4ක් පුරා අපනයන වර්ධනය කර ගැනීමටවත් මේ ආර්ථික ඔස්තාර්වරුන්ට නොහැකි වූ බව නේද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2014 දී ආසියාවේ තිරසරම කොටස් වෙළෙඳ පොළ ලෙස වාර්තා වූයේ කොළඹ කොටස් වෙළෙඳ පොළයි. එහි ප්‍රාග්ධනය ඇමෙරිකානු ඩොලර් බිලියන 23.7ක් වශයෙන් වාර්තා වුණා. එහෙත් 2015 සිට කොටස් වෙළෙඳ පොළ දැවැන්ත ලෙස කඩා වැටී අද වන විට එහි ප්‍රාග්ධනය ඇමෙරිකානු ඩොලර් බිලියන 15.5ක අගයක් දක්වා අඩු වෙලා තිබෙනවා. එපමණක් නොව, දිනෙන් දිනම එම අගය තව දුරටත් පහත වැටෙනවා. එයින් පෙනී යන්නේ ආයෝජකයන්ට ශ්‍රී ලංකාව කෙරෙහි විශ්වාසයක් නොමැති බවයි. එම තත්ත්වය වෙනස් කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමක්වත් අපට පෙනෙන්නේ නැහැ. මහ බැංකුව කැඩූ මහ හොරු රටේ ආර්ථිකය හසුරුවන විට අප රටට ආයෝජකයින්ගේ විශ්වාසය දිනා ගැනීමට නොහැකි වීම පුදුමයක්ද?

අප රටේ විදේශ සංචිත ප්‍රමාණයත් දැන් භයානක ලෙස අඩු වෙලා. 2014 වසර අවසාන වන විට විදේශ සංචිතය ඇමෙරිකානු ඩොලර් බිලියන 8.2ක් දක්වා ඉහළ නැංවීමට අපට හැකි වුණා. එම සංචිත ප්‍රමාණය මාස 5ක ආනයනයන්ට සමාන අගයක්. එහෙත්

2019 ජනවාරි 31වැනි දින ශ්‍රී ලංකාව සතුව තිබූ විදේශ සංචිත ප්‍රමාණය ඇමෙරිකානු ඩොලර් බිලියන 6.1ක් පමණයි. එය මාස 3ක ආනයන හා සමාන මුදලක් පමණයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2006 සිට 2014 දක්වා ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණය වූයේ සාමාන්‍යයෙන් වසරකට සියයට 2.8කින් පමණයි. එම අවප්‍රමාණය 1977 දී ආර්ථිකය විවෘත කළායින් පසු ශ්‍රී ලංකා ඉතිහාසයේ වාර්තා වූ අඩුම අවප්‍රමාණයයි. විශේෂයෙන්ම 2013 සහ 2014 වසරවල රුපියල ඉතාමත් ස්ථාවර මට්ටමකට පත්ව තිබූ අතර, එම වසර දෙකේදී පමණක් මහ බැංකුව විදේශ සංචිතයට ඇමෙරිකානු ඩොලර් බිලියන 981ක් එකතු කර ගත්තා. එහෙත් මෙම යහපත් ප්‍රවණතාව 2015 සිට 2018 දක්වා වසර 4 තුළ සම්පූර්ණයෙන්ම උඩු යටිකුරු වුණා. රුපියලේ අගය සියයට 39කින් අවප්‍රමාණය වුණා. එම කාලය තුළදී මහ බැංකුව ඇමෙරිකානු ඩොලර් මිලියන 3,476ක දැවැන්ත විදේශ විනිමය තොගයක් වෙළෙඳ පොළට තම සංචිතයෙන් නිකුත් කර තිබෙනවා. එපමණක් නොව, පසුගිය වසර 4තුළදී රජයේ අය වැය පරතරය දිගින් දිගටම ඉහළ ගියා. 2015 දී රජයේ ගිණුම්වලට අනුව අය වැය පරතරය සියයට 7.6ක් ලෙස වාර්තා වුවද, විගණකාධිපති පැවසුවේ එම පරතරය සියයට 10.5ක් බවයි. 2016 දී ඉතිහාසයේ පළමු වරට ශ්‍රී ලංකා රජයේ ගිණුම් පිළිබඳව තමාට අදහසක්වත් පළ කරන්නට නොහැකි යැයි විගණකාධිපති විසින් දරුණු වාර්තාවක් නිකුත් කළා. 2017 දී විගණකාධිපති වාර්තා කළේ, රාජ්‍ය ණය රුපියල් බිලියන 389කින් අවතක්සේරු කොට රජය විසින් වාර්තා කර ඇතැයි කියායි. මේවායින් පෙනී යන්නේ කිසිදු මූල්‍ය විනයක් නැති බව නේද?

මේ රජය විසින් අද රාජ්‍ය සේවයද අසහනයට පත් කරලා. තෝරා ගත් සමහර ක්ෂේත්‍රවල නිලධාරින්ට පමණක් වැටුප් හා දීමනා වැඩි කරමින් මුළු රාජ්‍ය සේවය තුළම විෂමතාවක් ඇති කර තිබෙනවා. අනෙකුත් ක්ෂේත්‍රවල නිලධාරින් පසුගිය දිනක මා සහ අප විපක්ෂයේ මන්ත්‍රීවරු හමුවෙන්න පැමිණියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන් කිව්වේ, දිසාපතිවරයාට රුපියල් 55,000යි, අද බැඳෙන මහෙස්ත්‍රාත්වරයාට හෝ නීතිපති දෙපාර්තමේන්තුවේ සමහර නිලධාරින්ට රුපියල් ලක්ෂ තුනහමාරක පමණ වැටුපක් ලැබෙනවා කියායි. අවශ්‍ය වෙන්නේ වැටුප් අඩු කරන්න නොවෙයි; වැටුප් වැඩි කරන්නයි. අනිත් අයටත් ඒ තත්ත්වය ලබා දෙන්න කියන එකයි ඔවුන්ගේ ඉල්ලීම.

එම නිසා බොහෝ ක්ෂේත්‍රවල සේවය කරන නිලධාරින්ගේ මානසිකත්වයත් අද කඩා වැටිලා. මේ සියලු ප්‍රශ්නවලටත් අපගේ නව රජයක් මුහුණ දෙන්නට සූදානම් බව අප මතක් කර දෙන්නට අවශ්‍යයි. පසුගිය වකවානුවේදී, ඉතා සංවේදීව මෙවැනි ප්‍රශ්න විසඳුවා වාගේම, ඉදිරියේදීත් මේ ප්‍රශ්න විසඳන්නට අප කැප වී සිටින බවත් මා මේ අවස්ථාවේදී කියා සිටින්නට කැමැතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මහින්ද රාජපක්ෂ විපක්ෂ නායකතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක් තිබෙනවා. ඊට අමතරව ඔබතුමාට තව කාලය අවශ්‍යද?

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
( மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
අමතර කාලය අවශ්‍යයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
විනාඩි කීයක් අවශ්‍යද?

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
( மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
කථාව ඉවර වන තෙක්. තව ටිකයි තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
එම ප්‍රමාණය අඩු කරනවා, UPFA එකේ වෙලාවෙන්.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
( மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැයක් මඟින් ඉෂ්ට විය යුතු ඉලක්ක අවුරුදු නවයක් තිස්සේ මමද, මට පෙර සිටි මුදල් ඇමතිවරුන්ද, මේ රටට පෙන්වා දී තිබුණා. ඒ අනුව, අය වැයක් රටේ සංවර්ධනයට රුකුලක් විය යුතුයි; රට යන දිශාව පෙන්වා දිය යුතුයි; ජනතාවට බලාපොරොත්තු දෙන්නට හැකි විය යුතුයි. එහෙත්, ඒ කිසිවක් මේ අය වැයෙන් නම් පෙන්වන්නේ නැහැ. එපමණක් නොව, මේ අය වැයෙන් අපේ රටේ දැවෙන ප්‍රශ්න එකකටවත් උත්තර නැහැ. අද අපේ රටේ ආර්ථිකය සංකෝචනය වෙනවා; රුපියල අවප්‍රමාණය වෙනවා; රැකියා නැති වෙනවා; ව්‍යාපාර කඩා වැටෙනවා; පොලී අනුපාතය වැඩි වෙනවා; මූල්‍ය ආයතන කඩා වැටෙනවා; ආයෝජකයින් රටෙන් පලා යනවා; දූෂණය වැඩි වෙනවා. එහෙත් ඒ එක ප්‍රශ්නයකටවත් මුදල් ඇමතිතුමා උත්තර දුන්නාද? මේ අය වැයේ කෘෂිකර්මය දියුණු කිරීමට එක වැඩසටහනක්වත් ඉදිරිපත් කර තිබෙනවාද? ඒ වුණාට, කියන්නේ නම්, අද රට පාලනය වෙන්නේ හත්වැනි පරාක්‍රමබාහුගෙන් කියලායි.

ඒකත් වැරදියි. පරාක්‍රමබාහුලා අටක් හිටියා. මෙතුමා නවවැනියා වෙන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, මේ භයානක තත්ත්වයෙන් මිදෙන්නට, මේ රජයට කිසිම සැලැස්මක් නැහැ. මේ අය වැයෙන් මේ දැවැන්ත ප්‍රශ්නවලට පිළිතුරු හොයනවා වෙනුවට, මුදල් ඇමති කරන්නේ, ඉදිකිරීම් ඇමති හැදුවයි කියපු සිහින මාලිගාවලට වැසිකිළි හදන්න මුදල් වෙන් කිරීම විතරයි.

එතැනදීත් වැරදි ගණන් කිව්වේ. හම්බන්තොට මුළු ලැයිස්තුවම මම බැලුවා. ලුණුගම්වෙහෙරේ තමයි ටිකක් වැඩියෙන් තිබෙන්නේ. බලනකොට පන්දහස් ගණනයි තිබෙන්නේ.

අපගේ කාලයේ රජය දැවැන්ත ව්‍යාපෘති ක්‍රියාත්මක කළා. අධිවේගී මාර්ග, විදුලි බලාගාර, වරායන්, ගුවන් තොටුපලවල්, රට පුරා මාර්ග පද්ධති, සෑම ගමකටම සංවර්ධන ව්‍යාපෘති, නගර අලංකරණය, වාරිමාර්ග යනාදිය අපි කළා. කාපට් පාරක් නැති, කොන්ක්‍රීට් පාරක් නැති ගමක් සොයා ගන්න බැහැ. ඔබතුමා දන්නවා, විශේෂයෙන් ඔබතුමාගේ ගමේ.

මුළු රටටම විදුලිය ලබා දුන්නා, දුප්පත්කම සැලකිය යුතු මට්ටමකට අඩු කළා, රැකියා අවස්ථා ශීඝ්‍ර ලෙස වැඩි කළා. සියලුම ජන කොටස්වල ආදායම් වැඩි වූ නිසා, ඔවුන්ගේ සම්පත් වැඩි වනවාත් සමඟම ඔවුන්ට අවශ්‍ය ආකාරයට නිවෙස් ලක්ෂ ගණන්

[ගරු මහින්ද රාජපක්ෂ මහතා]

හදා ගන්න පුළුවන් වුණා. අද, මේ රජය අපි හදපු සම්පත් විකුණා, ඒ මුදල්වලින් තැන් තැන්වල වැසිකිළි හදන්න බලාපොරොත්තු වෙනවා. ඒවා හෝදන්නයි, නඩත්තු කරන්නයි තමයි පෞද්ගලික අංශයෙන් ඔවුන් අද බලාපොරොත්තු වන දායකත්වය. ඒක බොහොම පැහැදිලිව කිව්වා.

ගරු කථානායකතුමනි, මගේ කථාව අවසන් කිරීමට පෙර, එක්සත් ජාතික පක්ෂ ආර්ථික ඔස්තාර්ලාගේ හපන්කම් ගැන විස්තරයක් කරන්නට, කරුණාකර මට ඉඩ දෙන්න. ලැයිස්තුව දිග නිසා, කරුණාකර ටිකක් ඉවසීමෙන් අසා සිටින්න. මෙන්න ඒ අයගේ හපන්කම්:

(01) බැඳුම්කර මගඩියට මුල් වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රමය නීති විරෝධිව වෙනස් කරන්නට මහ බැංකුවේ අධිපතිට නියෝග කරමින්, රටේ සිදුවූ විශාලතම මගඩියට නායකත්වය ලබා දෙමින්, රටට සහ ආර්ථිකයට රුපියල් බිලියන 1,000ක පාඩුවක් සිදු කිරීම.

(02) 2001දී සෘණ ආර්ථිකයක් වාර්තා කළ පසු, ශ්‍රී ලංකාවේ වාර්තා කළ අඩුම වර්ධන වේගය වන සියයට තුනේ වර්ධනය 2018දී වාර්තා කිරීම.

(03.) 2014දී ආසියාවේ ඉහළතම වර්ධන වේගය වාර්තා කළ ශ්‍රී ලංකාව, 2017 වන විට ඇෆ්ඝනිස්ථානය සමඟ අවසන් ස්ථානයට ලොකු සටනක් දීමට සමත් වීම. One before the last වෙන්න ලොකු සටනක්.

(04) "මැදි ආදායම්" රටක් වශයෙන් සැලකෙමින් සිටි ශ්‍රී ලංකාව, ඇස්තමේන්තු අනුව 2018දී ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 85කින් පමණ අඩු කර ගනිමින්, එනම් ඇමෙරිකානු ඩොලර් 3,980ක් දක්වා අඩු කර ගනිමින් නැවත "අඩු ආදායම් රටක්" බවට පත් කර ගැනීමට සූදුසුකම් කීම.

(05) ජනතාව මත පටවන බදු අවුරුදු 4ක කෙටි කාලයකින් දෙගුණ කරන්නට හැකි වනවාත් සමඟම, එය රජය ලැබූ මහත් ජයග්‍රහණයක් ලෙස සාර්ථකව අර්ථකථනය කිරීමට දක්ෂ වීම.

(06) රටේ ණය තොගය වසර 4ක් තුළ රුපියල් ට්‍රිලියන 7 සිට 12 දක්වා රුපියල් ට්‍රිලියන 5කින් වැඩිකර ගනිමින් රටේ ශීඝ්‍රතම ණය ගැනීමේ වාර්තාව ස්ථාපනය කිරීම.

(07) දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව ණයබරතාව සියයට 71 සිට සියයට 91 දක්වා වසර 4 තුළදී වේගවත්ම ණය වීමෙන් සහ පොලී ගෙවීම දෙගුණ කර ගැනීමෙන්, රට ණය උගුලකට ගොදුරු කර ගැනීම

(08) රුපියල ඇමෙරිකානු ඩොලරයට සාපේක්ෂව 2018දී රුපියල් 29.90කින් අවප්‍රමාණය කර ගනිමින්, පසුගිය රජයේ වසර 9ක කාලය තුළදී අවප්‍රමාණය වූ රුපියල් 28.93 පසු කරමින්, ශ්‍රී ලංකාවේ රුපියලේ මුළු ඉතිහාසයේම ඉහළතම කඩා වැටීම වාර්තා කිරීම.

(09) වසර 4ක් තුළදී රුපියල දැවැන්ත ලෙස කඩා වට්ටා ගැනීම හරහා කිසිදු භෞතික සම්පතක් එකතු නොකරමින් රජයේ ණය තොගය රුපියල් බිලියන 1,500කින් පමණ වැඩි කරගන්නට සමත්වීම.

(10) 2014දී පැවති අගයන් සමඟ සංසන්දනය කරන විට, 2017දී උද්ධමනය දෙගුණයක් කර ගන්නටත්, 2018දී එය තවත් සියයට 30කින් ඉහළ නැංවීමටත් සමත්වීම.

(11) ව්‍යාපාරවලට බලපාන පොලී අනුපාතයන් සියයට 90කින් පමණ වැඩි කර ගනිමින්, සියලුම ව්‍යාපාර දැවැන්ත අවපාතයකට පත් කරන අතරම, බැංකු සහ මූල්‍ය ආයතන ද දැඩි අපහසුතාවකට යොමු කිරීමට සමත්වීම.

(12) වසර 4ක් තුළදී අලුත් රැකියා දසලක්ෂයක් බිහි කරනවා වෙනුවට, තිබුණු රැකියා හාරලක්ෂ පනස්හතරදහසක් නැති කර ගැනීමට සියලු පියවර ගැනීම.

(13) මුළු රටම පාවා දෙමින් GSP Plus ලබා ගත්ත ද, වසර 4ක් තුළදී අපනයන අඩු කර ගනිමින් ද, විදේශ වෙළෙඳ ශේෂය සියයට 13කින් වැඩි කර ගනිමින් ද, රටේ විදේශ ගිණුම දැඩි පීඩනයකට ගොදුරු කිරීම.

(14) රටට ගලා එමින් තිබූ සෘජු විදේශ ආයෝජන දැඩි ලෙස අඩු කර ගනිමින් 2015 සිට 2018 දක්වා සාමාන්‍ය විදේශ ආයෝජන 2014ටත් වඩා අඩු අගයක පවත්වා ගැනීමට සමත්වීම.

(15) රට තුළට ගලා ආ විදේශිකයන් විසින් රාජ්‍ය සුරැකුම්පත්වල 2014දී ආයෝජනය කොට තිබූ ඇමෙරිකානු ඩොලර් බිලියන 3.4 සිට ඇමෙරිකානු ඩොලර් බිලියන 0.8 දක්වා, සියයට 76කින් අඩු කර ගැනීමට සමත්වීම. ඒක ලොකු දෙයක්.

**ගරු එස්.බී. දිසානායක මහතා**
(மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க)
(The Hon. S.B. Dissanayake)
ලෝක වාර්තාවක්.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

(16) ව්‍යාපාර, වෘත්තිකයන් සහ වෙළෙඳ ප්‍රජාවගේ දැඩි විරෝධය තුට්ටුවකටවත් නොසලකමින් සිංගප්පූරුව සමඟ නිදහස් වෙළෙඳ ගිවිසුමක් අත්සන් තැබීමට ශ්‍රී ලංකාව යොමු කිරීමට හැකිවීම.

(17) වසර 10කින් වාර්තා කළ අඩුම මට්ටමට විදේශ සංචිත කඩා වට්ටමින් ශ්‍රී ලංකාවේ විදේශ ගනුදෙනු කර ගැනීම ඉතා විශාල අවදානමකට ගොදුරු කර ගැනීමට හැකිවීම.

(18) වසර 4ක් තුළදී සෑම ණය ශ්‍රේණිගත ආයතනයකින්ම දෝස් මුරවලට භාජනය වෙමින් සෑම වසරකට වරක්වත් ශ්‍රී ලංකාවේ ණය ශ්‍රේණිය කඩා වට්ටා ගැනීමට පොහොසත් වීම.

(19) හම්බන්තොට වරාය විකුණා ලැබූ මුදල විනෙන් ලබා ගන්නා ලද ණය ගෙවීමට යොදවනවා යැයි කියමින්, එලෙස විකිණීමෙන් පසු එම මුදල් සාමාන්‍ය රාජ්‍ය වියදම් පියවීමට උපයෝගී කර ගනිමින්, ඉතා සූක්ෂම ලෙස රටේ ජනතාව මුළා කිරීමට සමත්වීම.

(20) 2015දී අය වැය පරතරය 1988න් පසු වාර්තා වූ වැඩිම අගය සටහන් කර ගැනීමට පොහොසත් වීම.

(21) රජයේ රාජ්‍ය ගිණුම පිළිබඳව "අදහසක්වත් පළ කිරීමට නොහැකියි" යැයි සහතිකයක් ඉතිහාසයේ පළමු වරට විගණකාධිපතිවරයාගෙන් ලබා ගැනීමට හැකිවීම.

(22) අයහපත් පාලනය නිසා නීතියේ ආධිපත්‍යය, ආර්ථික නිදහස, ව්‍යාපාර කිරීමේ පහසුතාව, මිනිස් සංවර්ධනය, ජාත්‍යන්තර තරගකාරිත්වය සහ දූෂණ ප්‍රත්‍යක්ෂය ඇතුළු සියලුම ජාත්‍යන්තර වර්ගීකරණවලින් ඉතා තියුණු ලෙස රටේ මට්ටම පහළ හෙළා ගැනීමට පොහොසත් වීම.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ "හපන්කම්" ලැයිස්තුවට මේ ජනතාව රවටන, වැඩ බැරි, දූෂිත, බොරු කියන, අසංවේදී රටට අහිතකර ආණ්ඩුවට තවදුරටත්, තවත් හපන්කම්

එකතු කරන්නට ඉඩ තියන්න පුළුවන්කමක් නැහැ කියලායි මා විශ්වාස කරන්නේ. අපි සියලු දෙනාම ඉවසුවා ඇති කියලා දැන් අප කියනවා. ඒ නිසා මේ දේශයට අහිතකර මේ ආණ්ඩුව ඉතා ඉක්මනින් ඉවත් කිරීමට අපට සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලමින්, මට අවස්ථාව ලබාදීම ගැන මූලසුනට ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. [බාධා කිරීමක්] ඔව්, ඔබතුමන්ලාට එහෙම නිදාගන්න තමයි කිව්වේ. ඔබතුමන්ලාට නිදාගන්නම වේවි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The next speaker is the Hon. Rauff Hakeem. You have 15 minutes.

[11.20a.m]

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම්, ජල සම්පාදන සහ උසස් අධ්‍යාපන අමාත්‍යතුමා)**
(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல், நீர் வழங்கல் மற்றும் உயர் கல்வி அமைச்சர்)
(The Hon. Rauff Hakeem - Minister of City Planning, Water Supply and Higher Education)

Hon. Deputy Speaker, I am glad to follow the Hon. Mahinda Rajapaksa, the Hon. Leader of the Opposition and our former President.

May I, at the very outset, congratulate our able Minister of Finance, the Hon. Mangala Samaraweera and the State Minister of Finance, the Hon. Eran Wickramaratne, for having produced a Budget, regarding which the Opposition is only able to make a few cynical comments about the welfare measures, salary increases and the general tenure of the Budget Proposals rather than having any substantial criticism about the entire content of the Budget.

In this regard, Sir, may I be permitted to say that with the political coup that took place on the 26th of October, 2018 and the resultant chaos that it created, we were faced with the danger of many international rating agencies downgrading Sri Lanka's capacity. With such a Damocles' sword hanging over our necks, we were able to produce a Budget which was replete with a variety of social security measures, increasing the social security net to protect the underprivileged and the poor as well as to provide increases to public servants' salaries, increases in pensions, the allowances to armed forces and payments to differently-abled persons, provide free milk to rural students, housing loans to newly married couples, soft loans to higher education scholarships to Ivy League universities and payment of fees for students to enter private universities as well. We must note that almost 24 per cent of allocations in this Budget has gone towards education, health and infrastructure development.

With all these measures being introduced, we must understand that we have managed to produce such a Budget with a large external debt stock that needs to be serviced. So, in this regard, it is very pertinent, Sir, to note there are certain things that have to take note of, if we are to maintain fiscal consolidation and to stabilize the macroeconomic position of the country.

In this regard, I believe it is pertinent for me to refer to a question that was raised by the Hon. Anura Dissanayake when the Hon. Ravi Karunanayake, the former Minister of Finance, was speaking. It relates to the issue of international sovereign bonds. That was started in 2007. For the past decade or more, we have been resorting to this mode of floating international sovereign bonds and the other variety which is called the foreign currency term financing facility. We talk about China, India and various others. There was an interesting article by the current Executive Director of the Institute of Policy Studies, Dr. (Ms.) Dushni Weerakoon. She talks about the entire loan portfolio of the Chinese, that it is about 14 per cent and similarly, the portfolio that belongs to the Indians is also 14 per cent, whereas our external borrowing through the international sovereign bonds and the foreign currency term financing facility is in the region of almost 33 per cent or more.

I am sure the Hon. Eran Wickramaratne will be able to correct me if I am wrong. This mode of financing, what we have to bear in mind when we borrow from the international financial markets where the lending rate is higher and the repayment period is shorter when compared to the bilateral loan portfolios is that we are indeed putting our macroeconomic fundamentals in a wrong-footing. Therefore, we need to be very careful. Though the Hon. Mahinda Rajapaksa was very carefully tiptoeing on the performance of his Government vis-a-vis ours, he is also equally responsible for having resorted to this mode of financing, particularly, to boost our external reserves at times of difficulties.

Now, what we need to bear in mind is the poor selection of infrastructure projects which are low on long-term returns as well as issues pertaining to poor governance in managing our debt portfolio when it comes to even the State-owned enterprises. I need to say that there are State-owned enterprises which deal with public utilities. Now, we have a variety of such institutions and these are also curtailed by a variety of different government policies. For instance, the National Water Supply and Drainage Board is unable to raise its tariffs for the past six years. This has seriously hampered its ability to repay its loans. Of course, the Treasury has stepped in to pay a substantial portion of the debt stock by providing certain facilities. But, we need to have a novel approach and change the financial model when it comes to state-owned enterprises if we are to reduce the external debt stock. Of course, the Budget, I am sure, does not reflect the entire debt stock of the state-owned enterprises. We need to be a little more prudent in looking at our overall financial and fiscal management issues. Now, of course, we have been able to get certain debt relief through specific arrangements with bilateral donors. For instance, the Hambantota Port issue, we were able to convert the loan into equity and were able to have some relief to a certain extent. This is one typical case of infrastructure projects with financial returns being questionable because there was no proper business plan. So, these business plans need to be looked at very aggressively before we invest in infrastructure projects, particularly, when it comes to income generating infrastructure projects such as ports and other facilities.

[ගරු රවුෆ් හකීම් මහතා]

So, this issue needs to be looked at a little more critically. I think the Ministers also need to engage with the Department of External Resources and I am sure the Finance Ministry would arrange this so that we will be able to have a proper mix of the loan portfolios that we try to engage with in order to provide the capital infusion to the entities that come under our purview. We must say that when it comes to the International Monetary Fund we have had some relief by engaging with them, but we need to be a little more cautious in approaching the challenges that we are faced with.

In the meantime, I must say that the "Gamperaliya" Programme and the "Enterprise Sri Lanka" Programme have surprisingly not attracted too much of criticism from the Opposition. We have had a few cynical comments and apart from that, they realized that these two Projects, which are part of the Budget Proposals, are very critical components of this Budget which, I am sure, will improve socio-economic conditions in our villages and enhance the entrepreneurship among our youth. I am sure, if these funds are provided and concentrated on the deserving target groups and recipients, it will certainly enhance the production of goods and services and improve the contribution to the GDP from the lagging regions. We have always seen the Western region has been the main contributor to the overall GDP of this country and several regions, your area, Mr. Deputy Speaker, Moneragala, is one of those districts which contributes the least amount to the GDP. The "Gamperaliya" Programme, the "Enterprise Sri Lanka" Programme, I am sure, the impact of those Projects will enhance the capacity of such poor regions to join their colleagues in the rest of the country to contribute better towards the GDP.

So, this has been the main focus and I am sure that is why the Opposition is unable to criticize this Budget since it has been well-thought out in a very difficult period. They themselves are responsible for having created that Constitutional chaos in October, last year which seriously debilitated our ability to contain the fiscal deficit that was already looming. So, we must say that we have managed to bring the fiscal deficit to somewhere around 4.5 per cent, but I am sure we will be very cautious in approaching the entire year because we have seen this as an election Budget where the proverbial Oliver Twist attitude of continuing to ask for more and more is going to be the attitude of the constituents. Therefore, it is up to the Ministry of Finance now that they have presented a well- thought out Budget, which will ultimately benefit the rural poor and provide that necessary safety net to the socially disadvantaged people in our lagging regions.

I must also congratulate the Hon. Finance Minister for having been very frank about our social security programme, the Samurdhi Programme, that it had certain structural weaknesses, particularly the political bias that was there and that it needs to be corrected. That is why a decision has been taken to increase the benefits and the number of beneficiaries and to see that the selection criteria of those beneficiaries will not replete with political discrimination which has taken place. The Hon. Mangala Samaraweera having been a Minister in the original regime that had introduced the Programme very clearly told us that there was political bias in the selection of beneficiaries.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
You have two more minutes.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)
Hon. Deputy Speaker, this issue of trying to implement the new social security progamme - not the new one, the earlier one - with a little bit of course correction to see that we have proper target groups selected so that the benefits will really give the necessary cushion for those people who need it the most, is commendable

Mr. Deputy Speaker, there are a few things that I need to talk about, particularly some Proposals that were contained in the last Budget relating to the importance of creating certain reservoirs. For instance, Wee Oya and Yatimahana were important reservoirs that needed to be built in time so that the Western Province's water supply issues would be corrected. Though there was a decision last year to fund these projects, they have still not come to fruition. We need to look at more dedicated reserviors for drinking water purposes in the upper basins of our major rivers. This is a matter that we have very often raised in our budget discussions with the Finance Ministry. I am sure that the Ministry of Irrigation and ourselves need to have further discussions with the Ministry of Finance on such issues.

I must also thank the Hon. Minister of Finance for having looked at the higher education sector with a broader mindset in order to provide better infrastructure for our universities to improve the quality of teacher resources that we are trying to provide, as well as to give much-needed relief to the students by providing them sufficient scholarships and loan schemes in order to enter higher educational institutions with only about 36,000 intake in our national universities and also with another 36,000 following in instuitions like the SLIATE and various other vocational training institutions. We have also invested heavily on the technological faculties of the universities. So, we must thank the Ministry of Finance for having allocated a sum of almost Rs.26 billion, I believe, towards setting up new technological campuses all over in the university system. With those words, Mr. Deputy Speaker, I conclude my remarks.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. Rajavarothiam Sampanthan. You have 25 minutes.

[11.35a.m.]

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

Thank you, Mr. Deputy Speaker, I thought I had 30 minutes. Let us see how we go along, Sir.

I want to commence my speech by congratulating the Hon. Minister of Finance who has presented his Budget in a very unfavourable economic environment. He has made substantial allocations for the North-East of the country considering the fact this area had been much affected by a war for a very long period of time, in the matter of housing particularly, and also other development activities including the creation of a Special Fund into which contributions could be made from time to time to enable essential development activities in the North-East to be commenced and executed.

We are told that the country is neck-deep in debt - both domestic and foreign. Debt servicing and Defence Expenditure almost ten years after the war came to an end continue to be our biggest items of expenditure. The two sides, the Government and the Opposition, the former Government, blame each other. But, we all know that they are both to blame. The civil war was a big drain on our economy. If the two sides agreed on a political solution, the war could have been avoided. This was well within the realm of the possible. Moderate Tamil political leadership were ready to cooperate and were deeply committed to a fair political solution.

A Prabhakaran would never have emerged. The Tamil people are not belligerent people. We have deep cultural and religious values. The country was devastated on account of this great folly. It took more than 25 years to end the war. The entire world, the international community supported you to defeat the LTTE. The LTTE was banned in Sri Lanka and also all over the world. You made commitments that you will evolve an acceptable political solution once the war came to an end, but that has not yet happened, despite Tamil moderates once again giving you the fullest support to achieve that. Tamil people are committed to a just reasonable political solution and we will do all that we can to achieve that objective. We are committed to ensuring that if the process of finding a political solution ends in failure, the failure is not attributed to us. We will remain committed to a political solution within the framework of an undivided, indivisible country. Meanwhile there has been corruption, profligacy, waste and egocentric projects at the country's expense. Both sides keep blaming each other; that is all that you do.

All of this has a very bad impact on the country's economy. You do not know how to overcome your difficulties. You have to somehow operate and manage. You are unable to attract foreign or even domestic investment in a big way. Who will want to invest in a country that does not keep its domestic or international commitments even after more than 25 years of civil war? The war has been brought to an end but the causes that led to the origin of the war have not yet been addressed. Everyone in the country and in the whole world acknowledges that.

Many underdeveloped countries in the world have made progress. We often talk about Singapore which in the early 1950s, wanted to model its development on Sri Lanka. Singapore's success was on account of its discipline and its commitment to excellence, to quality, to honesty and to equality. You are judged in Singapore only on your merits, nothing else. I do not know whether Sri Lankans can emulate Singapore. You cannot do it by word of mouth. You need to achieve it in action. Take the other countries in our region, in South Asia and Southeast Asia, which are making progress. If I might pick one, Bangladesh in the South Asian Region. Many factories that were closed down in Sri Lanka, when we lost international economic concessions on account of our poor conduct and when we breached international commitments, moved to Bangladesh.

Today the international community is yet hopeful that it can be helpful to us because they feel that as a democratic country, we may still turn around. Sustaining democracy has been our only achievement. There have been efforts to subvert democracy, but they have not been successful and those efforts have been thwarted. I think, Sir, we should praise our ordinary people for that. What do we need to do to change the situation? We do not have true peace. Can we call ourselves a country in which all people irrespective of who they are, the Sinhalese, the Tamils or the Muslims, are treated alike? It has been 70 years since we achieved Independence. This situation cannot continue indefinitely.

What needs to be done? Powers of governance need to be shared within an undivided, indivisible Sri Lanka so as to ensure that all people feel equal, that they have the sense of belonging to Sri Lanka and that Sri Lanka belongs to them. This is how multicultural, multiethnic and pluralistic societies are governed in several parts of the world; in Asia, Europe, Africa, America and Australia. All these countries prosper because they have peace, stability and harmony domestically amongst their own people. Why are we reluctant to do the right thing? Are the people of this country being misled and frightened by some who have their own agendas to capture power politically?

We have been actively engaged in the process of Constitutional Reform from the time of the ethnic holocaust in 1983. The Thirteenth Amendment to the Constitution constitutionally embodying initial proposals for the sharing of powers of governance was enacted in 1987/1988. The Thirteenth Amendment was not a solution. It was the beginning of a solution thirty years ago. Since then, it has been a continuing process. During President R. Premadasa's time, the Mangala Moonesinghe Select Committee Proposals. During President Chandrika Bandaranaike Kumaratunga's time, the 2000 August Proposals brought by her to Parliament. During President Mahinda Rajapaksa's time, the Multi Ethnic Experts Committee Report, the APRC process - the Tissa Vitarana Report as the Chairman of the APRC and during

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

President Maithripala Sirisena and Prime Minister Ranil Wickremesinghe's time, the Resolution converting Parliament into a Constitutional Assembly, the setting up of a Steering Committee, Sub Committees and their reports submitted to the Constitutional Assembly and debated in that Assembly. Much work has been done and there has been built through these several processes a great deal of consensus moving Constitutional Reform much beyond the Thirteenth Amendment to the Constitution giving us the opportunity to derive the benefit of all the work that has been done so far.

Are we going to throw all this away and take the risk of the conflict being resumed, or are we going to do our duty and arrive at a just and reasonable conclusion? Do we not have a duty to study all the Proposals that have been framed so far and in the interest of the country and its people make some wise decision? We must remember that all parties have been involved in these Processes. Some have been under the UNP governance, some have been under the SLFP governance. Both President Maithripala Sirisena and Prime Minister Ranil Wickremesinghe are committed to bringing this Constitutional Reform Process to an acceptable and satisfactory conclusion. This has been their publicly stated position. The two of them, President Maithripala Sirisena and Prime Minister Ranil Wickremesinghe, represent the SLFP and the UNF respectively. There is a general view that former President Mahinda Rajapaksa should also be a part of the Process. Several Hon. Members in the Opposition have conveyed that view to us. We are in complete agreement with that view and we would appeal to former President Mahinda Rajapaksa to be supportive of the Process. That could infuse the Process with greater confidence.

What former President Mahinda Rajapaksa has said and done so far, particularly when he was in power, has in several instances been strongly supportive of the Process. I would draw the attention of the Hon. Members to such instances. I do this only for the reason that it will be helpful to all of us. You will observe that there is no difference between what the former President said and did and what is happening now.

I would refer, Sir, to some of these matters because they are important. I refer to the Speech that President Mahinda Rajapaksa made at the Inaugural Meeting of the All Party Representative Committee called the APRC and the Multi-Ethnic Experts Committee on 11th July, 2006.

I quote from what he said, Sir:

"Our objective must be to develop a just settlement within an undivided Sri Lanka."

He went on to say, Sir:

"People in their own localities must take charge of their destiny and control their politico-economic environment. Central decision-making that allocates disproportionate resources has been an issue for a considerable time."

He went on to say, and I quote:

"Any solution must be seen as one that stretches to the maximum possible devolution-"

"Given the ground situation, given the background to the conflict, it therefore behoves on particularly the majority community to be proactive in striving for peace and there must be a demonstration of a well-stretched hand of accommodation."

That is what he wanted the majority community to do. These are President Mahinda Rajapaksa's words.

Then, Sir, I want to refer to a Joint Statement made by President Mahinda Rajapaksa and the Secretary-General of the UN when he came to Sri Lanka at the end of the war on 23rd May, 2009.

This is what the Statement says, and I quote:

"President Rajapaksa and the Secretary-General agreed that addressing the aspirations and grievances of all communities and working towards a lasting political solution was fundamental to ensuring long-term socio-economic development."

It further states, I quote:

"President Rajapaksa expressed his firm resolve to proceed with the implementation of the 13th Amendment, as well as to begin a broader dialogue with all parties, including the Tamil parties in the new circumstances, to further enhance this process and to bring about lasting peace and development in Sri Lanka."

This is what President Mahinda Rajapaksa himself said in a Statement he made with the Secretary-General of the UN.

Hon. Mahinda Rajapaksa's brother, Mr. Basil Rajapaksa, an important Minister, went to India in October, 2008. At the end of that visit there was a Statement made.

This is what he said, and I quote:

"Both sides discussed the need to move towards a peacefully negotiated political settlement in the island including the North. Both sides agreed that terrorism should be countered with resolve.

The Indian side called for implementation of the Thirteenth Amendment and greater devolution of powers to the provinces. Mr. Basil Rajapaksa emphasized that the President of Sri Lanka and his Government were firmly committed to a political process that would lead to a sustainable solution".

This is Mr. Basil Rajapaksa's statement and I have quoted that.

Prof. G.L. Peiris, the then Minister of External Affairs in the Mahinda Rajapaksa Government, between 15th and 17th of May, 2011, on his visit to India, said this in a joint statement. I quote:

"Both sides agreed that the end of armed conflict in Sri Lanka created a historic opportunity to address all outstanding issues in a spirit of understanding and mutual accommodation imbued with political vision to work towards genuine national reconciliation.

In this context, the External Affairs Minister of Sri Lanka affirmed his Government's commitment to ensuring expeditious and concrete progress in the ongoing dialogue between the Government of Sri Lanka and representatives of Tamil parties.

A devolution package building upon the 13th Amendment would contribute towards creating the necessary conditions for such reconciliation."

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, you have two more minutes.

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)
Sir, kindly give me five more minutes to finish.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
( மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Can I take it off from the Hon. Viyalanderan's time allocation?

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)
Kindly give me five more minutes.

Again, Sir, the Foreign Minister of India came to Sri Lanka and this is what he said in the course of his statement made on the 19th of January, 2012. I quote:

"The Government of Sri Lanka has on many occasions conveyed to us its commitment to move towards a political settlement based upon the full implementation of the Thirteenth Amendment to the Sri Lankan Constitution and building on it so as to achieve meaningful devolution of powers."

That is the commitment he made. He further said, I quote:

"We look forward to an expeditious and constructive approach to the dialogue process. We believe that continuation of the dialogue between the Government and the TNA would pave the way for a political settlement including under the rubric of the Parliamentary Select Committee."

The LLRC in their recommendations impressed the need for extensive devolution and wanted a solution based upon devolution, substantial devolution, maximum devolution. Those are the words used by the LLRC.

And your commitment at the United Nations Human Rights Council was - The Resolution adopted in October, 2015 states, I quote:

"Welcomes the commitment of the Government of Sri Lanka to a political settlement by taking the necessary constitutional measures, encourages the Government's efforts to fulfil its commitments on the devolution of political authority, which is integral to reconciliation and the full enjoyment of human rights by all members of its population;.."

So, this is the position, Sir. If one looks at what President Mahinda Rajapaksa has said, President Mahinda Rajapaksa has all along been supportive of the process of a political solution based upon maximum possible devolution building upon the Thirteenth Amendment. That is what Mangala Moonesinghe Select Committee brought about. That is what Chandrika Bandaranaike Kumaratunga's proposals brought about.

That is what the Prof. Tissa Vitharana Report brought about during the time the Hon. Mahinda Rajapaksa was the President. It was carried on with his blessings. So, all along Sir, the Mahinda Rajapaksa Government has been committed to a political solution based upon the maximum possible devolution, built upon the Thirteenth Amendment to the Constitution so as to ensure a meaningful devolution of power.

I would therefore, say Sir, that when the three leaders of the country, President Maithripala Sirisena, Prime Minister Ranil Wickremesinghe and former President, Mahinda Rajapaksa have all been taking the same view and have all been supportive of maximum possible devolution of power being shared in such a way that all the people in this country will feel that they are Sri Lankans and that Sri Lanka is their country. Why are we delaying? Our economy will never improve. You can talk and talk till the cows come home. But our economy will never improve. If our economy is to improve, there must be substantial investment to this country -both domestic investment and foreign investment. Today people do not trust you. You make commitments domestically and internationally which you do not keep. People do not trust you. People must invest in this country. You must develop an export-oriented economy. You must create jobs for our youth. Our youth must be employed. Unless that is done, your economy will never improve and you will never achieve it unless there is a political solution in this country and everybody is equal.
I thank you Sir, for the time you have given me.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා. ඔබතුමාට විනාඩි 14ක් තිබෙනවා.

[අ.භා.12.03]

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම අය වැය පිළිබඳව කථා කරන්න අවස්ථාව උදාවීම පිළිබඳව සතුට ප්‍රකාශ කරන අතර, මෙවර ඉදිරිපත් කර තිබෙන අය වැය සුවිශේෂී අය වැයක්ය කියන එක මම මුලින්ම කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාන්‍යයෙන් හැම වර්ෂයකම නොවැම්බර් මාසයේදී තමයි අය වැය ලේඛනයක් ඉදිරිපත් වන්නේ. ඒ අය වැය ලේඛනය සම්මත වුණාට පස්සේ ඊ ළඟ වසරේ ජනවාරි මාසයේ පළමුවැනි දා සිට දෙසැම්බර් මාසයේ 31 වෙනි දා දක්වා රටේ මුදල් පරිපාලනයේ යෝජනා ක්‍රියාත්මක කිරීමත් තමයි අය වැය ලේඛනයට අනුව කර ගෙන යන්නේ. හැබැයි, මේ වර්ෂයේ අය වැය සුවිශේෂී අය වැයක්ය කියා මම

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

සඳහන් කරන්නේ මේ නිසායි. එනම්, අපි මේ වර්ෂයේ අය වැය ඉදිරිපත් කරන්නේ මාර්තු මාසයේ 05 වෙනි දා වීමත්, එය අවසාන වශයෙන් සම්මත කෙරෙන්නේ අප්‍රේල් මාසයේ 05 වෙනි දා වීමත් නිසායි. පසු ගිය ඔක්තෝබර් මාසයේ 26 වෙනි දා සිදු කරන ලද දේශපාලන කුමන්ත්‍රණය හේතුකොටගෙන අපට මාස 4ක කාල පරිච්ඡේදයක් අය වැය ලේඛනයක් නොමැතිව මේ රට පාලනය කරන්න සිද්ධ වුණා. මාස 4ක කාල පරිච්ඡේදය තුළ කිසිදු අන්දමකින් රට තුළ අභාග්‍යසම්පන්න තත්ත්වයක් ඇති නොවීමට වගබලා ගැනීමට අපේ රජයට හැකියාව -පුළුවන්කම- තිබුණා. එම කාලය තුළ අපි රජයේ සේවකයින් අපහසුතාවට පත් කළෙත් නැහැ, ව්‍යාපාරිකයින් අපහසුතාවට පත් කළෙත් නැහැ එ් වාගේම පෞද්ගලික අංශය අපහසුතාවට පත් කළෙත් නැහැ. ඒ වාගේම නිලධාරින්ගේ සහ අනිකුත් උදවියගේ දීමනා කප්පාදු කිරීමක් සිදු වුණෙත් නැහැ, සමෘද්ධි දීමනාවේ පාලනයක් එහෙම නැත්නම්, අඩු කිරීමක් සිද්ධ වුණෙත් නැහැ. ඒ වාගේම ගැබිනි මව්වරුන්ගේ දීමනාවේ කිසිදු අඩු පාඩුවක් සිද්ධ වුණේ නැහැ, වැඩිහිටි දීමනාවේ අඩු පාඩුවක් සිද්ධ වුණේ නැහැ. ආබාධිත උදවියට ගෙවනු ලබන ගෙවීම්වල කිසිදු අඩු පාඩුවක් සිද්ධ වුණෙත් නැහැ. මේ ආදී වශයෙන් ගත්තාම සෑම අංශයකම උදවිය පීඩනයකට පත් නොකර කළ යුතු කාර්යය නිසියාකාරව කර ගෙන යෑමට මේ මාස 4ක කාල පරිච්ඡේදයේදී අපට හැකියාව ලැබුණා. එහෙම කළේ අය වැය ලේඛනයක් සම්මත කර ගැනීමකිනුත් තොරවයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේක තමයි මම කිව්වේ මෙවර ඉදිරිපත් කරපු අය වැය සුවිශේෂී අය වැයක්ය කියා. අප්‍රේල් මාසයේදී මේ අය වැය සම්මත කර ගත්තාට පස්සේ තව මාස 8ක වාගේ කාලයක් තමයි, අපට රටේ වැඩ කටයුතු කරන්න තිබෙන්නේ. එහෙම නම්, මාස 12ක කාල පරිච්ඡේදයක් වැඩ කටයුතු කිරීම සඳහා අය වැය ලේඛනයක් ඉදිරිපත් කර සම්මත කර ගන්නා වූ යෝජනා සඳහා වෙන් කර ගන්නා වූ මුදල්වලින් මාස 8ක් ඇතුළත සියලු රජයේ සේවකයිනුත් එක්කාසු කර ගෙන අපේ රජයට විශාල වැඩ කොටසක් කරන්න තිබෙනවා. මෙවර අය වැය සුවිශේෂී අය වැයක්ය කියා මම මුලින්ම සඳහන් කරන්න අදහස් කළේ අන්න ඒ නිසාය කියන එක මම මේ ගරු සභාවට කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දේශපාලන කුමන්ත්‍රණයක් නිසා රටේ විවිධ ප්‍රශ්නවලට මුහුණ දීලා, ආර්ථිකයේ යම් යම් ප්‍රශ්නවලට මුහුණ දීලා, ඒ වාගේම රුපියලේ අගය සම්බන්ධව යම් යම් ගැටලුකාරී තත්ත්වයන්වලට ඒ කාල පරිච්ඡේදය තුළදී අපට මුහුණ දෙන්න සිද්ධ වුණා. මේ සියල්ලටම මුහුණ දෙමින්, රටේ ජනතාවට කිසිදු පීඩනයක් ඇති කිරීමකින් තොරව අපට ගෙවන්න තිබුණු දැවැන්ත ණය වාරිකයක් ගෙවා දමන්නත් අපට පුළුවන් වුණා. එහෙම නම්, ලෝකය තුළ අපි හැල්ලු වෙන්න තිබුණු අවස්ථාව; ලෝකය තුළ CRIB එකට යන්න තිබුණු අවස්ථාවත් නැති කර රටේ ගෞරවය ආරක්ෂා කරමින් ඒ ණය වාරිකය ගෙවා දැමීමටත් අපි සමත් වුණා. ඒක තමයි මම කිව්වේ මෙවර අපි සුවිශේෂී අය වැයකට මුහුණ දීලායි, මේ වැඩ කටයුතු කර ගෙන යන්නේ කියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අය වැය පිළිබඳව කථා කරන මේ මොහොතේ ඒකාබද්ධ විපක්ෂය ඇතුළු විරුද්ධ පක්ෂයේ උදවිය කවුරුවත්ම මේ ගරු සභාවේ නැහැ. මෙවර අය වැය සම්බන්ධයෙන් මේ උදවිය විවිධ විවේචන ඉදිරිපත් කළා. එක් පැත්තකින් මේ අය වැය මැතිවරණය ඉලක්ක කර ගත් අය වැයක්ය කිව්වා. අනික් පැත්තෙන් මේක ජනතාවට දෙන කැරට් අලයක්ය කියා ඔවුන් අපට චෝදනා කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වනකොට ලංකාවේ අය වැය ලේඛන 73ක් ඉදිරිපත් වෙලා තිබෙනවා. එම අය වැය ලේඛන 73ම ගත්තාම බොහෝ විට අත්පුඩි ගසා සන්තෝෂ වෙලා එළියට ගිහිල්ලා රතිඤ්ඤ පත්තු කර ප්‍රීති ප්‍රමෝදයට පත් වුණු අය වැය. ඒ අය වැය තුළින් හාල් මිල අඩු කළා, කරවල මිල අඩු කළා, පරිප්පු මිල අඩු කළා, කිරි පිටි මිල අඩු කළා. එහෙම නැත්නම් පාන් රාත්තලේ මිල අඩු කරමින් රුපියල් තුනට පාන් ගෙඩිය දෙන්න තීන්දු කළාය කියන කතන්දරත් සමඟ තමයි පසු ගිය කාලයේ අය වැය ඉදිරිපත් කළේ. විපක්ෂයේ උදවිය බලාපොරොත්තු වුණේ මෙවරත් ඒ විධියේ සාම්ප්‍රදායික විධියට හාල් මිල, කරවල මිල, පරිප්පු මිල, සීනි මිල, කිරි පිටි මිල, එහෙම නැත්නම් පාන් ගෙඩියේ මිල අඩු කරන අය වැයක් ගෙනැල්ලා ජනතාවට ඉදිරිපත් කර යාවි කියායි.

නමුත් එවැනි අය වැයක් නොව, ඒ සම්ප්‍රදායෙන් මිදුණු, ජනතාව නොරවටන, ජනතාවට අත් වැලක් වෙන අය වැයක් විධියට තමයි මෙවර අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. චීන කියමනක් තිබෙනවා, "බඩගිනි මිනිහාට මාළුවෙක් දෙන්නට එපා; බිලී පිත්තක් දෙන්න" කියලා. එහෙම නම් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර අය වැය තුළිනුත් අනුගමනය කරලා තිබෙන්නේ බඩගිනි මිනිහාට මාළුවෙක් දෙනවා වෙනුවට බිලී පිත්තක් දෙන ක්‍රමවේදයයි. ඒ බිලී පිත්ත අරගෙන ගිහිල්ලා ඔහුට උපයා ගැනීමට ක්‍රමවේදය සකස් කර දෙන විධියට තමයි මෙවර අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ අය වැය තුළින් කිසිදු අන්දමකින් එකම පැත්තක්වත් අතහැර නැහැ. පෙර පාසල් දරුවාගේ පටන්, -පාසල් දරුවාගේ කිරි වීදුරුව පවා ඇතුළත්ව,- මේ රටේ ඉන්න වැඩිහිටියා දක්වා සියලු දෙනා ආවරණය කරන්නට කටයුතු කරලා තිබෙනවා. රජයේ සේවකයා ආවරණය කරන්නට කටයුතු කරලා තිබෙනවා. රුපියල් දසදහසකින් වැටුප් වැඩි කරපු ආණ්ඩුව මේ අය වැයෙනුත් රජයේ සේවකයාට රුපියල් 2,500කින් වැටුප් වැඩි කිරීමට පියවර ගෙන තිබෙනවා. වසර විස්සකින් හමුදා නිලයන් සඳහා වැටුප් වැඩි කිරීමක් සිදුවෙලා නොතිබුණු කාලපරාසයක් තුළ මෙවර ගරු මංගල සමරවීර අමාත්‍යතුමා ඉදිරිපත් කරන ලද අය වැය ලේඛනයෙන් රුපියල් 8,770ක් වැනි විශාල මුදලකින් හමුදා ක්ෂේත්‍රයේ උදවියගේ වැටුප් වැඩිවීමක් සිදු වෙනවා. මේක සුවිශේෂී කාරණයක්. පසුගිය වකවානුවේ දිගින් දිගටම පැවතුණ යුද්ධය නිසා ජීවිතක්ෂයට පත්වුණු පිරිස අතිමහත්. මගේ මැතිවරණ කොට්ඨාසය වන ආණමඩුව මැතිවරණ කොට්ඨාසයේ හැම පාරකම වාගේ යනකොට අපට හමුදා සෙබළුන්ගේ, හමුදා නිලධාරින්ගේ, පොලිස් නිලධාරින්ගේ සොහොන් කොත් දකින්න ලැබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එදා යුද්ධයට මුහුණ දීලා අපේ මැතිවරණ කොට්ඨාසවල තරුණයන් දහස් ගණන් ජීවිතක්ෂයට පත් වුණා. පැවතුණු ආණ්ඩුව හමුදා සෙබළා විකුණාගෙන කෑවා; හමුදා සෙබළා ජාතියේ විරුවන් කියමින් ඔවුන්ගෙන් වැඩ ගත්තා; ඔවුන්ව බිල්ලට දුන්නා; නමුත් ඔවුන් සහ ඔවුන්ගේ පවුල්වල යැපෙන්නන් සඳහා නිසියාකාර ක්‍රියාමාර්ග ගත්තේ නැහැ. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර අය වැය ඒ හමුදා සෙබළාව වර්ණනා කර කර ඔවුන් අන්දමින් ඉන්නේ නැතුව, ඒ උදවිය නිසි ඇගයීමකට ලක් කරපු අය වැයක් කියන එක මනාකොට ඔප්පු කර පෙන්වලා තිබෙනවා කියන කාරණය මම සඳහන් කරන්නට කැමැතියි. මමත් නිල ඇඳුම් අඳින ක්ෂේත්‍රයක සිටි පුද්ගලයෙක් නිසා විශේෂයෙන්ම මේ අය වැය ලේඛනය ඉදිරිපත් කළ මුදල් ඇමතිතුමාට සහ රජයට ප්‍රශංසාව පුද කරනවා, නිල ඇඳුම් අඳින උදවිය දෙස අවධානය යොමු කිරීම සම්බන්ධව.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බොහෝ කලකට පෙර විශ්‍රාම ලබා ගත් උදවිය ගැනත් මේ අය වැයෙන් අවධානය යොමු කර තිබෙනවා. විශේෂයෙන් පොලිස් සේවයේ සහකාර පොලිස් අධිකාරිවරයෙක් ගත්තොත්, ඔහුගේ මූලික විශ්‍රාම වැටුප රුපියල් 4,995ක් වැනි මුදලක්. මාසය අවසානයේ විශ්‍රාම වැටුප වශයෙන් ලැබුණේ රුපියල් 16,000ත්, 20,000ත් අතර ප්‍රමාණයක්. ඒ

වාගේම වැඩි වැටුපක් ලබන අලුතෙන් විශ්‍රාම ගන්නා උදවියට විශ්‍රාම වැටුප වශයෙන් ලොකු මුදලක් ලැබෙනවා. නමුත් වැටුප් තලයන් වැඩි කිරීමට ප්‍රථම විශ්‍රාම ගත් නිලධාරින්ට මාසයකට ලැබෙන්නේ රුපියල් 20,000ක්, 25,000ක් වැනි පොඩි මුදලක්. පොලිසියේ නිලධාරින්ට, හමුදා සේවයේ නිලධාරින්ට, රජයේ සේවකයන්ට පමණක් නොවෙයි, කලින් විශ්‍රාම ගත් මහාධිකරණ විනිසුරුවරයෙකුටත් ලැබෙන්නේ රුපියල් 25,000ක විතර මුදලක්. මෙතැන විශාල පරතරයක් තිබුණා. අලුතෙන් විශ්‍රාම ගන්න උදවිය සහ පැරණි විශ්‍රාමිකයන් අතර බරපතළ පරතරයක් තිබුණා. ඒ නිසාම පැරණි විශ්‍රාමිකයාට ජීවත්වීම බරපතළ අරගළයක් බවට පත්වෙලා තිබුණා. ඒ ගොල්ලන්ට ඔසු සැලෙන් බෙහෙත් ටික ගත්තා නම් පමණක් සහනදායී මිලකට බෙහෙත් ටික අරගෙන පාවිච්චි කරන්න පුළුවන්කම ලැබුණා. පෞද්ගලික අංශයේ ෆාමසිවලින් බෙහෙත් ගන්න වුණා නම්, ඒ බෙහෙත් ටික ගැනීමටවත් ඔවුන්ට ලැබෙන විශ්‍රාම වැටුප ප්‍රමාණවත් වුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් පරතරය අවම කිරීම සඳහා මෙවර අය වැය ලේඛනය තුළින් සාධනීය පියවරක් අරගෙන තිබීම ගැන ආඩම්බරයෙන් සිහිපත් කරන්නට ඕනෑ; ඒ වාගේම අපි ඒ ගැන ස්තුතිවන්ත වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තරුණ උදවිය සම්බන්ධයෙනුත් මේ අය වැයෙන් අවධානය යොමු කර තිබෙනවා. අපේ බ්‍රහ්මචාරී අවධිය අවසන් කරලා තරුණ අවධියට ඇතුළත් වෙනකොට විවාහ ජීවිතය අපට අත්‍යවශ්‍ය කාරණයක් වනවා. ඒක සම්ප්‍රදායක්. විවාහ ජීවිතයට ඇතුළත් වුණාම විවාහයෙන් පස්සේ කොහොමද කටයුතු කරන්නේ, ජීවත් වෙන්නේ කොහොමද කියන එක හැම තරුණ තරුණියකටම තිබෙන බරපතළ ප්‍රශ්නයක්. ඒක මනසේ තිබෙන බරපතළ වේදනාකාරී ප්‍රශ්නයක්.

නමුත් විවාහ ජීවිතය නීරස ජීවිතයක් නොවෙයි, රසවත් ජීවිතයක් බවට පරිවර්තනය කිරීම සඳහා යෝජනාවක් මේ අය වැය ලේඛනය තුළින් ගෙනැල්ලා තිබෙනවා. විවාහයෙන් පස්සේ ඒ විවාහක යුවළට තිබෙන දැවෙන ප්‍රශ්නය තමයි නිවහන. නිවහන කොහේද කියන එක සිහිනයකට පමණක් සීමා කරන්නේ නැතුව, පීඩනයකට පමණක් සීමා වෙන්න දෙන්නේ නැතුව ඒ පීඩනය රජය භාර අරගෙන විවාහයට පත්වෙන උදවියට තම නිවස ඉදිකර ගැනීම සඳහා බොහොම සහනදායී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට මේ අය වැය ලේඛනය තුළ සාධනීය තත්ත්වයන් තිබෙන බව අපට දකින්න පුළුවන්කම ලැබෙනවා.

අපි දිගින් දිගටම කළේ සමෘද්ධි ව්‍යාපාරය වැනි ව්‍යාපාර තුළින් දේශපාලන බල කණ්ඩායම් නිර්මාණය කරගෙන දේශපාලන බල හමුදාවන් පවත්වාගෙන යාමයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි. රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ අවධියේ එදා "ජනසවිය" දීලා ජනතාව ශක්තිමත් කළා. එදා ඒ "ජනසවිය" ව්‍යාපාරයෙන් අවුරුදු දෙකකට පමණයි එක පුද්ගලයෙකුට ඒ සහනාධාරය දීලා තිබුණේ. ඒක අවුරුදු දෙකකට සීමා කරලා තිබුණා. අවුරුදු දෙකෙන් පස්සේ ඔහු ශක්තිමත්, සවිබල ගැන්වූ පුද්ගලයෙකු බවට පරිවර්තනය කිරීමේ තේමාව, තීරණය, අධිෂ්ඨානය මත තමයි එදා "ජනසවිය" ක්‍රියාත්මක වුණේ. ඉන් අනතුරුව ඒ "ජනසවිය" ක්‍රියාදාමය වෙනස් කරමින් පසුගිය රජයන් විසින් "සමෘද්ධි" ව්‍යාපාරය ඇති කළා. ඒ "සමෘද්ධි" සාමාජිකයා තමන්ගේ දේශපාලන වහලෙක් බවට පරිවර්තනය කරගෙන තිබුණා. සමෘද්ධි අධිකාරිය යනු ඩාලි පාරේ තිබෙන ශ්‍රී ලංකා නිදහස් පක්ෂ කාර්යාලයට සමාන තවත් එක් කාර්යාලයක් බවට පත් වෙලා තිබුණා. ඔවුන්ගේ දේශපාලන බලකාය මෙහෙයවන, නඩත්තු කරන තැන සමෘද්ධි අධිකාරිය බවට පරිවර්තනය කරගෙන තිබුණා. ඒ තුළ සමෘද්ධිලාභියා දේශපාලන අතකොළුවක් වෙලා, දේශපාලන වහලෙක් බවට එදා ඒ රජය පත් කරගෙන තිබුණා. අද මේ අය වැයෙනුත් ලක්ෂ හයකට සමෘද්ධි සහනාධාරය අලුතෙන් ලබා දෙන්නට යෝජනා කරලා තිබෙනවා. මෙතැනදී කෙනෙකුට තර්ක කරන්න පුළුවන්, "එහෙම නම් ඇයි, මේ වතාවේ සමෘද්ධි සහනාධාරය ලක්ෂ හයකට ලබා දෙන්න යෝජනා කරන්නේ. තවත් දේශපාලන වහලුන් ලක්ෂ හයක් හදන්නද" කියලා. නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මෙතැන අරමුණ වුණේ මොකක්ද? මේ ලැබිය යුතු පුද්ගලයන් ලක්ෂ හයකට විතර ප්‍රමාණයකට මේ සහනාධාරය ලැබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
තව විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
අපේ ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමා මට තව විනාඩි තුනක් දෙයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මම විශ්වාස කරන්නේ නැහැ. මොකද අපට කාලය පිළිබඳව ලොකු ප්‍රශ්නයක් තිබෙන නිසා.

**ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා**
(மாண்புமிகு பாலித ரங்கே பண்டார)
(The Hon. Palitha Range Bandara)
හොඳයි. බැහැ නම් මොනවා කරන්නද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවර මේ සමෘද්ධි දීමනාව දෙන්න හදන්නේ අවුරුදු දෙකකටයි. ඒ ගොල්ලන් සවිබල ගන්වලා, ශක්තිමත් කිරීම තමයි අපේ ආණ්ඩුවේ පරමාර්ථය වෙලා තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පූජක පක්ෂයට රැකවරණය ලබා දෙන්න, සෞඛ්‍ය සම්පන්න කණ්ඩායමක් ඇති කිරීම සඳහා වැසිකිළි පද්ධතිය සකස් කරන්න, උසස් අධ්‍යාපනය ලැබීම සඳහා විදේශගත වෙන දරුවෙකුට අධ්‍යාපනය ලබා ගැනීම සඳහා මූල්‍යමය ප්‍රශ්න තුළ හිරනොවී වැඩ කටයුතු කරන්නට පහසුකම් සැලසීම ආදී වැඩ කටයුතු රාශියකින් සමන්විතව ක්‍රියාත්මක කරන අය වැයක් විධියට අපට මේ අය වැය හඳුන්වන්න පුළුවන්.

"ගම් පෙරළිය" වැඩ සටහන, ගරු රිෂාඩ් බදියුදීන් අමාත්‍යතුමා ක්‍රියාත්මක කරන "නංවමු ලංකා" වැඩසටහන වාගේ වැඩ කටයුතුත් එක්ක අපි ඉදිරියට යන්න තිබෙනවා. ඒ වාගේම සාර්ක් කලාපයේත්, ආසියානු කලාපයේත් ගත්තාම අපි අන්තිමයට ඉහළින් ඉන්න රාජ්‍ය බවට පත් වෙලා තිබෙනවා. නිදහස ලබන කොට ජපානයට වඩා එක ඩොලර් එකක් අඩුවෙන් ඒකපුද්ගල දළ ජාතික ආදායමක් තිබුණු අපි, අද සාර්ක් කලාපයේත්, ආසියානු කලාපයේත් නේපාලය අන්තිමයා වන කොට, නේපාලයට ඉහළින් ඉන්න රට බවට පත් වෙලා තිබෙනවා. සහනාධාර, රැවටිලි දේශපාලන අය වැය ලේඛන ඉදිරිපත් කරපු රටාව තුළ තමයි එවැනි තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ. ඒකෙන් ගොඩ යෑම සඳහා තමයි ආර්ථිකයට අත්වැලක් දෙන අය වැයක් ඉදිරිපත් කිරීමට මේ සැරේ පියවර ගෙන තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණයත් සිහිපත් කරන්න ඕනෑ. ගරු අගමැතිතුමාගේ වැය ශීර්ෂය රුපියල් බිලියන 1.1ක් වෙන කොට ගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය රුපියල්

[ගරු පාලිත රංගෙ බණ්ඩාර මහතා]

බිලියන 13.56ක් වෙනවා. මාස පහක කාලයක් තමයි වැඩ කටයුතු කරන්න තිබෙන්නේ. මාස පහක කාලයක් සඳහා එක පුද්ගලයෙකුට පමණක් රුපියල් බිලියන 13.56ක් -රුපියල් ලක්ෂ 13,560ක්- වාගේ මුදලක් වෙන් කරනවා. මාස පහක් තුළ මෙවැනි මුදලිකින් මොකක්ද කරන්නේ?

ඊයේ මම "ජනහඬ" වැඩසටහනේ ඉන්දෙද්දී පොළොන්නරුවේ උදවිය කථා කරලා පොළොන්නරුවේ තත්ත්වය පිළිබඳව කිව්වා. මේ අය වැය ලේඛනයේ කාරක සභා අවස්ථාවලදී -අද දවසේ ඡන්දයේදී නොවෙයි,- මෙවැනි මුදල් සම්භාරයක් වෙන් කිරීම තුළ ප්‍රයෝජනයක් තිබෙනවාද කියන එක පිළිබඳව හිතන්න වෙනවා. මේ අය වැය ලේඛනයේදී අපට ප්‍රශ්නගත එක කාරණයයි තිබෙන්නේ. රුපියල් බිලියන 13.56ක - රුපියල් ලක්ෂ 13,560ක මුදලක්- එක් පුද්ගලයෙකුගේ වැය ශීර්ෂයකට වෙන් කරලා තිබීම නම් අපට එකඟවිය හැකි කාරණයක් නොවෙයි කියන එක මෙම අය වැය ලේඛනය පරිශීලනය කරන කොට පෙනී යනවා කියන කාරණය සිහිපත් කරමින්, ඒ සම්බන්ධ ගත යුතු ක්‍රියාමාර්ගය මොකක්ද කියන එක පිළිබඳවත් අපට හිතන්න වෙනවා කියන කාරණය සිහිපත් කරමින්, කාලය ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුති කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට බොහොම ස්තුතියි.

ඊළඟට ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

ගරු සභානායකතුමනි, දිවා ආහාරය සඳහා වෙන්කර තිබෙන කාලයෙන් විනාඩි 3ක කාලයක් ලබාගැනීම සඳහා යෝජනා කරන්න.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පස් වරු 12.30න් පසුව විනාඩි 3ක් සභාව පවත්වාගෙන යන ලෙස මා යෝජනා කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා කථා කරන්න.

[අ.භා. 12.19]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු කථානායකතුමනි, වර්තමාන ආණ්ඩුව මේ ඉදිරිපත් කර තිබෙන්නේ අවසන් අය වැය ලේඛනයයි කියලා මා හිතනවා. අප රටේ ඉදිරි අනාගතය පිළිබඳව පරිච්ඡේදයක් ලිව්වා නම් මේ අවුරුදු 5 ගැන ලියැවෙන පිටු හිස් පිටුයි. හිස් පිටුවලින් තමයි මේ අවුරුදු 5 සමන්විත වෙන්නේ. ඒ වාගේම මේ අවුරුදු පහේ අප රටේ විනාශකාරී අන්තය ගැන ලිව්වා නම් එය පිටු දහස් ගණනක් පුරවන්න පුළුවන්. එතරම් විනාශකාරී අන්තයකට තමුන්නාන්සේලා මේ රට ගෙන ගියා. ඒ ගැන මා කියන්නම්. මේ රටේ සැබැවින්ම සිදුවන දේ පිළිබඳව ලිව්වා නම් ලියැවෙන ඉතිහාසය මා කියන්නම්. හැබැයි මංගල සමරවීර මහත්මයා හෝ ආණ්ඩුවේ අමාත්‍යවරු හෝ වෙන වෙන පරිච්ඡේද ලියන්න පුළුවන්. ඒ ඒ විෂයයන් ගැන කථා කරන වෙලාවේදී අග්‍රාමාත්‍යවරයාගේ සිට ඒ හැම ඇමතිවරයා පිළිබඳවම වෙන වෙන පරිච්ඡේද ඉදිරිපත් කරන්න මා සූදානම්. එය මතක තබා ගන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමුවෙන්ම මා කියන්නේ, අපේ රට ක්ෂේත්‍ර ගණනාවක අර්බුදයක තිබෙනවාය කියන එකයි. ආර්ථික වශයෙන්, සමාජයීය වශයෙන් විශාල අර්බුදයක් තිබෙනවා. මේ රටේ පාලන බලයට පත්කර ගන්නා ආණ්ඩුවල සැලසුම් බවට පත්විය යුතුව තිබුණේ, අපේ රට මේ අර්බුදවලින් මුදාගෙන ඉදිරියට ගෙන යෑම සඳහා අවශ්‍ය කරන සැලසුම් සහ ක්‍රියාමාර්ග සකස් කිරීමයි. අපේ රටේ ආර්ථිකය මුහුණ දී තිබුණු ප්‍රධානම අර්බුදයක් තමයි ණය අර්බුදය. හැබැයි මේ අවුරුදු 5 ඇතුළත මේ ණය අර්බුදය සමනය වීමට හැකියාවක් ලැබී තිබෙනවාද? එහෙම නැත්නම්, ඒ ණය අර්බුදයේ අපි තව තවත් ගිලී තිබෙනවාද? දැන් අප හමුවේ තිබෙන සංඛ්‍යා දත්ත සොයා බැලුවාම තවත් තීව්‍ර විනාශකාරී අන්තයක් දක්වා මේ ණය අර්බුදය කැඳවාගෙන ගොස් තිබෙන බව පෙනෙනවා.

මෙවර අය වැය ලේඛනයේ සඳහන් කර තිබෙනවා, ආසන්න වශයෙන් රුපියල් බිලියන 2,200 ඉක්මවන ණය මුදලක් නැවත ලබා ගැනීමට සිදු වුණාය, අපේ ණය සහ ණය පොලී වාරිකය වෙනුවෙන් රුපියල් බිලියන 2,200ක් ගෙවිය යුතුව තිබෙනවාය කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආසන්න වශයෙන් රජයේ අනිකුත් සියලු වියදම්වලට සමාන -පොඩ්ඩක් අඩුයි- වියදමක් ණය පොලිය සහ ණය වාරික වෙනුවෙන් අද අපට ගෙවිය යුතුව තිබෙනවා. මේ රාජ්‍යය, මේ පාලකයන් දශක ගණනාවක් මුළුල්ලේ මේ රට පාලනය කරලා, ගොඩ ආ නොහැකි දැවැන්ත ණය අර්බුදයකට මේ රට පත්කරලා තිබෙනවා. එයින් ගොඩ එන මාවතද අද තමුන්නාන්සේලා මේ සකස් කරමින් තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ ණය ලබා ගැනීමත් ව්‍යාපාරයක් -බිස්නස් එකක්- බවට පත් වී තිබෙනවා; මං කොල්ල කෑමක් බවට පත් වී තිබෙනවා. පසුගිය දා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර වෙළෙඳ පොළට නිකුත් කරනු ලැබුවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවුරුදු 5ක් කල් පිරෙන ඩොලර් බිලියනයකුත්, අවුරුදු 10ක් කල් පිරෙන ඩොලර් බිලියන 1.4කුත් ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර නිකුත් කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය දින කිහිපය ඇතුළත අපේ රාජ්‍යය පමණක් නොවෙයි, තවත් රාජ්‍යයනුත් මෙම ජාත්‍යන්තර බැඳුම්කර නිකුත් කර තිබුණා. එහිදී වියට්නාමය නිකුත් කර තිබෙන පොලිය සියයට 4.78යි. තායිලන්තය නිකුත් කර තිබෙන පොලිය සියයට 2.51යි. කඩා වැටෙමින් තිබුණු, කඩා වැටෙනවාය කියලා යුරෝපා සංගමයත් අර්බුදයකට අනතුරු හඟවා තිබුණු ග්‍රීසිය තමන්ගේ ස්වෛරී බැඳුම්කර නිකුත් කර තිබෙන පොලී අනුපාතිකය සියයට 3.84යි. ඒ වාගේම බොස්වානා රට තමන්ගේ බැඳුම්කර නිකුත් කර තිබෙන පොලී අනුපාතිකය සියයට 5.27යි. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ශ්‍රී ලංකා මහ බැංකුව, මේ ආණ්ඩුව අවුරුදු පහක් කල් පිරෙන ස්වෛරී බැඳුම්කර නිකුත් කර තිබෙන පොලී අනුපාතිකය සියයට 6.85යි. ඒ වාගේම අවුරුදු 10ක් කල් පිරෙන ඩොලර් බිලියන 1.4ක ස්වෛරී බැඳුම්කර නිකුත් කර තිබෙනවා.

එහි පොලී අනුපාතිකය සියයට 7.81යි. අද මුදල් අමාත්‍යවරයා හෝ මුදල් රාජ්‍ය අමාත්‍යවරයා මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළ යුතුව තිබෙනවා, මෙවැනි අධික පොලී අනුපාතයකට බැඳුම්කර නිකුත් කිරීමකට හේතු සාධක වුණේ කවරක්ද කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආණ්ඩුවක් තිබෙන්නේ කුමකටද? අනාගතයේ සිදු විය හැකි අනතුරු කලින් උපකල්පනය කොට ඒ සඳහා විසඳුම් ලබා ගැනීමට කලින් සැලසුම් කළ යුතුව තිබෙනවා. එවැනි කිසිදු සැලසුමක් නැතිව ඉබාගාතේ ආර්ථිකය ඇදෙන්නට දීලා, ඉබාගාතේ ණය අර්බුදය වර්ධනය වෙන්නට දීලා, ඉබාගාතේ ණය වෙළෙඳ පොළ වර්ධනය වෙන්නට දීලා මේ ණයවලින් මිදෙන්නට කියා හදිසි ස්වෛරී බැඳුම්කර ජාත්‍යන්තරයට නිකුත් කිරීම හරහා තමයි මේ අර්බුදය නිර්මාණය කරලා තිබෙන්නේ. එය ගෙවිය යුත්තේ මේ රටේ ජනතාව. ඒ බර දැරිය යුත්තේ මේ රටේ ජනතාව. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම නිසා මෙවැනි අධික පොලී අනුපාතිකයකට මෙම ස්වෛරී බැඳුම්කර නිකුත් කළේ ඇයි කියලා ආණ්ඩුවේ මුදල් අමාත්‍යවරයා අද මේ පාර්ලිමේන්තුවට පැහැදිලි කරන්නට ඕනෑ. තායිලන්තයට, වියට්නාමයට, ග්‍රීසියට, -කඩා වැටෙමින් තිබෙන ග්‍රීසියටත් වඩා- වඩා අධික පොලී අනුපාතිකයකට ස්වෛරී බැඳුම්කර නිකුත් කළේ ඇයි? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම කිව්වේ ඒකයි. අතිශය සැක කටයුතු ගනුදෙනු ලෙස තමයි අද මේ ණය ගැනීම් පෙනෙන්නේ.

2015 පෙබරවාරි මාසයේ 27වෙනි දා සුප්‍රකට බැඳුම්කර ගනුදෙනුව හා සමාන බරපතළ වංචාවක් මේ තුළ සිදු වී ඇති බව හරිම පැහැදිලියි. එම නිසා මේ හානිය පිළිබඳව ආණ්ඩුව මේ රටේ ජනතාවට කරුණු පැහැදිලි කළ යුතුව තිබෙනවා. එය මේ රටේ මුළු පොලී අනුපාතිකයටම අහිතකර බලපෑම් ඇති කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කෘෂි කර්මාන්තය සඳහා, තමන්ගේ කුඩා ව්‍යාපාර සඳහා, තමන්ගේ නිවස ඉදි කර ගැනීම සඳහා වැනි කටයුත්තකට කවර හෝ ණය මුදලක් අරගෙන තිබෙනවා නම් ඒ සියලු පොලී අනුපාතිකයන්ට මේ හරහා අහිතකර බලපෑම් ඇති කරනු ලබනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් දීර්ඝ ලෙස අපේ රට ණය අර්බුදයක හෙළුවා හැරුණු කොට ඒ ණය අර්බුදයෙන් ගොඩ ඒම සඳහා සැලැස්මක් සකස් කර ගන්නට බැරි වුණු අවුරුදු පහක් ලෙස තමයි මේ අවුරුදු පහ ගතවෙමින් තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍යයක් හැටියට අපට ණය අර්බුදයක් තිබෙනවා විතරක් නොවෙයි, ජනතාවක් හැටියට ගත්තත් අද ග්‍රාමීය ජනතාව මුහුණ දී තිබෙන ප්‍රධානම ගැටලුව ග්‍රාමීය ණයගැති භාවයයි. අද යාපනය දිස්ත්‍රික්කයේ සිය දිවි හානි කර ගන්නා අයගෙන් වැඩිම ප්‍රමාණයක් සිය දිවි හානි කර ගැනීම කරන්නේ ගත් ණය ගෙවා ගන්නට බැරිවයි. එම නිසා ආණ්ඩුවක් හැටියට සැලසුම් සකස් කළ යුතුව තිබෙන්නේ කුමන දිශාවටද? ග්‍රාමීය ජනතාව අත්පත් කරගෙන තිබෙන ග්‍රාමීය ණයගැති භාවය සියදිවි හානි කර ගැනීම දක්වා වර්ධනය වී තිබෙනවා. ග්‍රාමීය ජනතාවගේ ජීවිත කඩා වැටෙමින් තිබෙනවා; දේපොළ අහිමි වෙමින් තිබෙනවා; උගස් භාණ්ඩ සින්නවෙමින් තිබෙනවා; උගස් කරන ලද දේපොළ සින්නවෙමින් තිබෙනවා. විශාල ග්‍රාමීය ණයගැති භාවයකට අපේ රටේ ජනතාව මුහුණ දී තිබෙනවා. ආණ්ඩුව සැලසුම් සකස් කළ යුතුව තිබුණා, මේ ග්‍රාමීය ණයගැති භාවයෙන් අපේ රටේ ජනතාව මුදවා ගන්නේ කොහොමද කියලා. හැබැයි, මේ අය වැය ලේඛනයේ ඇතුළත් වී තිබෙන්නේ ග්‍රාමීය ජනතාව යළි යළිත් එම ණය උගුලේ හිර කිරීමේ දිසාවට අවශ්‍ය වෙන යෝජනායි. ඒ අනුව, ජනතාවට ග්‍රාමීය ණයගැති භාවයෙන් මිදීමට අවශ්‍ය සැලසුමක් ඉදිරිපත් කරන්නට මේ අය වැය ලේඛනය අසමත් වී තිබෙනවා.

දැන් අපි කෘෂිකර්මාන්තය ගැන බලමු. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ශ්‍රම බලකායෙන් සියයට 28.4ක් නිරත වෙන්නේ කෘෂි කර්මාන්තයේයි. ඔබතුමා නියෝජනය කරන මොනරාගල දිස්ත්‍රික්කයේ සියයට 80කගේ පමණ ප්‍රධාන ජීවිකාව බවට පත් වී තිබෙන්නේ කෘෂි කර්මාන්තයයි. අපේ රටේ ශ්‍රම බලකායෙන් සියයට 28.4ක්, -හතරෙන් පංගුවකට වඩා වැඩි ප්‍රමාණයක්- නියැලී ඉන්නේ කෘෂි කර්මාන්තයේයි. හැබැයි, ඔවුන් අපේ ජාතික ධනයට, ජාතික ආදායමට එකතු කරන්නේ 7.2ක වාගේ කුඩා ප්‍රතිශතයක්. සියයට 28.4ක ශ්‍රම බලකායක් රටේ ජාතික ධනයට එකතු කරන්නේ දළ දේශීය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස 7.2ක් වැනි ප්‍රමාණයක්. එය කිසිසේත්ම එම ජනතාවගේ ජීවිතය නඟා සිටුවීම සඳහා ප්‍රමාණවත් ආදායමක් බවට පරිවර්තනය වෙන්නේ නැහැ. ඔවුන්ගේ කෘෂි කර්මාන්තය තමන් වපුරන ශ්‍රමයට සරිලන ලෙස නිෂ්පාදනයක් අත්පත් කර දෙන්නේ නැත්නම් එය ඔවුන්ගේ ජීවිතය ඉස්සරහාට ගෙන යන්න පුළුවන් ආධාරකයක් බවට පත් වෙන්නේ නැහැ. එම නිසා කෘෂි කර්මාන්තයේ මේ තිබෙන අර්බුදය විසඳීම සඳහා සැලසුම් සකස් කළ යුතුව තිබුණා. ඒ සැලසුම් කොහේද තිබෙන්නේ? කෘෂි කර්මාන්තය පිළිබඳව කිසිදු ප්‍රගතිගාමී අදහසක් නැති අය වැය ලේඛනයක් බවට මේ අය වැය ලේඛනය පත් වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම අද වෙනකොට අපේ රටේ ආහාර සුරක්ෂිත භාවය බරපතළ අනතුරකට පත් වී තිබෙනවා. අපට අත්‍යවශ්‍ය ආහාර වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් බිලියන 1.8ක්, ආසන්න වශයෙන් අපේ මුළු ආනයන වියදම්වලින් සියයට 10ක් පමණ වැය කරන්නට සිදු වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහිදී එළවලු ආනයනය වෙනුවෙන් ඩොලර් මිලියන 369ක්, කිරි සහ කිරි ආශ්‍රිත ආහාර ආනයනය වෙනුවෙන් ඩොලර් මිලියන 319ක් ආදි වශයෙන් අධික ලෙස ආහාර ආනයනයකට යොමු වූ රාජ්‍යයක් බවට මේ රට පත් වී තිබෙනවා. එම නිසා මේ රටේ ආහාර සුරක්ෂිතභාවය පිළිබඳව සැලකිල්ලට ලක් කළ යුතුව තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගොවියාට තමන්ගේ නිෂ්පාදන සඳහා සාධාරණ මිලක් ලබා දෙන්නේ කොහොමද, පාරිභෝගිකයාට ස්ථාවර මිලක් සකස් කරන්නේ කොහොමද? ඒකට තමයි ආණ්ඩුවක් තිබෙන්නේ. පොළොන්නරුවේ ලූනු අස්වැන්න නෙළන ගොවියාගේ ලූනු ටික කොළඹ ජීවත් වන පාරිභෝගිකයාට ස්ථාවර මිලකට ලබා දෙන්නේ කොහොමද? මොනරාගල ජීවත් වන ගොවියාට සාධාරණ මිලක් ලබා දෙන්නේ කොහොමද? එයට මැදිහත් වීම සඳහා ආණ්ඩුවට සැලසුම් තිබිය යුතුයි. මෙය, ඒ කිසිදු සැලැස්මක්, දැක්මක් පිළිබඳව සඳහන්ව නොමැති අය වැය ලේඛනයක්. ඒ වාගේම, පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්ගේ, වතු අංශයේ වැඩ කරන ජනතාවගේ, ධීවර අංශයේ ජනතාවගේ ජීවිත ඉදිරියට ගෙන යෑම සඳහා දැක්මක් හෝ සැලැස්මක් නොමැති අය වැය ලේඛනයක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව නැවත නැවතත් උත්සාහ කරමින් තිබෙන්නේ, අපේ රට මේ ගමන් කරමින් තිබෙන වැරැදි ආර්ථික ප්‍රතිපත්තියේ දිශාවටම යළි යළි දොරටු විවෘත කිරීමටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පුද්ගලයකු හැටියට ගත්තොත් මම මේ පාර්ලිමේන්තුවේ අය වැය ලේඛන 20ක විවාදවලට සහභාගි වී තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආපසු හැරී බැලුවාම අපට තේරෙනවා, මේ අවුරුදු 20 තුළ ඵලදායි ලෙස, සැලසුම්සහගතව අපේ රටේ ආර්ථිකය මෙහෙයවූවා නම් 2000 වර්ෂයට වඩා අද වන විට ආර්ථිකය කවර ඉමක් දක්වා ගෙන යන්න අපට පුළුවන්කම තිබුණාද කියලා. හැබැයි අපේ ජීවිත කාලයේ, අපේ මේ පාර්ලිමේන්තු කාලයේ අප අත් විඳිමින් තිබෙන්නේ කුමක්ද? හැම

[ගරු අනුර දිසානායක මහතා]

අය වැය ලේඛනයක්ම ඉදිරිපත් කරන කොට ඒ ඒ ආණ්ඩුවල අමාත්‍යවරු ඉතාම බොළඳ ලෙස, හර සුන් ලෙස ඒ ඒ නිශ්චිත මොහොතේ ජනතාවට යමක් ලබා දෙන්න උත්සාහ දරනවා හැරුණු කොට දිගු කාලීනව ආර්ථික සැලැස්මක් සහිතව රට මෙහෙයවන්න අසමත් වී තිබෙනවා. එසේ අසමත් වීමේ ප්‍රතිඵලය කුමක්ද? 2000 වර්ෂයේදී අප මේ පාර්ලිමේන්තුවේ කතා කරන කොට අපේ රටේ පැවැති ආර්ථිකයේ ස්වභාවයත්, 2019 වර්ෂය සඳහා අය වැය ලේඛනය ඉදිරිපත් කරන විට තිබෙන ස්වභාවයත් ගත්තොත්, ඉදිරිගාමී දිශාවට යනවා වෙනුවට ඉතාම පසුගාමී, කඩා වැටුණු ආර්ථිකයක් අපි නිර්මාණය කර දී තිබෙනවා. ඒ නිසා මේ ආර්ථික උගුලෙන්, තමුන්නාන්සේලා අවුරුදු ගණනාවක් තිස්සේ අනුගමනය කරමින් තිබෙන වැරැදි දිශානතියක් සහිත ආර්ථික ගමනෙන්, තීරණාත්මක ලෙස මේ රට මුදා ගන්න සමත් වන්නේ නැත්නම් මේ ආර්ථික අර්බුදය තවදුරටත් තීව්‍රතාවකින් යුතුව වර්ධනය වනවා හැරුණු විට එය සමනය නොවන බව නම් ඉතාම පැහැදිලියි. අපි අපේ රටේ නිෂ්පාදනය ඉස්සරහට ගන්නේ කොහොමද? අපි අපේ රටේ නිෂ්පාදකයා ආරක්ෂා කර ගන්නේ කොහොමද? අපි අපේ රටේ නිෂ්පාදකයා ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන නීති පද්ධතිය සකස් කරන්නේ කොහොමද? හැබැයි මංගල සමරවීර අමාත්‍යවරයා අය වැය ලේඛනය ඉදිරිපත් කරන විට ඉතාම හර බරව සහ වටිනා ලෙස ඉදිරිපත් කළ අදහස තමයි, අපේ රටේ ආණ්ඩුව තවදුරටත් ලිහිල්කරණ ප්‍රතිපත්තියේ තමයි ඉදිරියට යන්නේ කියන එක. මේ ලිහිල්කරණ ප්‍රතිපත්තිය අවුරුදු 40කට වඩා වැඩි කාලයක් ගත කරමින් තිබෙනවා. මේ ලිහිල්කරණ ප්‍රතිපත්තිය අපට අත් පත් කර දී තිබෙන්නේ ආර්ථික වශයෙන් අතිශය විනාශකාරී, කටුක අත්දැකීම්. ඒ නිසා තීරණාත්මක ලෙස ආර්ථිකය නව දිශාවකට මෙහෙයවීම සඳහා දැක්මක් හෝ වුවමනාවක් මේ පාලකයන්ට නොමැති බව පැහැදිලියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් තිබෙනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රට ගමන් කරමින් තිබෙන ආර්ථික උපාය මාර්ගය වෙනස් කිරීමේ දිශාවට හැරෙන්නේ නැතිව මේ රටේ ජනතාවට සේවා සපයන්නේ කොහොමද? අද අපේ රටේ ප්‍රවාහන සේවයෙහි විශාල අර්බුදයක් නිර්මාණය වී තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජනතාවට තමන්ගේ කාලයෙන් වැඩි කාලයක් බස් රථයේ, දුම්රියේ ගත කරන්න සිදු වී තිබෙනවා. එන්න එන්න ඒ කාලය අඩු වනවාද, වැඩි වනවාද? 2000 වර්ෂයේ තිබුණාට වඩා අද මිනිසුන් බස් එකේ සිටින කාලය වැඩි වී තිබෙනවා; 2000 වර්ෂයේ තිබුණාට වඩා අද මිනිසුන් දුම්රියේ සිටින කාලය වැඩි වී තිබෙනවා. 2000 වර්ෂයේ තිබුණාට වඩා අද මිනිසුන්ට මහ මඟ රස්තියාදු වීමට සිදුව තිබෙන කාලය වැඩි වී තිබෙනවා. සැබෑ සංවර්ධනය නම්, මේ සේවා හරහා ජනතාවට ප්‍රතිලාභ ලැබිය යුතුයි. නමුත්, කවර සේවාද ලැබී තිබෙන්නේ?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල් අධ්‍යාපනය ගෙන බලන්න. දැන් සමීක්ෂණවලින් ඔප්පු වී තිබෙනවා, අ.පො.ස. උසස් පෙළ හදාරන සෑම දරුවකු වෙනුවෙන්ම පවුලකට ආසන්න වශයෙන් රුපියල් 13,000ක වැය බරක් දරන්න සිදු වී තිබෙනවා කියලා. දරුවාට ඉගැන්වීම සඳහා විශාල වැය බරක් දරන්න පවුලකට සිදු වී තිබෙනවා. අද අධ්‍යාපනය පාසල් අධ්‍යාපනය එළියෙන් ගන්න සිදු වී තිබෙනවා. පාසල් අධ්‍යාපනය විශාල කඩා වැටීමකට භාජන වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2017 වසර ගෙන බලන්න. 2017 වසරේ පළමු වසරට එකම ළමයකුවත් ඇතුළත් නොවුණු පාසල් 433ක් තිබෙනවා. පළමුවන වසරට එක ළමයකු විතරක් ඇතුළත් වූ පාසල් 137ක් තිබෙනවා. පළමුවන වසරට ළමයින් දෙදෙනකු ඇතුළත් වූ පාසල් 138ක් තිබෙනවා. එහෙම තත්ත්වයක් තිබෙන අතරේ පාසල් 36කට ඉල්ලුම් පත්‍ර ලක්ෂයක් එනවා. මේ අර්බුදයට විසඳුම් සොයා තිබෙනවාද? මේ අර්බුදයට තිබෙන විසඳුම කවරක්ද? අපේ රටේ පාසල් පද්ධතිය නවීකරණය කරලා පාසලේ අධ්‍යාපනය කෙරේ දරුවන් තුළ තිබෙන විශ්වාසය සහතික කිරීම සඳහා පාසල් අධ්‍යාපනය සේවාවක් හැටියට වර්ධනය කළ යුතුව තිබෙනවා. ප්‍රවාහනය සේවාවක් හැටියට වර්ධනය කළ යුතුව තිබෙනවා. සෞඛ්‍යය සේවාවක් හැටියට වර්ධනය කළ යුතුව තිබෙනවා. ආර්ථිකය සැබැවින්ම වර්ධනය වනවා නම්, ජනතාවට තමන්ගේ සේවා ඉතාම කාර්යක්ෂමව සහ පහසුවෙන් ලබා ගැනීමේ හැකියාව තිබෙන්න ඕනෑ.

ඒ කිසිවක් ඇතිකොට නැහැ. ඒ නිසා ආර්ථිකය තවතවත් තීව්‍ර කරන, අර්බුදයකට ගෙනෙන පාලනයක් හා දැක්මක් හැරුණු විට, වෙන විකල්ප ආර්ථික උපාය මාර්ගයක් හෝ සැලැස්මක් මේ පාලන සමයේ ආණ්ඩුවට නොමැති බව තමයි මෙම අය වැය ලේඛනයෙනුත් පෙන්නුම් කරමින් තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මට මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පස් වරු 1.30 දක්වා සභාවේ වැඩ කටයුතු තාවකාලිකව අත්හිටුවනවා.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ.භා. 1.30ට නියෝජ්‍ය කාරක සභාපතිතුමා (ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා)ගේ සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.30 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.30 p.m. and then resumed,* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *in the Chair.*

[பி.ப. 1.31]

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, 2019ஆம் ஆண்டுக்கான வரவு செலவுத் திட்டம் தொடர்பில் எனது கருத்துக்களையும் தெரிவிப்பதற்கு வாய்ப்பு வழங்கியமை குறித்து முதலில் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன்.

எமது மக்கள் எட்ட நின்று பார்வையார்களாகப் பார்த்துவிட்டு, ஒரு பெருமூச்சினை வெளிப்படுத்திவிட்டுச் செல்லக்கூடிய வெறும் வரைபுகளாக மாத்திரமே இந்த நாட்டின் வரவு செலவுத் திட்டங்கள் காணப்படுகின்றனவே

தவிர, அவற்றின் மூலமாகக் கூறப்படுகின்ற விடயங்களின் நடைமுறைச் சாத்தியம் என்பது வெறும் பூச்சிய நிலையில் இருந்து வருவதாகவே எமது மக்களால் தொடர்ந்தும் கணிக்கப்பெற்று வருவதை நான் இந்தச் சந்தர்ப்பத்திலே குறிப்பிட்டாக வேண்டும்.

குறிப்பாக, கடந்த வருடம் நாடாளுமன்றத்தில் சமர்ப்பிக்கப் பட்ட வரவு செலவுத்திட்ட வரைபிலே 'நல்லிணக்கம்' என்ற தலைப்பின்கீழ் வடக்கு, கிழக்கு சார்ந்து கிட்டத்தட்ட 20 விடயங்கள் குறிப்பிடப்பட்டிருந்தன. இந்த 20 விடயங்களில் கடந்த ஆண்டு அல்லது இதுவரையில் எந்தெந்த விடயங்கள் நடைமுறைப்படுத்தப்பட்டு, நிறைவேற்றப்பட்டுள்ளன என்ற கேள்வி எமது மக்களிடையே எழுகின்றது. வடக்கு, கிழக்கு மாகாணங்களில் செங்கல் மற்றும் ஓடுகள் கொண்ட 50,000 வீடுகள் அமைக்கப்படும் எனக் கூறப்பட்டது. அப்படி ஏதேனும் வீடுகள் அமைக்கப்பட்டனவா என்பது பற்றி எமது மக்களுக்குத் தெரியாது. இம்முறை வரவு செலவுத் திட்டத்தில் 'நல்லிணக்கம்' எனும் தலைப்பிலிருந்து 'சமூகப் பராமரிப்பு முன்னெடுப்புகள்' என்ற தலைப்புக்கு மாற்றி, 2019ஆம் ஆண்டு வடக்கு, கிழக்கு மாகாணங்களில் 15 ஆயிரம் செங்கற்களினாலான வீடுகளின் நிர்மாணப் பணிகள் ஆரம்பிக்கப்படும் என்றும் இதற்காக 4,500 மில்லியன் ரூபாய் ஏற்கனவே ஒதுக்கப்பட்டுள்ளது என்றும் மேலும் 5,500 மில்லியன் ரூபாய் பெற்றுக் கொடுக்கப்படும் என்றும் குறிப்பிடப்பட்டுள்ளது. இந்த நிலையில் வடக்கு, கிழக்கில் வீடமைப்புத் திட்டத்தினை மேற்கொள்வதற்கெனத் திறைசேரியில் நிதி இல்லை என்றே கடந்த பல மாதங்களாகக் கூறப்பட்டு வந்துள்ள நிலையில், ஏற்கனவே ஒதுக்கப் பட்டுள்ளதாகக் கூறப்படுகின்ற அந்த 4,500 மில்லியன் ரூபாய் எங்கே இருக்கின்றது என்ற கேள்வி எழுகின்றது. அதேநேரம், இங்கே பிரஸ்தாபிக்கப்பட்டுள்ள 'ஹோம் ஸ்வீட் ஹோம்', 'சிஹின மாளிகா' - 'கனவு மாளிகை' போன்ற வீடமைப்புக் கடன் திட்டத்தைப்போல், யுத்தம் காரணமாக இடம்பெயர்ந்து பாதிக்கப்பட்டுள்ள மக்களுக்கும் தேசிய வீடமைப்பு அதிகாரசபையின் ஊடாகவோ அல்லது வேறு ஏதாவது அரச நிறுவனங்களின் ஊடாகவோ வீடமைப்புக் கடன் திட்டத்தை இரட்டிப்பாக வழங்கக்கூடிய வழிவகைகள் தொடர்பில் ஆராய்வதும் எமது மக்களுக்கு வசதியாக அமையும் என்பதையும் இங்கு நான் சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

நுண்கடன் பிரச்சினை காரணமாக மிகுந்த பாதிப்புக்களை எதிர்நோக்கியிருக்கின்ற பெண்களை அப்பிரச்சினையிலிருந்து மீட்டெடுப்பது தொடர்பில் கடந்த வரவு செலவுத்திட்ட வரைபில் பிரஸ்தாபிக்கப்பட்டிருந்தது. கிராமியக் கூட்டுறவு வங்கிகள், சேமிப்பு மற்றும் கடன் கூட்டுறவுச் சங்கங்களின் ஊடாக இவர்களைக் கடன் பொறியிலிருந்து மீட்பதற்கான குறைந்த வட்டியிலான கடன் திட்டம் ஒன்று வடக்கு மற்றும் வட மத்திய மாகாணங்களில் முன்னோடியாக ஆரம்பிக்கப்படும் எனக் கூறப்பட்டது. அது எந்தளவுக்குச் சாத்திமானது என்பதற்கு எவ்விதமான பெறுபேறுகளையும் மேற்படி கடன் சுமைகளுக்கு ஆளானோர் மத்தியில் காணக்கூடியதாக இல்லாத நிலையில், இம்முறையும் படுகடன் நிவாரணத் திட்டமானது கூட்டுறவு, கிராமிய வங்கிகள் மற்றும் சிக்கனக் கடன் கூட்டுறவுச் சங்கங்களின் ஊடாகத் தொடர்ந்து முன்னெடுக்கப்படும் எனக் குறிப்பிடப்பட்டுள்ளது.

மேற்படி நுண்கடன் சுமை காரணமாகப் பாதிக்கப்பட்டுள்ள மக்களுக்கு மேலும் கடன்களை வழங்கி அதற்கான நிவாரணங்களை வழங்குவது என்பது 'மரத்திலிருந்து விழுந்தவனை மாடேறி மிதித்த கதை'யாகவே அமையும் என்பதை நான் ஏற்கனவே சுட்டிக்காட்டியிருந்தேன். மத்திய வங்கியின் கண்காணிப்பு ஏற்பாடுகள் வலுவுள்ளதாக அமைந்திருப்பின் இத்தகைய நிதி நிறுவனங்களால் இம்மக்கள் இந்தளவு பாதிப்புகளை எதிர்நோக்கியிருக்க மாட்டார்கள். இந்த நிலையில், ஐக்கிய நாடுகள் சபையின் பிரதிநிதி Pablo Bohoslavsky என்பவர் அரசாங்கத்தினால் கடுமையானதும் உறுதியானதுமான கட்டளைக் கட்டமைப்பொன்று உருவாக்கப்படும் வரையில் நுண்கடன்களை மீளச் செலுத்து வதைத் தற்காலிகமாக இடைநிறுத்துமாறு அறிவிப் பொன்றினை இலங்கை அரசு விடுக்க வேண்டுமெனக் குறிப்பிட்டுள்ளார் எனத் தெரிய வருகின்றது. ஐக்கிய நாடுகள் கவுன்ஸிலின் 40வது அமர்வில் அவர் சமர்ப்பித்துள்ள அறிக்கையில், அதிக வட்டியுடன்கூடிய நுண்கடன்களை வலுவிழக்கச் செய்து, தாம் இதுவரை செலுத்திய நிதியினை இழப்பீடு என்ற வகையில் கோருவதற்கு பாதிக்கப் பட்டோருக்குச் சந்தர்ப்பம் வழங்கப்பட வேண்டும் என்றும் அரச வங்கிகள் தமது நிவாரண ரீதியிலான கடன் வழங்கல்களை விரிவுபடுத்த வேண்டும் என்றும் அதில் குறிப்பிடப்பட்டுள்ளதாக மேலும் தெரிய வருகின்றது. இது இந்த நுண்கடன் பிரச்சினைக்குச் சிறந்த ஒரு தீர்வாக அமையுமென்றே கருதுகின்றேன். வேண்டுமானால் மேற்படி நிதி நிறுவனங்கள் பாதிப்படையாத வகையில் நியாயமான ஒரு பொறிமுறையினை ஏற்படுத்தவும் முடியும். குறிப்பாக, நிதி நிறுவனங்களால் வழங்கப்பட்டுள்ள கடன் தொகைகளுக்கு எமது மக்களால் தாங்கிக்கொள்ளக்கூடிய ஒரு நியாயமான வட்டியினை உறுதி செய்து, கடனுடன் சேர்த்து அதனை அறவிட்டுக் கொள்வதற்கும் அதனை மீறிய வகையில் அறவீடுகள் இடம்பெற்றிருக்கின்ற நிலையில், அத்தொகை யினை பாதிக்கப்பட்டோருக்கு மீள வழங்குவதற்கும் நடவடிக்கை எடுக்க இயலும். இதனைக் கடன் செலுத்தியோருக்கும் செலுத்த இருப்போருக்குமான ஏற்பாடாக முன்னெடுக்க வேண்டும். அதேநேரம், கடன்களைச் செலுத்தவேண்டி இருப்போரில் கடன்களைச் செலுத்த இயலாத நிலையில் இருப்போருக்கென ஒரு நிவாரணத் திட்டம் கொண்டுவரப்பட்டு, அவர்களது கடன்களை அரசு ஏற்கக்கூடிய ஓர் ஏற்பாடும் அவசியமாகும் என்பதை இங்கு வலியுறுத்த விரும்புகின்றேன்.

அடுத்ததாக, நெடுந்தீவு மற்றும் கிளிநொச்சிப் பகுதிகளில் உணவு பதனிடும் நிலையங்கள் அமைப்பதாகக் கடந்த வரவு செலவுத் திட்டத்தில் குறிப்பிடப்பட்டது. அது எந்தவகையில் சாத்தியமாயிற்று என்பது தெரியவில்லை. அச்சுவேலிக் கைத்தொழிற் பேட்டையின் அபிவிருத்தி தொடர்பில் பிரஸ்தாபிக்கப்பட்டது. மேற்படி கைத்தொழிற்பேட்டைக்குச் செல்கின்ற பாதை இன்னமும் மிகுந்த பாதிப்புகளுக்கு உட்பட்டே காணப்படுகின்றது. யாழ்ப்பாணத்தில் நவீன பொருளாதார மையமொன்று ஆரம்பிக்கப்படுமெனக் குறிப்பிடப்பட்டது. அதன் நிலைமை என்னவென்று தெரியவில்லை. ஆனால், இம்முறையும், மத்திய பொருளாதார மையமொன்றுடன் இணைக்கப்பட்ட 10 துணைப் பொருளாதார நிலையங்கள் வடக்கு, கிழக்கு மாகாணங்களில் உருவாக்கப்படும் என்றும் மேலும், காங்கேன்துறை, மாந்தை கிழக்கு, பரந்தன், கொண்டச்சி, கிண்ணியா, சம்மாந்துறை, திருகோணமலையில் கைத்தொழிற் பேட்டைகள் அமைக்கப் படவுள்ளதாகவும் குறிப்பிடப்பட்டுள்ளது.

கடந்த வரவு செலவுத்திட்டத்தில் யுத்தம் மற்றும் இன முறுகலினால் பாதிக்கப்பட்ட, கணவன்மாரை இழந்த பெண்களுக்கும், முன்னாள் இயக்க உறுப்பினர்களுக்கும் வாழ்வாதார உதவிகள் வழங்கப்படுமெனக் குறிப்பிட்டப் பட்டிருந்தது. புனர்வாழ்வளிக்கப்பட்ட முன்னாள் இயக்க உறுப்பினர்களில் வாழ்வாதார வசதிகள் இல்லாதோருக்கு அவர்களது திறன்களின் அடிப்படையில் தேசிய தொழில்சார்

[ගරු ඩග්ලස් දේවානන්දා මහතා]

தகைமைச் சான்றிதழ்கள் வழங்கப்படுமென்றும் இதற்கென நடமாடும் சேவை ஒன்று ஆரம்பிக்கப்படும் என்றும் கூறப்பட்டது. அதன் நிலைமை என்னவென்று தெரியவில்லை. மேலும், குறைந்தபட்சம் 5 முன்னாள் இயக்க உறுப்பினர் களைத் தொழிலுக்காகச் சேர்த்துக் கொள்கின்ற தனியார் நிறுவனங்களுக்கு தொழிலாளர் ஒருவருக்கு தலா 10,000 ரூபா வீதம் 50 வீதமான ஊதிய மானியம் பெற்றுக் கொடுக்கப்படும் எனவும் கூறப்பட்டது. இவை எல்லாம் எந்தளவுக்குச் சாத்தியமான செயற்பாடுகளாகச் சமூகத்தில் நடைமுறைப் படுத்தப்பட்டுள்ளன என்பது இன்னமும் கேள்விக்குறியாகவே இருக்கின்றது.

தாங்கள் கூறித்தான் கடந்த வரவு செலவுத்திட்டத்தில் வடக்கு, கிழக்கு தொடர்பில் பல்வேறு விடயங்கள் உள்ளடக் கப்பட்டன எனக் கூறி, இந்த ஆட்சியைக் கொண்டுவந்ததாக மார்தட்டிக்கொண்டு வந்த தமிழ்த் தரப்பினர், உள்ளடக்கப் பட்ட விடயங்கள் செயற்படுத்தப்பட்டனவா? என்பது தொடர்பில் அக்கறையின்றி மௌனமாகவே இருந்துவிட்டு, இந்த முறை வரவு செலவுத் திட்டத்தையும் நம்புகின்றோம் எனக் கூறிக்கொண்டிருக்கிறார்கள். அந்த வகையில் பார்க்கின்றபோது வரவு செலவுத்திட்ட வரைவுகளும், இந்தத் தமிழ்த் தரப்பு அரசியல்வாதிகளும் எமது மக்களைப் பொறுத்தவரையில் ஒன்றே என்றுதான் தெரிய வருகின்றது. அதாவது, வெறும் வாய்ப்பேச்சு மாத்திரம்தான். அதுவன்றி செயலில் ஒன்றுமே இல்லை!

அதேநேரம், இம்முறை வரவு செலவுத் திட்டத்தினூடாகத் தோட்டத்தொழிலாளர்களது நாளாந்த ஊதியத்திற்கென 50 ரூபாய் ஒதுக்கப்படுமெனக் கூறப்பட்டு வந்துள்ள நிலையில், தோட்டத் தொழிலாளர்களது ஊதியப் பிரச்சினைக்குத் தேயிலைச் சபையுடன் கலந்துரையாடி, உடனடித் தீர்வு எட்டப்படுமெனக் குறிப்பிட்டுள்ளதுடன் வேறு எவ்விதமான குறிப்புகளும் அது தொடர்பில் இல்லை.

அத்துடன், "பனை நிதியம்" என்றதொரு விடயம் இம்முறை உள்ளடக்கப்பட்டுள்ளது. இதற்கென 2,500 மில்லியன் ரூபாய் முன்மொழியப்பட்டுள்ளதாகத் தெரிவிக்கப்பட்டுள்ளது. இதற்குப் பங்களிப்புச் செய்யுமாறு நலன்விரும்பிகள், கொடை வள்ளல்கள் மற்றும் விசேஷமாக புலம்பெயர் மக்கள் ஆகியோருக்கு அழைப்பும் விடுக்கப்பட்டுள்ளது. இந்த நிலையில், இச்செயற்பாடானது நிலைபேற்றைக் கொண்டதா? என்றொரு சந்தேகத்தையே ஏற்படுத்துவதாக உள்ளது. இத்தகையதொரு நிதியம் திறைசேரியினால் நிர்வகிக்கப் படுகின்ற நிலையில், இதற்குப் பங்களிப்பு வழங்குவதற்கென எவரும் முன்வருவார்களா? என்பது சந்தேகமாகவே இருக்கின்றது.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் ஒரு நிமிடம் இருக்கின்றது.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நான் மேலதிகமாக மூன்று நிமிடங்கள் கேட்டேன். மொத்தம் 12 நிமிடங்கள் ஒதுக்கப்பட்டன. என்னுடைய நேரக் கணிப்பின்படி இன்னும் இரண்டு நிமிடங்கள் இருக்கின்றன.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
உங்களுக்கு 12 நிமிடங்கள்தான் ஒதுக்கப்பட்டிருக்கின்றன.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
ஆம்! எனக்கு இன்னும் இரண்டு நிமிடங்களை கூடுதலாகத் தருமாறு கேட்டுக்கொள்கின்றேன்.

ஏற்கெனவே வடக்கு, கிழக்கு மாகாணங்களின் வீடமைப்புத் திட்டத்திற்கென ஒதுக்கப்பட்டதாகக் கூறப்பட்ட நிதியே இல்லை எனத் திறைசேரி தெரிவித்ததாகக் கூறப்பட்ட நிலையில், இது ஒரு கேள்விக்குறியான நிலைமையிலேயே காணப்படுகின்றது என்பதால், இத்திட்டத்தின்கீழான ஏற்பாடுகள் தொடர்பில் நாம் பொறுத்திருந்தே பார்க்க வேண்டியுள்ளது. அதேநேரம், "பனை நிதியம்" என்கின்ற பெயர் எமது பகுதியினை அடையாளப்படுத்துவதாக அமைந்திருப்பது வரவேற்கத்தக்கது. எனினும், பனை வளத் தொழில் சார்ந்த மக்களின் வாழ்வாதாரங்களை உயர்த்துகின்ற திட்டங்களும் அதில் உள்ளடக்கப்பட்டிருக்க வேண்டும். இத்தகைய ஏற்பாடுகள் மாகாண ரீதியில் நிர்வகிக்கப்படக் கூடிய நிலைமைகளைக் கொண்டிருப்பின், அவற்றுக்கான பங்களிப்புகளைச் சமூகம் சார்ந்த பலரிடமும் எதிர்பார்க்கக் கூடியதாக இருக்கும்.

அடுத்து, நல்லிணக்கம் தொடர்பில் கடந்த பல வருடங்களாகப் பிரஸ்தாபிக்கப்பட்டு, அதற்கென பல்வேறு நிதி ஒதுக்கீடுகளும் மேற்கொள்ளப்பட்டு வருவதாகக் கூறப்படுகின்றது. இந்தச் செயற்றிட்டங்களினூடாக இன்று இந்த நாட்டில் நல்லிணக்கம் என்பது எந்தளவுக்கு வலுப்பெற்றுள்ளது? என்பது கேள்விக்குறியேயாகும். அந்த நிலையில், இங்கே பிரதமரின்கீழ் இயங்கும் நல்லிணக்கப் பொறிமுறை ஒருங்கிணைப்புச் செயலகத்தின்மூலமாக விழிப்புணர்வு மற்றும் தெளிவுபடுத்தல் நிகழ்ச்சிக்காக 200 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டுள்ளதாகக் குறிப்பிடப் படுகின்றது. அதேநேரம், கலை மற்றும் கலாசாரத்தினூடான சமாதானத்திற்கான நிகழ்ச்சித்திட்டம் எனக் கூறப்பட்டு, மேலுமொரு தொகை நிதி தேசிய ஒருமைப்பாடு மற்றும் நல்லிணக்கத்திற்கான அலுவலகத்திற்கு ஒதுக்கப் பட்டுள்ளதாகக் குறிப்பிடப்பட்டுள்ளது. அதேநேரம், வடக்கு மாகாணத்தில் நிலைபேறான வாழ்வாதாரத்தினை ஏற்படுத்தவும், நல்லிணக்கத்தினை உறுதிப்படுத்தவும் "கடந்த காலத்தை மறப்போம் - எதிர்காலத்தைக் கட்டியெழுப்புவோம்" என்றதொரு திட்டம் தொடர்பில் கூறப்பட்டுள்ளது.

கடந்த காலத்திலிருந்து இந்த நாடு பாடம் படித்துக் கொள்ளாத நிலையிலே, கடந்த காலத்தை மறப்போம் என்பதை எமது மக்கள் ஏற்றுக்கொள்ளப்போவதில்லை என்பதையே நான் இங்கு சுட்டிக்காட்ட வேண்டியுள்ளது. இந்த நாட்டில் கடந்த காலங்களில் இடம்பெற்றுள்ள பாதிப்புகள் தொடர்பில் பல்வேறு ஆணைக்குழுக்கள் அமைக்கப்பட்டு, பல்வேறு பரிந்துரைகள் முன்வைக்கப்பட்டுள்ளன.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களது உரையை முடித்துக்கொள்ள வேண்டும்.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)
நன்றி! எனது உரையின் எஞ்சிய பகுதியைச் சபைக்குச் *சமர்ப்பிக்கின்றேன்.

[අ.භා. 1.44]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා (සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ - அபிவிருத்தி உபாயமுறைகள் மற்றும் சர்வதேச வர்த்தக பிரதி அமைச்சர்)
(The Hon. Nalin Bandara Jayamaha - Deputy Minister of Development Strategies and International Trade)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2019 වසර සඳහා ඉදිරිපත් කර ඇති අය වැය ලේඛනය සම්බන්ධයෙන් අදහස් දක්වන්න අද ප්‍රථම වතාවට මට අවස්ථාව ලැබීම ගැන මම සතුටු වනවා. විශේෂයෙන්ම ගරු මංගල සමරවීර ඇමතිතුමා ඉදිරිපත් කළ මේ අය වැය සංවර්ධනය හා සුබසාධනය කියන කරුණු දෙකම කැටි කර ගත්, කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ආර්ථික ඉලක්ක කරා රට යොමු කරන, ඉතාම ප්‍රගතිශීලී අය වැයක් ලෙස අපිට හඳුන්වන්න පුළුවන්. සමහර වෙලාවට, විපක්ෂයේ මන්ත්‍රීවරු එක්සත් ජාතික පක්ෂය ධනවාදී පක්ෂයක් ලෙස හඳුන්වනවා; ඒ තුළ සිටින්නේ ධනවාදී ආර්ථිකයක් මෙහෙය වන පිරිසක්ය කියා කියනවා. හැබැයි, මේ අය වැය දිහා බැලුවාම, එය ධනවාදී අය වැයක් කියා අපිට කියන්න බැහැ. සුබසාධනය කැටි කර ගත්, පහළ මට්ටමේ සිටින දුගී දුප්පත් ජනතාව වෙනුවෙන් වැඩි අවධානයක් යොමු කළ, සෑම තරාතිරමකම, සමාජ මට්ටමකටම අය ආකර්ෂණය කරගන්න පුළුවන් ප්‍රගතිශීලී අය වැයක් විධියට මට මෙවර අය වැය හඳුන්වන්න පුළුවන්. ඒක තමයි, අපි දකින වෙනස.

මේ අවුරුදු තුනහමාර, හතර ඇතුළත අපි අය වැය ලේඛන කීපයක්ම ඉදිරිපත් කළා. ඒ හැම එකක්ම හැම තිස්සේම ජනතා සුබසාධනය කැටි කරගෙන ඉදිරිපත් කළ අය වැය ලේඛන හැටියට හඳුන්වන්න පුළුවන්. මේ අවුරුදු තුනහමාර තුළ අපි ඇතිකළ වෙනස දිහා බැලුවාම, මෙය සමාජවාදී ආණ්ඩුවක්ද කියලා අපිට හිතෙනවා.

අපි අවුරුදු හතළිස් ගණනක් තිස්සේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ගැන කථා කළා. හැම වසරකම අපේ නායකයන් සේනක බිබිලේ මහත්මයාගේ ගුණ සැමරුම් උත්සව පැවැත්වූවා. හැබැයි, එතුමාගේ ගුණ සැමරුම පවත්වන දවසට විතරයි රාජ්‍ය ඖෂධ ප්‍රතිපත්තිය ගැන කථා කළේ. එය ක්‍රියාත්මක කළේ නැහැ. ඒක ක්‍රියාත්මක කරන්න බැරි වුණේ මොකද? ලෝකයේ තිබෙන බහුජාතික සමාගම්වලට යට වුණු පාලකයන් මෙච්චර කාලයක් අපේ රටේ හිටියා. ඖෂධ මාෆියාවට යට වුණු, බහුජාතික සමාගම්වලට යට වුණු සෞඛ්‍ය ඇමතිවරු මෙච්චර කාලයක් අපේ රටේ හිටියා. හැබැයි, මට මතක විධියට 2016 අවුරුද්දේ මේ ජාතික ඖෂධ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන්න අපිට පුළුවන් වුණා. ඒ සම්බන්ධයෙන් අපි සතුටු වනවා. අද සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දැවැන්ත පෙරළියක් සිදුවෙලා තිබෙනවා; විශාල වෙනසක් වෙලා තිබෙනවා. ඖෂධ ගණනාවකම මිල විශාල වශයෙන් අඩුවෙලා තිබෙනවා. ඒ වාගේම ප්‍රමිතියෙන් වැඩි ඖෂධ, උපකරණ අද අපේ රටට ගෙනෙනවා. මම හොඳ උදාහරණයක් කියන්නම්. සෞඛ්‍ය ඇමති රාජිත සේනාරත්න මැතිතුමා ඊයේ කිව්වා, අද අපි හෘදය රෝග වෙනුවෙන් පාවිච්චි කරන්නේ ඇමෙරිකාවේ තිබෙන හොඳම stent එකයි කියා.

ඩොනල්ඩ් ට්‍රම්ප් මහත්මයාට හෙට හෘදයාබාධයක් හැදුණොත්, එතුමාට පාවිච්චි කරන්නේත් අපේ රටේ රෝගීන් සඳහා අද පාවිච්චි කරන stent එකමයි. මේක තමයි, අපි ඇති කළ අලුත් වෙනස. සෞඛ්‍ය ක්ෂේත්‍රය ඒ තැනට ගෙනෙන්න අපට පුළුවන් වුණා. ඒ විතරක් නොවෙයි, ගරු හර්ෂ ද සිල්වා ඇමතිතුමා ක්‍රියාත්මක කළ "සුවසැරිය" ව්‍යාපෘතිය ගැන බලන්න. මේවා ධනවාදී වැඩ පිළිවෙළවල් නොවෙයි. මේවා සමාජවාදී වැඩ පිළිවෙළවල්. මේවා එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ මේ ආණ්ඩුවයි ක්‍රියාත්මක කළේ. අපිට මතකයි, ඒ කාලයේ සමහර සංවිධාන කියූ දේවල්. කෙළින්ම කියනවා නම් GMOA එක, විපක්ෂයේ අය කිව්වා, "ඉන්දියානු RAW ඔත්තු සේවය එනවා; ඉන්දියාවෙන් වෛද්‍යවරුන් එනවා; ඉන්දියාවෙන් හෙද සහායිකාවන් එනවා; driversලා එනවා" කියා. තවදුරටත් එහෙම කියනවාද කියා මම අහනවා. Ambulanceවලට ගල් ගහන්නය කිව්වා. තවදුරටත් ඒ මතය දරනවාද කියා මම අහනවා. එක්කෙනෙක් හෝ ඒ මතය දරනවා නම්, නැඟිටලා කියන්න. කොළ පාට ඉර තිබෙන, ඒ සුදු පාට වෑන් එක අද ගමේ සාමාන්‍ය සරල දර්ශනයක් බවට පත් වෙලා තිබෙනවා. ඉස්සර සුදු පාට වෑන් විතරයි තිබුණේ. ඒකේ කොළපාට ඉරි තිබුණේ නැහැ. ඒකේ අරගෙන ගියේ රෝගීන් නොවෙයි. ඒ වෑන් එක මරණය කරායි ගියේ. අද බලන්න, වෙනස. මේවා තමයි අපි කළ වෙනස්කම්. අනෙකුත් සියලුම ක්ෂේත්‍රවල ඒ දැවැන්ත වෙනස වෙලා තිබෙනවා.

"ගම්පෙරළිය" වැඩසටහන දෙස බලන්න. රුපියල් කෝටි 8,000ක මුදලක් ලංකාව පුරා විසිරුණු ගම්මාන සියල්ලටම වෙන් කර තිබෙනවා. රුපියල් කෝටි 8,000න් කරන්න පුළුවන් වෙන වැඩ විධියට තිබුණේ මොනවාද? රාජපක්ෂ මහත්මයා කළ වැඩත් එක්ක සංසන්දනය කරලා මම කියන්නම් කෝ. කොළඹ නෙළුම් කුලුන තිබෙනවා නේ. නෙලුම් කුලුනු නවයක් මේ කෝටි 8,000න් හදන්න පුළුවන්. කටුනායක-කොළඹ අධිවේගී මාර්ගය ඉදිකිරීමට වැය වුණේ මිලියන 45,000යි; කෝටි 4,500යි. කටුනායක-කොළඹ අධිවේගී මාර්ග දෙකක් සෑදීමට වැයවන මුදල අපි ගමේ සංවර්ධනය වෙනුවෙන්, ගමේ සුබසාධනය වෙනුවෙන්, දුප්පත් ජනතාව නඟා සිටුවීම වෙනුවෙන් වෙන් කර තිබෙනවා. මේවා තමයි අපි කළ වෙනස්කම්.

ගිය අවුරුද්දේ "ගම්පෙරළිය" වැඩසටහන කඩාකප්පල් කළා, දවස් පණස්දෙකේ කුමන්ත්‍රණය සිදු කරලා. ඒ කැබිනට් මණ්ඩලයේ පළමුවැනි රැස්වීමේදීම "ගම්පෙරළිය" වැඩසටහන නැවැත්වූවා. මේවා ගැන කථා නැහැ. ඖෂධ මාෆියාව ක්‍රියාත්මක කළ කට්ටිය, කෙටි කාලයක් -දවස් 52ක්- සිටි සෞඛ්‍ය ඇමතිවරුන් සහ ඊනියා අගමැතිතුමා හම්බ වෙන්න ගිහින් තිබෙන බව අපට ආරංචියි. අපේ සෞඛ්‍ය ඇමතිතුමා සියලුම බීම වර්ග සඳහා colour code එකක් දැම්මා; "traffic light" දැම්මා. වැඩිම සීනි ප්‍රමාණයක් තිබෙන ඒවාට රතු පාට, ඊළඟ එකට කහ පාට සහ සීනි අවම මට්ටමේ තිබෙන ඒවාට කොළ පාට යෙදුවා. මේ නිසා වසරකට රුපියල් බිලියන 4ක් මේ ඊනියා සමාගම්වලට අහිමි වෙලා තිබෙනවා. මොකද, "traffic light" දැම්මාට පසුව ඒවායේ මිල අඩු වුණා. දවස් පණස්දෙකේ ආණ්ඩුව පැවැති කාලයේ මේ අය ගිහිල්ලා ඊනියා අගමැතිවරයාව හම්බ වෙලා තිබෙනවා. එසේ හම්බ වෙන්න ගිහිල්ලා, "අපිට විශාල ප්‍රශ්නයක් තිබෙනවා. වාර්ෂිකව බිලියන 4ක් අහිමි වෙනවා, මේ නිසා අපේ බිස්නස් කඩා වැටී තිබෙනවා, අපිට උදව් කරන්න" කියා කිව්වා ලු. "එක වසරක බිලියන හතර මම දෙන්නම්, ඊට පසුව හැම දාම ඔබතුමන්ලාට ඒ බිලියන හතරේ ආදායම් ලබන්න පුළුවන්" කියා ඊනියා අගමැතිතුමා කිව්වා ලු. ඔන්න, තත්ත්වය. ඔන්න, දවස් 52 තුළ කරන්න හැදූ දේවල්.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කියන්නේ මේකයි. අපි කළ ඒ දැවැන්ත වෙනසේ ප්‍රතිඵල අද ජනතාව භුක්ති විඳිනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

සංවර්ධන උපාය මාර්ග සහ ජාත්‍යන්තර වෙළෙඳ නියෝජ්‍ය අමාත්‍යතුමා විධියට මම කියන්න කැමැතියි, අපි සතියකට කලින් බිංගිරියේ අපනයන සැකසුම් කලාපයක් පටන් ගත් බව. එය, අක්කර 1,200ක් දක්වා වර්ධනය කරන්න පුළුවන්. එය අනාගතයේදී දැවැන්ත ආයෝජනයක් බවට පත් වෙන, රැකියා අවස්ථා 75,000ක් බිහි වෙන දැවැන්ත අපනයන සැකසුම් කලාපයක්. පළමුවැනි දවසේම ආයෝජකයෝ -රටේ සහ ජාත්‍යන්තරයේ ප්‍රමුඛ ආයතන- දොළොස්දෙනෙක් ආවා. අවුරුදු 15කින් අපේ රටේ අපනයන සැකසුම් කලාපයක් ඉදිවෙලා නැහැ. මේ තොරතුරු දැක්කාම අපට ඔළුවේ අත ගසා ගන්න හිතුණා. 2004දී තමයි අන්තිමට අපනයන සැකසුම් කලාපයක් ඉදිවෙලා තිබෙන්නේ. රාජපක්ෂ මහත්මයාගේ කාලයේදී නොයෙක් මාදිලියේ ඇමතිවරුන් සිටියා. හැබැයි, එක අපනයන සැකසුම් කලාපයක් බිහි කරන්න බැරි වුණා. අන්තිමට බිහි කළ අපනයන සැකසුම් කලාපය තමයි මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපය. මිරිජ්ජවිල අපනයන සැකසුම් කලාපයේ අක්කර 600ක් තිබෙනවා. හැබැයි, 2015 වනතෙක් එය හිස් භූමියක් විධියටයි තිබුණේ. 2004දී හැදූ අපනයන සැකසුම් කලාපයවත් පුරවා ගන්න එතුමන්ලාට බැරි වුණා. එතකොට මොනවාද, මේ ගොල්ලන් කරලා තිබෙන්නේ?

රටක් විධියට ඉස්සරහට යන්න නම්, අපේ අපනයන වර්ධනය වෙන්න ඕනෑ. නැත්නම් අපිට ඉස්සරහට යන්න බැහැ. එදා බිංගිරියට ආපු වෙලාවේ ගරු අගමැතිතුමා කිව්වා, "වියට්නාමයේ අපනයන සැකසුම් කලාපය 350කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. අක්කර 250,000කට ආසන්න ප්‍රමාණයක අපනයන සැකසුම් කලාප තිබෙනවා." කියා. අපි කොහේද ඉන්නේ? අපනයනයෙන් තොරව අපට රටක් විධියට ඉස්සරහට යන්න පුළුවන්ද? දැන් අපි ඒ වාගේ දැවැන්ත වැඩකටයුතු ගණනාවක් ආරම්භ කර තිබෙනවා. මගේ බිංගිරිය ආසනයේ වැඩකටයුතු ආරම්භ කළා. අපි හෙට-අනිද්දා වනකොට කළුතර මිල්ලනියේ අපනයන සැකසුම් කලාපය ආරම්භ කරනවා. එතෙක්-මෙතෙක් අපේ රටට ආපු ලොකුම ආයෝජනය තමයි, හම්බන්තොට තෙල් පිරිපහදුව. වටිනාකම ඩොලර් බිලියන 4යි. මේ මාසයේ 24වැනි දා එහි වැඩ පටන් ගන්නවා. මාර්තු 24 කියන්නේ ඉතා වැදගත් දවසක්. අපේ අගමැතිතුමාගේ 70 වන උපන් දිනය සමරන දවස. එදාට අපේ අමාත්‍යාංශයෙන් තෑගි එකක් නොවෙයි, දෙකක් දෙනවා. එකක් තමයි, ඩොලර් බිලියන 4ක තෙල් පිරිපහදුව. අනෙක් එක තමයි, ඩොලර් මිලියන 75ක සිමෙන්ති කර්මාන්තශාලාව. මේ දෙකේම අපි එදාට වැඩ පටන් ගන්නවා. මුල්ගල් තබනවා නොවෙයි. ඒක හොඳට මතක තබා ගන්න. එදායින් පස්සේ දිගටම වැඩ සිදු වෙනවා. දැනටත් මූලික කටයුතු ආරම්භ වෙලා තිබෙනවා.

මාර්තු 24 වැනි දා කටයුත්ත ගැන ගරු මලික් සමරවික්‍රම මැතිතුමා, සජිත් ප්‍රේමදාස මැතිතුමා ඇතුළු අපි දැනුත් සාකච්ඡා කරයි ආවේ. අපේ ව්‍යාපෘති දෙකකට විතරක් ඩොලර් බිලියන 4.5ක සෘජු විදේශ ආයෝජනයක්. 2018 අපේ සමස්ත සෘජු විදේශ ආයෝජන ප්‍රමාණය ඩොලර් බිලියන 2.37යි. ඒකත් 2017ට සාපේක්ෂව සියයට 40ක වර්ධනයක්. අපි 2019 මාර්තු මාසයේ 24 වැනි දා ව්‍යාපෘති දෙකකින් විතරක් ඩොලර් බිලියන 4.5ක ආයෝජනයක් ගෙනෙනවා. ගරු දිලිප් වෙදආරච්චි ඇමතිතුමනි, මාර්තු 24 වැනි දා හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් මේ වැඩ කටයුත්ත ආරම්භ වීමත් සමඟම රැකියා 10,000කට වැඩි ප්‍රමාණයක් බිහි වනවා. මේවා තමයි අපි කරපුවා. දවස් 52ක ඊනියා ආණ්ඩුවක් කරපු අයගෙන් අපි මෙය අහන්න කැමැතියි. ඒ දවස් 52 ඊනියා ආණ්ඩුවේ එක දෙයකට මම සතුටු වෙනවා. අපේ බන්දුල ගුණවර්ධන මහත්මයා තමයි අපේ අමාත්‍යාංශය භාර ඇමතිවරයා විධියට හිටියේ. මොකක්ද? එතුමාගෙන් මාධ්‍යවේදීන් අහපුවාම ශ්‍රී ලංකා-සිංගප්පූරු නිදහස් වෙළෙඳ ගිවිසුමට මොකද කරන්නේ කියා. එතුමා කිව්වා, "මොනවා කරන්නද? මේක ඉතා හොඳ ගිවිසුමක්. අපි මේක ඉස්සරහට අරගෙන යනවා." කියා. "කිව්වේ නැහැ." කියනවාද? මොකද කියන්නේ? ඒක තමයි ඇත්ත. අපි කරපු ව්‍යාපෘති සම්බන්ධව මේ ආණ්ඩුවට විරුද්ධව යම්කිසි චෝදනාවක් කළා නම්, එම චෝදනා අසත්‍ය බැවින් දින 52 කළේ, එම චෝදනා ඉවත් කර ගැනීමයි. එතුමන්ලා බොරුවට තමන්ගේ විරෝධය පළ කළා.

අපේ රටේ අපනයන ආර්ථිකය දිහා බලනකොට වැදගත් කථාවක් කියන්න තිබෙනවා. අපට මතකයි 80 දශකයේ මුල් භාගයේ -අපි පාසල් ගිය කාලයේ- අපේ ප්‍රධාන අපනයන භෝග ලෙස සඳහන් කළේ, තේ, පොල් හා රබර්. අද අපේ අපනයනවලින් සියයට 7යි තේවලින් තමයි ආවරණය වෙන්නේ. පොල්වලිනුත් ඒ හා සමාන ප්‍රමාණයක්. තේ, පොල් හා රබර් කියන භෝග තුනෙන්ම සියයට 20කට අඩු ප්‍රමාණයක් තමයි අපේ අපනයනයන්ගෙන් ආවරණය වන්නේ. ඒ කියන්නේ තේ, පොල් හා රබර් අපනයනය අඩු වෙලා නොවෙයි. හැබැයි, දිවංගත ආර්. ප්‍රේමදාස මැතිතුමා 80 දශකයේ අපේ රටට ඇඟලුම් කර්මාන්තය හඳුන්වා දුන්නා. අද අපේ අපනයන ආදායමෙන් සියයට 63ක් ලැබෙන්නේ ඇඟලුම් කර්මාන්තයෙන්. සමහරු මේකට හිනා වුණා. එදා 80 දශකයේදී ප්‍රේමදාස ජනාධිපතිතුමා ඇඟලුම් කර්මාන්තශාලා 200ක් ආරම්භ කළා. එදා හිනා වුණා, ටේලර් සාප්පු දමනවා කියා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකයි තිබෙන්නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට විනාඩි 15ක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
No, no. You have only two minutes.

**ගරු බුද්ධික පතිරණ මහතා (කර්මාන්ත හා වාණිජ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு புத்திக பதிரண - கைத்தொழில் மற்றும் வாணிப அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Buddhika Pathirana - Deputy Minister of Industry and Commerce)
මගෙන් විනාඩි පහක් දෙන්නම්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මෙතුමාගෙන් විනාඩි පහක් ලැබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
කවුද දෙන්නේ? ගරු නියෝජ්‍ය ඇමතිතුමාත් කථා කරන්න ඕනෑ නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා මට විනාඩි කීපයක් දෙන්න.

එදා 80 දශකයේ ඇඟලුම් කර්මාන්තශාලා ආරම්භ කරනකොට සමහරු කිව්වා, "සුද්දියන්ට ජංගි මහනවා." කියා. [බාධා කිරීමක්] අද අපේ රටේ අපනයන ආදායමට සියයට 63ක් එන්නේ ඇඟලුම් කර්මාන්තයෙන්. ප්‍රේමදාස ජනාධිපතිතුමා ඇඟලුම් කර්මාන්තශාලා ආරම්භ කිරීමේදී ඒවා බස්නාහිර පළාතේ කොළඹ, ගම්පහ දිස්ත්‍රික්කවලට පමණක් සීමා කළේ නැහැ. එතුමා කළ වැදගත්ම දේ තමයි, මැදවච්චියෙත් කර්මාන්තශාලා හැදුවා; අම්පාර, නුවරඑළිය හා මඩකලපුවෙත් හැදුවා. ඒ විතරක් නොවෙයි, ආයෝජකයෝ දිරිමත් කරන්න අවශ්‍ය කරන හැම කටයුත්තක්ම කළා. ඊයේ-පෙරේදා අගමැතිතුමා මා නියෝජනය කරන බිංගිරිය ආසනයට ආපු වෙලාවෙත් කිව්වා, "අපට මේ විධියට සමච්චල් කළාට අද අපි ඉන්නේ මේ තත්ත්වයේ." කියා. මම දැක්කා ඊයේ-පෙරේදාත් මේ ජංගි කථාව අල්ලාගෙන අගමැතිතුමාට අපහාස කරනවා. හැබැයි මේ අය එලෙස අපහාස කරන්නේ ලජ්ජාවටයි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

අපේ අපනයන ගත්තාම සියයට 63ක් ලැබෙන්නේ ඇඟලුම් කර්මාන්තයෙන්. අද ලෝකයේ හොඳම ඇඟලුම් අපේ රටෙන් අපනයනය වනවා. අපේ දරුවෝ විශේෂයෙන්ම අපේ කාන්තාවෝ එහෙම නැත්නම් තරුණියෝ තමයි මේකට දායකත්වය දක්වන්නේ. අද අපේ රටේ තරුණියන් සම්බන්ධයෙන් තිබෙන තැන මොකක්ද? ඔවුන්ට ගරහන පුද්ගලයෝ සිටිනවා. මම නම් කියන්නේ අපේ රටේ වැදගත්ම පිරිස තමයි අපේ රටේ අපනයන ක්ෂේත්‍රයේ සේවය කරන තරුණියන්. ඒ අයගෙන් සියයට 63ක් අපේ ආර්ථිකයට දායකත්වයක් ලබා දෙනවා. එහෙමනම්, අපි මේ අපනයන ක්ෂේත්‍රයේ සේවය කරන තරුණියන්ට මීට වඩා වැඩි සැලකිල්ලක් දක්වන්න ඕනෑ. මම හිතනවා, අපි පුද පූජා පවත්වන්න ඕනෑ; අපි ඒ අයට ගරු සම්මාන දෙන්න ඕනෑ කියා. ඒ තත්ත්වයට අපනයන ක්ෂේත්‍රයේ වැඩ කරන තරුණියන්ව පත් කරන්න ඕනෑ. ඒක තමයි කළ යුත්තේ. මොකද, ඒ තරම්ම ලොකු සේවයක් අපනයන ක්ෂේත්‍රයේ තරුණියන්ගෙන් රටට සැලසෙනවා, ඒ දායකත්වය ලැබෙනවා. නමුත්, අපි රටක් විධියට ඒ තරුණියන්ට දීලා තිබෙන තැන මොකක්ද? අපි සමාජයක් විධියට තරුණියන්ට දීලා තිබෙන තැන මොකක්ද? මම ඒක මේ ගරු සභාවෙන් අහන්න කැමතියි. මම පැහැදිලිවම කියනවා, මෙවර අය වැය තුළින් ඉදිරියට රට අරගෙන යන්න පුළුවන් තැනට ගෙනැල්ලා තිබෙන බව. අද විපක්ෂය භය වෙලා තමයි ඉන්නේ. අලුතෙන් ප්‍රතිලාභීන් ලක්ෂ හයකට සමෘද්ධිය දෙනවා කියනකොට, මේ අය තක්බීර් වෙලා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි ගරු නියෝජ්‍ය අමාත්‍යතුමා. වේලාව අවසානයි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ කථාව අවසන් කරන්න මට තත්පරයක කාලයක් ලබා දෙන්න. මේ ගොල්ලන් භය වෙලා. අපි පැහැදිලිවම කියනවා, අපි මෙවර අය වැය ගෙනැල්ලා තිබෙන්නේ ඡන්දයක් ඉලක්ක කරගෙන නොවෙයි කියා. කෙටි කාලීන, මධ්‍ය කාලීන, දිගු කාලීන ආර්ථික සැලසුම් සමඟ රටේ දුප්පත් ජනතාවට සහන දෙන්නයි, ඒ අය සංවර්ධනය කරන්නයි, ඒ අය නඟා සිටුවන්නයි මෙවර අය වැය ඉදිරිපත් කර තිබෙන්නේ කියන එක මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
හොඳයි. මීළඟට, ගරු රෝහිත අබේගුණවර්ධන මන්ත්‍රීතුමා.

[අ.භා.1.59]

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, විශේෂයෙන්ම අය වැය දෙවන වර කියවීමේ විවාදයේ ඡන්දය පවත්වන්න කලින් නියෝජ්‍ය ඇමතිතුමා කථා කරනකොට මට මතක් වුණා ත්‍රිරෝද රථවල පිටුපස ගහලා තිබෙන හොඳ කියමන්. ත්‍රිරෝද රථයක ගහලා තිබුණා, "කථාව නැවෙන් - අතේ හබලක්වත් නැහැ." කියා. දැන් ඒ වාගේ තමයි මෙතුමා කථා කළේ. 'නැව් ටෝක්' තමයි දෙන්නේ. පදින්න හබලක් නැහැ. එතුමා කථා කරගෙන යනකොට මම හිතුවේ, නත්තල් පප්පාගේ නංගිගේ පුතා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ කියපු දේවල් ටික ශ්‍රී ලංකාව තුළ නිවැරදිව සිද්ධ වුණා නම්, 2018 පෙබරවාරි 10 වෙනිදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව පළාත් පාලන මැතිවරණයෙන් අන්ත පරාජයට පත් වන්නේ නැහැ. එහෙම නම් දිනන්න ඕනෑ ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
What is the point of Order, Hon. Member?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මගේ වෙලාව මට දෙන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
අපේ බොහොම උගත්, බුද්ධිමත් මිත්‍රයාගෙන් මම අහනවා. ඊයේ පෙරේදා ඔබතුමා කළුතර හොරණ ප්‍රදේශයේ ටයර් කර්මාන්ත ශාලාව පැත්තේ පොඩ්ඩක් ගියේ නැද්ද?

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
එතැනටත් එන්නම්. දෙන්න එපායැ උත්තරය. වාඩි වෙලාම අහගෙන ඉන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැයට ඉස්සෙල්ලා 2015, 2016, 2017, 2018 අය වැය හතරක් ඉදිරිපත් කළා. මේ ආණ්ඩුවේ අවසාන අය වැය මෙයයි. මේ මරණ මංචකයේ අය වැය. හැබැයි, මේ මරණ මංචකයේ අය වැය ඉදිරිපත් කරනකොට -2019 අය වැය ඉදිරිපත් කරනකොට-

[ගරු රෝහිත අබේගුණවර්ධන මහතා]

මංගල සමරවීර ඇමතිවරයාට මතක නැහැ, ඊට ඉස්සෙල්ලා ඉදිරිපත් කරපු අය වැය හතරේ තිබුණු දේවල් ක්‍රියාත්මක කළාද නැද්ද කියන එක. මුලින් ඒවා ක්‍රියාත්මක කරන්න ඕනෑ කියා අපි බොහොම පැහැදිලිව කියනවා. මේ ආණ්ඩුව බලයට පත් වෙනකොට ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි දැක්කා පුංචි වාහනයක් පිළිබඳව බොහොම පැහැදිලිව කියනවා. මේ රටේ සිටින හැම කෙනාටම, හැම පවුලකටම තමන්ට පුංචි වාහනයක් බොහොම අඩුවට ගන්න පුළුවන්කමක් ලබා දෙනවා කිව්වා. අපට මතකයි 2015 එක්සත් ජාතික පක්ෂයෙන් වෙළෙඳ දැන්වීමක් දැම්මා, පුංචි කාර් එකක් සහිතව. නංගි කෙනෙක් තෙමීගෙන එනවා. දැන් මුළු රටේම මිනිස්සු ඒ තෙමිච්ච නංගිව හොයනවා. මොකද, හේතුව? කොහෙන්ද ඒ පුංචි කාර් එක ගන්න තිබෙන්නේ කියා අහන්න. මේ අය වැයට කලින් ගිය අවුරුද්දේ ගෙනාවේ නීල හරිත අය වැයක් කිව්වා. ඊළඟට කිව්වා, "2025 දී ගෙනෙන හැම වාහනයක්ම පරිසර හිතකාමී වාහන. ඒවාට භාවිත කරන්නේ ඉන්ධන නොවෙයි." කියා. එහෙම කියපු ආණ්ඩුව අද බදු ගහලා තිබෙනවා. මේ රටේ සුඛෝපභෝගී නොවන වාහන ගණයට අයිති වෙන්නේ "WagonR" පොඩි වාහනයයි, "Alto" එකයි, "Maruti" එකයි විතරයි.

සියලුම වාහනවලට බදු ගහලා. බදු ගැහීම තුළ වාහනයක් ගන්නවා නොවෙයි, මනුෂ්‍යයකුට වාහනයක් ගැන හිතන්නවත් බැරි තත්ත්වයකට පරිවර්තනය වෙලා තිබෙනවා. එදා අපේ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ push bicycle එකක් තිබුණු කෙනා මෝටර් සයිකලයක් ගත්තා; මෝටර් සයිකලයක් තිබුණු කෙනා three-wheeler එකක් ගත්තා; Three-wheeler එකක් තිබුණු කෙනා කාර් එකක් ගත්තා; කාර් එකක් තිබුණු කෙනා වෑන් එකක් ගත්තා; වෑන් එකක් තිබුණු කෙනා බස් එකක් ගත්තා. දැන් බස් එකක් තිබුණු මනුෂ්‍යයා බස් එක විකුණලා push bicycle එකක් අරගෙන. ඇයි? ගෙවා ගන්න විධියක් නැහැ.

ඊළඟට, මගේ මිත්‍ර ගරු මුදල් ඇමතිතුමා බොහොම උජාරුවට කිව්වා, රැකියා ලබා දීම ගැන. අනේ! එතුමාට අමතක වුණු, අපට මතක් වුණු, රටටත් අමතක නොවුණු දේ මතක් කරන්න මම දැන් ලැහැස්තියි. රනිල් වික්‍රමසිංහ අගමැතිවරයා කිව්වා, දස ලක්ෂයක් රැකියා දෙනවා කියලා. එක අවුරුද්දකට රැකියා ලක්ෂ දෙකයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගණන් හදලා බලන්න. 2019 ජනවාරි 08 වැනිදාට මේ ආණ්ඩුවට අවුරුදු 4ක් ඉවරයි. එහෙම නම් රැකියා ලක්ෂ 08ක් දීලා තිබෙන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන අයගෙන් මම අහනවා, රැකියා ලක්ෂ 08 දුන්නේ කොහේද කියලා. රැකියා ලක්ෂ 08ක් නොවෙයි, තිබුණු ආයතනත් දැන් වහලා. දැන් මගෙන් අහනවා, "හොරණ තිබෙන කර්මාන්ත පුරයේ ටයර් ෆැක්ටරිය දැක්කේ නැද්ද?" කියලා. අන්න, රබර් ගස් දැම්මාම, ටයර් පැටවු ගහනවා. මම කළුතර, හොරණ. රබර් ගහ අරගෙන ගිහිල්ලා දමනවා. දැම්මාට පස්සේ "ටාං, ටාං" ගාලා ටයර් පැටවු ගහනවා. දැන් කොල්ලෝ ටයර් තල්ලු කරගෙන යනවා. එන්න, බලන්න. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාත් එන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු රෝහිත අබේගුණවර්ධන මහතා**
(மாண்புமிகு ரோஹித அபேகுணவர்தன)
(The Hon. Rohitha Abeygunawardana)
මළ කෙළියයි! සමා වෙන්න. [බාධා කිරීමක්] මෙතුමා මගේ වෙලාව කෑවා.[බාධා කිරීමක්] ටයර් ෆැක්ටරි මතක් වෙනවා, මේ ගොල්ලන් ඉතිහාසයේ තරුණයන්ගේ බෙල්ලට ටයර් දමාපු අය.

ඊළඟට, බේමාගේ කොලුවා කියනවා, මේ රටේ පාසල් යන හැම දරුවකුටම කිරි වීදුරුවක් ලබා දෙනවා කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේකට මට පිළිතුරක් අරගෙන දෙන්න. තමුන්නාන්සේගෙන් තමයි ඉල්ලන්නේ. දැන් මේ ගොල්ලන් පාසල් යන දරුවන්ට කිරි වීදුරුවක් දෙන්න හදනවා. රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය මෙන්න මේ වාගේ පෝස්ටරයක් එවා තිබෙනවා. ඒකේ සඳහන් වෙනවා, "ප්‍රවේසම් වන්න! කිරිපිටි භාවිතයේ ඔබ මෙතෙක් කල් නොදැන සිටි අන්තරායයන් 21ක්" යනුවෙන්. මොනවාද ඒ යටතේ තිබෙන්නේ? ඇදුම, අසාත්මිකතා, කනේ ආසාදන, අධි රුධිර පීඩනය සහ හෘදය රෝග, ශ්වසන ආසාදන, බුද්ධි මට්ටම අඩුවීම, දියවැඩියාව ආදී වශයෙන් රෝග 21ක් ගැන සඳහන් කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එක පැත්තකින් රටේ අය වැය ඉදිරිපත් කරලා මුදල් ඇමතිවරයා කියනවා, කිරි වීදුරුවක් අපේ රටේ අනාගත දරුවාට දෙන්න කියලා. අනෙක් පැත්තෙන් රජයේ සෞඛ්‍ය අමාත්‍යාංශය කියනවා, කිරි පිටිවලින් මෙවැනි රෝග 21ක් හැදෙනවා කියලා. අම්මාපල්ලෙ, ඒ කිරි ටික පොවන්න ඕනෑ මෙන්න මේ නඩේට. එතකොට මේ රෝග 21 හැදෙනවා. මේකේ ඇත්ත මොකක්ද කියලා අපට කියා දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේ හොයන්නේ දෙන්න හදන කිරි වීදුරුවේ තිබෙන ළමයාට අවශ්‍ය පෝෂණය නොවෙයි; කිරිපිටි සමාගම්වලට අවශ්‍ය පෝෂණයයි. දැන් බොහොම පැහැදිලිව පෙනෙනවා, මේ අය වැය තුළින් මේ රටේ මිනිසුන් අන්තිම අගාධයට ඇද දමා තිබෙනවායි කියන කාරණය.

රාජ්‍ය සේවකයාට රුපියල් 2,500ක් ජූලි මාසයේ ඉඳන් දෙනවා කිව්වා. හැබැයි, මාර්තු 05 ඉඳලා බදු වැඩි වෙනවා. ගහපු බදු ටික මාර්තු 05 සිට එකතු කරනවා. රාජ්‍ය සේවකයාගේ රුපියල් 2,500 ජූලි මාසයේ සිටයි දෙන්නේ. අය වැය කියලා කියන්නේ මේකද? මේක අය වැයක් නොවෙයි. මේ අය වැය ගැන අහලා රටේ මිනිසුන්ගේ අවයව ගැලවිලායි තිබෙන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමා අපහසුතාවට පත් කරන්නේ නැතුව මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, අවසාන වශයෙන් "Home Sweet Home" ගැනත් වචන කිහිපයක් කියලා මගේ කථාව නතර කරන්නට. දැන් තරුණ තරුණියන්ට කසාද බැඳපු ගමන්ම 'දෙයියනේ' කියලා "Home Sweet Home" ණය යෝජනා ක්‍රමය යටතේ, රුපියල් කෝටියක මුදලක් හම්බ වෙනවා. අලුත් ගෙදරකට ගිහිල්ලා ජෝඩුවට ජොලියෙන්, ලව් කර කර ඉන්න පුළුවන්. ඉතින් මේකට ආදර්ශයක් දෙන්න එපායැ. කසාදයක් බැඳලා, "Home Sweet Home" අලුත් ගෙදරක ඉන්න ආදර්ශයක් දෙන්න ඕනෑ. ඒ නිසා අපි විපක්ෂය හැටියට ගරු මුදල් ඇමතිවරයාට යෝජනා කරනවා, පළමුවෙන්ම ඒ ආදර්ශය දෙන්න කියලා. කසාදයක් බැඳලා, රුපියල් කෝටියක මුදල අරගෙන, "Home Sweet Home" එකට ගිහිල්ලා තමන්ගේ දයාබර බිරිඳ සමඟ -පෙම්වතිය සමඟ එහෙම නැත්නම් පෙම්වතා සමඟ හෝ කමක් නැහැ.- ඒ ආදර්ශය පෙන්වන්න.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේවා අසත්‍ය; මේවා දෙන්න බැහැ. අද සවස 5.00ට ඡන්ද විමසීම සිදු වෙනවා. ගරු කථානායකතුමා මූලාසනයට එනවා.

තමුන්නාන්සේලාගේ ටීඑන්ඒ පක්ෂයෙන් තමයි, මේ සභාවේ මේ අය වැය පිළිබඳව දිනනවාද, නැද්ද කියලා තීන්දු කරන්නේ; ඔබතුමන්ලා තමයි තීන්දු කරන්නේ. එහෙම නැත්නම් මේ ආණ්ඩුවට ශක්තියක් නැහැ; ආණ්ඩුවට බහුතරයක් නැහැ. ටීඑන්ඒ එක ඡන්දය දුන්නොත් තමයි, අය වැය සම්මත වෙන්නේ. හැබැයි, මේ අය වැය පරාද කරන්න අපි අපේ උපරිම උත්සාහය දරනවාය කියන කාරණය මතක් කරනවා.

[අ.භා.2.08]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වනවා, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන්. මම අද දින සහභාගි වන්නේ මගේ පාර්ලිමේන්තු දිවියේ හතරවැනි අය වැය විවාදයටයි. 'අන්තිම එක' කියලා විපක්ෂයෙන් කියනවා. නමුත්, ඉදිරියේදී බලමු, අන්තිම අය වැය වෙයිද, තව කීපයක් ඔය විධියට ඉස්සරහට යයිද කියලා; තව හයක් විතර යයිද දන්නේ නැහැ.

මට විනාඩි 15ක් තිබෙනවා නේද, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි?

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
You have 14 minutes. විනාඩි දහහතරයි.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මිනිත්තුවක් කපලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පළමුව කියන්න ඕනෑ, මීට පෙර කථා කළ අපේ ගරු මන්ත්‍රීතුමා -හිටපු අමාත්‍යතුමා,- පරණ නැව්වල වැඩ කරපු කෙනෙක් කියන කාරණය. ගරු මන්ත්‍රීතුමනි, දැන් තිබෙන නැව්වල නම් හබල් නැහැ; ඔරුවල තමයි හබල් තිබෙන්නේ. මේ අය වැය ගැන විපක්ෂය කථා කළේ පරණ නැව්වල ඉඳගෙනම තමයි. අලුත් නැව් තිබෙනවා. ඒ නිසා අලුත් නැව්වල නැඟලා, ලෝකය දිහා බලලා කථා කරන්න කියලා විශේෂයෙන්ම එතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

රටේ ජනතාව වෙනුවෙන් ක්‍රියාත්මක කළ හැකි යෝජනා ඉදිරිපත් කර ඇති නිසා, ඉතිහාසයේ මම දුටු වෙනත් අය වැයවලට වඩා මෙවර අය වැයේ සුවිශේෂත්වයක් තිබෙන බව මම දකිනවා. අපි මේ උත්තරීතර පාර්ලිමේන්තුවට ඇවිල්ලා කථා කරන්න ඕනෑ, රටේ ජනතාවට අපි මොනවාද කළේ, මොනවාද කරන්නේ කියන කාරණා සම්බන්ධයෙන්. රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න, රටේ යටිතල පහසුකම් ටික හදන්න, සමාජයීය, සංස්කෘතික, ආගමික වශයෙන් රට ඉස්සරහට ගෙන යන්න ඒ වාගේම ජාත්‍යන්තර වශයෙන් ශ්‍රී ලංකාව සම්බන්ධීකරණය කරලා, ශ්‍රී ලංකාව ජාත්‍යන්තරයේ දිදුලන රටක් හැටියට පත් කරන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ තමයි මේ අය වැය තුළ තිබෙන්නේ.

මේ රටේ වැසිකිළි නැති ලක්ෂ ගණනක ජනතාවක් ඉන්නවාය කියන කාරණය සම්බන්ධයෙන් අපි, තමුන්නාන්සේලා සියලුදෙනාම පළමුවෙන්ම ලජ්ජාවට පත් වෙන්න ඕනෑ. ඒ වාගේම, වැසිකිළියක් හදාගන්න බැරි ජනතාවක් මේ රටේ ඉන්නවා නම්, තමුන්නාන්සේලා, අපි මේ පාර්ලිමේන්තුවේ ඉඳගෙන මොන තරම් කයිවාරු ගැහුවත්, අපි මොනවාද කළේ කියලා ආපහු හැරිලා අපි දිහාම බලන්න ඕනෑ. ඒ නිසා, මේ රටේ ජනතාව වෙනුවෙන් වැඩ කටයුතු කිරීමේ විශාල වැදගත්කමක් සහ වගකීමක් අපට පැවරී තිබෙනවා. ඒ වගකීම ඉෂ්ට කරන්න තමයි, ගරු මුදල් අමාත්‍යතුමා 2019 වසරේ මේ අය වැය මේ උත්තරීතර සභාවට ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ මාසය ඇතුළත මේ අය වැය මේ උත්තරීතර සභාවේදී අපි අනුමත කර, ඉන්පසුව මේ රටේ වැඩ කටයුතු කරද්දී, ග්‍රාමීය වශයෙන්, පළාත් වශයෙන්, ඒ වාගේම දිස්ත්‍රික්ක වශයෙන් ගත්තාම මොනවාද කළ යුත්තේ කියන කාරණය අපි දන්නවා. ඒ කටයුතුත් මේ අය වැයත් එක්ක සම්බන්ධීකරණය කරලා; බද්ධ කරලා වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රථමයෙන්ම මේ කරුණ මම කියන්න ඕනෑ. එක් එක් දිස්ත්‍රික්කවල තිබෙන සම්පත් ටික හරියට හඳුනාගෙන, ඒ සම්පත් ටික ශ්‍රී ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කරන්න හසුරුවන්නේ කොහොමද, ජාත්‍යන්තර වශයෙන් වෙළෙඳ පොළවල් නිර්මාණය කරගන්නේ කොහොමද කියන කාරණය සැලකිල්ලට ගත යුතු වනවා. විශේෂයෙන්ම අපනයනය වැඩි කිරීමට අවශ්‍ය කරන වැඩ පිළිවෙළ තුළ කෘෂි කර්මාන්තය මූලික කරගෙන ගොවි ගම්මාන, පළතුරු ගම්මාන ඇති කළ යුතු වනවා. ඒ හා සමානව මේ රටට කීර්තියක් ගෙනෙන, මේ රටේ නිපදවන අනෙකුත් ධාන්‍ය වර්ග සියල්ලම නිෂ්පාදනය කරන ගම්මාන නිර්මාණය කරලා, ඒ ගම්මානවලින් අපනයන භෝග නිෂ්පාදනය කිරීම, එසේ කරමින් ආනයනය අඩු කරලා, අපනයනය වැඩි කරලා, මේ රටට ආදායම් ලබාගන්න අවශ්‍ය කරන වැඩ පිළිවෙළ සකස් කර තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ සඳහා විශේෂ මුදල් ප්‍රමාණයක් මේ අය වැය තුළින් වෙන් කර තිබෙනවා.

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට අපේ වගකීම තමයි, මේ අය වැයෙන් වෙන් කර තිබෙන මුදල් හරියාකාරව වියදම් කිරීම සහ මේ අය වැයෙන් බලාපොරොත්තු වුණු යෝජනාවන් නිවැරදි ආකාරයට, සැලසුම්සහගතව, නිර්මාණශීලීව රටේ සමස්ත ජනතාව වෙනුවෙන් මේ රට තුළ ක්‍රියාත්මක කිරීම. එය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කරන වැඩ පිළිවෙළ අපි සකස් කරද්දී අපි විපක්ෂයෙන් බලාපොරොත්තු වන්නේ, මේ හා සම්බන්ධව ඔබතුමන්ලාගේ චෝදනා සහ යෝජනායි. මඩ ගහන එකට වඩා, එහෙම නැත්නම් කුලප්පු කරන එකට වඩා, එහෙමත් නැත්නම් සමහර වෙලාවට පාර්ලිමේන්තුවට ඇවිල්ලා එක එක මන්ත්‍රීවරයාගේ පෞද්ගලික ජීවිතයට අනවශ්‍ය විධියට ඇඟිලි ගහන විධියට ප්‍රකාශ නිකුත් කරනවාට වඩා හොඳයි, තමුන්නාන්සේලා දන්නා යෝජනා ටික ඉදිරිපත් කිරීම. තමුන්නාන්සේලා කාලයක් තිස්සේ හොඳ වැඩකාරයෝ හැටියට හිටියා. ඒ කාලයක් තිස්සේ කරපු වැඩවලින් තමුන්නාන්සේලාගේ යෝජනා ටික ඉදිරිපත් කරන්න පුළුවන්,"මෙන්න මෙතැන අඩු පාඩුවක් තිබෙනවා. මෙතැන යම් කිසි ප්‍රශ්නයක් තිබෙනවා, අපි එකට එකතු වෙලා මේක විසඳමු" කියලා.

අද අපි රාජ්‍ය සේවයට -විශේෂයෙන් හමුදාවට, පොලීසියට, රාජ්‍ය සේවකයන්ට- විශාල මුදලක් වෙන් කර තිබෙනවා. මේ අය වැය ලේඛනයෙන් පුනරාවර්තන වියදම් හැටියට වැඩිම ප්‍රමාණයක් මුදල් වෙන් කර තිබෙන්නේ වැටුප් වැඩි කිරීම සම්බන්ධවයි. මේ අවස්ථාවේදී රාජ්‍ය නිලධාරින්ගෙන් අපි බලාපොරොත්තු වෙනවා, ඒ අය මේ රට වෙනුවෙන් විශාල වැඩ කොටසක් කරයි කියලා. ඒ අය ණය ගැතියි විතරක් නොවෙයි. අප හා සමානවම ඒ සියලු දෙනාම පාවිච්චි කරන්නේ මේ රටේ සමස්ත ජනතාවගේ ජීවන කඳුළු ටික; දහඩිය ටික; ලේ ටික. එම නිසා මේ රටේ ජනතාව වෙනුවෙන් මීට වඩා වැඩි වැඩ කොටසක් සිද්ධ කිරීමට රාජ්‍ය සේවයේ සියලු දෙනාටම යම් කිසි බැඳීමක් තිබෙනවා; වගකීමක් තිබෙනවා.

මා විශේෂයෙන්ම මතක් කරන්නට ඕනෑ කාරණයක් තිබෙනවා. මගේ පුත්තලම දිස්ත්‍රික්කයේ මගේ ආසනය ගත්තාම වැසිකිළි නැති පවුල් තුන්දාහක් ඉන්නවා. ඒ සම්බන්ධයෙන් මගේ කාර්යාලයේ මේ වෙනකොට සංඛ්‍යාලේඛන තිබෙනවා. ඒ අය සමහර වෙලාවට මට ඇවිත් ඒ අයගේ අපහසුතාවන් කියා තිබෙනවා. උදේ අවදිවෙලා දරුවන් පාසල් යන්න සූදානම් වන

[ගරු හෙක්ටර් අප්පුහාමි මහතා]

විට ඒ අයට වැසිකිළි පහසුකම් නැති නිසා, ඒ කර්තව්‍යය කර ගන්න බැරිව අල්ලපු ගෙදර ගේට්ටුව අරින තුරු සමහර දෙමව්පියන් දරුවනුත් අරගෙන ඇවිත් බලාගෙන ඉන්නවා. එහෙම බලාගෙන ඉන්නකොට කොච්චර අපහසුතාවන්ට ලක් වෙනවා ඇද්ද? ඒ දරුවන්ට එක පැත්තකින් සෞඛ්‍ය ප්‍රශ්න; එක පැත්තකින් මානසික වශයෙන් පීඩාව. ඒ අයගේ අවශ්‍යතා අපි සම්පූර්ණ කළේ නැති නිසා විශේෂයෙන් පරිහානියට පත් වෙන්නේ අපේ රටේ ජනතාවයි. ඒ නිසා තමයි අපි ඒ වැඩ පිළිවෙළ සකස් කළේ. එසේ නම් වැසිකිළියක් හදාගන්න බැරි විධියේ ජනතාවක් මේ රටේ ඉන්නවා නම් ඒ අය නඟා සිටුවීම සඳහා තමයි අපි සමෘද්ධි ව්‍යාපාරය සඳහා තවත් ලක්ෂ 6ක් නැත්නම් ලක්ෂ 8ක් බලාපොරොත්තුවෙන් මුදල් වෙන් කර තිබෙන්නේ. මේ මුදල් ප්‍රතිපාදන ලබා දෙද්දී එක පණිවුඩයක් ලබා දෙන්න අපි සූදානම්. දේශපාලනය කරන, සමෘද්ධි දීමනාව ලබා ගන්න සුදුසුකම් නැති අය සමෘද්ධි වැඩසටහනේ ඉන්නවා නම් කරුණාකර ඒ අය අයින් වෙන්න සූදානම් වෙන්න ඕනෑ. මොකද, අහිංසක දුප්පත් ජනතාව නඟා සිටුවීමේ වැඩසටහනයි අපි ක්‍රියාත්මක කරන්නට බලාපොරොත්තු වෙන්නේ. කෙටි කාලයක් තුළදී මේ අය නඟා සිටුවන්නට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබා දෙනවා හා සමානවම මේ අයට දැනුම, ඒ දැනුමත් එක්ක අපෙන් ලැබිය යුතු සහයෝගය ඒ වාගේම රජයෙන් ලබා දිය යුතු අනෙකුත් යටිතල පහසුකම් සියල්ල එකට එකතු කර වැඩ පිළිවෙළක් සකස් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අලුතෙන් විවාහ වෙන ජෝඩුවකට ලබා දෙන නිවාස ණය සම්බන්ධව මේ අය කථා කළා. ඒ අය නිවාස ණය ගත්තාට පස්සේ ණය වාරිකය කොහොමද ගෙවන්නේ කියා ඇහුවා. හත්දෙයියනේ! මේ අයට මේ ගැන හිතාගන්න මොළයක් නැහැනේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් හැටියට මේ අය හිතන්න ඕනෑ, ඒ මුළු ණය මුදලම අරගෙන ලොකු මාළිගාවක් හදන්න අවශ්‍ය නැහැ කියන එක. පුංචි පැලක් ලස්සනට හදා ගන්නට අවශ්‍ය කරන මුදලක් ගන්න පුළුවන්; තමන්ගේ ණය මුදල අඩු කර ගන්න පුළුවන්; කැමති විධියට ණය මුදල අඩු කර ගන්නට පුළුවන්. අලුතෙන් විවාහ වෙන යුවළකට තමන්ට කැමති ආකාරයෙන් නිවසක් හදාගන්න අවශ්‍ය කරන සහයෝගය, ශක්තිය සහ මග පෙන්වීමයි අපි ලබා දී තිබෙන්නේ. රජයක් හැටියට ඒක අපේ වගකීම. වැසිකිළි නැති කෙනාට වැසිකිළි හදා දෙනවා නම්, ආදායම් අඩු කෙනාට සමෘද්ධි දීමනාව ලබා දෙනවා නම්, අලුතෙන් විවාහ වෙන යුවළකට ඒ අයගේ නිවස හදා ගන්න අවස්ථාව දෙනවා නම්, ඒ අයට තමන්ගේ ව්‍යාපාර කර ගන්න, තමන්ගේ රැකියාව කර ගන්න අවශ්‍ය කරන ණය මුදල අඩු පොලියකට ලබා දෙනවා නම් මඟ පෙන්වීම අපි කර තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ වාගේම දරුවන්ට නිදහස් අධ්‍යාපනය ලබා දෙද්දී විශේෂයෙන් "ළඟම පාසල හොඳම පාසල" වැඩසටහන යටතේ පාසල් දරුවන්ට අවශ්‍ය කරන පහසුකම් ටික ලබා දෙනවා නම්, ළමයින්ට රක්ෂණය ලබා දී ළමයින් රැක බලාගන්නා වැඩසටහන ඉෂ්ට කරනවා නම්, ඒ ළමයාව දහතුන්වන වසර දක්වා ගෙන ගිහින් විශේෂයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය ලැබන්නේ නැත්නම්, ඒ දරුවන්ට අවශ්‍ය කරන අනෙකුත් වෘත්තීයමය සුදුසුකම් ලබා දී මඟ පෙන්වා ඒ අය යහමඟට ගන්නවා නම් තවත් මොනවාද රජයක් හැටියට කරන්නට තිබෙන්නේ? මේ වැඩ පිළිවෙළයි මේ අය වැයෙන් විශේෂයෙන් මේ රටට ඉදිරිපත් කර තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කුඩු ගැන, ගංජා ගැන, මත් ද්‍රව්‍ය ගැන අපි කථා කරනවා. අපි ඒ සඳහා දැන් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. මත් ද්‍රව්‍ය ගැන කථා කරද්දී සිර ගෙවල්වල ඉන්න හිරකාරයන්ගේ තිබෙන සම්බන්ධතාවය නිසා මේ රටට මත්ද්‍රව්‍ය වැඩියෙන් එනවාය කියන එක අපි සිහිපත් කරන්නට ඕනෑ. සිර ගෙවල්වල ඉන්න සිරකරුවන් වෙනුවෙන් විශේෂයෙන්ම පුනරුත්ථාපන වැඩසටහනක් අපි පටන් අරගෙනයි තිබෙන්නේ. ගොවිපළවල් සකස් කර ඒ අයගෙන් මේ ආර්ථිකයට ශක්තියක් ලබා දෙන්න මේ රජය කටයුතු කරනවා. ඒ අය වෙනත් දේවල්වලට යොමු වීමේ අවස්ථාව නැති කර ආර්ථික ශක්තිය ලබා දීමට අවශ්‍ය කරන ගොවිපොළවල් නිර්මාණය කර, ඒ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ටිකයි, මුදල් ප්‍රතිපාදන ටිකයි ලබා දී ඒ අයව අපි හදනවා. ඒ අය හදනකොට තමන්ගේ පිටස්තරව ජීවත් වන සියලු දෙනාත් එක්ක පවුලක් හැටියට හොඳ යහතින් ජීවත් වෙන්න ඒ අයට අවස්ථාව සලස්වනවා. ඒ වාගේම රටේ යම් වැරදි වැඩ පිළිවෙළක් සිද්ධ වෙනවා නම් ඒ අයට අවස්ථාව ලැබෙන්නේ නැහැ, ඒ වැරදි වැඩ පිළිවෙළට සම්බන්ධ වන්න.

ඒ නිසා ඒකට අවශ්‍ය කරන වැඩ පිළිවෙළත් මේ අය වැයේ තිබෙනවා. මෙම වැඩ පිළිවෙළත් එක්කම අපි සමෘද්ධි වැඩ පිළිවෙළ ගැන කථා කරද්දී, අපි එය දේශපාලන සංවිධානයක් ලෙස ගන්න බලාපොරොත්තු වෙන්නේ නැහැයි කියන එක විශේෂයෙන් සිහිපත් කරන්න ඕනෑ. පසුගිය ආණ්ඩු සමෘද්ධි ව්‍යාපාරය දේශපාලන සංවිධාන හැටියට තියාගෙන අහිංසක දුප්පත් ජනතාව පාගලා, පාගලා හැමදාම කළේ, තමුන්ගේ ඡන්ද ගොඩ වැඩි කරගන්න, එහෙම නැත්නම් බඩ ගෝස්තර දේශපාලනය ශක්තිමත් කරගන්න සමෘද්ධි දීමනාව දීලා ඒ අය එතැනම තැබීමයි. විශේෂයෙන්ම සමෘද්ධි දීමනාව ලබා දීලා රජයක් හැටියට අපි බලාපොරොත්තු වෙන්නේ, සමෘද්ධිමත් රටක ජීවත් කරවීම සඳහා ඔවුන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීමයි. ඒ වාගේම ඔවුන්ව ඉදිරියට ගන්න, උඩට ගන්න. උඩට අරගෙන ඊට පස්සේ ඒ අයට සමෘද්ධි දීමනාව දෙන එක නතර කරන්න පුළුවන්. හැබැයි, අපි සමෘද්ධි දීමනාවම දීලා, ඒක වවාගෙන කාලා, ඒ පවුල් සියල්ලම නැති කරලා, ඒ අයගේ ආර්ථික තත්ත්වය එකම තැනක තබනවා නම්, ඒක මේ රටට විශාල ප්‍රශ්නයක්.

මේ අවස්ථාවේදී විදේශ රැකියා පිළිබඳවත් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. මොකද, අපි විදේශ රැකියා ගැන කථා කරද්දී, විශේෂයෙන්ම ගෘහ සේවිකාවන් පිට රට යවනවා වෙනුවට මෙම වැඩ පිළිවෙළ යටතේ වෘත්තීය පුහුණුව ලබා ගත් අය අපට පිට රට යවන්න පුළුවන්කම තිබෙනවා. මේ වැඩ පිළිවෙළ යටතේ වන 13වැනි වසර දක්වා වන අධ්‍යාපන ක්‍රමයත්, ඒකට සම්බන්ධ වුණු අනෙකුත් වෘත්තීය පුහුණු ආයතන සියල්ලත් ඒකරාශි කරලා, ඒ සම්බන්ධීකරණයත් එක්ක විශේෂයෙන්ම පිරිමි පක්ෂයෙන් පුහුණු ශ්‍රමිකයන් පිරිසක් අපි හදනවා. කාන්තාවන්ට පිට රට යන්න අවශ්‍ය නම්, විශේෂයෙන්ම පුහුණු ශ්‍රමිකයන් හැටියට අපි ඒ අයවත් පුහුණු කරනවා. එම නිසා පුහුණු ශ්‍රමිකයන් හැටියට එක පැත්තකින් අපි ඔවුන්ව දැනුමෙන් පෝෂණය කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

විශේෂයෙන්ම ඒ අයව දැනුමෙන් සන්නද්ධ කරලා ශ්‍රී ලංකාවේ කීර්තිය ආරක්ෂා කර ගනිමින් ඔවුන්ව පිට රටවලට යවන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ හා සමානවම ශ්‍රී

ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කරන්න අවශ්‍ය කරන විදේශ විනිමය ලබා ගත හැකි වැඩසටහනක් ක්‍රියාත්මක කරන්නත් අපි බලාපොරොත්තු වෙනවා.

අවසාන වශයෙන් මම ගරු මුදල් අමාත්‍යතුමාට යෝජනාවක් කරන්න බලාපොරොත්තු වෙනවා. විශේෂයෙන්ම 2008 වසරට පෙර ශ්‍රී ලංකා රේගුව හරහා භාණ්ඩ ගෙන්වන විට සිදු වූ හොරකම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ අවස්ථාවල බදු ගෙවීම විශාල වශයෙන් පැහැර හැරලා තිබෙනවා. කාරණා දෙකක් පිළිබඳව මම මේ අවස්ථාවේ සිහිපත් කරනවා. ඒ වෙලාවේ ඩයලොග් සමාගම මේ රටට CDMA දුරකථන හොරෙන් ගෙනැල්ලා අහුවෙලා තිබෙනවා. ඊට පස්සේ එම CDMA දුරකථන ගෙන්වීම නතර කළාට පස්සේ ඒවාට බදු සහන දීලා තිබෙනවා. හැබැයි, එතැනදී අහු වුණු දුරකථන සඳහා ශ්‍රී ලංකා රේගුව CBCU/2008/11 යටතේ ඩයලොග් ආයතනයට රුපියල් බිලියන 4.4ක බද්දක් නියම කරලා තිබෙනවා. හැබැයි, ඒ මුදල තවම ගෙවලා නැහැ; මහ හැරලා තිබෙනවා. මොකද, එදා තිබුණු ආණ්ඩුවේ ඇමතිවරුත් එක්ක සම්බන්ධ වෙලා තමයි මේ හොරකම කරලා තිබෙන්නේ. මේ හොරකම සම්බන්ධයෙන් ගෙවන්න නියම කළ මුදල් ප්‍රමාණය ගෙවලා නැහැ. ඒ හා සමානවම ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය කළ හොරකමකුත් CBCU/2008/2 ලිපිය මඟින් පෙන්වා දී තිබෙනවා. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයේ වංචාව විධියට බිලියන 1ක් තිබෙනවා. මේ හා සමානවම රේගුව මඟින් නියම කළ දඩ මුදල් ගෙවීම පැහැර හරින ලද විශාල පිරිසක් ඉන්නවා. අපි අය වැය ගැන කථා කරද්දී,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් කළ කාලය දැන් අවසන්.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)
මට තව තත්පර කිහිපයක් දෙන්න ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මුදල් අමාත්‍යතුමාගෙන් ඉතාම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කොකා පෙන්වලා බදු නොගෙවමින් හැංගිලා සිටින කණ්ඩායමත් අල්ලාගන්න කියා. අපි ළඟ සංඛ්‍යා ලේඛන තිබෙනවා. ඉදිරියේදී අපි ඒවා ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ හා සමානවම රේගුව මඟින් දඩ මුදල් ගහපු අයගේ මුදල් ටිකත් එකතු කරගන්න කියලා විශේෂයෙන්ම අපි ගරු මුදල් අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා. එම ඉල්ලීම කරමින් සමස්ත ශ්‍රී ලංකා ජනතාවට ජය වේවා කියා ප්‍රාර්ථනා කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
බොහොම ස්තුතියි. මීළඟට ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය.

[අ.භා. 2.21]

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, යහ පාලන ආණ්ඩුවේ අවසාන කාලයේ; ස්වභාවිකව මිය ඇදෙමින් තිබෙන යහ පාලන ආණ්ඩුවේ අවසාන අය වැය පිළිබඳ විවාදය අවස්ථාවේ වචන කිහිපයක් කථා කරන්නට ලැබීම ගැන මම බොහොම සන්තෝෂ වෙනවා.

විශේෂයෙන්ම අපට මතකයි, රනිල් වික්‍රමසිංහ මැතිතුමා එක් මැතිවරණයකට ඉස්සෙල්ලා මේ රටේ තරුණයින්ට කිව්වා, රත්තරන් බ්‍රේස්ලට් දෙනවා කියලා.

ශ්‍රී ලාංකීය තරුණයාගේ හදවත වර්තමාන අගමැතිවරයාට හඳුනා ගැනීමට බැරි වී තිබෙනවා. එතුමා ඉන්නේ තවමත් එතැන. රත්තරන් බ්‍රේස්ලට් තරුණයන්ට දෙනවා කිව්වාට, අපේ රටේ තරුණයන් ඒක විශ්වාස කළේ නැහැ. එතුමා ඒ මැතිවරණයේදී පරාජයට පත් වුණා. නමුත්, අදත් එතුමා එතැනම ඉඳගෙන ශ්‍රී ලාංකීය තරුණයාට නැවතත් පොරොන්දු ගොන්නක් දීලා, ශ්‍රී ලාංකීය තරුණයා විහිළුවකට ලක් කිරීමට කටයුතු කරන බව තමයි අපට පෙනෙන්නේ. එතුමන්ලා මේ රටේ ජනතාවට කිව්වා free Wi-Fi දෙනවා කියලා. මේ රටේ තරුණයන් ටවුන්වලට ගිහිල්ලා ඔවුන්ගේ smartphone එකේ රනිල් වික්‍රමසිංහගේ නම ගැහුවාම smartphone එක මැද්දේ තිබෙන බෝලය කැරකෙනවා මිස free Wi-Fi ලැබුණේ නැහැ කියලා ඔවුන් අපට කියනවා. උගස් කරන ලද රත්තරන් බඩුවල බැංකු පොලිය සම්පූර්ණයෙන් කපා හැර, රත්තරන් බඩු නිදහස් කර දෙනවා කියලා මේ රටේ කාන්තාවන්ට කිව්වා. ඒ අය වැය පොරොන්දු එකක්වත් මේ රටේ ඉෂ්ට වුණේ නැහැ. විශ්‍රාමිකයන්ට නොමිලේ ගමන් පහසුකම් ලබා දෙනවා කිව්වා. ඒ විතරක් නොවෙයි, ගොවීන්ගේ සියලු ණය කපා හරිනවා කිව්වා. ගැබිණි මාතාවකට රුපියල් 20,000ක පෝෂණ මල්ලක් දෙනවා කිව්වා. අද මට කලින් කථා කළ මගේ සහෝදර මන්ත්‍රීතුමා කිව්වා වාගේ, මේ රටේ තරුණ තරුණියන්ට නොතෙමී යන්න වාහන ලබා දෙනවා කිව්වා. අපට එක කරුණක් ගැන බය තිබෙනවා. මේ අවුරුදු හතර පුරා ගෙනා අය වැයවලදී නොයෙකුත් බොරු පොරොන්දු ලබා දුන්නා වාගේම, දිගටම මේ රටේ තරුණයන් රැවටීම නිසා ඔවුන්ගේ බලාපොරොත්තු බිඳ වැටුණොත්, අවසානයේ මේ රටේ බටලන්දක් නිර්මාණය කරන්නත් අපේ අගමැතිතුමා බලාගෙන ඉන්නවාද දන්නේ නැහැ.

මේ ආණ්ඩුව ඉදිරිපත් කර තිබෙන අය වැයෙන් මොනවාද මේ රටේ ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීමට ඉදිරිපත් කර තිබෙන සාධනීය යෝජනා? අය වැයක් කියන්නේ රටේ අනාගතය සම්බන්ධයෙන් තිබෙන ප්‍රතිපත්ති ප්‍රකාශය; මූල්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශය. මේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට, දේශීය කර්මාන්තකරුවන් දිරිගැන්වීමට, දේශීය සුළු කර්මාන්තකරුවන් දිරිගැන්වීමට, මේ රටට ආයෝජන ගෙන ඒමට, මේ රටේ ජනතාවගේ ජීවිත ශක්තිමත් කිරීමට ඔබතුමන්ලාගේ මේ අය වැය තුළ මොනවා හෝ සාධනීය යෝජනා තිබෙනවාද? ගසකින් ඵලයක් ලබා ගන්න නම්, ඒ සඳහා පැළයක් හිටවන්න ඕනෑ; පොහොර දමන්න ඕනෑ; වතුර දමන්න ඕනෑ; අවශ්‍ය පසුබිම හදන්න ඕනෑ. එහෙම කළොත් තමයි අපට ඵලයක් ලබා ගැනීමට හැකි වන්නේ. නමුත් අද සිද්ධ වෙලා තිබෙන්නේ අවුරුදු හතරක් පුරාවට මේ රටේ ජනතාව රවට්ටමින් පොරොන්දු ලබා දීම පමණයි. මගේ සහෝදර ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු කියනවා, මේ අවුරුදු හතර ඉවර වෙනකොට "අපි අහවල් වැඩ පිළිවෙළ පටන් ගන්නවා" කියලා. ජනාධිපතිවරණයට තිබෙන්නේ තව මාස හතයි. දැන් මේ මේ වැඩ පිළිවෙළ පටන් ගන්නවාය කියනවා. ඒ නිසා ඔබතුමන්ලාගේ ආණ්ඩුවට මේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට නිවැරදි දෘෂ්ටියක් නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමිය, ඔබතුමියට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ඔබතුමන්ලා සරණ යන ඒ රටවල් අපේ රට සූරාගෙන කෑවා මිස, කවදාවත් අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට කටයුතු කරපු රටවල් නොවෙයි. විශේෂයෙන් මේ රටේ ජනතාවගෙන් එකතු කරන බදු මුදල් තමයි, ඔබතුමන්ලා මේ රටේ ආර්ථිකය ශක්තිමත් කිරීමට පාවිච්චි කරන්නේ.

අද හැම අංශයකටම බදු ගහලා තිබෙනවා. අපේ ආණ්ඩුව කාලයේ රටේ ජනතාවගෙන් වැඩියෙන්ම බදු එකතු කරපු වර්ෂයේත් රුපියල් බිලියන 1,000යි එකතු කළේ. ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආවාට පස්සේ සෑම අංශයකටම බදු ගහලා, අද එකතු කරන බදු ප්‍රමාණය රුපියල් බිලියන 2,000ක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අද මේ රටේ මිනිසුන්ට ජීවත් වෙන්න බැහැ. අද මේ රටේ මිනිස්සු යම්කිසි මුදලක් අතට ගත්තාම, සති දෙකක් යනකොට ඒ මුදල ඉවරයි. මේ පාර්ලිමේන්තුවේ ගැලරියේ ඉන්න මාධ්‍යවේදීන් දන්නවා, අපේ රටේ ඉන්න සාමාන්‍ය ජනතාව දන්නවා, ඔවුන්ට ලැබෙන වැටුපෙන් සති දෙකකට වඩා ජීවත් වෙන්න බැහැ කියලා.

ඒ විතරක් නොවෙයි, මහ බැංකු කොල්ලය නිසා මේ රටේ පොලී අනුපාත විශාල ප්‍රමාණයකට වැඩි වෙලා තිබෙනවා. තනි ඉලක්කමේ තිබ්බ පොලිය අද මේ රටේ ජනතාවට දරා ගන්න බැරි තත්ත්වයට වැඩි වෙලා තිබෙනවා. ඔබතුමන්ලා ආර්ථිකය ශක්තිමත් කරනවා කියන්නේ, මේ රටට ආදායම් එන්න තිබුණු වරායවල් විකුණා දැමීමත්, මේ රටේ තිබෙන සම්පත් විකුණා දැම්මත්, ජනතාවට පොලී එකතු කිරීමත් විතරයි. ඒ හැර ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් මේ මව්බිමේ ආර්ථිකය ශක්තිමත් කරන රටට හරියන නිවැරදි දෘෂ්ටියක් සහිතව,-

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

ගරු මන්ත්‍රීතුමියට නියමිත කාලය දැන් අවසානයි.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

ඔබතුමන්ලා ඡන්ද ඉලක්ක කරගෙන මේ රටේ ජනතාවට bracelets දෙනවා කිව්වා; free Wi-Fi දෙනවා කිව්වා. කාන්තාවන්ගේ රත්රන් බඩුවලට අය කර තිබෙන පොලිය අයින් කරනවා කිව්වා. රාජ්‍ය සේවකයන්ට නොමිලේ බයිසිකල් දෙනවා කිව්වා. දැන් මේ අය වැයෙන් සිහින මාලිගා දෙනවාය කියනවා. ඉතිහාසය පුරාවටම එක්සත් ජාතික පක්ෂය ජනතාවට බොරු පොරොන්දු දීලා, යමක් කරගන්න බැරි වෙච්ච නිසා මේ අවුරුද්දේත් මේ දීලා තිබෙන්නේ පොරොන්දු පමණයි කියන එක මේ රටේ සාමාන්‍ය ජනතාවට තේරුම් ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා මේ රටට අවශ්‍ය වෙනවා, ශක්තිමත් නායකත්වයක් සහිතව නිවැරදි දෘෂ්ටියක් තිබෙන ආණ්ඩුවක්. විධායකයේ සිට ව්‍යවස්ථාදායකයේ සිට මුළු මහත් ලංකාව පුරාම රාජ්‍ය පාලනය ගම දක්වා ගිහින් මේ මව්බිම නැඟිට්ටවන්න පුළුවන් නිවැරදි නායකත්වයක්, ශක්තිමත් නායකත්වයක් තිබෙන පාලනයක් මේ රටට අවශ්‍යයි. ජනතාව තලා පෙළා බදු ගහන, රටේ සම්පත් විකුණන පරගැති ආණ්ඩුවක් මේ රටට අවශ්‍ය නැහැයි කියන එක සඳහන් කරන්න ඕනෑ. මේ ආණ්ඩුව පරාජය කිරීමට මේ රටේ ජනතාව පසුගිය පළාත් පාලන මැතිවරණයේ ප්‍රතිඵලත් එක්ක පෙළ ගැසී ඉන්නවා. නමුත් මේ ආණ්ඩුව අද ප්‍රජාතන්ත්‍රවාදය උල්ලංඝනය කරමින් ඡන්ද කල් දමමින් ඉන්නවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමිය.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)

මේ රටේ ජනතාව එයට විරුද්ධව ප්‍රතිචාර දක්වා තිබෙනවා. ඒ වෙනුවෙන් මේ රටේ ජනතාව පෙළ ගැසී සිටින බව මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

මීළඟට, ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා.2.30]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි.

මංගල සමරවීර මැතිතුමා එක්සත් ජාතික පක්ෂයේ, අපේ තනි ආණ්ඩුවකින් ඉදිරිපත් කරපු මංගල අය වැය වෙනුවෙන් කථා කරන්නට අවස්ථාවක් ලැබීම පිළිබඳව සන්තෝෂයට පත් වෙනවා.

අපේ පවිත්‍රා වන්නිආරච්චි මන්ත්‍රීතුමිය ප්‍රකාශ කරපු විධියට මේ අය වැය ලේඛනයේ කිසිම දෙයක් නැහැ. එහෙම තමයි එතුමිය කිව්වේ. මේ අය වැය ලේඛනයේ දැක්මක් නැහැ කියලා තමයි එතුමිය කිව්වේ. මෙතෙක්, වසර හතරක කාලසීමාවක් තුළ ආපු දුර පිළිබඳවත්, ඒ කාලසීමාව තුළ සිද්ධ වුණු දේවල් මොනවාද කියන එකත් එතුමිය කිව්වා. අපේ නිවාස සංවර්ධන ව්‍යාපෘතිය යටතේ "ගම්උදාව" ව්‍යාපෘතිය මේ වන විට ගම්මාන 2,500කට ආසන්න ප්‍රමාණයක් සකස් වෙමින්, දැන් 176වැනි ගම්උදාවත් ජනතා අයිතියට පත් වෙමින් යන බව මම එතුමියට කියන්න කැමැතියි. ඒ වාගේම, මධ්‍යම අධිවේගී මාර්ගයේ මීරිගම ඉඳලා කුරුණෑගල දක්වා කොටසේ දැන් සියයට 80ක් වැඩ අවසන් වෙලා තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Order please! Will an Hon. Member propose the Hon. Bimal Rathnayake to the Chair?

**ගරු මනෝ ගනේසන් මහතා (ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனோ கணேசன் - தேசிய ஒருமைப்பாடு, அரசகரும மொழிகள், சமூக மேம்பாடு மற்றும் இந்து சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Mano Ganesan - Minister of National Integration, Official Languages, Social Progress and Hindu Religious Affairs)

I propose that the Hon. Bimal Rathnayake do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

*අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු බිමල් රත්නායක මහතා මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. BIMAL RATHNAYAKE *took the Chair.*

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

අපි බිංගිරියේ මේ ඊයේ-පෙරේදා කර්මාන්තපුරයක් ආරම්භ කළා. අපේ රටේ තිබෙන බොහෝ බෞද්ධ ආගමික ස්ථානවලට දැවැන්ත සංවර්ධනයක් කිරීමේ අරමුණින් මුදල් වෙන් කරලා තිබෙනවා. රෝහල් සඳහාත් අපි මුදල් වෙන් කරලා තිබෙනවා. "හොඳම පාසල - ළඟම පාසල" වැඩසටහන යටතේ පාසල් 7,000 ගණනකට මේ වන විට තනි මහල් ගොඩනැගිලි, දෙමහල් ගොඩනැගිලි, තුන්මහල් ගොඩනැගිලි වාගේ විවිධාකාර පහසුකම් ලබා දීලා තිබෙනවා. පාරවල්වල යනකොට මේවා තමුන්නාන්සේලාට බෝඩ්වලින් බලාගන්න පුළුවන්. ඒ නිසා අපි මේ ඉදිරිපත් කරපු අය වැය දැක්මක් ඇති අය වැයක් මිස, දැක්මක් නැති අය වැයක් නොවෙයි කියන එක මම විශේෂයෙන්ම කියන්න ඕනෑ. අපි මේ අය වැය තුළින් සමෘද්ධිලාභීන් ලක්ෂ හයකට සමෘද්ධිය ලබා දෙමින්, දුගියා පිළිබඳවත් අපි අවධානය යොමු කරලා තිබෙනවා.

මෙතෙක් කාලයක් රණවිරුවන් පිළිබඳව ප්‍රශස්ති ගයමින් සිටියා මිසක් ඔවුන්ට කිසිම සහනයක් සැලසුවේ නැති ආණ්ඩු තිබෙද්දී, අපි මේ පාර රණවිරුවන් ගැන, විදේශ ශ්‍රමිකයන් ගැන, ව්‍යාපාරිකයන් ගැන, දරුවන් ගැන කල්පනා කරලා යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. මහින්ද රාජපක්ෂ මහත්තයා කසාද බඳින ජෝඩුවලට කසාද බඳින ගාස්තුව රුපියල් 1,000 සිට 5,000 දක්වා වැඩි කළා. එහෙම කටයුතු කරපු මහින්ද රාජපක්ෂ මහත්මයාට කිසිම සදාචාරයක් නැහැ, අලුත් ජෝඩු ගැන; මේ විවාහ වීම් ගැන කථා කරන්න. රුපියල් 1,000ට තිබුණු විවාහ රෙජිස්ට්‍රාර් ගාස්තුව රුපියල් 5,000ක් දක්වා වැඩි කළා, මහින්ද රාජපක්ෂ මහත්මයා. විවිධ ක්ෂේත්‍ර පිළිබඳව අවධානය යොමු කරපු අය වැයක් හැටියට මට මේ අය වැය ලේඛනය හඳුන්වන්න පුළුවන්. මේක මහා සිහින සිතුවිල්ලක්; සිහින චින්තනයක්, විකාරරූපී ලියවිල්ලක් හැටියටයි හඳුන්වන්නේ. එවැනි ලියවිලි අපි දැක තිබෙනවා.

"මහින්ද චින්තනය" කියලා ලියවිල්ලක් අපි දැක්කා. ඒක මහින්ද රාජපක්ෂ මහත්මයා සහ එතුමාගේ පවුලේ කොම්පැනිය විසින් හදපු එතුමාගේ චින්තනය. චින්තනය පිළිබඳව ලියවිල්ල අපි දැක්කා. ඒ ලියවිල්ල තුළ තිබුණු දේවල්වලින් අවුරුදු 10ක් මහින්ද රාජපක්ෂ මහත්මයා රට පාලනය කළා නේ. ඒ, "මහින්ද චින්තනය" තුළ ලියවිලා තිබුණු දේවල්වලින් සියයට කීයක්ද ඉෂ්ට කළේ කියන කාරණය ගැන කථා කරනවා නම්, මේ වාගේ මාතෘකා පිළිබඳව කථා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. "මහින්ද චින්තනය" තුළින් එම අවුරුදු 10 තුළ සියයට කීයක්ද ඉෂ්ට කරනු ලැබුවේ? තමන්ගේ කුණු තියාගෙන වෙනත් කුණු ගැන කථා කරන එක කනගාටුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසු ගිය ආණ්ඩු කාලයේ සම්පූර්ණයෙන් මහින්ද රාජපක්ෂ මහත්මයා ඇතුළු ඔය කණ්ඩායම රණවිරුවන්ව කරේ තියාගෙන, පිටේ තියාගෙන තමයි තමන්ගේ දේශපාලන ගමන ගියේ. බොරු වචන දාලා, බොරු අං තට්ටු දාලා, බොරුවට වර්ණනා කරලා, මුරුංගා අතුවල තියලා, රණවිරුවන් පාවිච්චි කරමින් ඔවුන්ගේ කර මතින් දේශපාලන ගමන ගියා මිසක් ඔවුන්ට එක තුට්ටු දෙකක් ලබා දුන්නේ නැහැ. හැබැයි, අපේ රටේ සමස්ත රණවිරුවන් වෙනුවෙන් අපි විශාල වැටුප් වැඩි කිරීමක් කරලා තිබෙනවා. කමාන්ඩෝ දීමනාව රුපියල් 1,000 සිට 5,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ගෙවල් කුලී දීමනාව සියයට 200කින්, නිල ඇඳුම් දීමනාව, රණවිරු දීමනාව වැඩි කරලා තිබෙනවා. අපි රණවිරුවෝ කරේ තියාගෙන ගිහිල්ලා, ඒ ගංගාවෙන් එගොඩ වෙලා අපේ දේශපාලන ගමන යෑම වෙනුවට රණවිරුවන්ට ශක්තියක් ලැබෙන විධියට මේ අය වැය ලේඛනය තුළින් ඔවුන්ට සහන දෙන්න අවස්ථාව අපට ලැබිලා තිබෙනවා.

විශේෂයෙන්ම පොලීසිය ගැනත් කියන්නට ඕනෑ. අපි 2016 වසරේදී සියයට 40කින් පොලීසියේ වැටුප් වැඩි කළා. 2016දී පොලීසියේ සියලු දෙනාගේ සංයුක්ත දීමනාව අපි වැඩි කළා, තෘප්තිමත් පොලීසියක් නිර්මාණය කිරීම සඳහා. අතිගරු ජනාධිපතිතුමා මේ දවස්වල පොලිස් දෙපාර්තමේන්තුව භාරගෙන මත්ද්‍රව්‍ය ඇතුළු සියලු අපරාධ වැළැක්වීම සඳහා පොලීසිය මෙහෙයවමින් ඉන්නවා. ඒ එක්කම මම මෙතැනදී පොඩි යෝජනාවකුත් කරන්න කැමැතියි. අපි පොලීසියෙන් උසස් සේවයක් බලාපොරොත්තු වෙනවා නම්, අපි තෘප්තිමත් පොලීසියක් නිර්මාණය කරන්න ඕනෑ. පොලීසිය ගැන අපට අහන්න ලැබෙන කථා සමහර වෙලාවට හොඳ නැහැ. පගාව; අල්ලස්; ජරාව ගැනීම ගැන අහන්නට ලැබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි තෘප්තිමත් පොලීසියක් නිර්මාණය නොකිරීම නිසායි එහෙම සිදු වන්නේ.

සාමාන්‍ය පොලිස් නිලධාරි මහත්මයෙක් සිතාසියක් හරි, කටඋත්තරයක් ගන්න හරි ගමකට එන්නේ තමන්ගේ මෝටර් සයිකලයෙන්. තමන්ගේ අතින් පෙට්‍රල් ගහගෙන එන්නේ. පහසුකම් නැහැ. ඒ ගම්වල ඉන්න වැදගත් අයට පොලීසිය අවශ්‍ය වෙන්නේ නැහැ. ඔවුන්ට පොලීසිය අවශ්‍ය වෙන්නේ නැති වුණාට පොලීසිය අවශ්‍ය වෙන මිනිහෙක් ගමේ ඉන්නවා. ගමේ ඉන්න වැඩියෙන්ම අපරාධ කරන, කසිප්පු විකුණන, අරක්කු විකුණන මිනිහාට තමයි පොලීසිය වටින්නේ. "ආ! එන්න සර්. කොහොමද සර්, වාඩි වෙන්න සර්." කියලා කථා කරන්නේ. රෙද්ද එළලා, එහෙම තමයි පොලීසිය පිළිගන්නේ. අන්තිමට ඒ පොලිස් නිලධාරියා ගෙදරින් ආපසු යන කොට ගහේ තිබෙන දෙහි ගෙඩි ටිකක් හරි කමක් නැහැ කඩලා දීලා තමයි ඒ නිලධාරියා පිටත් කරලා යවන්නේ. පොලීසිය ජරාවට හුරුවන්නේ එහෙමයි. හැබැයි, තෘප්තිමත් පොලීසියක් තිබෙනවා නම්, සියලු අවශ්‍යතා සම්පූර්ණ කරපු පොලීසියක් තිබෙනවා නම්, පොලිස් නිලධාරින්ට රජෙක් වාගේ ගමට එන්න පුළුවන්; වැදගත් විධියට ගමට එන්න පුළුවන්. ඒක නිසා මම ජනාධිපතිතුමාට කියන්නේ, පොලීසියෙන් වැඩ ගන්නවා වාගේම තෘප්තිමත් පොලීසියක් නිර්මාණය කරන්න කියන එකයි. පොලිස් නිලධාරින්ගේ තිබෙන අපහසුකම්, දුෂ්කරතා මැඩ පවත්වන්න කටයුතු කරන්න කියන එකයි. ඒ එක්කම "මතට තිත" ගැන කථා කරන කොට, කථා නොකරම බැරි තව එක දෙයක් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මත්ද්‍රව්‍ය ගැන කථා කරන කොට ඒක අද අපේ රටේ විශාල සමාජ ප්‍රශ්නයක්. මත්ද්‍රව්‍ය කියන ඒ, පිළිලය අපි තුරන් කළ යුතුයි. හැබැයි, මේ අය වැය ලේඛනය තුළ මත්ද්‍රව්‍ය සඳහා බන්ධනාගාරගත වූවන්ට එළිමහන් කඳවුරු දෙකක් සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මගේ උපාධියට කළේ, අපරාධ විද්‍යාව සම්බන්ධවයි. අපරාධ විද්‍යාව කරපු පුද්ගලයකු හැටියට මා දන්නවා, මත් ද්‍රව්‍ය යම්තම් භාවිත කරලා රිමාන්ඩ් බන්ධනාගාරගත කරන පුද්ගලයකු සති දෙකකින්, මාසයකින් පසුව ආපසු එළියට එන්නේ මත් ද්‍රව්‍ය පිළිබඳව ඩිප්ලෝමාවක්

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

අරගෙනයි කියලා. මත් ද්‍රව්‍ය පිළිබඳ උපාධියක් අරගෙනයි එන්නේ. ඒවා බෙදා හරින තැන්, ඒ ජාලාවන්, විවිධ අයියලා, ඒ පප්පලා, ඒ මහප්පලා සියලුදෙනාම දැන හඳුනාගෙනයි එන්නේ. එය අපේ රටේ මත් ද්‍රව්‍ය ජාලය ව්‍යාප්ත වීමට කාරණාවක් වන නිසා අපි එළිමහන් කඳවුරු දෙකක් ඇති කරන්න මේ අය වැයෙන් යෝජනා කර තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. මත්පැන් පිළිබඳවත් මා වචනයක් කියන්නට ඕනෑ. සමහර විට මේ කාරණය සමාජය කොහොම තේරුම් ගනියිද කියා මා දන්නේ නැහැ. ජනාධිපතිතුමා ප්‍රකාශ කරනවා, මේ වෙසක් පොහොය වනකොට අපේ රටේ මත් උවදුර සම්පූර්ණයෙන් අවසන් කරනවාය කියලා. එහෙම කරන එක හොඳයි. අපි එය අගය කරනවා. මත් ද්‍රව්‍ය සම්පූර්ණයෙන් අවසන් කළ යුතුයි. හැබැයි වෙසක් පොහොය වනකොට අපේ රටින් සම්පූර්ණයෙන්ම මත්පැන් උවදුර තුරන් කර දමනවා නම්, අපේ රටේ තිබෙන ආණ්ඩුවේ වගකීම සහිත, ආණ්ඩුව බදු අය කර ගන්නා රට බීම තැබෑරුම් - wine stores - සියල්ල වසා දමන්නය කියන එකත් මා ජනාධිපතිතුමාට කියනවා. අපේ රටේ හැම නගරයක්, නගරයක් ගානේම තිබෙන, ආණ්ඩුවේ අනුග්‍රහය ලබන, ආණ්ඩුවේ අරක්කු කඩ ටිකත් වසා දමන්නය කියලා මා කියනවා. මොකද, ආණ්ඩුව අරක්කු විකුණන්න වෙනම කඩ දමන්න උදවු කරන්නයි, permit දෙන්නයි කටයුතු කරමින් ගමේ තිබෙන ඒවා අල්ලනවා. මේ අතර ලොකු පරස්පරයක් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අඩියක් ගහන්නේ ඇයි කියලා මිනිසුන්ගෙන් ඇහුවාම එක එක කථා කියනවා නේ. හිතේ අමාරුවට අඩියක් ගහනවා, ඇඟේ අමාරුවට අඩියක් ගහනවා, මොළේ අමාරුවට අඩියක් ගහනවා, යාළුවාගේ ප්‍රශ්නයකට අඩියක් ගහනවා කියලා කියනවා. එවැනි ප්‍රශ්න තිබෙනවා. ඒ ප්‍රශ්නය තිබෙන්නේ දුප්පත් මිනිහාට විතරද? ලොකු මිනිහාට ඇඟේ අමාරුවට අඩියක් ගහන්න නගරයේ තැබෑරුම තිබෙනවා. ලොකු මිනිහාගේ හිතේ අමාරුවට, මොළේ අමාරුවට, සියලු අමාරුවලට අඩියක් ගහන්න එතැන නිල වශයෙන් අරක්කු ටික විකුණනවා. හැබැයි ගම්වල ඉන්න අහිංසක දුප්පතාට, කම්කරුවාට තිබෙන ඇඟේ අමාරුවට, හිතේ අමාරුවට, දාහය නිවා ගන්න අඩියක් ගැසීමේ වරප්‍රසාදය අහිමි කිරීම පිළිබඳව සමාජ විද්‍යාත්මකව හිතන්න අවශ්‍ය වෙනවා. අපි එහෙම කරන එක වැරැදියි. ඇති නැති පරතරය ඒ තුළිනුත් ප්‍රකාශ වෙනවා. ඒ නිසා මංගල සමරවීර ඇමතිතුමාට මා යෝජනා කරනවා, අරක්කු සම්පූර්ණයෙන් තහනම් කරනවා නම් කරුණාකරලා නගරයේ තිබෙන අවන්හල් සියල්ලේ ඉඳලාම තහනම් කරන්න පටන් ගනිමු. පොඩි මිනිහාට විතරක් ඒ වරප්‍රසාදය අහිමි කරන්න එපා, පොඩි මිනිහාටත් යම්කිසි වරප්‍රසාදයක් ලබාදෙන්න. අවශ්‍ය නම් ප්‍රමිතියකින් යුක්ත, සෞඛ්‍ය ආරක්ෂිත, පහළ මිල මට්ටමක ගල් අරක්කු බෝතලයක් අඩුම තරමේ රුපියල් 500කට හෝ රුපියල් 1,000කට ලබා දෙන්න. මා හිතන හැටියට එය හොඳ යෝජනාවක්. මා ජනාධිපතිතුමාටත් ඒ ගැන කියන්නම්. අපි පොඩි මිනිසුන් ගැන එහෙම හිතමු. සුරාව, සූදුව ගැන ලොකු මිනිහාටත්, පොඩි මිනිහාටත් නීති දෙකක් තිබෙන්න බැහැ. ඒ ගැනත් මා මේ අවස්ථාවේදී විශේෂයෙන් මතක් කරනවා.

ඊළඟට, "සිහින මාළිගා" ණය යෝජනා ක්‍රමය ගැන බොහොම අවඥා සහගතව කථා කළා. අපේ අහිංසක, දුප්පත් කාන්තාවන් විදේශගත වෙන්නේ කර කියා ගන්න කිසිම දෙයක් නැතිකම නිසායි. දුප්පත්කම ඉහ වහා ගියාම, තමන්ගේ ස්වාමිපුරුෂයා හම්බ කරන්නේ නැති වුණාම, උපයන මුදල ඒ පවුලට මදි වුණාම සිහින මාළිගා රාශියක් හිතේ තබාගෙන, බලාපොරොත්තු රාශියක් හිතේ තබාගෙන තමයි ඔවුන් විදේශගත වෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
**(The Hon. Presiding Member)**

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
**(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)**
**(The Hon. Thushara Indunil Amarasena)**

හැබැයි, ඔවුන් විදේශගත වුණාම සමාජයීය ප්‍රශ්න රාශියක් ඇතිවෙනවා. දරුවන් ටික නන්නත්තාර වෙනවා; ස්වාමිපුරුෂයා නන්නත්තාර වෙනවා. ඒ කාන්තාව ආපසු එනකොට සිහින මාළිගා සියල්ල බිඳ වැටිලා තිබෙනවා. අපි විදේශ ශ්‍රමිකයින්ගෙන් විශාල ආදායමක් උපයා ගන්නවා නම්, ඒ අය වෙනුවෙන් යම් සේවයක් කරන්න රජයක් හැටියට අපි බැඳිලා ඉන්නවා. මෙතෙක් කාලයක් කිසිම රජයක් ඔවුන් වෙනුවෙන් අවධානය යොමු කළේ නැහැ. තමන්ගේ පැල්කොටේ හදාගන්න, තමන්ගේ ගෘහය හදාගන්න, රජයක් හැටියට මේ අය වැය ලේඛනය යටතේ අපි මැදිහත්වන බව මා කියන්න ඕනෑ.

ඒ විතරක් නොවෙයි. Enterprise Sri Lanka ණය වැඩසටහන ගැනත් කියන්න ඕනෑ. අපි ඉතාමත් හොඳ වැඩසටහනක් හඳුන්වා දීලා තිබෙනවා. මංගල සමරවීර ඇමතිතුමාගේ ඒ ප්‍රකාශ මා අගය කරනවා. හැබැයි ඒ ගැන මා සෑහීමකට පත් වෙන්නේ නැහැ. Enterprise Sri Lanka ණය වැඩසටහන යටතේ මෙපමණ ප්‍රමාණයක් ණය දීලා තිබෙනවාය කියලා කියනවා. එහෙම කිව්වාට Enterprise Sri Lanka ණය වැඩසටහන යටතේ ගම්වල ණය ලබාගත් අය ඉතා අඩුයි. මොකක්ද සිද්ධ වෙන්නේ? ලොකු ඉලක්කම් ටිකක් තිබෙනවා. බැංකුකරුවන්ගේ පෞද්ගලික හිතවතුන් මේ Enterprise Sri Lanka කියන බෝර්ඩ් එක යටතේ, රජය ලබාදෙන වරප්‍රසාද යටතේ ඒ ණය මුදල් ටික ලබා ගන්නවා. ඊට පස්සේ මුදල් අමාත්‍යාංශයට බොරු ඉලක්කම් සපයනවා. එහෙම අය මේ සභාවේත් ඇති. ඒ සියලු දෙනාටම මා චෝදනා කරනවා.

ඒක බොරුවක්. බොරු ඉලක්කම් තමයි සපයන්නේ. අන්තිමට අපි "එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා" යටතේ මෙච්චර ණය දුන්නාය කියනවා. බැංකු නිලධාරින්ගේ හිතවතුන් පක්ෂ භේදයක් නැතිව, -පොඩි ගතමනාවකුත් අරගෙන- ඒ ණය වරප්‍රසාදය ලබා ගන්නවා. මේ ක්‍රමය වැරැදියි. එම නිසා, එය වහාම නිවැරැදි විය යුතුයි.

පුංචි කාර් සඳහා තිබෙන බදු පිළිබඳවත් මෙතුමන්ලා කථා කළා. පසුගිය දවස්වල අපේ රුපියලේ අගය කඩාගෙන වැටුණාය කියා අපි දන්නවා නේ. අපේ රටෙන් ඩොලර් පිටවීම නවත්වා ගත යුතුයි. ඒ වාගේම අපි මේ වාහන තදබදයත් අඩු කර ගත යුතුයි. අපි අද ඉලක්කම් පිටුපස හඹා යනවා; අලුත් numbers හොයාගෙන යනවා. අපේ පරණ වාහන ටික නැවත නැවත භාවිතයට ගත්තොත් මොකද වෙන්නේ? අලුත් වාහන සොයන එවැනි ක්‍රියාමාර්ග අධෛර්යවත් කරන්න ගත්ත ක්‍රියාමාර්ගයක් හැටියටත් අපට මේ ගැන හිතන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
**(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)**
**(The Hon. Presiding Member)**

ගරු මන්ත්‍රීතුමනි, කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
**(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)**
**(The Hon. Thushara Indunil Amarasena)**

මට තව සුළු වෙලාවක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එම නිසා තමුන්නාන්සේලා පුංචි කාර් ගැනත් කලබල වෙන්න එපා. එය අපේ පරිසරය ආරක්ෂා කර ගන්න, වාහන තදබදය අවම කරන්න, අපේ රුපියල ආරක්ෂා කර ගන්න ගත්ත ක්‍රියාමාර්ගයක් හැටියට සලකන්නය කියා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා. අප මේ සමස්ත ක්‍රියාදාමය පිළිබඳවයි අවධානය යොමු කළ යුත්තේ. මෙම අය වැය ලේඛනය පරදින්න අප ඉඩ දෙන්නේ නැහැ. අපි අනිවාර්යයෙන්ම මෙය ජයග්‍රහණය කරන බව ප්‍රකාශ කරමින්, මගේ කථාව අවසන් කරනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජයන්ත සමරවීර මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.44]

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීතුමා "මහින්ද චින්තනය" ගැන කිව්වා. මම එතුමාට කියන්න ඕනෑ, මහ බැංකුව මහ දවාලේ කඩන සැලසුම ගැන මහින්ද චින්තනයේ ලියැවිලා තිබුණේ නැති බව. 30/1 යෝජනාව අත්සන් කරලා, රණ විරුවන් දං ගෙඩියට යවන සැලසුම් ගැන මහින්ද චින්තනයේ සඳහන් වෙලා තිබුණේ නැහැ. හම්බන්තොට වරාය හදන විධිය මිසක්, ඒක විකුණාගෙන කෑම පිළිබඳව නොවෙයි, මහින්ද චින්තනයේ ලියැවිලා තිබුණේ. කොළඹ - දකුණ අධිවේගී මාර්ගය හදන එක මිස, ඒවා බහු ජාතික සමාගම්වලට විකුණාගෙන කන එක ගැන නොවෙයි, මහින්ද චින්තනයේ ලියැවිලා තිබුණේ. ඒ වාගේම අගමැතිවරු කවදාවත් ජාතික ගීයට, "ජාතික සින්දුව" කියා කිව්වෙත් නැහැ. මහින්ද චින්තනයේ එහෙම දෙයක් ලියැවිලා තිබුණෙත් නැහැ. අන්න ඒ කාරණා ටිකත් ඔබතුමන්ලා මතක තියාගන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය ගැන කථා කළ ආණ්ඩුවේ හැම මන්ත්‍රීවරයකුම වාගේ අය වැය ගැන නොවෙයි, එහි සිටි මැක්කා ගැන තමයි වැඩිපුරම කථා කළේ. වැසිකිළි හැදීම පිළිබඳව හැමකෙනෙක්ම දිගටම කථා කළා. වැසිකිළියක් හදා ගන්න බැරි තත්ත්වයට මේ රටේ ජනතාව පත් කළා නම් එහෙම කළේ, අපි අවුරුදු 30ක් 40ක් තිස්සේ කර ගෙනගෙන ආව නව ලිබරල්වාදී වෙළෙඳ පොළ ආර්ථික ගමන විසින්මයි. යම් තරමකට හෝ ඒකේ වෙනසක් වුණා නම්, එහෙම වුණේ 2010 - 2014 කාල වකවානුවේයි. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව එදා විකුණාගෙන කාපු ආයතන නැවත ජනතාව සතු කරලා; රට සතු කරලා; ජාතිය සතු කරලා ඒ ගමන හරවන්න ගත්ත උත්සාහය අද නැවත වතාවක් තමුන්නාන්සේලා අනෙක් පැත්තට හරවා තිබෙනවා. එක පැත්තකින් මේ ආණ්ඩුව දුප්පත් ජනතාවට බදු පිට බදු ගහලා, ඒ අය කබලෙන් ළිපට ඇද දමා තිබෙනවා. දුප්පත් ජනතාවට බඩු වෙනුවට බදු කන්න බල කරලා, මහා පරිමාණ කොම්පැනිකාරයන්ට විතරක් බදු පිට බදු සහන ලබා දීලා තිබෙනවා.

මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සමයේ මේ රටට වසරකට කිරි පිටි මෙට්‍රික් ටොන් 90,000 - 98,000ත් අතර ප්‍රමාණයක් ආනයනය කළා. එම කිරි පිටි ආනයනය අධෛර්වත් කිරීම සඳහා කිරි පිටි කිලෝ එකකට රුපියල් 225ක බද්දක් ගහලා තිබුණා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අද සාකච්ඡාවක් තිබෙනවා, ආනයනික කිරි පිටිවල තිබෙන්නේ වස විස කියා. අද ඒක ඔප්පුවෙලා තිබෙනවා. ඒ වස විස තිබෙනවා කියලා ඔප්පුවෙලා තිබෙන කිරි පිටි ආනයනය කිරීම අධෛර්යවත් කරන්න මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සමයේ රුපියල් 225ක බද්දක් ගැහුවා. නමුත් මොකද වුණේ? රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ ආණ්ඩුව ආවා. පළමුවැනි මාස හතර යනකොට ඒ රුපියල් 225ක බද්ද රුපියල් 223 දක්වා අඩු කළා. එතකොට ඒ සඳහා අය කරන බද්ද රුපියල් 2යි. ආනයනික කිරි පිටි සමාගම්වලින් -ෆොන්ටෙරා සමාගමෙන් සහ නෙස්ලේ සමාගමින්- ගන්න තිබුණු රුපියල් මිලියන 10,000ක බද්ද -ඒ අය අතේ තියාගෙන හිටපු සල්ලි- තමුන්නාන්සේලා යළිත් ෆොන්ටෙරා සමාගමට සහ නෙස්ලේ සමාගමට දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ඒ සමාගම්වලට රුපියල් මිලියන 10,000ක් දෙනවා. අනෙක් පැත්තෙන් දුප්පත් මිනිස්සුන්ට බදු ගහනවා.

මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ සමයේ මේ රටේ ජනතාව හාල් මෙට්‍රික් ටොන් 2,900,000ක් පරිභෝජනය කළා. අද වන විට එය මෙට්‍රික් ටොන් දහනව ලක්ෂය දක්වා අඩු වෙලා තිබෙනවා. ඒ ජනතාව කෑමට ගත්තේ පාන් පිටියි. අද පාන්පිටි මෙට්‍රික් ටොන් දහනව ලක්ෂයක් ලංකාවට ආනයනය කරනවා. ඒකට එදා බදු ගැහුවා. හැම පාන්පිටි කිලෝවකටම රුපියල් 22ක බද්දක් ගැහුවා. තමුන්නාන්සේලා ආවා විතරයි, රුපියල් විසිදෙකේ ඒ බද්ද ඉවත් කර දැම්මා. ප්‍රීමා සමාගමට බදු සහන දීලා, රුපියල් මිලියන 38,000ක් තමුන්නාන්සේලා සාක්කුවේ දමා ගත්තා. එක පැත්තකින්, තමුන්නාන්සේලා ෆොන්ටෙරා සමාගමට, ප්‍රීමා සමාගමට බදු සහන දෙනවා. අනික් පැත්තෙන් දුප්පත් ජනතාවට බදු පිට බදු පටවලා, මේ රටේ මිනිසුන්ට බදු කන්න කියා බල කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
මට තව සුළු වෙලාවක් දෙන්න.

2015 ජනවාරි 08වන දායින් පස්සේ රාජ්‍ය සේවයට එකතුවෙන කාටවත් විශ්‍රාම වැටුප නැහැ. මෙතුමන්ලා රණ විරුවෝ ගැන උදන් අනනවා; ඒ අය වෙනුවෙන් කථා කරනවා. නමුත් රණ විරුවන් හිරේ දමනවා; බුද්ධි අංශයේ නිලධාරීන් හිරේ දමනවා. වසන්ත කරන්නාගොඩ මහත්මයාට CID එක ඉස්සරහට ගිහින් රීයේ පැය අටක කාලයක් කට උත්තර දෙන්න සිද්ධ වුණා. ජාතියක් විසින් රකින්න ඕනෑ රණ විරුවන්ව තමුන්නාන්සේලා හිරේ දමා තිබෙනවා.

මේ අය වැය සම්මත කර ගන්න බැරි බව එතුමන්ලාට තේරෙනවා. ඒ නිසා දැන් අය වැය සම්මත කර ගන්න හදන්නේ කොහොමද? මෙතුමන්ලාට මේ අය වැය දිනා ගන්න මන්ත්‍රීවරු 113දෙනා හොයා ගන්න බැහැ. ඒ 113දෙනා හොයා ගන්න TNA එක ඉස්සරහා දණ ගහනවා; දෙමළ බෙදුම්වාදී ව්‍යාපාරය

[ගරු ජයන්ත සමරවීර මහතා]

ඉස්සරහා දණ ගහනවා. මාවෙ සෝ. සේනාධිරාජා මන්ත්‍රීතුමා කියනවා, අපේ කොන්දේසි ඉෂ්ට නොකළොත්, අය වැයට ඡන්දය දෙන්නේ නැහැය කියා. තමුන්නාන්සේලා දෙමළ බෙදුම්වාදී ව්‍යාපාරය ඉස්සරහා දණ ගහලා තිබෙනවා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
The Hon. Seyed Ali Zahir Moulana. You have eight minutes.

[பி.ப. 2.50]

**ගරු සෙය්යිඩ් අලි සාහිර් මව්ලානා මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செயிட் அலி ஸாஹிர் மௌலானா - சமூக வலுவூட்டல் இராஜாங்க அமைச்சர்)
(The Hon. Seyed Ali Zahir Moulana - State Minister of Social Empowerment)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, எமது நல்லாட்சி அரசாங்கமானது, கடந்த வருடம் கம்பெறலிய எனும் துரித அபிவிருத்திப் புரட்சியைத் தொடக்கி வைத்து மக்களுக்குப் பாரிய சேவைகளை வழங்குவதற்கு முன்னின்று செயற்பட்ட வேளையிலேதான், தேசிய அரசாங்கத்தில் அங்கம் வகித்த சிலர் அரசாங்கத்திலிருந்து விலகி அரசியலமைப்பிற்கு முரணாக அரசாங்கம் ஒன்றை அமைத்து, எமது பொருளாதார அபிவிருத்திச் செயற்பாடுகளை முடக்கிச் சுமார் 54 நாட்கள் இந்த நாட்டிலே எந்த அரசாங்கமும் செயற்படாத நிலையை உருவாக்கினார்கள். அந்தத் தீய சக்திகளுக்கு எதிராக மக்கள் எம்முடன் இணைந்து செயற்பட்டனர். நாங்கள் வன்முறையை நாடாது நீதிமன்றப் படிகளை நாடினோம். எமக்கு நீதி கிடைத்தது. பாராளுமன்றம் மீண்டும் உயிர்பெற்றது. முற்றான அழிவிலிருந்து உருவாகிப் பறக்கும் பீனிக்ஸ் பறவைகள் போன்று மீண்டெழுந்து, எம்மை நம்பியிருக்கும் நாட்டு மக்களுக்கு மகிழ்ச்சிதரும் வரவு செலவுத் திட்டமொன்றை எமது நல்லாட்சி அரசாங்கம் இப்போது முன்வைத்திருக்கின்றது. நியாயபூர்வமாகக் கூறுவதென்றால், குறைகூறமுடியாத அளவுக்கு இருக்கின்ற இந்த வரவு செலவுத் திட்டத்தை எதிர்க்கட்சியினர் தேர்தல்கால வரவு செலவுத் திட்டம் என விமர்சிக்கின்றனர். அப்படியானால், இது மக்களை நம்பவைக்கும், மக்களுக்கு நன்மை பயக்கும் வரவு செலவுத் திட்டம் என்பதனை மறைமுகமாக அவர்கள் ஏற்றுக் கொள்கின்றனர்.

'கம்பெறலிய' வேலைத்திட்டத்தினூடாக ஒவ்வொரு பாராளுமன்ற உறுப்பினருக்கும் 300 மில்லியன் ரூபாய் வழங்கப்பட்டிருப்பது மற்றுமொரு சிறப்பம்சமாகும். இத்திட்டத்தின் மூலமாகக் கிராமிய வீதிகள், பாலங்கள், வடிகால்கள், சிறுவர் பூங்காக்கள், விளையாட்டு மைதானங்கள் போன்ற இன்னும் பல அபிவிருத்தி வேலைகள் நடைபெறுவதுடன், முக்கியமாக பல் சமய மதத்தலங்களையும் அபிவிருத்தி செய்வதற்கான வாய்ப்பு வழங்கப்பட்டிருப்பது மிகவும் பயன்மிக்கதாகும்.

எமது ஆரம்பக் கைத்தொழில், சமூக வலுவூட்டல் அமைச்சின்மூலமாக, மக்களின் வாழ்க்கைத்தரத்தினை உயர்த்துவதற்காகப் பல்வேறு அனுகூலங்கள் இவ்வரவு செலவுத் திட்டத்தில் உள்ளடக்கப்பட்டுள்ளமை இன்னொரு முக்கியமான அம்சமாகும். வறுமைக்கோட்டின்கீழ் வாழ்கின்ற மக்களின் வாழ்வாதாரத்தை மேம்படுத்துவதற்காகச் சமுர்த்தி பயனாளிகளாகச் சுமார் 6,00,000 குடும்பங்கள் இவ்வருடம் புதிதாக இணைக்கப்படவுள்ளனர். சமூக சேவைத் திணைக்களத்தினால் அங்கவீனமுற்ற நோயாளர்களுக்கு வழங்கப்படும் உதவிப் பணக் கொடுப்பனவுகள் அதிகரிக்கப் பட்டுள்ளன. வறுமை நிலையிலுள்ள குடும்பங்களுக்கு வாழ்வாதார உதவிகளை வழங்கி அவர்களை வலுவூட்டு வதற்கும் கிராமப்பகுதி மக்களின் அடிப்படை வசதிகளை மேம்படுத்துவதற்குமான நடவடிக்கைகள் இவ்வரவு செலவுத் திட்டத்தின்மூலமாக ஏற்படுத்தப்பட்டுள்ளமை பாராட்டத் தக்கது. ஆரம்பக் கைத்தொழில் அமைச்சின்மூலமாக, விவசாய மற்றும் நீரியல் வளத்துறைகளில் பொருளாதார அபிவிருத்தியை நோக்கமாகக்கொண்டு தொழில் முயற்சியாளர்களுக்கு மானியம் வழங்கி அவர்களை ஊக்குவிப்பதையிட்டு குறிப்பாக, கிழக்கு மாகாணத்தில் பல்வேறு செயற்திட்டங்கள் முன்வைக்கப்பட்டிருப்பதையிட்டு நாங்கள் இதனைப் பாராட்டுகின்றோம்.

இந்த அரசாங்கம் சுகாதாரம், கல்வி போன்ற துறைகளுக்கு அதிகளவு நிதி ஒதுக்கீடுகளைச் செய்ததன்மூலமாக மக்களின் ஆரோக்கிய வளர்ச்சியையும் அறிவுசார் வளர்ச்சியையும் மேம்படுத்துவதில் முக்கிய கரிசனை காட்டுகின்றது. நாட்டின் சுகாதாரத் துறையானது மிகவும் சிறப்பாக வழிநடாத்தப்பட்டு வருவதுடன் கல்வித்துறையும் சிறப்பாக அபிவிருத்தி செய்யப்பட்டு வருகின்றது. "அருகிலுள்ள பாடசாலை சிறந்த பாடசாலை" என்ற செயற்திட்டமானது, பாடசாலைக் கட்டமைப்புக்கு வளம் சேர்க்கும் சிறப்பான செயற்திட்டமாகும்.

வடக்கு, கிழக்கு மாகாணங்களின் அபிவிருத்திக்குப் பெயர் குறித்து நிதியொதுக்கீடுகள் செய்யப்பட்டுள்ளன. வடக்கு, கிழக்கில் யுத்தத்தால் அழிவடைந்த பகுதிகளை அபிவிருத்தி செய்வதற்கு நிதியொதுக்கீடுகள் செய்யப்பட்டுள்ளமை வரவேற்கத்தக்கதாகும். வடக்கு மாகாணத்திலிருந்து இடம்பெயர்ந்த முஸ்லிம்களை மீள் குடியமர்த்துவதற்காக வளங்கள் அதிகரிக்கப்பட்டுள்ளமை பாராட்டத்தகுந்த இன்னுமோர் அம்சமாகும். இதனை நாங்கள் அனைவரும் மிகவும் மகிழ்ச்சியுடன் வரவேற்கின்றோம். கிழக்கு மாகாணத்திலுள்ள குறைந்த வருமானம் பெறும் குடும்பங்கள் தொடர்பாக விசேட கரிசனை காட்டப்பட்டுள்ளது. மொத்தத்தில் வடக்கு, கிழக்கு மாகாணங்களில் வசிக்கும் சிறுபான்மையினருக்கு மிகவும் ஆறுதல் தருகின்ற வரவு செலவுத் திட்டமாக இவ்வரவு செலவுத் திட்டம் அமைந்துள்ளது.

அரச ஊழியர்களின் சம்பள உயர்வுக்காக நிதியொதுக்கீடு செய்யப்பட்டுள்ளதுடன், ஓய்வூதியம் பெறுநர்களின் ஓய்வூதிய முரண்பாட்டினை நீக்குவதற்காகவும் நிதிகள் ஒதுக்கீடு செய்யப்பட்டுள்ளமை மிகவும் வரவேற்கத்தக்கதாகும்.

வருமானம் குறைந்த மட்டத்திலுள்ள மக்களின் அடிப்படைத் தேவைகளைக் கருத்திற்கொண்டு மலசலகூடம், குடிநீர்த்திட்டம் போன்ற அடிப்படைத் தேவைகளை நிறைவு செய்யவும் நிதியொதுக்கீடுகள் செய்யப்பட்டுள்ளன.

அத்துடன் நாட்டின் போக்குவரத்துத் துறையை அபிவிருத்தி செய்து மேலும் மேம்படுத்துவதற்காகப் பல்வேறு வேலைத்திட்டங்கள் இந்த வரவு செலவுத் திட்டத்தில் உள்ளடக்கப்பட்டுள்ளன.

இலங்கையின் அனர்த்த முகாமைத்துவ வேலைத்திட்டத் திற்காகவும் பெருமளவு நிதி ஒதுக்கீடு செய்யப்பட்டுள்ளதால் பல்வேறு அனர்த்தப் பாதிப்புக்களிலிருந்து நமது நாடும் மக்களும் விரைவாக மீண்டுகொள்ளக்கூடிய வாய்ப்பு அதிகமாகும்.

Having said that, Hon. Presiding Member, I must say that the Hon. Minister of Finance, the Hon. Mangala Samaraweera, presented last week what has received accolades far and wide as a clean, lean and forward-thinking Budget for the year 2019 in keeping with our country's commitment to attaining sustainable, holistic and inclusive development for our populace along with ensuring that Sri Lanka leads the charge in working towards transforming the world by attaining the Sustainable Development Goals set by the United Nations by 2030.

The Hon. Mangala Samaraweera has gloriously set a precedent for the future Ministers of Finance to follow by breaking tradition and curbing expectation of the pundits who heavily stipulated that the Budget, 2019 would be nothing short of an election Budget. I am elated that it is far from the same and laud his commitment towards the creation of a new economic and social order for Sri Lanka through meaningful growth.

Thank you very much.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Thank you, Hon. State Minister. You saved some minutes for us. මී ළඟට, ගරු තිලංග සුමතිපාල මැතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා.2.57]

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

නමෝ බුද්ධාය!

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම අය වැය ඉදිරිපත් කර තිබෙන අවස්ථාවේ සුළුවෙන් හෝ වචන ස්වල්පයක් කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන මම සන්තෝෂ වනවා. මංගල සමරවීර මැතිතුමා උත්සාහ ගෙන තිබෙනවා, මේ අය වැය ලස්සන සිහින මාළිගාවක් හැටියට ඉදිරිපත් කරන්න. මොකද, එතුමාට තිබෙන තත්ත්වයත් සමඟ; ආර්ථික බලපෑමත් සමඟ මීට වඩා යමක් කරන්න පුළුවන්ය කියා කාටවත් හිතාගන්න බැහැ. ඊට හේතුව, එක් පැත්තකින් මෙවර අය වැයෙන් සහන ලබා දෙන්න උත්සාහ ගන්න ගමන්, අනික් පැත්තෙන් ආයෝජකයන්ට දෙන්න තිබෙන සහන අඩු කර තිබෙනවා. මෙවැනි අභියෝගාත්මක තත්ත්වයකදී මිශ්‍රණයක් විධියට තමයි, එතුමා ඒ පණිවුඩය යවා තිබෙන්නේ. අය වැයකින් එක්කෝ සහනාධාර දීලා, හැම මිනිහෙකුටම උදව් කරන්න පුළුවන් විධියට නැතිබැරිකම -දිළිඳුකම- වෙනුවෙන් නියෝජනයක් කරන්න ඕනෑ. එහෙම නැත්නම් මේ ආර්ථිකය බේරා ගන්න නම්, ආයෝජකයින්ට අවශ්‍ය බදු සහන දීලා ඒ අය ශක්තිමත් කර අපේ ආර්ථිකය සුරක්ෂිත කරන්න ඕනෑ. මේ දෙක මැද දෝලනය වෙමින් දැක්මක්, සැලැස්මක් නැති බව මේ අය වැයේ සමස්ත විග්‍රහය කියායි මට නම් පෙනෙන්නේ. ඒ වාගේම මෙවර අය වැයට මෙතුමා පාවිච්චි කර තිබෙන වචන දෙස බැලුවාම පෙනෙන්නේ මොකක්ද? ඔබ - අපට මතකයි, මංගල ඇමතිතුමා කියන්නේ කාට හෝ බැරි නම්, බැහැයි කියා ප්‍රචාරය කරන්න බොහොම දක්ෂ කෙනෙකු බව. වර්තමාන අගමැතිතුමා වන රනිල්ට එදා බැහැයි කියා ලොකු ප්‍රචාරයක් ගෙන ගිය අපේ මංගල ඇමතිතුමා, මේ වතාවේ සිහින මාළිගාව කියන මාතෘකාව මේ අය වැයට එකතු කරන්න උත්සාහ ගෙන තිබෙනවා. ඒ කෙසේ වෙතත් මේ අය වැය ලේඛනයේ පරතරය බැලුවොත් ආදායමට වඩා වියදම විශාල වශයෙන් වැඩි බව අපට පෙනෙනවා. මෙහි රුපියල් බිලියන 800ක වාගේ ප්‍රමාණයක අය වැය පරතරයක් තිබෙනවා. එහෙම වෙන්නේත් අපේක්ෂිත ආදායම් මේ අවුරුද්දේ මේ රජයට ආවොත් පමණයි. නමුත්, මේ අවුරුද්දේ අපේක්ෂිත ආදායම් එන්න පුළුවන් තත්ත්වයක් කිසිසේත්ම නැහැ. පසු ගිය අවුරුදු තුන හතරේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අය වැයවල අපේක්ෂිත ආදායමත් සියයට සියයක් ස්ථාපිත කර නැහැ. එම නිසා මේ අවුරුද්ද අවසන් වනකොට අඩුම තරමින් ඇමෙරිකානු ඩොලර් බිලියන දෙකහමාරක්, තුනක් අලුතෙන් ණය ගන්න සිද්ධ වන බව පැහැදිලියි. දැනට අපේ සමස්ත ආදායමෙන් -ඒ කියන්නේ අපේ දළ දේශීය ආදායමෙන්- සියයට 91ක් ණය ගෙවන්න වැයවනවා. ඒ අනුව, මේ අය වැය අපට තවදුරටත් ණය ලබා ගන්න සිද්ධ වන අය වැයක් කියා පැහැදිලියි. මේ අවුරුද්ද අන්තිම වනකොට මේ ආණ්ඩුව තිබුණොත්, අනිවාර්යයෙන්ම මේ ආණ්ඩුවට නැවතත් ණය ගන්න සිද්ධ වනවා. එහෙම නැත්නම් රාජ්‍ය ආදායම පහත වැටී තිබෙන නිසා මේ ආණ්ඩුවට රාජ්‍ය සේවකයින්ගේ පඩි ගෙවා ගන්නත් බැරිව තවදුරටත් පවතින්න බැරිවනවා. එහෙම තත්ත්වයක් ඇති වුණොත් මේ සියයට 91 තව ටිකක් වැඩිවනවා. අපි අත් දැකීමෙන් දැක්කා, මේ විධියටම 2000 වර්ෂයේදී රට ඍණ ආර්ථිකයකට තල්ලු වූ ආකාරය.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

මම කථාව පටන් ගත්තා පමණයි. මම හිතුවේ නැහැ, මූලාසනයේ සිටින ඔබතුමා මට එහෙම කරයි කියා.

කෙසේ වෙතත් මේ ආර්ථිකයේ ප්‍රධාන කරුණු දෙස බැලුවාම එක දෙයක් ප්‍රකාශ කරන්න මම කැමැතියි. ඒ තමයි, බදු ක්‍රම. දැනට බදු වර්ග කීපයක් තිබෙනවා. එනම්, Income Tax, Economic Service Charge, Value Added Tax, Nation Building Tax, Stamp Duty Levy by CGIR, Stamp Duty Levy by Provincial Councils, Crop Insurance Levy, Tourism Development Levy, Telecommunication levy, Migration Tax, Mineral Tax, Levy on Teledramas, films and TV commercials, Cellular Tower Levy, Levy on rooms of five-star hotels, Motor Vehicle Concessionary Levy, Debt Repayment Levy, Levy on Mobile SMS, Luxury Tax, Vehicle Entertainment Levy, Carbon Tax, Customs Duty, Cess on Imports, Export Cess, Excise Duty, Excise Duty on Special Provisions, Special Commodity Levy, Ports and Airports Development Levy, Business Tax, Prize Competition Tax and Entertainment Tax. මේ විධියට බදු වර්ග 30ක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කළ යුතුයි.

**ගරු තිලංග සුමතිපාල මහතා**
(மாண்புமிகு திலங்க சுமதிபால)
(The Hon. Thilanga Sumathipala)

හොඳයි.

[ගරු තිලංග සුමතිපාල මහතා]

මේ බදු වර්ග 30ක් එක්ක බලනකොට අපට පෙනෙනවා, සරල බදු ක්‍රමයක් නැති එක මූලික ප්‍රශ්නයක් බව. බදු ප්‍රතිපත්තියක් නැති එක මූලික ප්‍රශ්නයක්. ඒ නිසා ආයෝජකයන් කිසිසේත් දිරිමත් කරන්නේ නැති, ආයෝජකයන්ව සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප කරන, ඔවුන් අධෛර්යවත් කරන අය වැයක ස්වරූපයක් ගන්නවා. මේ බදු අන්තිමට අය කරන්නේ අහිංසක මහජනතාවගෙන්. ජනතාවට බදු පිට බදු පටවලා තිබෙනවා. මොන වචන සෙට් එක දැම්මත් අවසානයේදී ඒ අය තෘප්තිමත් වෙන්නේ නැහැ. ඒ අය මේ රජයේ ගමන් මාර්ගය ප්‍රතික්ෂේප කරනවා කියන එක පැහැදිලිව මා කියා සිටිනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට ස්තුතියි.

මීළඟට, ගරු මහින්ද යාපා අබේවර්ධන මන්ත්‍රීතුමා. ඔබතුමාටත් විනාඩි 5ක් වෙන් කර තිබෙනවා.

[අ.භා.3.02]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මේ කථා කරන්නේ මේ රජයෙන් ඉදිරිපත් කරපු හතරවන අය වැය ලේඛනය ගැන. හතර වැනි අය වැය ලේඛනය ගැන කල්පනා කරලා බලනකොට, පසුගිය අය වැය ලේඛන ගැනත් අපට හිතන්න වෙනවා. ඒ අය වැය ලේඛන තුළ මේ රට සංවර්ධනය කිරීම සඳහා මේ උදවිය යෝජනා කරලා තිබුණේ මොනවාද ? ඒ යෝජනා එකක්වත් හරියට ක්‍රියාත්මක කෙරුවාද? ඒවායින් කොච්චර ප්‍රමාණයක් අතහැර ගිහිල්ලා තිබෙනවාද? පසුගිය අය වැය ලේඛනවලදී මුදල් වෙන් වෙලා තිබෙනවා, "Develop Aruwakkalu waste disposal and management site" වෙනුවෙන්. නමුත් ඒකට වෙච්ච දෙයක් ගැන ආරංචියක් නැහැ. ඊළඟට, මුදල් වෙන්කරලා තිබෙනවා, "Concessional loans scheme to companies in agriculture, agro-processing including drip irrigation, poultry, canning, plantation and hotel industry, to generate electricity from solar power for their own use". ඒ ගැනත් කිසිම ආරංචියක් නැහැ. කිසිම වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙච්ච බවක් ගැන ආරංචියක් නැහැ. මුදල් වෙන් වෙලා තිබෙනවා, "Support the ground water monitoring mechanism". ඒකත් එහෙමමයි. ඒ වාගේම මුදල් වෙන්වෙලා තිබෙනවා, " Nilwala Eliya Model Park" එකට. ඒකත් එහෙමමයි. අපට පෙනන විධියට කිසිම දෙයක් නැහැ. ඊළඟ, මුදල් වෙන් වෙලා තිබෙනවා, "Cleaning 10 lagoons". ඒවා ගැන කිසිම කථාවක් නැහැ. ඒවා ගැන අද වෙනතුරු මොකුත් වෙලා නැහැ. ඉතින් එහෙම නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ලේඛනය ගැන කථා කරලා වැඩක් තියෙනවාද? මේවා හැදුවෙත් අපේ නිලධාරි මහත්වරු එකතු වෙලා. දැන් මේ අය වැය ලේඛනය-[බාධා කිරීමක්] ඒක ඇත්ත. කථා කරන්න විනාඩි 5ක් වැඩියි. පාර්ලිමේන්තුවේ Research Unit එකෙන් මම මේ කාරණා ගත්තේ. තව ලැයිස්තුවක්ම තිබෙනවා. එහෙම නම් මේ අය වැය ලේඛන ගැන කථා කිරීම අපේ කාලය නාස්ති කිරීමක්; මේ පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කිරීමක්. පසුගිය අය වැය ලේඛනවල ඉදිරිපත් කළ යෝජනා සම්බන්ධයෙන් කිසිම දෙයක් මේ නිලධාරි මහත්වරු කරලාත් නැත්නම්, ඒ මහත්වරුන්ට කරන්න දේකුත් නැත්නම්, මේ ආණ්ඩුව කරලාත් නැත්නම් අපි මේ අය වැය ලේඛනයක් ගැන මොනවාද කථා කරන්නේ? රටේ කාලය නාස්ති කරනවා; පාර්ලිමේන්තුවේ කාලය නාස්ති කරනවා; නිලධාරි මහත්වරුන්ගේ කාලය නාස්ති වෙනවා. එහෙම නැතුව මෙහි කිසිම හරයක් නැහැ. දැන් මෙතැනදි කථා කළ ඒවා ගැන තව කථා කරනවා නම්, මේ අය වැය ලේඛනය ඇතුළේ තිබෙන තව ගොඩක් දේවල් ගැන කථා කරන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම නම්, "මේවා අය වැය ලේඛනද?" කියා අහන්න තමයි අපට සිද්ධ වන්නේ. මේ නිලධාරි මහත්වරුත් ලජ්ජා වෙන්න ඕනෑ, මේ වාගේ අය වැය ලේඛන පෙළක් ඉදිරිපත් කරන්න දායක වීම ගැන සහ ඒවා ආරක්ෂා කිරීම සඳහා ඒ උදවියට තවදුරටත් කතා කරන්න සිදු වීම ගැන.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුව කවදාවත් ආර්ථික සැලැස්මක් එක්ක බලයට ආවේ නැහැ; මහ ජනතාව අතරට ගිහින් "අපි මේවා කරනවා" කියා පොරොන්දු වෙලා බලයට ආවේ නැහැ. උගුල් අටවා, එදා මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ ආණ්ඩුවට විරුද්ධව ගහන්න පුළුවන් සෑම බොරුවක්ම ගහලා අවසානයේදී ජනතාව මුළා කරලා බලයට ආවා. එහෙම බලයට ඇවිත් ජනතාව ආකර්ෂණය කර ගැනීම සඳහා යෝජනා විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කළා. "ජාතික විධායක සභාව" කියා එකක් ඒ දවස්වල හැදුවා. හදලා කිව්වා, මෙය කැබිනට් මණ්ඩලයටත් වඩා ඉහළින් රටේ ප්‍රතිපත්ති හැසිරවීම සඳහා සකස් කරන ලද ආයතනයක් කියා. අද ඒ ජාතික විධායක සභාව ගැන කිසිම ආරංචියක් නැහැ. එයින් මොකවත් වෙලා නැහැ. එය කරපු දෙයක් නැහැ. මේ ආණ්ඩුවට ගැටලුව වෙලා තිබෙන්නේ, "ඔළුවට තුවාලයක් කර ගන්නේ නැතිව, ඇඟට පතට තුවාලයක් කර ගන්නේ නැතිව මේ අවුරුද්ද ගත කරගන්නේ කොහොමද?" කියන එකයි. ඒ නිසා මෙය එදා වේල අය වැයක්. මේ ආණ්ඩුව රැකගෙන යන්න, මේ වර්ෂය ගත කරන්න විතරක් කරගෙන යන වැඩ පිළිවෙළක් මිස මෙහි අනාගත දර්ශනයක් නැහැ. ඒ හින්දා ආණ්ඩුව කරන්න බැරි නම් මේ රට තවත් විනාශ කරන්නේ නැතිව මේ නඩයම යා යුතුයි. මෙතුමන්ලා කරපු එකම දේ තමයි, ශ්‍රී ලංකා මහ බැංකුව මහ ගිනි දවල් හොරා කෑම. එහි දුක තමයි අද ජනතාවට විඳින්න සිදු වෙලා තිබෙන්නේ. ඒවා නිසා තමයි අද ආර්ථිකය පාලනය කරගන්න බැරි වෙලා තිබෙන්නේ. මෙය නිෂ්ඵල අය වැයක්. මේ ගැන කතා කිරීම නිෂ්ඵල වැඩක්. අපේ කාලය නාස්ති කළා, මුළු රටේම, ජාතියේම ධනය තවදුරටත් විනාශ කළා කියා ප්‍රකාශ කරමින් මම මගේ වචන ස්වල්පය හමාර කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි, නියමිත වෙලාවට කථාව අවසන් කිරීම පිළිබඳව. මීළඟට, ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට විනාඩි 14ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා.3.07]

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මංගල සමරවීර අමාත්‍යතුමා විසින් ගෙන එන ලද අනගිභවනීය අය වැය පිළිබඳ විවාදය අවස්ථාවේ කතා කරන්න ලැබීම ගැන මා සන්තෝෂයට පත් වෙනවා. මෙය අනගි අය වැයක් කියා කියන්නේ මා නොවෙයි. මෙහෙම කියන්නේ, හිටපු මුදල් ඇමති රොනී ද මැල් මැතිතුමායි. අද "රැස" පත්තරයේයි, එය සඳහන්ව තිබෙන්නේ. එතුමා කියනවා, "මංගල ගෙනාවේ අනගි අය වැයක්" කියා. ලංකා

ඉතිහාසයේ වැඩිම අය වැය සංඛ්‍යාවක් ඉදිරිපත් කරපු -දැනට අය වැය 11ක් ඉදිරිපත් කර තිබෙන,- හිටපු මුදල් අමාත්‍ය රොනී ද මැල් මැතිතුමා තමයි මේ විශේෂ අය වැය සම්බන්ධයෙන් එතුමාගේ දැක්ම ඉදිරිපත් කරන්නේ.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ඒ ඉස්සර.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
එතුමා දක්ෂයි. එතුමා එදත් එහෙමයි, අදත් එහෙමයි. ඒ දක්ෂකම නිසා තමයි එතුමාට හැකියාවක් ලැබුණේ 11 වතාවක් ම අය වැය ඉදිරිපත් කරලා ලංකාවේ වාර්තාවක් තබන්න. හැබැයි ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ඒ වාර්තාව සම කරන්න ගිය සැරේ උත්සාහ කළා. නමුත් බැරි වුණා, එතුමා අවුරුදු දෙකකට කලින් ගෙදර ගිය නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මංගල සමරවීර අමාත්‍යතුමා ගෙන ආ මේ අය වැය ගැන අද දවස වන විට මේ පාර්ලිමේන්තුවේ කතා කරපු මන්ත්‍රීවරුන් -විශේෂයෙන් විපක්ෂයේ මන්ත්‍රීවරුන්- කියපු දේවල් ගත්තාම, විරුද්ධ වෙන්න දෙයක් සොයා ගන්න බැරිව වටේ වටේ අත ගාලා යමක් සොයා ගන්නවා වාගේ දෙයක් තමයි අපට දැනුණේ. අද වන විට මේ අය වැය සම්බන්ධයෙන් මාධ්‍යවලින් කෙරෙන සාධනීය ඉදිරිපත් කිරීම් වැඩියි. ඒ නිසා මේ අය වැය පැහැදිලිවම ජනතාවගේ බලාපොරොත්තු ඉටු කරන අය වැයක් බවට පරිවර්තනය වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි විශ්වාස කරනවා, ඔක්තෝබර් 26වන දා මේ රටේ සිදු වුණේ ලෝකයේ සිදු වූ නින්දිතම රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයයි කියා. ඒ රාජ්‍ය විරෝධී කුමන්ත්‍රණයෙන් පසුව ඉදිරිපත් කරන ලද මේ අය වැය හරහා අපට හැකියාවක් ලැබෙනවා, මේ රටේ නැති වී ගිය කීර්ති නාමය ලබා ගන්න. මා ඇයි එසේ කියන්නේ? මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීතුමකු මේ සභාවේ ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා මම දැක්කා. මා හිතන විධියට අනුර කුමාර දිසානායක මහත්මයා තමයි ඒ ප්‍රශ්න කිරීම කළේ. මෑතකදී මහ බැංකුව විසින් අධික පොලියට ISB - International Sovereign Bonds - නිකුත් කිරීම පිළිබඳව එතුමා ප්‍රශ්න කළා. අප හැමෝටම මතකයි ව්‍යවස්ථා විරෝධී ආණ්ඩුවක් පිහිටුවා දින 52ක් පැවැති බව. ඒ කාලය තුළ ඒ ව්‍යාජ ආණ්ඩුවට අප හැම විටම මතක් කළා, අපට වෙන්න පුළුවන් විපත්ති පිළිබඳව.

අපිට ජාත්‍යන්තර ආධාර ලබා දෙන ආයතන මේ සිදු වූ වෙනස පිළිබඳව විමතිය පළ කළා. විශේෂයෙන් Millennium Challenge Corporation ආයතනය වැඩ නතර කළ බව ඔබතුමන්ලාට මතක ඇති. අපි කරපු කැප කිරීම තුළින් බිහි වුණු නිර්මාණශීලී ආණ්ඩුව කෙරෙහි අවිශ්වාසය -අවිනිශ්චිතභාවය- ඇති වුණේ මේ දින 52ක කාලය තුළදීයි. ලෝකයේ තිබෙන රටවල්වල ආර්ථිකයන් ගැන ශ්‍රේණිගත කිරීම් කරන ආයතන - Moody's, Fitch, Standard & Poor's, S&P - ඔබතුමන්ලා දන්නවා. මේ ශ්‍රේණිගත කිරීම් කරන ආයතන විසින් මේ දින 52ක කාලය තුළදී ශ්‍රී ලංකාවේ ශ්‍රේණිගත කිරීම පහළ දැම්මා. එහි ඍණාත්මක ප්‍රතිඵලයක් වශයෙන් තමයි, ISB පොලිය ඉහළ යෑම සිදු වුණේ. මේක භයානක ප්‍රතිඵලයක්. එවැනි ඍණාත්මක ප්‍රතිඵල තිබෙන කොටත් මෙවැනි අය වැයක් ඉදිරිපත් කරන්න අපිට හැකියාව ලැබුණා. ISB පොලී ප්‍රතිශත ගැන කිව්වොත් අවුරුදු පහක International Sovereign Bondsවලට 2018 අවුරුද්දේ පොලිය වශයෙන් තිබුණේ සියයට 5.75ක්. ඒ ප්‍රමාණය අවුරුදු 10ක් වනකොට සියයට 6.75ක් වුණා. නමුත් ඔක්තෝබර් මාසයේ සිදු වුණු මේ කාලකණ්ණි සිදුවීමත් එක්ක මේ රටේ අවුරුදු පහක International Sovereign Bondsවල පොලිය ගිය සතියේ සියයට 6.85ක් - සියයට 1කින්- දක්වා ඉහළ ගියා. ඒ වාගේම අවුරුදු දහයක ISB පොලිය සියයට 7.85ක් දක්වා ඉහළ ගියා. මේ රටේ සිද්ධ වෙච්ච අවාසනාවන්ත සිද්ධිය තමයි මේකට හේතුව වුණේ. මේවාට වග කියන්න ඕනෑ කවුද? මේවාට වග කියන්න ඕනෑ, මේ දින 52 ආණ්ඩුවේ හිටපු මුදල් ඇමතිතුමා සහ දින 52 ආණ්ඩුවේ හිටපු, ව්‍යාජව ආක්‍රමණය කරපු දේශ ද්‍රෝහී ආණ්ඩුවේ ඇමතිවරුයි. මේ ඇමතිවරු ක්‍රියා කරපු ආකාරය අපි දැක්කා. ඉතාම නින්දිත -පහත්- විධියට ඔවුන් කටයුතු කරපු නිසා මේ රටේ තත්ත්වය පහතට වැටුණා.

මේ කාරණය සම්බන්ධයෙන් ප්‍රශ්න කරපු අනුර කුමාර දිසානායක මන්ත්‍රීතුමාට මම කියන්න කැමතියි, මේ කාරණය ගැන අවධානය යොමු කරලා, දින 52 වකවානුවේ සිද්ධ වෙච්ච දේවල් එක්ක මේ විවේචනය සිද්ධ කරන්න කියලා. ඒ වාගේම තමයි, වසර 10කට පෙර ශ්‍රී ලංකාවේ ආර්ථිකය හා සමාන මට්ටමක ආර්ථිකයක් පැවති ලෝකයේ රටවල් බොහොමයක් ඔවුන්ගේ ආර්ථිකයන්ගේ පැහැදිලි වර්ධනයක් මෙම ගත වූ කාල සීමාව තුළ අත්පත් කරගෙන ඇති බව අපිට ඒ දත්ත පරීක්ෂා කිරීම තුළින් පැහැදිලි වනවා. ඒ අනුව දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 10කින් පමණ ඒ රටවල්වල ආර්ථික වර්ධනය වේගවත් කරගෙන තිබෙනවා. ඒ අනුව වියදම ඵලදායී අංශ වෙතට නැඹුරු කරමින්, ප්‍රාග්ධන වියදම් වැඩි කරමින් කටයුතු කර ඇති බව අපිට පැහැදිලි වනවා. නමුත් පසුගිය වසර 10ක පමණ කාලය තුළ ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආදායම, දළ දේශීය නිෂ්පාදිතයට සාපේක්ෂව එක තැන පල් වන ස්වභාවයක් පෙන්නුම් කරනවා. මේ හේතුව නිසාවෙන් රජයේ වියදම් සීමා කිරීම වාගේ වැඩ පිළිවෙළවල් මත තමයි පසුගිය කාලය පුරාවටම -අවුරුදු 10 තිස්සේ- රජයන්ට කටයුතු කරන්න සිදු වුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙම තත්ත්වය වෙනස් කිරීමට නම් රාජ්‍ය ආදායම වැඩි කර ගත යුතු වනවා. සෑම වසරකම අය වැය මඟින් රාජ්‍ය ආදායම ගැන පුරෝකථනය කරනු ලැබුවත්, එය වසර අවසානයේදී කොතරම් සාර්ථක වුවාදැයි කියා පරීක්ෂා කරන ක්‍රමවේදයක් තවමත් රට තුළ නිසි පරිදි ක්‍රියාත්මක වෙන්නේ නැහැ. පසුගිය සෑම වසරකදීම අපේක්ෂිත රාජ්‍ය ආදායම අපිට ලැබී නැහැ. එම නිසා අපේක්ෂිත රාජ්‍ය වියදම් පියවා ගැනීමට දේශීය සහ විදේශීය ණය මූලාශ්‍ර මත යැපීමට රජයට සිදු වුණු එක වළක්වා ගන්න බැහැ.

මම මේ කාරණයත් විශේෂයෙන් මතක් කරන්න ඕනෑ. ආර්ථික විශේෂඥයන් යැයි කියා ගන්නා සමහර පොතේ ගුරාලාට -සමහර උදවියට- මේ යථාර්ථය ගැන කථා කරන්න තේරෙන්නේ නැහැ. රුපියල් 2,500කින් පවුලක් නඩත්තු කර ගන්න පුළුවන් කියලා ආර්ථික ඔස්තාර්ලා කියපු ආකාරය අපිට මතකයි. මේගොල්ලන්ටත් මෙම ප්‍රශ්නය විග්‍රහ කර ගන්න තේරෙන්නේ නැහැ. ඒක තමයි ඛේදනීය තත්ත්වය. ඒ නිසා මේ තිත්ත ඇත්ත ගරු සභාවට අපි දැනුම් දෙන්න කැමතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි මේ උත්තරීතර සභාව තුළ තර්ක විතර්ක ඉදිරිපත් කරලා, යෝජනා ඉදිරිපත් කරලා, ඒවා සම්මත කර ගත්තේ මේ අය වැය, හොඳම අය වැයක් හැටියට -හොඳම දේ- රට හමුවේ තබන්න ඕනෑ නිසායි. අපේ රටේ මිලියන 16ක් පමණ ඉන්න දුප්පත් ජනතාවගේ යහපත -අභිවෘද්ධිය- සඳහා ක්‍රියාවට නැංවෙන වැඩ රාශියක් මෙවර අය වැයේ ඇතුළත්වෙලා තිබෙනවා. නමුත් මේ තීරණ ගැනීමේදී විශේෂයෙන්ම රාජ්‍ය නිලධාරින්ගේ යන්ත්‍රණය නිසි පරිදි ක්‍රියාවට නැඟෙන්නේ නැති බව අපි සොයා ගත්තා. රටේ ආර්ථිකය සහ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වනවාට මේ ගරු සභාවේ සිටින ඔබතුමන්ලා වාගේම අපි සියලු දෙනාමත් එක පයින්ම කැමතියි.

[ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා]

මෙම අය වැය ලේඛනයෙන් යෝජනා කර තිබෙන ඒවායේ ප්‍රතිලාභ ජනතාවට නිසි පරිදි ලැබෙනවාද කියන එක අපි සොයා බැලිය යුතුයි. මේ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග විශේෂයෙන් පාර්ලිමේන්තුවේ ක්‍රියාත්මක වෙන රජයේ මුදල් පිළිබඳ කාරක සභාව සහ අනෙක් කාරක සභා හරහා ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. අය වැය මඟින් පුරෝකථනය කර ඇති රජයේ ආදායම වන රුපියල් බිලියන 2,077, -ට්‍රිලියන දෙකකට ආසන්න මුදල- මේ වසර අවසානයේදී ළඟා කරගත හැකි වැඩසටහනක් මේ රටට අවශ්‍ය වෙනවා.

මම විශේෂයෙන් අගය කරනවා, මංගල සමරවීර මුදල් අමාත්‍යතුමා මේ අය වැය තුළම යෝජනාවක් විධියට අන්තර්ගත කරලා තිබෙන අධීක්ෂණ සහ මෙහෙයුම් ඒකකය. මම එය ඉතාම සතුටින් කියන්නේ. Revenue Intelligence Unit එක මුදල් අමාත්‍යාංශය තුළ ස්ථාපිත කිරීමෙන් අපිට හැකියාවක් ලැබෙනවා, මේ වසර තුළ අපේක්ෂිත රාජ්‍ය ආදායමට එක රුපියලක්වත් අඩු නැතුව එකතු කරගන්න. මෙම වගකීම තිබෙන්නේ මුදල් අමාත්‍යාංශය විසින් පිහිටුවන එම ආයතනයටයි; එම Unit එකටයි. එනිසා මාස තුනක් ගෙවී ඇති මේ වසර තුළ ආර්ථිකයේ සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම තුළින් දිළිඳුබව සහ ආදායම් ව්‍යාප්තියේ විෂමතාව අඩු කරලීමටත්, විශේෂයෙන්ම රජයේ සහනාධාර ලැබිය යුතු තැනැත්තන් හට ඒවා ලබා දීම සඳහාත් මේ තීරණය ඉතාම වැදගත් වෙනවා. මෙම ඒකකය මඟින් රාජ්‍ය ආදායම ලැබීමේ යන්ත්‍රණයේ පවතින සිදුරු වසා දමා, රාජ්‍ය ආදායම බිලියන තුන්දහසක් -ට්‍රිලියන තුනක්- දක්වා වර්ධනය කරලීමට අවශ්‍ය පියවර ගනියි කියලා අපි විශ්වාස කරනවා. ඒ වාගේම නිවැරදි ආර්ථික දත්ත මත විශ්ලේෂණය කර වසර 2025 වනවිට ශ්‍රී ලංකාව ඉහළ ආදායම් ලබන රටක් බවට පත් කර ගැනීමට මුදල් අමාත්‍යවරයා ප්‍රමුඛ අප රජයට හැකි බවත් සඳහන් කරන්න කැමැතියි. මේක ඉතාම වැදගත් කාරණයක්. මොකද, විශේෂයෙන් රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේදී - Public Finance Committee එකේදී - අවුරුදු තුනක් තිස්සේ අපි මේ ගැන පරීක්ෂණ කළා. අපි නිතර කථා කරනවා, මේ රටේ බදු ආදායම් - සෘජු බදු හා වක්‍ර බදු- ගැන. අපි සෘජු බදු කෙළින්ම එකතු කර ගන්නා ක්‍රමවේදයේ විශාල විෂමතා තිබෙනවා. අද වනවිට මේ රටේ සෘජු බදු ගෙවන පුද්ගලයින් රුපියල් මිලියන 2,900 ගණනක බදු ගෙවිය යුතුයි. නමුත් ගෙවා තිබෙන්නේ, මිලියන 125යි. Assessment එකෙන් පසුවත් මිලියන හාරසිය ගණනක් විතරයි ගෙවන්නේ. ඒක තමයි මෙහි සැබෑ තත්ත්වය. අපි මේ වැඩ පිළිවෙළ හරහා මේ බදු ගෙවිය යුතු පුද්ගලයින්ගෙන් බදු හරියාකාරව ලබා ගෙන, මේ බදු විෂමතාවය අඩු කරගෙන ජනතාව මත දැනට පටවා තිබෙන බදු බර අයින් කරගන්න උත්සාහ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) ஆசு மாரசிங்க)
(The Hon. (Prof.) Ashu Marasinghe)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බලාපොරොත්තු වෙනවා, මෙම ක්‍රියාදාම හරහා රටේ ප්‍රශ්න විසඳා ගෙන මෙම වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කරන්න.

මේ අවස්ථාවේදී මම කථා කරන්න කැමැතියි, ගරු ජනාධිපතිතුමාගේ වැය ශීර්ෂය ගැන. එතුමාගේ අමාත්‍යාංශ ගැන විශාල විවාදයක් මේ වනවිට මේ රටේ තිබෙනවා. ජනාධිපතිතුමාත් මේ රටේ, මේ ආණ්ඩුවේ කොටස්කාරයෙක්. මම මේ අවස්ථාවේ මතක් කර දෙන්න කැමැතියි, ගමරාළ හා එළදෙනගේ කථාව. ගමරාළ එළදෙනක් හදනකොට, තණකොළ කවා, පෝෂණය කරලා ඔක්කෝම කරනවා. ඒ වාගේම එළදෙනගෙන් දොවා ගන්නා කිරි ටික, ලබා ගන්නා ගොම ටික ගමරාළට හිමි වෙනවා. හැබැයි, එළදෙනට අවශ්‍ය සියලුම පහසුකම් ටික -තණකොළ ටික, පුන්නක්කු ටික- දීලා අවසානයේදී මොකද වෙන්නේ? ජනාධිපතිවරයා ළඟ තිබෙනවා, ආරක්ෂක අමාත්‍යාංශය, මහවැලි අමාත්‍යාංශය හා පරිසර අමාත්‍යාංශය. මේ සියලුම අමාත්‍යාංශ එතුමා යටතේ තබාගෙන අවසානයේදී එතුමා විතරක් credit එක ගන්නා ක්‍රමය වැරැදියි. එළදෙනට තණකොළ ටික දීලා, පුන්නක්කු ටික දීලා හදනවා වාගේම, ඒ කීර්තියත් සම-සමව බෙදී යා යුතුයි, මේ ආණ්ඩුව තුළ. එහෙම නැතුව "මම විතරයි මේ ආණ්ඩුවේ හරි" කියන ප්‍රකාශය කරන්න ජනාධිපතිවරයා උත්සාහ කරනවා නම්, එම ප්‍රකාශය සම්පූර්ණයෙන් වැරැදියි. අපි පැහැදිලිව විවේචනය කරනවා, එතුමාගේ ක්‍රියා කලාපය. ඒ නිසා එතුමාට කියනවා, අද දවස ඇතුළත -[බාධාකිරීමක්] මොකක්ද, ඔබතුමා කියන්නේ? [බාධාකිරීමක්]

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

-ගැන කථා කළා විතරයි, ඒ වාගේ කථා කළා. කමක් නැහැ. ගමරාළ හා එළදෙනගේ කථාව මට මතක් වෙන්නේ අන්න ඒ නිසා තමයි, මන්ත්‍රීවරුනි. මම කියන්න කැමැතියි, මේ ජනාධිපතිතුමාට නැවත හැරෙන්න පුළුවන් බව. මේ එළදෙනගේ කිරි ටික, ගොම ටික විතරක් ගන්න එපා. මේ එළදෙන පෝෂණය කරන්න අවශ්‍ය තණකොළ ටික දෙන්න, පුන්නක්කු ටික දෙන්න එතුමාත් සහභාගි විය යුතුයි. එහෙම වුණේ නැත්නම් වෙන්නේ මේ රටේ වගකීම, මේ රටේ ජනතාව ගැන හිතන වගකීම එක්සත් ජාතික පක්ෂය පැත්තෙන් තබා, එතුමා මේ අය වැය තුළ වැඩියෙන්ම - ඉතිහාසයේ සිටි ජනාධිපතිවරුන් ගැන 2012 සිට වාර්තා සියල්ල මම ළඟ තිබෙනවා.

අද නොවෙයි, මම හෙට ඒ ගැන කථා කරනවා. මහින්ද රාජපක්ෂ මහතා 2012, 2013, 2014 වෙන් කර ගත්තා වාගේ නොවෙයි, ඒ වාගේ දෙගුණයක් -බිලියන 13ක්- මෙවර අය වැයෙන් ජනාධිපතිවරයා වෙන් කරගෙන තිබෙනවා. එය අපට ප්‍රශ්නයක්. ඒ ප්‍රශ්නය තමයි අපේ පසු පෙළ මන්ත්‍රීවරුන්ගේ හදවත් තුළ දෝංකාර දෙන්නේ. ඒ නිසා, අපි මේ ගැන හෙට වැඩියෙන් කථා කරන්න බලාපොරොත්තු වනවා. මංගල සමරවීර ඇමතිතුමා විසින් ඉදිරිපත් කරන ලද මේ අනභිභවනීය අය වැය අපි කිසිම සැක සංකාවක් නොමැතිව අද සම්මත කර ගන්නා බව අවසාන වශයෙන් පවසමින් නිහඬ වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සී.බී. රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක් වෙන් කර තිබෙනවා.

[අ.භා.3.20]

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

අය වැය තුළ ගැබ් වුණු කාරණා බලනකොට අපට කියන්න තිබෙන්නේ "ලෝකෙට පරකාසේ - ගෙදරට මරගාතේ" කියලායි. අවුරුදු 20 ගණනක් මාත් මේ පාර්ලිමේන්තුවේ ඉඳලා තිබෙනවා. මෙතුමන්ලාම තමයි කිව්වේ, ලැප්ටොප් දෙනවා කියලා. දැන් "ටොප් ලැට්" දෙන්න අවශ්‍ය පසු බිම මේ අය වැයෙන් සකස් කරලා තිබෙනවා. මෙතුමන්ලා තාරුණ්‍ය ගැන කථා කරමින්, බල්ලන් ගැන කථා කරමින්, මිලියන 100, 100 වෙන් කර තිබෙනවා. ස්වාභාවිකවම වන්ධ්‍යාකරණය වුණු අය මේ කැබිනට් මණ්ඩලයේ ඉන්නවා. ඒ අයට පුළුවන් බල්ලන් වන්ධ්‍යාකරණය කිරීම උගන්වන්නත්. මංගල සමරවීර ඇමතිතුමා වන්ධ්‍යාකරණය පිළිබඳ විශාරදයෙක් හැටියට මා දකිනවා. එතුමාට ඒ අවස්ථාව සලසා දෙන්න ඕනෑ කියන එක තමයි මම විශේෂයෙන්ම සඳහන් කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ණය ගැනීම සහ බදු වැඩි කිරීම, විකිණීම, මුදල් අච්චු ගැසීම මේ අවුරුදු හතර පුරාවටම මෙම ආණ්ඩුවේ කාර්යයක් බවට පත් වෙලා තිබෙනවා. මේ ණය බර අපේ පරපුරෙන් පරපුරට යනවා. අපේ දරු පරපුරටම මේ ණය ගෙවන්න සිද්ධ වන පසුබිම සකස් කරන රජයක් හැටියට අපට මේ රජය හඳුන්වන්න පුළුවන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳව 2014දී වෙනත් අය මොනවාද කිව්වේ කියලා විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ. ඒ, මෙන්න මේවායි.

"ආසියාවේ සංවර්ධනය වන රටවල් අතරින් ශ්‍රී ලංකාව ශීඝ්‍රයෙන් වර්ධනය වෙමින් පවත්නා රටවල් අතරින් එකකි"

- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ජූලි 29, 2014 - "කලාපීය යටිතල පහසුකම්වලට සමාන මාර්ග සහ වරාය ඉදිකිරීමේ දැවැන්ත ව්‍යාපෘතිය හරහා දියුණුවක් ශ්‍රී ලංකාවේ පෙනේ"
- Fitch Ratings, මැයි 2014 -
  "අය වැය පරතරය අඩු වනවාත් සමඟම රාජ්‍ය මූල්‍ය තත්ත්වය යහපත් වෙමින් පවතී"
- ජාත්‍යන්තර අරමුදල, ජූලි 2014 -
  "දුගීභාවය අවම කර ගැනීම පිළිබඳව ශ්‍රී ලංකාව සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වා තිබෙනවා"
- Millennium Development Goals, UNDP -
  "ජාත්‍යන්තර තරගකාරීත්වය සහ ඉහළ ඒක පුද්ගල ආදායම හරහා ශ්‍රී ලංකාවේ ආර්ථිකයේ ශක්තිමත්භාවය පිළිබිඹු වනවා"
- Moody's, ජූලි 2014 -
  "ආසියාවේ වඩාත්ම තිරසාර කොටස් වෙළෙඳ පොළ බවට කොළඹ කොටස් වෙළෙඳ පොළ අද පත් වී තිබෙනවා"
- මහ බ්‍රිතාන්‍යයේ Capital Finance International, දෙසැම්බර් 2014 -
  "ලෝකයේ ශීඝ්‍රයෙන්ම වර්ධනය වන නගර 10 අතරට කොළඹ නගරය එක් වනවා"
- Annual Travel Study of MasterCard 2014 -

එදා මේ රටේ ආර්ථිකය පිළිබඳව ලෝකය කථා කළේ මෙන්න මේවා තමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද Moody's කියනවා, "විදේශීය මූල්‍යකරණය අවදානම් තත්ත්වයකට පත්ව ඇති රටවල් අතර ශ්‍රී ලංකාව සිටී" කියලා.

අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියනවා, රජයට දැන් ණය ගෙවා ගන්න අපහසු බව. එක්සත් ජාතික පක්ෂයේ නියෝජ්‍ය නායක හා හිටපු මුදල් ඇමතිවරයා කියනවා, "මේ රට බංකොලොත් වනවා" කියලා. Standard & Poor's ප්‍රකාශ කරනවා, "ශ්‍රී ලංකා මහ බැංකුවේ ණය අවදානම ඉහළ මට්ටමක" කියලා. මහ බැංකු අධිපති ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි ප්‍රකාශ කරනවා, "මේ රට අද දරුණු අවපාතයක" කියලා. විගණකාධිපති ගාමිණී විජේසිංහ මහතා කියනවා, "රජයේ දූෂණ මුළු මනින්ම ඉවත් කළ හැකි නම් රජයේ වියදම්වලින් සියයට 25ක් ඉතිරි කර ගත හැකියි" කියලා. 2019 වර්ෂය සඳහා රජයේ වියදම රුපියල් බිලියන 4,500ක්. ජර්මානු තානාපති ජෝන් රෝච්ඩ් මහතා ප්‍රකාශ කර තිබෙනවා, "ශ්‍රී ලංකාව කිසිම ආයෝජනයක් සඳහා සුදුසු නොවෙයි" කියලා.

අද මේ රටට අවලාද නගන සමහර රටවල්, එදා අපට කථා කරලා ප්‍රශංසා කළා. ඒ රටවල් අද අපි ගැන කථා කරන්න සූදානම්.

මම කෘෂිකාර්මික ප්‍රදේශයක ජීවත් වෙන, එවැනි ප්‍රදේශයක් නියෝජනය කරන පුද්ගලයෙක්. එදා කිව්වා කෘෂිකර්ම ක්ෂේත්‍රය සඳහා -එළවලු වගාව සඳහා- අවශ්‍ය පහසුකම් ටික දෙනවා කියලා. Polytunnels වාගේ දේවල් දෙනවා, වෙළෙඳ ආර්ථිකය හදලා දෙනවා, පොහොර සහනාධාරය දෙනවා, සහලින් ස්වයංපෝෂිත කරනවා කියලා එදා කිව්වා. අද ඒ පිළිබඳව කිසිම සඳහනක් කරන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වතු කම්කරු ජනතාවගේ වැටුප සඳහා රුපියල් 900ක් දෙන්නම් කියලා අපි එදා කථා කරගත්තා. නමුත් මෙවර අය වැයෙන් ඒ වැටුප ගැන සඳහනක් නැහැ. දැන් කියනවා, සෙස් බද්දෙන් රුපියල් 50ක් දෙන්නම් කියලා සාකච්ඡා කරනවා කියලා. ඒ කම්කරුවා මේ රටේ ජාතික ධනයට විශාල දායකත්වයක් ලබා දෙනවා. ඔවුන්ට ඒ වැටුප වැඩි කරලා දෙන්න ඕනෑ.

අපි කිසි වෙලාවක හරි දේ හරියි කියන්න බය වෙන්නේ නැහැ; පැකිළෙන්නේ නැහැ. මේක පුස් අය වැයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳ මා ඔබතුමාට ස්තුතිවන්ත වනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නියමිත වේලාවට කථාව අවසන් කළා, බොහොම ස්තුතියි.

මීළඟට, ගරු සුජීව සේනසිංහ ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 15ක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 3.26]

**ගරු සුජීව සේනසිංහ මහතා (විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க - விஞ்ஞான, தொழில்நுட்ப மற்றும் ஆராய்ச்சி அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. Sujeewa Senasinghe - Non Cabinet Minister of Science, Technology and Research)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි.

[ගරු සුජීව සේනසිංහ මහතා]

මංගල සමරවීර ඇමතිතුමාගේ මංගල අය වැය ගැන කථා කරන්න අවස්ථාවක් ලැබීම ගැන මා සන්තෝෂ වනවා.

මේ අය වැය හොඳ අය වැයක් කියන එක හැම තැනින්ම කියැවෙනවා. සී.බී.රත්නායක මන්ත්‍රීතුමා කියපු කාරණය සම්බන්ධයෙනුත් යමක් කිව යුතු වනවා. අපිත් හැම වෙලේම හරි දේට හරියි කියන, වැරදි දේට වැරදියි කියන මන්ත්‍රීවරු. අපිත් පැකිළෙන්නේ නැහැ වැරදි නම් වැරදියි කියන්නත්, හරි නම් හරියි කියන්නත්. හැබැයි, එතුමා කියපු කාරණා කීපයක් හරි. ඒ අවස්ථාවේදී එහෙම කියපු රටවල් තිබුණා, එහෙම කියපු ආයතන තිබුණා. හැබැයි, ඔබතුමාට මේ ණය කන්දරාව ගැන මතක ඇති. මෙය ට්‍රිලියන අටහමාරක වාගේ ණය ප්‍රමාණයක්. ඔබතුමන්ලාගේ පාලන කාලය තුළ විශාල ණය කන්දරාවක් එකතු වුණා.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
ගරු ඇමතිතුමනි,-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔබතුමා උත්තර දෙන්න එපා. ඔබතුමාට මා බාධා කළේ නැහැ. [බාධා කිරීමක්] එහෙම argue කරන්න එපා. ඔබතුමා කියන ඒවාත් අපි අහගෙන හිටියා නේ. ඔබතුමා කියපු කථා ගොඩක් වැරදි කථා. මම ඒවාත් අහගෙන හිටියේ මගේ වෙලාවේදී උත්තර දෙන්නයි.

**ගරු සී.බී. රත්නායක මහතා**
(மாண்புமிகு சீ.பி. ரத்நாயக்க)
(The Hon. C.B. Rathnayake)
එහෙම නම් මා කියන එක අහන්න ඕනෑ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඒවා අහන්න බැහැ. ට්‍රිලියන අටහමාරක් ණය තිබෙනවා. ඔබතුමා මහ බැංකුවේ වාර්තාව පරීක්ෂා කරලා බලන්න. මාත් එක්ක ඒ ගැන argue කරලා හරියන්නේ නැහැ. 2015දී ට්‍රිලියන අටහමාරයි. ට්‍රිලියන දහයහමාරයි දැන්. [බාධා කිරීමක්] අහගන්න. අහගෙන ඉන්න. සාවධානව අහගෙන ඉන්න පුරුදු වෙන්න. [බාධා කිරීමක්] කියනකොට රිදෙනවා. කොහේද ගණන් දන්නේ?

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
කුමාරස්වාමිලා කියනවා-

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඔව්,කුමාරස්වාමිලා, විගණකාධිපතිලා දැන් කථා කරනවා. ඒ දවස්වල කථා කළේ නැහැ, කට පුට්ටු වෙලා හිටියේ. ඒ දවස්වල කථා කරන්න බයයි. ඒ දවස්වල එක නිලධාරියෙක් කථා කළේ නැහැ. එක්කෙනෙක් කථා කළේ නැහැ. කථා කළේ නැත්තේ මොකද කියලා ඔබතුමන්ලා දන්නවා. ඒ කථා කළේ නැත්තේ මර්දනය නිසා. සුදුවෑන් ආවා, ගැහුවා, කුඩු කළා, මැරුවා. ඒ නිසා කථා කළේ නැහැ. දැන් අපි ප්‍රජාතන්ත්‍රවාද ඇති කරලා තිබෙනවා. ඒ නිසා අහගන්න. "Daily FT" එකේ තිබෙන්නේ,- මේ මම කියන එකක් නොවෙයි, [බාධා කිරීමක්] ඉතින් අහගෙන ඉන්නකෝ, කියවන්නේ නැතිව. Verbal diary එක වාගේ, ගිරවෙක් වාගේ කියවන්නේ නැතිව ඉන්න. කට විතරයි. මුහුණ විතරයි පෙනෙන්නේ රැවුල එහාට මෙහාට යනවා. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
බාධා කරන්න එපා. එතුමාගේ කථාව කරගෙන යන්න දෙන්න.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
අපි ඉතාම සාවධානව ඔබතුමා කථා කරනවිට අහගෙන හිටියා. පොඩ්ඩක් ඉගෙන ගන්න. ඔබතුමා ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයෙක් නේ. ඔබතුමා ලියලා දීපුවා නේ කියෙව්වේ. මම මේ කරුණු ඔක්කෝම අධ්‍යයනය කරලා ආවේ. ඒ නිසා අහගෙන ඉන්න. - [*Interruption.*] Listen to me, please. This is what the "Daily FT" of 2nd January, 2019, says, not me. - [*Interruption*] Listen to me. - [*Interruption*]. First, you listen to me. Without listening how can you answer?

"Daily FT" states, I quote:

> "It is reported that Sri Lanka will have $ 4.2 billion in debt service payments in 2019, $ 3.7 billion in 2020, $ 3.3 billion in 2021 and $ 3.7 billion in 2022, adding up to a total of $ 14.9 billion during the four years."

මේවා අපි ගත්ත ඒවා නොවෙයි. මේ ගත්ත ණය ප්‍රමාණය ආපහු ගෙවන ආකාරය - debt service payments - අපි කළමනාකරණය ගත් ආකාරය බලන්න. ත්‍රිකුණාමල වරාය හදන්න ණය ගත්තා නම්, තවත් ණය එකතු වෙනවා. ආර්ථික වර්ධන වේගයත් ඉහළින් පෙන්නුම් කරනවා. ත්‍රිකුණාමල වරාය හදන්න කියලා අපි ඩොලර් මිලියන 2ක්, 3ක් ණය ගත්තා නම් ආර්ථික වර්ධන වේගය 6.5ක්,7.5ක් පෙන්නුම් කරනවා.

ණය ගත්තාම, ඒ ණය ගෙවීම ආර්ථික වර්ධන වේගයේ පෙන්නුම් කෙරෙන්නේ නැහැ. ආර්ථිකයට දමන මුදල් ටික ඔක්කෝම ආර්ථික වර්ධන වේගයට ගණනය කෙරෙනවා. ඒ වාගේම- [බාධා කිරීම්] අහගන්නකෝ. I further quote:

> "The major challenge in the New Year and years after is to refinance large volume of foreign debt settlements because of increasing Government's debt refinancing cost of external sources due to poor credit ratings and associated political risk."

ඔබතුමන්ලා ඉදිරිපත් කළ කරුණු සියල්ල ඔබතුමන්ලාට වාසි සහගත දේවල් පමණයි. තමුන්නාන්සේලා අවුරුදු දෙකකට කලින් ඡන්දයක් තිබ්බේ මොකද? ඇයි ඡන්ද පරදින්නේ? ඔබතුමන්ලා කියන සුරංගනා ලෝකය රටේ ඇත්තටම හදලා තිබුණා නම්, අවුරුදු දෙකකට කලින් ඉල්ලාගෙන විත් කිරි කැවේ ඇයි? ඉල්ලා ගෙන විත් කිරි කාලා දැන් විපක්ෂයේ ඉඳගෙන දුක් වෙන්නේ ඇයි? අවුරුදු දෙකක් හොඳ "ෂපාන්" එකේ ඉන්න තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක තමයි මධ්‍යස්ථ තත්ත්වය. The "Daily FT" also states, I quote:

> "Sri Lanka's economy grew only by around 3.1 % in 2017 well below the envisaged levels of the Central Bank of Sri Lanka (CBSL), as a result of disruptions from droughts and floods, and policy tightening...."

Why do we need policy tightening? That is because of the huge debt incurred by the country. So, this is not done for our private gains.

> "...However, the CBSL expected the economy to be recovered in 2018 and will grow by 4.5 %."

- [බාධා කිරීම්] අත්තිවාරම දමලා තිබෙන්නේ. ඒ අත්තිවාරම අනුව- [බාධා කිරීම්] ඔබතුමායි, මායි පසුව හම්බ වෙමු. ඔබතුමා වෙනත් තැනකදී විවාදයකට එන්නකෝ. Do not shout like a child. If you do not agree, clarify it in your speech. Why are you disturbing? I am making a decent speech and only your mouth is working from the other side. Do not do that. Have a little bit of decency to listen to other people. Listen to other people also.

It further states, I quote:

> "The economy is expected to grow by 4.5 and 4.3 % in 2019 according to the ADB and IMF's forecasts respectively."

මේ සියලු දෙයින් සඳහන් වෙන්නේ ආර්ථික වර්ධන වේගය ඇති කරන ආකාරයයි. විශේෂයෙන්ම මහින්ද රාජපක්ෂ මැතිතුමා උදේ Budget deficit එක ගැන කථා කළා. ඔබතුමන්ලාත් අහගෙන හිටියා. 2015 Budget deficit එක කීයද? සියයට 7.6යි. එතකොට මේ අවුරුද්දේ Budget deficit එක කීයද? [බාධා කිරීමක්] මම අහන්නේ, ඔබතුමාගෙනුයි. ඔබතුමාට අවස්ථාවක් දෙන්නම්. ඔබතුමා දන්නවා නම් කියන්න. අනිවාර්යයෙන්ම ඔබතුමා දන්නේ නැහැ. වට පිට බලන්නේ නැතිව කියන්න. [බාධා කිරීමක්] මම නම් කරලා කියනවා, සී.බී. රත්නායක මන්ත්‍රීතුමා උත්තරයක් දෙන්න. [බාධා කිරීමක්] මේ අවුරුද්දේ Budget deficit එක කීයද?[බාධා කිරීම්] කවුරුන් හෝ ලියා දුන්නු එකක් ඇවිල්ලා කියවන්න පුළුවන්. හැබැයි, ප්‍රශ්නයක් ඇහුවාම උත්තර දෙන්න බැහැ. ඒ නිසා ආර්ථිකය ගැන අවබෝධයක් නැතිව කථා කරන්න එපා කියන එකයි අපි කියන්නේ. මේ අවුරුද්දේ Budget deficit එක සියයට 4.4යි. ඊළඟ අවුරුද්ද වන විට සියයට 3.3ට ගෙනෙන්න අපට පුළුවන්. දියුණු රටවල් ගත්තොත්, කැනඩාවේ සෘණ 2යි. ප්‍රංශයේ සියයට 3.1යි. ලෝකයේ හැම රටකම විශේෂයෙන් ඇමෙරිකාව, ජපානය වාගේ රටවල- [බාධා කිරීමක්] Budget deficit එක සෘණ මට්ටමේ තිබෙනවා. හැම රටක්ම තමන්ගේ ආදායමත් එක්ක වියදම ගණනය කරන්නේ ඒ ආකාරයටයි. හැබැයි, ඒ රටවල ආදායම සහ වියදම විශාල ලෙස වෙනස්. ඒ රටවල් අපේ රටත් එක්ක සන්සන්දනය කරන්න බැහැ.

2022 වසර වන විට අපේ අපනයන ආදායම ඩොලර් බිලියන 27 දක්වා වැඩි කරන්න අපි බලාපොරොත්තු වෙනවා. මේ වන විට අපනයන ආදායම සියයට 30කින් වර්ධනය වෙලා තිබෙනවා. ඇඟලුම් කර්මාන්තය සියයට 30කින් වර්ධනය වෙලා තිබෙනවා. [බාධා කිරීම්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
කොහේද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මේ රටේ; ලංකාවේ. ඔබතුමන්ලා පරීක්ෂා කර බලන්න. මහ බැංකු ගිණුම් පරීක්ෂා කර බලන්න. එක එක්කෙනාගෙන් අහගෙන ඇවිල්ලා මෙතැන කියවන්න එපා. බන්දුල ගුණවර්ධන මහත්මයා ලියා දෙන ඒවා මෙතැන කියවන්න එපා. ඔබතුමන්ලා ඔක්කෝටම තිබෙන්නේ එකම note එක. උදේ මහින්ද රාජපක්ෂ මහත්මයා කථා කරන කොට අපි දැන ගත්තා, ඒ note එක තමයි කියවන්නේ කියලා. විශේෂයෙන්ම ඔබතුමන්ලාගේ අවධානය යොමු කරනවා- [බාධා කිරීම්] I will tell you. I will give you the figures year by year. Just listen to me because I have only 15 minutes. So, let me talk within that time.

මම දර්ශක ටිකක් ඉදිරිපත් කරන්නම්. එකක් තමයි, Sri Lanka moves up in the World Happiness Report. මෙකේ තිබෙන්නේ මේ රටේ ඇති වෙලා තිබෙන තත්ත්වය. ඔබතුමන්ලා ඒක පිළිගන්නවා. ඒක ඇති වුණේ අපේ ආණ්ඩුව තුළින්. යහපාලන ආණ්ඩුව ගෙනැල්ලා, ඒ තුළින්- [බාධා කිරීම්]හරි. Sri Lanka was placed in the 120th slot last year and has moved up to 116th in the latest Global Happiness Index. මේ අවුරුදු 3 ඇතුළත රටවල් 20කින් ඉදිරියට ඇවිල්ලා තිබෙනවා. ඒක පිළි ගන්නවාද? මිනිස්සු සන්තෝෂයෙන් ඉන්නවා නම්, ආර්ථික වර්ධන වේගය, අනෙකුත් සමාජ සුබසාධන කටයුතු සියල්ල මෙකට අදාළ වෙනවා. රටේ තිබෙන නිදහස, යහපාලනය, නීතිය මේ සියලු දේවල් අදාළ වෙනවා. මේවා නිකම් ඇති වුණේ නැහැ. ජනතාව මේක අවබෝධ කරගෙනයි ඉන්නේ. ඒ වාගේම Corruption Perception Index එක- [බාධා කිරීම්]නැහැ, නැහැ. අහ ගන්න. The website of the Transparency International states, I quote:

> "Since its inception in 1995, the Corruption Perceptions Index, Transparency International's flagship research product,..."

Sri Lanka scored 38 points out of 100 on the 2018 Corruption Perception Index and rank of Sri Lanka was 89. Sri Lanka has improved from 105 to 89. මෙන්න මේ කාලය තුළ - [බාධා කිරීම්] ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමා කියන්න, Index of Economic Freedom කීයද කියලා. දන්නේ නැහැ නේද? Sri Lanka has the 110th rank that is close to the position of such countries as China. So, Sri Lanka has done this. During the past three years, we have done tremendously in those areas. The next one is Doing Business Index. [බාධා කිරීම්] හොඳයි, මම එකක් අහන්නම්. අපේ රටේ Doing Business Index rank එක කීයද කියලා ඔබතුමා පුළුවන් නම් කියන්න. ඔබතුමා දන්නවා නම් කියන්න. දැන් දිගටම මාත් එක්ක argue කළා නේ. අපේ රටේ Doing Business Index rank එක කීයද කියලා කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමා කියන්න. [බාධා කිරීම්] ඔබතුමා හැම එකටම argue කරනවා නේ.

ගරු කෙහෙළිය රඹුක්වැල්ල මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවා නම් කියන්න. [බාධා කිරීමක්] ලන්සා මන්ත්‍රීතුමාට කියන්න කියලා කියන්න එපා. ලන්සා මන්ත්‍රීතුමා කොහොමද ඒවා දන්නේ. ඔබතුමා කියන්න. ලන්සා මන්ත්‍රීතුමා මගේ යහළුවා. එතුමා අමාරුවේ දමන්න එපා. Doing Business Index එක කීයද කියන්න? ඊට කලින් කියන්න, ගිය අවුරුද්දේ කීයද තිබුණේ කියලා?

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
Hundred and twelve. [බාධා කිරීමක්]

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
වැරැදියි, වැරැදියි. No. It is wrong. It is 95. [බාධා කිරීමක්] ඒක තමයි කියන්නේ. [බාධා කිරීමක්] අන්න එහෙම හරි.

[ගරු සුජීව සේනසිංහ මහතා]

ඔබතුමන්ලා කියපු ගිය අවුරුද්දේ ගණන පොඩ්ඩක් හරි. අපි කළ කාර්ය භාරය නිසා දැන් අනුපහට ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම Doing Business Index එක අපි රටවල් 15ක් ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. චීනය 70යි. මේ වාගේ රටවල් තිබෙනවා. චීනය ළඟට එන්න තමයි අපි උත්සාහ කරන්නේ. 2022 වෙන කොට අපි බලාපොරොත්තු වෙනවා, 85ට එන්න. [බාධා කිරීමක්] හිනහවෙන්න පුළුවන්; හිනහවෙන්න පුළුවන්. දැන් 95ට ඇවිල්ලා තිබෙනවා. මාස කිහිපයකට කලින් 100 වාර්තා කළා. විශේෂයෙන්ම, - [බාධා කිරීමක්] මම කිව්වා කියලා ලියාගන්න. අපි සියලු රජයේ ආයතන computerize කළාම, මේ අගය තවත් 10කින් විතර ඉස්සරහට එනවා, මේ අවුරුද්ද ඇතුළත. මෙන්න මේක තමයි මේ ආණ්ඩුව කළේ. යහ පාලනය ගෙනැල්ලා, අපි හොඳ අත්තිවාරමක් දැම්මා. G7 countriesවල අය ඔබතුමන්ලාගේ ජනාධිපතිතුමාව ළඟින් වාඩි කරවාගෙන "Champion of Democracy" කියලා කිව්වා. ඔබතුමන්ලා දැන් එතුමාගේ නැට්ටේ එල්ලිලා ඉන්නවා. හැබැයි, ඒ දවස්වල ඔබතුමන්ලා මොකක්ද කිව්වේ? එතුමාටත් බැන්නා. එතුමාටත් දැන් ඒවා අමතක වුණාට, එතුමා අපිත් එක්ක ඉන්න කොට තමයි "Champion of Democracy" කියලා එතුමාව G7 countriesවල අය ළඟින් වාඩිකරවා ගත්තේ. ඒ අත්තිවාරම තුළ තමයි අපි මේ සංවර්ධනය ලබා ගන්නේ.

විශේෂයෙන්ම ඔබතුමාට මම ඉදිරිපත් කරනවා භෝගයන්ගේ වර්ධනය. මේ අවුරුදු දෙකේ කෘෂිකර්මය,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
මට disturb කළා නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම, ආදායම සම්බන්ධයෙන් බන්දුල ගුණවර්ධන මහත්මයාගේ,-

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ වෙලාවෙන් එතුමාට විනාඩි දෙකක් ලබා දෙනවා.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Thank you very much. I am getting two minutes.

ඒ වාගේම, ක්‍රය ශක්තිය සම්බන්ධයෙන් කිව යුතුයි. 2013-2014 ආදායම තිබෙනවා. ගෘහ ඒකකයක මාසික ආදායම, රුපියල් 45,878යි. මේ අවුරුදු තුන ඇතුළත අපේ ආණ්ඩුව සියයට 104කින් සියලු දෙනාගේම පඩි වැඩි කරලා තිබෙනවා. ඔබතුමන්ලා ඒ ගැන නිකම් හිතලාවත් තිබුණේ නැහැ. සියයට 104කින් පඩි වැඩි කර තිබෙනවා. ඔබතුමන්ලා නවත්වපු තැන ඉඳලා, රුපියල් 45,000ක් වූ පවුලක ආදායම, දැන් රුපියල් 62,237ක් වෙලා තිබෙනවා. ඒ වාගේම වියදම රුපියල් 54,000යි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඩොලර් එක කීයද?

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
ඩොලර් එක කීයද කියලා කියන්නම්. ඒකත් අපි දන්නවා. මේ අන්තිම මාස කිහිපය තුළ ඩොලර් එකට සාපේක්ෂව අපේ රුපියලේ අගය සියයට 6කින් වැඩි වුණා. ඒ කියන්නේ ඩොලර් එකට ගෙවිය යුතු මුදල රුපියල්3කින් අඩු වුණා. එහෙම වුණේ, අපනයන වැඩි වුණු නිසා. විශේෂයෙන් ඇඟලුම් කර්මාන්තය සියයට 30කින් වැඩි වෙලා තිබෙනවා. මත්ස්‍ය කර්මාන්තය සියයට 15කින් වැඩි වෙලා තිබෙනවා.

ගරු සී.බී. රත්නායක මැතිතුමනි, ඔබතුමා ඕනෑම රූපවාහිනී විවාදයකට එන්න. මම ඔබතුමාගේ ඕනෑම අභියෝගයක් භාර ගන්නම්. එහෙම නොවුණොත්, මම මන්ත්‍රීකමෙන් ඉල්ලා අස් වෙනවා. [බාධා කිරීමක්]පොඩ්ඩක් ඉන්න. සී.බී. රත්නායක මැතිතුමනි, ඔබතුමා පුළුවන් තරම් පාඩම් කරලා එන්න, මා සමඟ රූපවාහිනී විවාදයකට. මම හිතන විධියට අවුරුදු පහක් විතර යයි පාඩම් කරන්න, මොකද ඔබතුමා මොනවාවත් දන්නේ නැති නිසා . එවැනි කාලයක් වුණත් මම ඉන්නවා. අවුරුදු පහකින් හරි ඔබතුමා එවැනි විවාදයකට එයි කියලා බලාපොරොත්තු වෙනවා.

විශේෂයෙන්ම, රබර් නිෂ්පාදනය කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරනවා. නිෂ්පාදනය සියයට 5.1කින් වර්ධනය වෙලා තිබෙනවා. රබර් අපනයනය සියයට 6.6කින් වර්ධනය වෙලා තිබෙනවා. ඒ වාගේම සුළු අපනයන භෝග සියයට 31කින් වර්ධනය වෙලා තිබෙනවා. සෝයා බෝංචි නිෂ්පාදනය සියයට 80කින් වැඩි වෙලා තිබෙනවා. පසුගිය කාලයේ තිබුණු ඉඩෝරය, ගංවතුර සියල්ල එක්කත් මෙවැනි තත්ත්වයක් වාර්තා කරලා තිබෙනවා. විශේෂයෙන්ම, ඔබතුමාගේ අවධානය යොමු කරනවා, unemployment පිළිබඳව. අපේ ජනාධිපතිතුමා, ඒ වාගේම තව මන්ත්‍රීවරයෙක් මට කිව්වා, පෞද්ගලික අංශයේ රැකියා විශාල ප්‍රමාණයක් ඇති වෙලා තිබෙනවා. ඒක නිසා - [බාධා කිරීමක්] ආණ්ඩුවට එන්න බැහැ කියලා. පෞද්ගලික අංශයේ රැකියා වැඩි වෙන්නේත් අපි වැඩ කළ නිසායි. 2015දී 4.7 per cent unemployment rate එකක් තිබෙනවා. දැන් කීයද? සියයට 4.2යි. බින්දුවයි දශම පහකින් අඩු වෙලා. මෙන්න මේ අමාරුම කාලය තුළ, ට්‍රිලියන 10ක් ණය අරගෙන තිබෙන කාලයේ ඒ ණය ගෙවන අතර මේ සංවර්ධනය සිදු කර තිබෙනවා. මේ අත්තිවාරම උඩ, ඉදිරි අනාගතයේ දී විශාල සංවර්ධනයක් කරන්න අපි බලාපොරොත්තු වනවා.

ඇඟලුම් කර්මාන්තය විතරක් නොවෙයි. මගේ අමාත්‍යාංශය ගැන මට කථා කරන්න අවස්ථාවක් ලැබුණේ නැහැ. අපේ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය දිනයේ දි මම ඒ ගැන කථා කරන්නම්. විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය තුළින් ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මැතිතුමාත් අධීක්ෂණ මන්ත්‍රීවරයා වශයෙන් කටයුතු කරමින් අපි විශාල වැඩ කොටසක් කරගෙන යනවා. ආණ්ඩුවට බර දමන්නේ නැතිව, පෞද්ගලික අංශයේ දායකත්වය ලබා ගනිමින් "ශිල්ප සේනා" කියලා වැඩසටහනක් අපි දියත් කරනවා. එය මහපොළ, ගම්උදාවට වඩා ලොකු වැඩසටහනක්. ඒ තුළින් ආර්ථිකයට ඩොලර් බිලියන 5ක දායකත්වයක් බලාපොරොත්තු වෙනවා. මෙතුමා IT industry එකේ ආර්ථිකයට කරන දායකත්වය ඩොලර් බිලියනයක් වෙනවා. තව අවුරුදු දෙකක් යන විට IT industry එකේ ආර්ථිකයට කරන දායකත්වය ඩොලර් බිලියන 5 දක්වා වැඩි කරන්න

බලාපොරොත්තුවනවා. ඒ සම්බන්ධ growth of indicatorsවල දත්ත මා ළඟ තිබෙනවා. ඒ අනුව IT industry එකෙන් ඩොලර් බිලියන 5ක් බලාපොරොත්තු වනවා. ඒ වාගේම විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය තුළින් ඩොලර් බිලියන 5ක සංවර්ධනයක් සහ වර්ධනයක් ඉදිරි අනාගතයේ දී අපි බලාපොරොත්තු වනවා.

ඒ තාක්ෂණ දැනුම අපි ජනතාව අතරට ගෙන යන්න ඕනෑ. මේ වාගේ වැඩකටයුතුවලට පෞද්ගලික අංශය සම්බන්ධ කර ගන්නේ විශේෂයෙන්ම මගේ නායකත්වය යටතේයි. මට තිබුණේ රාජ්‍ය අමාත්‍ය ධුරයක්, foreign trade සම්බන්ධයෙන්. එහිදී ලෝක බැංකුව සහ ITC ආයතනය මාව navigator හැටියට පත් කළා. ඒකේදී අපට ලක්ෂ 6,000ක් -ණය නොවෙයි.- තෑගි වශයෙන් ලබා දී රටේ ජාතික අපනයන ප්‍රතිපත්තියක් හැදුවා. ඒක අපි තනිවම හැදුවේ නැහැ. පෞද්ගලික අංශයත්, ආචාර්යවරු සහ මහාචාර්යවරුනුත් එකතු කර ගෙන, Chambers ටිකත් එකතු කර ගෙන අප ඒ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කළා. ඒ තුළින් මේ වෙනකොට විශාල ප්‍රගතියක් ලබා තිබෙනවා. ගරු මන්ත්‍රීතුමනි, අපි කොපමණ විවාද කර ගත්තත් අපි සියලුදෙනාම එක රටේ පුරවැසියෝ නේ. මේ සංවර්ධනය අපිට විතරක් නොවෙයි, ඔබතුමන්ලා සියලුදෙනාටම අයත් වෙනවා. [බාධා කිරීමක්] ඔබතුමන්ලා ඔක්කොම යූඑන්පී එකේ හිටපු,- [බාධා කිරීම්] ආණ්ඩුව පැත්තේ හිටියා නම් මෙතැන ඉඳගෙන කෑ ගහනවා නේ. දැන් විරුද්ධ පක්ෂය පැත්තට ගිහින් කෑ ගහනවා. එහෙම කරන්න එපා. [බාධා කිරීමක්] බලන්න, ගාමිණී ලොකුගේ මන්ත්‍රීතුමා කොච්චර ලස්සනට මේ දේවල් අහගෙන ඉන්නවාද කියා. අහගෙන ඉඳලා මේවාට උත්තරයක් දෙන එක වෙනම දෙයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තමයි තිබෙන්නේ.

**ගරු සුජීව සේනසිංහ මහතා**
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Thank you. - [*Interruption.*] Do not disturb me.

ගරු ජනාධිපතිතුමාටත් තව මාස 8ක පමණ කාලයක් තමයි තිබෙන්නේ. ඒ කාලය තුළ අපි හොඳ "ගේමක් " දීගෙනයි යන්නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඒකට ඊර්ෂ්‍යා කරන්න එපා. [බාධා කිරීමක්] ගරු ජනාධිපතිතුමාට අපි කියන්නේ, මේ ලණු දෙන පිරිසට අහු වෙන්නේ නැතිව ඉන්න කියායි. ජනාධිපතිතුමාගේ කලින් කථාවකදී එතුමා කියා තිබෙන දෙයක් මම අද උදේ දැක්කා. 'සරත් ෆොන්සේකා මැතිතුමායි, ජනාධිපතිතුමායි, චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියයි ජීවිතක්ෂයට පත් වෙන්නේ කොහොමද එතුමා පරාජය වුණොත්' කියා ජනාධිපතිවරණය කාලයේ එතුමා කළ කථාවකදී කියා තිබෙනවා. එතුමාට ඒක පොඩ්ඩක් මතක් කරගන්න වෙයි. එතුමාගේ වටේ ඉන්නේ ලෙහෙසි පහසු කට්ටියක් නොවෙයි නේ. කොයි වෙලාවේ "ගේම" දෙයිද දන්නේ නැහැ. ගරු ජනාධිපතිතුමාගෙන් අපි මෙන්න මේ ඉල්ලීම කරනවා. අද අපේ රට හොඳ තැනක ඉන්නවා. අපි ඒ සඳහා හොඳ අත්තිවාරමක් දමා තිබෙනවා. මෙම අත්තිවාරම මත සිටිමින්, රට සංවර්ධනය කිරීම සඳහා, ඔබතුමා ධුර කාලය දරන අන්තිම මාස කිහිපයේදීත් අපිත් එක්ක එකතු වෙන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබාදීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හොඳයි. ඔබතුමාට බොහොම ස්තුතියි. The next speaker is the Hon. Angajan Ramanathan. You have four minutes. - [*Interruption.*] Order, please!

**ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා**
(மாண்புமிகு கெஹெலிய ரம்புக்வெல்ல)
(The Hon. Keheliya Rambukwella)
Sir, all I need is 20 seconds because -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
No, Hon. Member, we do not have time. Please understand, we do not have time. I cannot allow that. Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු මූලාසනය සඳහා ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු මනෝ ගනේසන් මහතා (ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனோ கணேசன் - தேசிய ஒருமைப்பாடு, அரசகரும மொழிகள், சமூக மேம்பாடு மற்றும் இந்து சமய அலுவல்கள் அமைச்சர்)
(The Hon. Mano Ganesan - Minister of National Integration, Official Languages, Social Progress and Hindu Religious Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු මයන්ත දිසානායක මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ගරු බිමල් රත්නායක මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු මයන්ත දිසානායක මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிமல் ரத்நாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. BIMAL RATHNAYAKE *left the Chair, and* THE HON. MAYANTHA DISSANAYAKE *took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Angajan Ramanathan, you may start your speech now.

**ගරු අංගජන් රාමනාදන් මහතා**
(மாண்புமிகு அங்கஜன் இராமநாதன்)
(The Hon. Angajan Ramanathan)
Thank you, Hon. Presiding Member, for giving me this opportunity to share my analysis and opinion on the Proposals of the Budget, 2019. - [*Interruption.*]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please!

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, I rise to a point of Order

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Minister, what is your point of Order?

ගරු සුජීව සේනසිංහ මහතා
(மாண்புமிகு சுஜீவ சேனசிங்க)
(The Hon. Sujeewa Senasinghe)
Sir, the Hon. Angajan Ramanathan is speaking. So, let him speak. After that, when they speak, I will disturb.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Please do not disturb. You may continue, Hon. Member. - [*Interruption.*] Order, please! Hon. Keheliya Rambukwella, Hon. Senasinghe, will you yield? - [*Interruption.*]

[3.43p.m.]

ගරු අංගජන් රාමනාදන් මහතා
(மாண்புமிகு அங்கஜன் இராமநாதன்)
(The Hon. Angajan Ramanathan)
Sir, the Budget has been themed “Enterprise Sri Lanka - Empowering the People and Nurturing the Poor”, a visionary theme. However, based on our historical experiences of unsatisfactory implementation of the past few Budgets of this Government, I would like to consider the new Proposals as more of a political mission than a vision-based plan.

These actions make us believe that the fiscal strategy of the Government remains unrealistic, boosted expenditure and trying to reach the ambitious fiscal deficit of 4.4 per cent of GDP given in Budget, 2019 is a challenging uphill task and an attempt to woo the voters. Also, I would like to remind that the Budget Deficit in 2018 was also targeted at 4.8 per cent, but finally reached 5.3 per cent.

Though I have multiple concerns on the Proposals, in the interest of time, I am planning to discuss only two areas of concern. One area of concern is, the tertiary sector which comprises of over 50 per cent of GDP, especially the tourism sector, which remains a significant contributor and has the potential to grow exponentially. With little support from the Government, the so-called “informal sector”, on its own, supported by the internet platforms has shown tremendous growth and is earning foreign income for the country.

Apart from incentifying specifically the import of go-karts, which benefits only a small segment of the industry, it is disappointing to note that the Government has not proposed anything meaningful or sustainable towards long-term development of the tourism industry. I believe that the Proposal to only allow online booking of lodging with more than five rooms, if the same are registered with the SLTDA is not only a mistake, but also an attempt to discourage the new entrants to the industry. Apart from discouraging them, what is the purpose of that Proposal? I am sure all the micro and small operators would want to know that. The added administrative work as a result of this Proposal may discourage the micro and small entrepreneurs and it will eventually place another tax burden on the resource-strapped micro, small and medium-sized homestay operators. Listening to the Hon. Minister’s Proposal, I understood that this Government is more interested in jumping into regulate the informal tourism industry which came into life, not because of the efforts of the Government, but because of the internet booking platforms and the citizens of this country with entrepreneurial spirit.

Sir, if regulation, at this point, is a must and if a Sri Lankan entrepreneur has the ability to receive a direct booking to a room in his house from a foreigner through the internet and then receive the payment in US Dollars, can we at least make life of that budding entrepreneur a little bit easier by letting him register his small business through the internet, encouraging his work instead of making him waste time doing administrative work?

Another area that concerns me is the "Gamperaliya" Programme. I wish to believe that "Gamperaliya" has significant potential to uplift the rural economy and livelihoods, but, unfortunately, in my opinion, the functional mechanism of this programme has been designed with an election-oriented political motivation. It simply lacks transparency in the processing of qualifying projects. There is no clear mechanism in place for the selection and vetting of suitable projects and it lacks accountability and transparency. If the objective of the programme is rural development, it must become apolitical and the funds should be directed towards projects based on the needs of the people, not of political authorities. In my opinion, the process can create divisions and disparity at village level, electoral level and will eventually reflect at the country level as well. Therefore, I would like to propose that the programme selection to be based on the needs of the electorates and the merits of the proposal to be in relation with the programme's vision.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up. The time is up.

ගරු අංගජන් රාමනාදන් මහතා
(மாண்புமிகு அங்கஜன் இராமநாதன்)
(The Hon. Angajan Ramanathan)
Please give me ten seconds more, Sir.

So, a programme which talks of nationwide rapid development should not be politicized for short-term gains.

In the interest of time, I am concluding my speech. Some of my concerns will, however, follow in the coming days at the Committee Stage Discussion on the Votes of Ministries. Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. A. Aravindh Kumar. You have 14 minutes.

[பி.ப. 3.48]

**ගරු අ. අරවින්ද් කුමාර් මහතා**
(மாண்புமிகு அ. அரவிந்த் குமார்)
(The Hon. A. Aravindh Kumar)

Thank you, Sir.

இன்று 2019ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட விவாதத்திலே கலந்துகொண்டு எங்களின் கருத்துக்களையும் முன்வைக்க வாய்ப்பு வழங்கியமைக்கு அவைத் தலைவர் அவர்களுக்கு நன்றி கூறிக்கொண்டு, ஒரு சில விடயங்களை இங்கே பகிர்ந்துகொள்ள விரும்புகின்றேன்.

முதலாவதாக, நிதி அமைச்சர் கௌரவ மங்கள சமரவீர அவர்களினால் முன்வைக்கப்பட்ட இந்த வரவு செலவுத் திட்டத்தை, இதுவரை ஐக்கிய தேசிய முன்னணி அரசாங்கத் தினால் முன்வைக்கப்பட்ட வரவு செலவுத் திட்டங்களோடு ஒப்பிடும்போது, இந்த நாட்டின் அனைத்துப் பிரதேசங்களை யும் அனைத்து மக்களையும் உள்ளடக்கியவாறு மிக நன்மை பயக்கும் விதத்தில் இந்த வரவு செலவுத் திட்டம் தயார் செய்யப்பட்டிருப்பதைக் காண முடிகின்றது. ஆகவே, இந்த வரவு செலவுத்திட்டத்தை நாங்கள் வெகுவாக வரவேற்பதோடு, இந்த வரவு செலவுத் திட்டத்தின் ஊடாகக் கிடைக்கக்கூடிய அனைத்து அனுகூலங்களையும், மக்களின் பிரதிநிதிகள் என்ற வகையில் நாங்கள் எங்களது பிரதேசங்களுக்குக் கொண்டு செல்வது எமது பொறுப்பு என்பதையும் நான் இந்த இடத்திலே பதிவு செய்ய விரும்புகின்றேன்.

வரவு செலவுத் திட்டத்தைப் பொறுத்த அளவிலே, ஆளும் தரப்பினாலே முன்வைக்கப்படும் எவ்வித முன்மொழிவையும் அது நன்மையாக இருந்தாலும் சரி, தீமையாக இருந்தாலும் சரி, எதிர்ப்பதுதான் எமது வழமை என்ற நிலைப்பாட்டில் எதிர்க்கட்சிகள் இருந்து செயற்படுவதை நாங்கள் பொதுவாகவே பார்க்கக்கூடியதாக இருக்கின்றது. நேற்று இந்தச் சபையிலே ஓர் எதிர்க்கட்சி உறுப்பினர் பேசும்போது இந்த வரவுசெலவுத்திட்டத்திலே மிக அழகான வசனங்கள் உள்ளடக்கப்பட்டிருப்பதாகவும் இலக்கங்களின் எண்ணிக்கை, அதாவது தொகை, அதிகரிக்கப்பட்டிருப்பதாகவும் கூறினார். நல்லதொரு வரவு செலவுத் திட்டம் முன்வைக்கப்படும்போது அழகான வார்த்தைப் பிரயோகங்கள் உள்ளடக்கப்படுவதும் எண்ணிக்கையிலே அதிகரிப்பு ஏற்படுவதும் இயல்பானது. அதுதான் மக்களுக்குப் பயனுள்ள வரவு செலவுத் திட்டமாக இருக்க முடியும். ஆகவே, அதைக்கூட விமர்சனம் செய்வதில் ஒரு தனி சுகத்தை எதிர்த் தரப்பினர் அனுபவிப்பதைக் காணக்கூடியதாக இருக்கின்றது. எது எப்படியிருந்தாலும் அது எமக்குப் பொருத்தமானதல்ல.

இந்த நாட்டிலே 15 இலட்சம் இந்திய வம்சாவளி மக்கள் வாழ்ந்துகொண்டிருக்கின்றார்கள். இந்த 15 இலட்சம் மக்களின் மத்தியிலே 10 வீதமானோர், அதாவது 1 ½ இலட்சம் பேர் மாத்திரமே இப்பொழுது தோட்டங்களிலே தொழிலாளர்களாக வாழ்ந்துவருகிறார்கள்; தொழில் செய்கின்றார்கள் என்று சொல்லப்படுகின்றது. அப்படியென்றால் தோட்டங்களிலே தொழில் செய்பவர்கள் வெறுமனே 10 வீதம் மாத்திரம்தான். இதற்குப் புறம்பாக அதாவது 90 வீதமான எமது மக்கள் தோட்டப்புறங்களுக்கு வெளியே வாழும் மக்கள் கூட்டமாக இருக்கிறார்கள். இவ்வாறு தோட்டங்களுக்கு வெளியே வாழும் எமது மக்கள் கூட்டத்தை பல்வேறு பிரச்சினைகளுக்கு முகம்கொடுக்கும் மக்கள் கூட்டமாக அடையாளப்படுத்த முடியும். ஏனெனில், தொழில்வாய்ப்பு, தேசிய நீரோட்டத்தில் இணைந்து செயற்படும் வாய்ப்பு அதேபோல் கல்விக்கான சரியான அடித்தளம் இல்லாமை, ஏனைய மக்கள் அனுபவித்து வருகின்ற உரிமைகளை தாமும் அனுபவிப்பதிலே இருக்கும் தடைகள் என்று எமது மக்கள் கூட்டம் பல்வேறு பிரச்சினைகளுக்கு முகம்கொடுக்கும் மக்கள் கூட்டமாக இருக்கிறார்கள். ஆகவே, இவர்களின் நலன்களைக் கவனிப்பதிலும் பேணிப் பாதுகாப்பதிலும் அந்த மக்களின் பிரதிநிதிகள் என்ற வகையிலே எங்களுக்குப் பாரிய பொறுப்பிருக்கின்றது. அந்தப் பொறுப்பிலிருந்து நாங்கள் இம்மியும் விடுபட முடியாது. ஆனால், கடந்த காலங்களைப் பொறுத்தளவிலே, சம்பந்தப்பட்டவர்கள் அவ்வாறு மக்கள்மீது கரிசனை கொண்டு செயற்பட்டார்களா என்ற கேள்வியை எழுப்பினால் அதற்கும்கூட விடை பூஜ்ஜியமாகவே இருக்கின்றது. ஆனால், எம்மைப் பொறுத்தவரை நாம் அவ்வாறல்ல. இந்த ஐக்கிய தேசிய முன்னணி ஆட்சிக்கு மலையக மக்கள் ஒட்டுமொத்தமாக வாக்களித்தார்கள். அனைத்து மலையக மக்களின் வாக்குகளும் ஐக்கிய தேசிய முன்னணியை ஆட்சிக் கட்டிலிலே அமர வைப்பதற்குத் துணைநின்றது. ஆகவே, இந்த அரசாங்கத்தின் ஊடான எமது மக்களின் எதிர்பார்ப்பு அதிகமாக இருக்கின்றது; அதிலே எவ்வித தவறும் இல்லை. அதேநேரம் கடந்த 3½ வருட காலகட்டத்திலே இந்த அரசாங்கத்தினூடாக மலையக மக்கள் பல்வேறு அனுகூலங்களைப் பெற்றிருக்கிறார்கள் என்பதை யும் நான் இந்த இடத்திலே மிக மகிழ்ச்சியோடு பதிவுசெய்ய விரும்புகின்றேன்.

இந்த அரசாங்கத்தினால் முதன்முதலாக மலையகத்திற்கு என மலைநாட்டு புதிய கிராமங்கள், உட்கட்டமைப்பு வசதிகள் மற்றும் சமுதாய அபிவிருத்தி அமைச்சு உருவாக்கப்பட்டது. அதற்குப் பிறகு படிப்படியாக பல்வேறு நல்ல நிகழ்வுகள் இடம்பெற்றன. உதாரணமாக, நுவரெலியா மாவட்டத்திலே 4 புதிய பிரதேச சபைகள் உருவாக்கப்பட்டன. இந்த நாட்டிலே வேறெந்தப் பிரதேசத்திலும் இவ்வாறு 4 புதிய பிரதேச சபைகள் ஏற்படுத்தப்படவில்லை. அது எமது மக்களுக்காக ஏற்படுத்தப்பட்டது. இது உண்மையிலே வரவேற்கப்படக் கூடிய ஒரு விடயமாகும். இதற்கு அடுத்தபடியாக இப்பொழுது புதிதாக உருவாக்கப்பட்ட மலையகத்திற்கான அபிவிருத்தி அதிகாரசபை இந்த வருடத்திலே முழுமையாக இயங்கும் நிலைமை ஏற்பட்டிருக்கின்றது. இவை அனைத்தையும் எமது மக்களுக்கு நன்மைகளைக் கொண்டுவரும் விடயங்களாகவே நாங்கள் பார்க்கின்றோம்.

அதேநேரத்தில் இப்பொழுது மலையகம் சார்பான ஓர் அமைச்சு புதிதாக உருவாக்கப்பட்டு எனது தலைவர் கௌரவ இராதாகிருஷ்ணன் அவர்களுக்கு வழங்கப்பட்டிருக்கின்றது. அது விசேட பிரதேசங்கள் அபிவிருத்தி அமைச்சு ஆகும். இந்த அமைச்சின் செயற்பாடுகளும் மலையகத்தைச் சார்ந்ததாகவே இருக்கப்போகின்றது. அதாவது, முற்றிலும் மலையகத்திற்கு அபிவிருத்திகளை மேற்கொள்ளும் ஓர் அமைச்சாக இந்த அமைச்சு இயங்கப் போகின்றது. அந்த வகையில், மலைநாட்டு புதிய கிராமம் என்ற ஓர் அமைச்சு, இதற்குப் புறம்பாக விசேட அபிவிருத்திக்கான இன்னுமோர் அமைச்சு, மலையக அபிவிருத்தி அதிகாரசபை மற்றும் புதிய பிரதேச சபைகள் என்று ஒவ்வொன்றாக ஒன்றுசேர்ந்து, அவை மையப்படுத்தப் படும்போது, அதனூடாகப் பல்வேறு அனுகூலங்கள் மலைய கத்தைப்போய் சேரும் என்பதிலே எவ்வித சந்தேகமும் இல்லை. இந்த இலக்கை நோக்கித்தான் நாங்கள் போய்க் கொண்டிருக்கின்றோம்.

[ගරු අ. අරවින්ද් කුමාර් මහතා]

அதேநேரத்தில், மிகவும் மோசமான வறுமை நிலையிலுள்ள மக்கள் கூட்டமாக மலையக மக்கள் இருக்கிறார்கள். இந்த நாட்டிலே வறுமைக் கோட்டுக்குகீழே உள்ளவர்களில் மிக அதிகமானவர்கள் யார் என்று கேட்டால் எடுத்த எடுப்பிலேயே அது மலையக மக்கள் என்று நாங்கள் சொல்ல முடியும். இதிலே மாற்றுக் கருத்துக்கு இடம் கிடையாது. எவரும் இதை மறுதலித்துப் பேசவும் முடியாது. அதாவது, "நிலைமை அவ்வாறானதல்ல! பொய்யான விடயங்கள் முன்வைக்கப்படு கின்றன" என்று எவருமே இதனை மறுதலித்துப் பேச முடியாது. உண்மையிலேயே, இந்த நாட்டிலே மிக மோசமான வறுமையைச் சந்திக்கும் மக்களாக தோட்டப்புற மலையகத்து வாழ் மக்கள் மாத்திரமே காணப்படுகின்றார்கள். ஆகவே, இம்முறை கௌரவ நிதி அமைச்சர் அவர்கள் 600,000 பேருக்குப் புதிதாக சமுர்த்தி நிவாரணம் வழங்குவதற்கு மேற்கொண்டிருக் கின்ற நிதி ஒதுக்கீட்டின் 10% ஆவது, அதாவது, 60,000 தோட்டப்புற மக்களுக்காவது இந்த நன்மை போய்ச்சேர வேண்டும் என்று நான் இந்த இடத்திலே கேட்டுக்கொள்ள விரும்புகின்றேன். இன்னும் 600,000 மக்களுக்கு சமுர்த்தி நிவாரணம் வழங்குகையில் தோட்டப்புறங்களைச் சார்ந்தவர் களும் உள்வாங்கப்படுவது ஒரு நன்மை தரும் விடயமாக இருப்பது மாத்திரமன்றி, வறுமைக் கோட்டிற்குகீழ் இருக்கும் மக்களை உண்மையிலேயே அடையாளங்கண்டு, அவர்களுக்கு இந்த நிவாரணம் வழங்கப்பட்டதாக வரலாற்றிலும் பதிவு செய்யப்படுமென நான் இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன். இவ்வாறு இந்த வரவு செலவுத்திட்டத்தின் ஊடாகக் கிடைத்திருக்கும் ஏனைய அனைத்து நன்மைகளும் தோட்டப்புறங்களுக்கும் கொண்டுசெல்லப்பட வேண்டும்.

இதில் பல்வேறு அமைச்சுக்களுக்குப் பல்வேறு நடவடிக்கைகளுக்காகப் பெருந்தொகையான நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. இவ்வாறு நிதி ஒதுக்கீடு செய்யப்படும்போது, அந்த அமைச்சுக்களின் செயற்பாடு களிலே இந்தப் பிராந்தியத்திற்கு இவ்வளவு, இந்த மக்களுக்கு இவ்வளவு, இந்த மாகாணத்திற்கு இவ்வளவு என்றெல்லாம் புறம்பாக நிதி ஒதுக்கீடு செய்யப்படுவதில்லை. அமைச்சுக்கான நிதி ஒட்டுமொத்தமாக ஒதுக்கீடு செய்யப்படுகின்றது. ஆகவே, மக்களின் பிரதிநிதிகள் என்ற வகையிலே அந்தப் பணத்தை - அந்த நிதியினை எவ்வாறு ஒவ்வொரு அமைச்சிலுமிருந்து பெற்றுக்கொண்டு, எமது மக்களின் அபிவிருத்திக்காகக் கொண்டுசெல்ல முடியும் என்பதை நாங்கள் தெரிந்துகொள்ள வேண்டும்; புரிந்து கொள்ள வேண்டும். "மயிலே மயிலே இறகு போடு" என்று சொன்னால் எந்தவொரு மயிலும் இறகு போடாது. மயிலின் இறகு தேவையென்றால் அதை நாங்கள் பிடுங்கித்தான் எடுக்க வேண்டும். குறித்த ஒவ்வோர் இடத்திலுமிருந்தும் நிதியைப் பெற்று எமது மக்களின் அபிவிருத்திக்காகக் கொண்டு செல்ல வேண்டுமென்றால், அதனைக் கறக்கும் யுக்தியை நாங்கள் கையாள வேண்டும்; கறக்கும் பாணியைக் கையாள வேண்டும். அவ்வாறு செய்தால், உண்மையிலே எமது மக்களின் பிரச்சினைகளை நாங்கள் வெகுவாகத் தீர்ப்பதற்கு ஏதுவாக இருக்கும். அதனையே நான் செய்துகொண்டிருக்கின்றேன். எங்கெங்கிருந்தெல்லாம் நிதிகளைப் பெற முடியுமோ, எங்கெங்கிருந்தெல்லாம் நிதிகளைக் கறக்க முடியுமோ அவற்றைக் கறக்கும் செயற்பாட்டிலே நான் இம்மியும் பின்னிற்காமல் செயற்பட்டுக் கொண்டிருக்கின்றேன். இவ்வாறு செயற்படுவதனூடாக மக்களின் பிரச்சினைகளை ஏதோ ஒரு மட்டத்திற்குத் தீர்க்க முடியும் என்ற நம்பிக்கை - விசுவாசம் இருக்கின்றது.

இந்த வரவு செலவுத்திட்டம் பல்வேறு தரப்பினருக்கும் நன்மை பயக்கும் வரவு செலவுத் திட்டமாக இருக்கின்றது. அதேநேரம் தோட்டத் தொழிலாளர்களின் சம்பளம் தொடர்பாக இந்த வரவு செலவுத் திட்டத்தில் பிரஸ்தாபிக்கப் படவில்லை என்று ஒரு சிலர் சொல்கின்றார்கள். உண்மையிலே அது இங்கு பிரஸ்தாபிக்கப்படவில்லை. ஆனால், அரச நிதியில் ஏதோ ஒரு வகையிலே தோட்டத் தொழிலாளர்களுக்கு ஒரு நாளைக்கு 50 ரூபாய் என்ற அடிப்படையில் வழங்குவதற்கான நடவடிக்கை இப்பொழுது மேற்கொள்ளப்பட்டிருக்கின்றது. ஆகவே, பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சர் கௌரவ நவின் திஸாநாயக்க அவர்களும் அதேபோல் தொழிற்றுறைக்குப் பொறுப்பான அமைச்சர் கௌரவ ரவீந்திர சமரவீர அவர்களும் எம்மோடு கலந்து பேசியதன் ஊடாக - தமிழ் முற்போக்குக் கூட்டணிப் பாராளுமன்ற உறுப்பினர்களோடு தொடர்ந்து மேற்கொண்ட பேச்சுவார்த்தைகள் ஊடாக அந்த இலக்கை நாங்கள் இப்போது அடைந்திருக்கின்றோம். ஏதோ ஒரு வகையில் தோட்டத் தொழிலாளர்களுக்கு நன்மைபயக்கும் வண்ணம் ஒரு நாளைக்கு 50 ரூபாய் என்ற வகையிலே தோட்டத் தொழிலாளர்களுக்குக் கொடுப்பனவு வழங்குவதற்கான ஏற்பாடுகள் இப்பொழுது மேற்கொள்ளப்பட்டிருக்கின்றன. ஆகவே, அதையும்கூட இன்னுமொரு நல்ல அம்சமாக நான் பார்க்கின்றேன். எமது மக்களின் உழைப்பை விஞ்சுவதற்கு இந்த நாட்டிலே எவருமே கிடையாது. அவர்கள் மிகக் கடினமான உழைப்பாளிகள்; மிக அதிகமாக உழைக்கும் பாணியைக் கையாள்பவர்கள். இந்த நாட்டிலே காலை முதல் இரவு வரை தொழில் செய்யும் தொழிலாளர்கள் என்றால், அது தோட்டத் தொழிலாளர்கள் மாத்திரமே. அவர்களது அந்த உழைப்பைக் கொச்சைப்படுத்தி ஏளனமாகப் பார்க்க முடியாது. ஆகவே, இந்த அரசாங்கத்திற்கு வாக்களித்த மக்களுக்கு அந்த அரசாங்கத்தின் நிதியிலேயிருந்து ஒரு நாளைக்கு 50 ரூபாய் என்ற வகையிலே சம்பள உயர்வொன்று கிடைப்பதென்பது உண்மையிலே அவர்கள் அளித்த வாக்குகளுக்குக் கிடைத்த பயன் என்பதை நான் இந்த இடத்திலே பதிவுசெய்ய விரும்புகின்றேன்.

இந்த வரவு செலவுத் திட்டத்தினூடாக முழு நாடும் சுபிட்சமடையும்வண்ணம் திட்டங்கள் தயாரிக்கப்பட்டு முன்வைக்கப்பட்டிருக்கின்றன. இந்தத் திட்டங்கள் ஊடாகவும் நிதியொதுக்கீட்டின் ஊடாகவும் இந்த நாட்டை வளப்படுத்துவதற்கு, இந்த நாட்டின் முன்னேற்றத்திற்கு, இந்த நாட்டின் நல்ல எதிர்காலத்திற்காக நாங்களனைவரும் இன, மத, மொழி பேதங்களை மறந்து சமத்துவத்தோடு கைகோர்த்துச் செயற்பட வேண்டுமென்று கேட்டுக்கொண்டு, சந்தர்ப்பமளித்த கௌரவ அவைத் தலைவர் அவர்களுக்கு மீண்டும் நன்றி கூறி, விடைபெறுகின்றேன். வணக்கம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Thank you. The next speaker is Hon. Prasanna Ranaweera. You have four minutes.

[අ.භා.4.01]

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුවේ පස්වැනි අය වැය වාගේම වර්තමාන මුදල් අමාත්‍යවරයාගේ දෙවැනි අය වැය ඉදිරිපත් කොට, ඒ පිළිබඳ දෙවෙනිවර කියැවීම පිළිබඳ විවාදය පවත්වන මොහොතේ මම කියන්නට ඕනෑ, පසුගිය වසර හතරේදී වාගේම මෙවර අය වැයත් සුන්දර වචන ටිකක් දාලා ඉදිරිපත් කර තිබෙන කථාවක් බව. මේ ගොල්ලෝ ආණ්ඩු බලයට පත්වන

වෙලාවේ දින 100න් අලුත් රටක් හදනවා කියලා තමයි ආවේ. හැබැයි, දින 100න් රටට මොකුත් නැති වුණත්, මතක් වෙන්න එක දෙයක් කළා. එදා මහ දවාලේ මේ රටේ මහ බැංකුව මං කොල්ල කෑවා. ඊට පස්සේ මේ වාගේම ඇවිල්ලා "මාස 60කින් අලුත් රටක් හදන පංච විධ ක්‍රියාවලිය" ඉදිරිපත් කළා. ඊට පස්සේ 2014 දෙසැම්බර් 19වැනි දා දින 100 වැඩ පිළිවෙළ ඉදිරිපත් කළා. 2015 ජූලි 23වැනිදා "මාස 60කින් අලුත් රටක් හදන පංච විධ ක්‍රියාවලිය" ඉදිරිපත් කරලා, 2015 නොවැම්බර් 5වැනිදා රට හදන ආර්ථික වැඩ පිළිවෙළ ඉදිරිපත් කළා. 2016 ජනවාරි 29වැනිදා "මෙගාපොලිස් සංවර්ධන වැඩ සටහන" ඉදිරිපත් කළා. 2017 දී රජයේ ආර්ථික සැලැසුම් ප්‍රකාශය ඉදිරිපත් කළා. ඊට පස්සේ 2017 දී "තිරසාර යුගයක් සඳහා නව ආර්ථික සැලැස්ම" ඉදිරිපත් කළා. ඊළඟට 2018 අගෝස්තු මාසයේදී "තුන් අවුරුදු සංවර්ධන ආර්ථික සැලැස්ම" ඉදිරිපත් කළා. 2018 සැප්තැම්බර් 4වැනිදා "2025 දී පොහොසත් රටක්" කියන හත් අවුරුදු සැලැස්ම ඉදිරිපත් කළා. ඒවායේ බොහොම සුන්දර වචන ටිකක් තිබුණා. දසලක්ෂයක් රැකියා, ආර්ථික සංවර්ධන අධිකලාප 45ක්, කර්මාන්ත හා තාක්ෂණ සංවර්ධන අධිකලාප 11ක්, සංචාරක සංවර්ධන අධිකලාප, කෘෂි සංවර්ධන අධිකලාප, ධීවර ආර්ථික අධිකලාප, ගමට රටක්, පොකුරු ගම්මාන 2,500ක්, මේ ආදී විධියට තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වැඩ පිළිවෙළවල් ගෙනාවේ. දැනුත් ඒ වාගේම වැඩ පිළිවෙළක් ගෙනැල්ලා තිබෙන්නේ. ඒක අලුත්ම concept එකක්. පුංචි කාර් සිහින ලබා දීලා එදා තරුණ තරුණියන්ව රැවැට්ටුවා වගේ, අද තරුණ යුවළ සඳහා "Home Sweet Home" කියලා ණය ලබා දීමේ වැඩ පිළිවෙළක් ගෙනැල්ලා තිබෙනවා.

එදා අය වැය කථාවේදී කිව්වේ කොහොමද? එම ණය මුදල දෙන්නේ, සියයට 6 පොලියට අවුරුදු 25කින් ගෙවන්න කියලා කිව්වා. හැබැයි, ආණ්ඩුව පොලිය ගෙවන්නේ අවුරුදු 5ක් කියලා තමයි අය වැය ඇතුළේ තිබෙන්නේ. ණය මුදල ලබා ගන්නා ණයකාරයා අවුරුදු 20ක්ම පොලිය ගෙවන්න ඕනෑ. හැමදාම රැවැට්ටුවා වගේ තමයි මෙවරත් රවට්ටලා තිබෙන්නේ.

ඊළඟට කියනවා, පුහුණු ශ්‍රමිකයන් නැති නිසා තරුණ තරුණියන්ව පුහුණු කරන්න ඕනෑ කියලා. ඒ සඳහා අය වැයෙන් වෙන් කරලා තිබෙන්නේ කීයද? රුපියල් මිලියන 100යි. බල්ලෝ වඳ කරන්නත් රුපියල් මිලියන 100ක් වෙන් කරලා තිබෙනවා. කොල්ලන්ව බල්ලෝ ගානට දාලාද, බල්ලන්ව කෝල්ලෝ ගානට දාලාද කියන එකයි මෙතැන තිබෙන ප්‍රශ්නය. මේ ආණ්ඩුව අද බල්ලෝ, කොල්ලෝ එක ගානට දාලා තිබෙනවා. හැබැයි, කොල්ලන්ට කැමැති ආණ්ඩුව මේ විධියට කොල්ලන්ට සලකන්නේ ඇයි කියන එක මට ප්‍රශ්නයක්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් කළ කාලය දැන් අවසන්.

**ගරු ප්‍රසන්න රණවීර මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணவீர)
(The Hon. Prasanna Ranaweera)
එම නිසා අපි කියනවා, මේ ලියවිල්ලත්, කලින් ඉදිරිපත් කළ ලියවිලි හා ප්‍රකාශ වගේ බොරු ලියවිල්ලක් විතරයි කියලා. කිසිම ආර්ථික සැලැස්මක්, තරුණ තරුණියන්ට රැකී රක්ෂා දීමේ වැඩ පිළිවෙළක්, ඒ කිසිදු දෙයක් නැහැයි කියන එක බොහොම පැහැදිලිව ප්‍රකාශ කරන්න ඕනෑ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු අජිත් පී. පෙරේරා අමාත්‍යතුමා.

[අ.භා. 4.04]

**ගරු අජිත් පී. පෙරේරා මහතා (ඩිජිටල් යටිතල පහසුකම් හා තොරතුරු තාක්ෂණ කැබිනට් නොවන අමාත්‍යතුමා)**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா - டிஜிட்டல் உட்கட்டமைப்பு வசதிகள் மற்றும் தகவல் தொழில்நுட்ப அமைச்சரவை அந்தஸ்தற்ற அமைச்சர்)
(The Hon. Ajith P. Perera - Non Cabinet Minister of Digital Infrastructure and Information Technology)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය දෙවැනි වර කියැවීමේ විවාදයේදී මටත් කථා කරන්න ලැබීම සතුටක්. මම පළමුවෙන්ම මේ අය වැයේ ඇති මා පෞද්ගලිකව එකඟ නොවන එක් කරුණක් ගැන කියන්නට අවශ්‍යයි. ඒ තමයි කාබන් බද්ද පිළිබඳ කාරණය. මම ඒ පිළිබඳව අය වැයෙන් පසු කළ සාකච්ඡා අනුවත්, ඉන් පසුව නිලධාරීන් සමඟ කළ සාකච්ඡා අනුවත් පෙනී යනවා, යම් ආකාරයක ධනාත්මක ප්‍රතිඵල සහිත පිළිතුරක් ලැබෙයි කියලා. ජනතාවගේ හඬ ඉදිරිපත් කරන අප වැනි ඇමතිවරුන් කෙරෙහි සංවේදී වීම පිළිබඳව මම ස්තුතිවන්ත වෙනවා.

ඒ, අපේ ආණ්ඩුවේ ස්වභාවය. ඒ, අපේ ආණ්ඩුවේ විලාසය. ඒ වාගේම යම් විකල්ප මත ප්‍රකාශ කරන්නට අපට අවකාශ තිබෙනවා. ඒ විකල්ප මතයට ගරු කිරීම මේ රජය තුළ ලැබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයේ තිබෙන ඉතාම වැදගත් යෝජනා කිහිපයක් පිළිබඳව විපක්ෂයේ මන්ත්‍රීවරු සැහැල්ලුවෙන් කථා කරනවා. මේ රටට අවශ්‍ය විදේශ විනිමය අරගෙන එන, මේ රටේ ආර්ථිකය ශක්තිමත්ව පවත්වාගෙන යන්නට අපට දායක වන ඒ සුවිශේෂ විදේශගත ශ්‍රමිකයන් පිළිබඳව අපේ රජය විශාල සැලකිල්ලක් දක්වනවා. අපේ රටේ ආර්ථිකය ගොඩ නඟන මේ රටේ අනාගතය කෙරෙහි විශාල දායකත්වයක් දක්වන මේ විදේශගත ශ්‍රමිකයන් කෙරෙහි කිසිම රජයක් මීට කලින් ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වා තිබුණේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සිහින මාලිගා නිවාස ණය යෝජනා ක්‍රමය යටතේ විදේශගත ශ්‍රමිකයන්ට 3.46ක වාර්ෂික පොලී අනුපාතයකට - මාසයකට නොවෙයි, වාර්ෂිකව.- රුපියල් ලක්ෂ 100ක් දක්වා නිවාස ණය ලබා ගැනීමට අවකාශ ලැබෙනවා. එය, තමන්ගේ දූ දරුවන්, අදාරණීය බිරිඳ, ස්වාමි පුරුෂයා, නෑදෑ හිත මිතුරන් නැතිව අපේ රටෙන් ඈත රටක සිට තම ආර්ථිකය ගොඩ නැඟීමට ලේ දහඩිය හෙලමින් ඒ දුක් විඳින මිනිසුන් වෙනුවෙන් මේ රජය ලබා දෙන්නේ වටිනාම සහනයක්. "පවුලේ සම්පයන් අතහැර ඇයි ඔබ විදේශගත වෙන්නේ?" කියා අපි ඇහුවොත්, බොහෝ දෙනෙක් කියන්නේ ගෙයක් හදා ගන්න මුදලක් හොයාගන්න විදේශ ගත වන බවයි. එම නිසා පළමුවැනි වතාවට, මධ්‍යම පාන්තික නිවසක් සාදා ගැනීමට ප්‍රමාණවත් වන මුදලක් - 3.46ක වාර්ෂික පොලියකට ලක්ෂ සියයක ණය මුදලක්, - ලබා දීමට එතුමා දැක් වූ සංවේදීභාවය පිළිබඳව මම ගරු මංගල සමරවීර ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා.

ඒ වාගේම අපේ විශේෂ අවධානයට ලක් වී තිබෙන තවත් නිවාස ණය යෝජනා ක්‍රමයක් තමයි "Home Sweet Home" නිවාස ණය යෝජනා ක්‍රමය. මේ ණය යෝජනා ක්‍රමය යටතේ අලුත විවාහ වූ මධ්‍යම පාන්තික තරුණ තරුණියන්ට සහන ණය මුදලක් ලබා ගැනීමට අවස්ථාව ලැබෙනවා. මේ ණය මුදලේ වාරික ගෙවීම මුල් කාලයේ තමයි අමාරු වෙන්නේ. නිවස හදනකොට ඒක අමාරුයි. අනෙක, ජීවිතයේ මුල් කාලයේ අමාරුයි. ඒ නිසා මේ සහනය ලබා දීමේදී මුල් වසර ගණනාව සඳහා විශේෂිත සහනයක් ලබා දී තිබෙනවා. ඒ නිසා තමයි මේ ණය විශේෂිත වන්නේ.

[ගරු අජිත් පී. පෙරේරා මහතා]

මූලාසනාරූඪ ගරු සභාපතිතුමනි, මෙම අය වැය තුළ කාරණා කිහිපයක් ගැන විශේෂ අවධානය යොමු වුණා. මහින්ද යාපා අබේවර්ධන හිටපු ඇමතිතුමා අරුවක්කාලු කසළ රඳවනය පිළිබඳ බොහොම හාස්‍යයෙන් සඳහන් කළා. මම එතුමාට අභියෝග කරනවා; යෝජනා කරනවා, අරුවක්කාලුවලට ගිහින් බලන්න කියලා. මේ කසළ රඳවනයේ කටයුතු දැන් සම්පූර්ණයෙන්ම වාගේ අවසන්. කොළඹ කුණු කොලොන්නාවේ ගොඩ ගහලා, කොලොන්නාවේ මිනිසුන්ට, විනාශය, දුක, මරණය අත් කර දෙන ගෝඨා ක්‍රමවේදය වෙනුවට, මේ රටේ කුණු ප්‍රශ්නය සදාකාලිකව විසඳන්නා වූ පරිසර හිතකාමී විසඳුමක් අරුවක්කාලු කසළ රඳවනය මඟින් මේ වසර අවසන් වන විට අපි අත් කර දෙනවා. ඒ ප්‍රදේශවල ජනතාවගේ කුණුත්, කොළඹ කුණුත් නිසි ක්‍රමවේදයට ආරක්ෂිතව රැඳවීමට මෙය සමත් වෙනවා. අපි ස්ථිරසාර විසඳුමක් ඉදිරිපත් කර තිබෙනවා. සැක කරනවා නම් බලන්න යන්න එන්න කියා මම අභියෝග කරනවා.

ඊට අමතරව විදුලිබල අමාත්‍යවරයා හැටියට විදුලිබල අමාත්‍යාංශයේ තනතුරු දරපු කාලයේ ලෝකයම පිළිගත් ක්‍රමවේදයක් වන කසළවලින් විදුලිය නිෂ්පාදනය කිරීම - waste-to -energy - පිළිබඳ අපි කල්පනා කළා. අපි මේ සඳහා කෙරවලපිටියේ මෙගාවොට් 10ක කසළවලින් විදුලිය නිෂ්පාදනය කිරීමේ බලාගාරයක් හදලා තිබෙනවා. මේ වසර අවසානය වන විට එහි කටයුතු ආරම්භ කරන්න පුළුවන්. ඒ වාගේම පිළියන්දල කරදියානේ කසළවලින් විදුලිය නිෂ්පාදය කිරීමේ බලාගාරයක් හදලා තිබෙනවා. මේ බලාගාර දෙකේ විදුලිය නිෂ්පාදනය කිරීම සඳහා දිනකට කසළ ටොන් 1,200ක වාගේ ප්‍රමාණයක් අවශ්‍ය වෙනවා. බස්නාහිර පළාතේ සම්පූර්ණයෙන් එකතු වන කසළ ප්‍රමාණය අරුවක්කාලු අරගෙන යන්න වෙන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒවා මෙම බලාගාර දෙක සඳහා අවශ්‍ය වෙනවා.

අපි තුන්වැනි බලාගාරයක් පිළිබඳ යෝජනා කළා. නමුත් බොහෝ විශ්ලේෂකයන් කියන්නේ කසළ මඟින් විදුලිය නිෂ්පාදනය කරන තුන්වැනි බලාගාරයක් අවශ්‍ය වෙන එකක් නැහැ; මොකද, දැනට බස්නාහිර පළාතේ තිබෙන කසළ සඳහා මේ බලාගාර දෙක ප්‍රමාණවත් කියලා. එහෙම වුණොත් අපට අරුවක්කාලුවලට අරගෙන යන්න වෙන්නේ අළු ටික පමණයි. ඒ නිසා මෙම වසර අවසානය වන විට බස්නාහිර පළාතෙත්, මුළු රටේමත් කසළ බැහැර කිරීම පිළිබඳ ලෝකයම පිළිගත්, විද්‍යානුකූල දියුණු වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර අවසන් කිරීමට අපි කටයුතු කරනවාය කියන කාරණය මම කියන්න කැමැතියි.

මේ වන විට ඉදිවෙමින් පවතින ඒ බලාගාර නිරීක්ෂණය කිරීමට පැමිණෙන ලෙස මහින්ද යාපා අබේවර්ධන මැතිතුමාට මම ආරාධනා කරනවා. හැම දේම "වුණේ නැහැ, වුණේ නැහැ" කියලා කියන්න එපා. ඒ වාගේම පුනර්ජනනීය බලශක්තිය පිළිබඳ එතුමා අභියෝග කළා. ඔබගේ රජය කාලයේ සූර්ය බලයෙන් නිෂ්පාදනය කළේ මෙගාවොට් 32ක විදුලිය ප්‍රමාණයක් පමණයි. අපේ රජය කාලය තුළ 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය යටතේ අද වන විට මෙගාවොට් 200කට වැඩි විදුලි ප්‍රමාණයක් වහලය මත සවි කරන සූර්ය බලය නිෂ්පාදනය කිරීමේ බලාගාර හරහා අපි ජාතික පද්ධතියට ලබා දෙනවා. ඒ වාගේම වාණිජමය වශයෙන් මෙගාවොට් 50ක බලාගාර අපි ඉදි කරලා තිබෙනවා.

ඒ වාගේම, මෙගාවොට් එක බැගින් වූ බලාගාර 60ක්, මෙගාවොට් එක බැගින් වූ බලාගාර 90ක් වශයෙන් තවත් බලාගාර සඳහා අපි නියමිත තරගකාරී ටෙන්ඩර් ක්‍රමවේදය හඳුන්වා දීලා, සුපිරිසිදු වැඩ පිළිවෙළක් සකස් කරලා තිබෙනවා. ඒ වාගේම, තවත් මෙගාවොට් 10 බැගින් වූ සූර්ය බලාගාර දෙකක් අපි ටෙන්ඩර් කළා. මෙගාවොට් 20ක් සඳහා වූ තවත් සුළං බලාගාර ටෙන්ඩර් කරලා, දූෂිත බලපත්‍ර ක්‍රමවේදය වෙනුවට තරගකාරී මිලට ඒ අවස්ථා ලබා දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ අනුව පුනර්ජනනීය බලශක්තිය තහවුරු කිරීම සඳහා අපි නිශ්චිත වැඩ පිළිවෙළක් ගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ නිසා, "මේවා වුණේ නැහැ; වුණේ නැහැ" කියලා කියන ඒ සටන්පාඨ වෙනුවට, කරුණාකරලා ඇස් දෙක ඇරලා බලන්න. මේ ක්‍රමය පවත්වාගෙන යාම සඳහා නිසි ක්‍රමවේදයක්, යහ පාලන ක්‍රමවේදයක් අපි හඳුන්වා දීලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මේ අය වැයේ තිබෙන සුවිශේෂී ලක්ෂණයක් තමයි, මේ රටේ ආර්ථිකය ඩිජිටල්කරණය කිරීම සඳහා විවිධ යෝජනා ගණනාවක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙනුත් විශාල මුදල් ප්‍රමාණයක් අපට වෙන් කරලා තිබීම. මේ රටේ පවතින ආර්ථිකය නවීකරණයට ලක් කරලා, ඩිජිටල්කරණයට ලක් කරලා, වැඩිමනත් ආදායමක් උපයා ගැනීමට අවශ්‍ය උපාය මාර්ග හඳුනා ගැනීම සඳහා මේ පිළිබඳව මලයාසියානු රජයටත් උදව් කරපු McKinsey & Company හරහා අපි විශේෂඥ වාර්තාවක් ලබා ගත්තා. දැන් සති දෙකකට කලින් අමාත්‍ය මණ්ඩලය ඒ McKinsey වාර්තාවේ තිබෙන යෝජනා ක්‍රියාත්මක කිරීම සඳහා වූ ප්‍රතිපත්තිමය අනුමැතිය ලබලා දුන්නා. දැන් තිබෙන්නේ ඉදිරිපත් කිරීම; ඒවා ක්‍රියාත්මක කිරීම.

අපේ රටේ පවතින කර්මාන්ත සඳහා ඩිජිටල්කරණය හරහා අපට අලුත් මුහුණුවරක් ලබා දෙන්න පුළුවන්; ඔවුන්ගේ ලාභය වැඩි කරලා දෙන්න පුළුවන්; කාර්යක්ෂමතාව ළඟා කරලා දෙන්න පුළුවන්. ඒ වාගේම, ශ්‍රී ලාංකික නිෂ්පාදන සඳහා අලුත් මුහුණුවරක් අපට ලබා දෙන්න පුළුවන්කම ලැබෙනවා. ඒ නිසා අපි ඉතාම සතුටු වෙනවා, මේ McKinsey වාර්තාව මත පදනම් වෙලා මේ රටේ පවතින ආර්ථිකය ඩිජිටල්කරණය කිරීම සඳහා වූ වැඩ පිළිවෙළ ගැන. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම අපට තව අභියෝගයක් තිබෙනවා. ඒ තමයි, අපේ රාජ්‍ය තන්ත්‍රය නවීකරණය කිරීම. මිලියන 21ක්වූ ජනගහනයෙන් මිලියන 1.4ක් රජයේ සේවකයන් ඉන්නවා. ජනගහනයට සාපේක්ෂව විශාල රාජ්‍ය ව්‍යුහයක් අපට තිබෙනවා. මේ රාජ්‍ය ව්‍යුහය ඩිජිටල්කරණය කළහොත්, ජනතාව සතුටින් තැබීමට ඉවහල් වන ආකාරයට හොඳ සේවයක් ලබා දෙන්න අපට පුළුවන්. ඒ වාගේම, නාස්තිවන මුදල්, දූෂණයට වැය වන මුදල් මේ රටේ ඉතිරි කර ගැනීමට අපට හැකියාවක් ලැබෙනවා. ඒ ඉතිරි කරන මුදල් ජනතාව වෙනුවෙන් වඩාත් හොඳ අරමුණු කරා යොදවන්නට අපට අවකාශ ලැබෙනවා. ඒ නිසා ඩිජිටල්කරණය පිළිබඳව ගරු අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා බරපතළ කැපවීමකින් කටයුතු කරනවා. ඒ වාගේම, මුදල් අමාත්‍ය ගරු මංගල සමරවීර මැතිතුමාත් ලොකු කැපවීමකින් කටයුතු කරනවා. ඒ වාගේම, ලංකාවට පරිගණක තාක්ෂණය පිළිබඳ මූලධර්ම හඳුන්වාදීමට ඉවහල් වුණු ICTA එකේ පළමුවැනි සභාපතිවරයා වෙච්ච, මේ රටේ ඩිජිටල්කරණය පිළිබඳ තොරතුරු තාක්ෂණ විෂය හඳුන්වාදීම පිළිබඳව පුරෝගාමියෙක් වෙච්ච මුදල් රාජ්‍ය අමාත්‍ය ගරු ඉරාන් වික්‍රමරත්න මැතිතුමාත් මේ සභාවේ ඉන්නවා. එතුමාගෙනුත් විශාල සහයෝගයක් අපට ලැබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම, ආචාර්ය හර්ෂ ද සිල්වා මැතිතුමාත් ඒ ක්ෂේත්‍රය පිළිබඳව දැවැන්ත උනන්දුවක් දක්වනවා. ඩිජිටල්කරණය සහ නවීන ලෝකයේ තාක්ෂණය භාවිතය පිළිබඳව පුළුල් දැනුමක් තිබෙන මැති ඇමතිවරුන් අපේ රජය තුළ සිටීම අපට වාසනාවක්. ඒ නිසා මේ ඩිජිටල්කරණය සඳහා අවශ්‍ය වන්නාවූ ඒ තාක්ෂණික දැනුම ලබා ගැනීමටත්, ඒ තාක්ෂණය භාවිතා කිරීමට අවශ්‍ය කරන ආයෝජන ලබා ගැනීමටත් අපට හැකි වෙනවා කියන විශ්වාසය තිබෙනවා. ඒ පිළිබඳව මගේ විෂය පිළිබඳ විවාදයේදී වැඩිමනත් කරුණු

දක්වන්නම්. නමුත්, මේ අය වැය මඟින් ඒ දක්වලා තිබෙන ප්‍රමුඛතාව අගය කිරීමට මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ඒ වාගේම, මේ තරම් අමාරු කාලයක, ඉතිහාසයේ වැඩිම ණය මුදල් ගෙවන කාලයක මේ රටේ ආර්ථිකය නවීකරණය කරන්නත්, රාජ්‍ය තන්ත්‍රය නවීකරණය කරන්නත් කරන මේ කැපවීම ගැන අගය කරන්න මම මෙය අවස්ථාවක් කර ගන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම බලන්න ඕනෑ කාරණයක් තිබෙනවා. මේ රටේ සංචාරක කර්මාන්තය වෙනුවෙන් "මුකුත් වුණේ නැහැ; මුකුත් වුණේ නැහැ"යි කියලා කියනවා. කියන්න ලෙහෙසියි. හැබැයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලෝකය අපි දෙස බලන්නේ කෙසේද? අපි දේශපාලන වාසි උදෙසා අපි එකිනෙකාට චෝදනා කර ගන්නවා.

නමුත් ලංකාව දිහා ලෝකය බලන්නේ කෙසේද? ලෝකයේ ප්‍රමුඛතම සංචාරකයන් සඳහා මගපෙන්වන "Lonely Planet" සඟරාව 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකාව ලෝකයේ අංක එකේ ගමනාන්තය බවට නම් කර තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ඒක මේ ආණ්ඩුව වෙනුවෙන් කරපු දෙයක් නොවෙයි. ලංකාව ලෝකයේ නොම්මර එකේ සංචාරක ගමනාන්තය ලෙස නම් කරන්නේ, අපේ රටේ සංචාරය කරන සංචාරකයන්, ඒ වාගේම, සංචාරක කර්මාන්තයේ යෙදෙන ඒ හා සමාන ආයතන විසින් ලබාදෙන අදහස් අනුවයි. ඒ නිසා අපි මොන කථා කිව්වත්, අපේ රට 2019 වසරේ ලෝකයේ නොම්මර එකේ සංචාරක ගමනාන්තය බවට පත් වෙලා තිබෙන්නේ, අපේ රජය විසින් අනුගමනය කරපු මේ යහපත් ප්‍රතිපත්තිවල ප්‍රතිඵලයක් විධියටයි. අපේ රටේ සංචාරක කර්මාන්තය දියුණු කර ගන්න තව බොහෝ දේවල් කරන්න තිබෙනවා. McKinsey Report එක අනුව ඩිජිටල්කරණය හරහා අපි බලාපොරොත්තු වෙනවා, ඒ සංචාරක ක්ෂේත්‍රයේ නවීනතාවක් ඇති කරන්න; වැඩි ලාභයක් ලබන්න. ඒ සඳහා යෝජනා මේ අය වැයේ සඳහන් කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙනවා.

**ගරු අජිත් පී. පෙරේරා මහතා**
(மாண்புமிகு அஜித் பீ. பெரேரா)
(The Hon. Ajith P. Perera)
ලංකාව ලෝකයේ නොම්මර එකේ ගමනාන්තය බවට පත් වෙන එක අපට ආඩම්බරයක්. ඒක අපේ ආණ්ඩුවේ දක්ෂකමක්. ඒක අපේ ආණ්ඩුවේ හපන්කමක්. මේ තත්ත්වය ඉස්සරහට අරගෙන යන එක සහ දිගින් දිගටම මේ ස්ථානයේ රැඳී සිටීම සඳහා අපි කටයුතු කළ යුතු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අවසාන වශයෙන් මේ කාරණය කියන්න ඕනෑ. දැන් මේ ආණ්ඩු පෙරළන්න කථා කරනවා. ගරු ජනාධිපතිතුමාගේ ඉඳලා විපක්ෂ නායකතුමා දක්වා, ඒ වාගේම විපක්ෂයේ ඉන්න මන්ත්‍රීතුමන්ලාත් දවස පුරා කථා කරන්නේ ආණ්ඩුව පරාජයට පත් කරන්නයි. නමුත් මොකක්ද මේ අය වැය විවාදය තුළ තිබෙන තත්ත්වය? විපක්ෂයේ මන්ත්‍රීවරුන් සම්පූර්ණයෙන් නිදිමත ස්වභාවයෙන් පසුගාමීව බලාපොරොත්තු අත්හැරලා ඉන්න ස්වභාවයක් පෙනෙන්නේ. අපේ ජ්‍යෙෂ්ඨ හිටපු ඇමති ගාමිණී ලොකුගේ මැතිතුමා හොඳටම නිදි. [බාධා කිරීමක්] දැන් ඇහැරුණා. ඒ වාගේම, විපක්ෂයේ මන්ත්‍රීවරු ඉන්නේ කී දෙනාද? එකයි, දෙකයි, තුනයි, හතරයි, පහයි, හයයි, හතයි, අටයි, නවයයි. විපක්ෂය පැත්තේ ඉන්නේ මන්ත්‍රීවරු නවයයි. ඒක තමයි තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයට විපක්ෂයෙන් ඡන්දයක් ඉල්ලනවා නම් -මම හිතනවා, ඉල්ලන එකකුත් නැහැ කියලා.- අන්ත පරාජයක් අත් වෙනවා. මේ රටේ තිබෙන දේශපාලන යථාර්ථය ඒකයි. තව මාස කිහිපයකින් ප්‍රධාන මැතිවරණයක් එනවා. ඒ මැතිවරණයේදී සියලු ප්‍රජාතන්ත්‍රවාදී, ජනතා හිතවාදී බලවේග එකතු කරලා සැබෑ යහපාලන රජයක් ගොඩනඟන්නට අපි එකතු වෙනවා. ඒ හරහා දැවැන්ත ජයග්‍රහණයක් ලබා ගන්නවා. මේ අය වැය හරහා ඇති වෙලා තිබෙන ධනාත්මක තත්ත්වය තුළ මේ රට ඉදිරියට යන්න අපට ශක්තිය ලැබෙනවා. අපි මේ අය වැය දිනනවා වාගේම, මේ ආර්ථිකය පිළිබඳව ඇති වෙලා තිබෙන ගැටලු කළමනාකරණය කරගෙන රට ඉදිරියට ගෙන යනවාය කියන කාරණයත් මම විශේෂයෙන් සඳහන් කරන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට ගරු දුනේෂ් ගන්කන්ද මන්ත්‍රීතුමා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු නිමල් ලන්සා මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු හතරක් තිබෙනවා.

[අ.භා.4.22]

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය ලේඛනය ගැන කථා කරන්න මට විනාඩි හතරයි තිබෙන්නේ. ඒ නිසා ඉතා ඉක්මනින් කථා කරන්න වෙයි. අය වැය ලේඛනයේ අපි දැකපු සුවිශේෂ ලක්ෂණය මෙයයි. ආදායම 2018 වර්ෂයට සාපේක්ෂව සියයට 100කින් වැඩි කරගෙන තිබෙනවා. මේ ආදායම වැඩි වෙලා තිබෙන්නේ නිෂ්පාදනය වැඩි වෙලා නම්, මේ ආදායම වැඩි වෙලා තිබෙන්නේ අපනයනය වැඩි වෙලා නම්, මේ ආදායම වැඩි වෙලා තිබෙන්නේ ආයෝජන වැඩි වෙලා නම් කිසිම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, මේ ආදායම වැඩි කරගෙන තිබෙන්නේ කොහොමද? මේ ආදායම වැඩි කරගෙන තිබෙන්නේ මේ රටේ ජනතාව එදිනෙදා පාවිච්චි කරන භාණ්ඩ හා සේවාවලට වක්‍ර බදු ගහලා. එහෙම නැත්නම් සෘජු බදු ගහලා. මේ විධියට ආදායම සියයට සියයකින් වැඩි කර ගත්තාම මේ රටේ ජනතාවට මාර්තු 1වැනි දායින් පස්සේ විශාල ප්‍රශ්නයකට මුහුණ පාන්න සිදු වෙනවා. මොකද, සියයට 35කින් මේ රටේ භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යනවා.

එක්සත් ජාතික පක්ෂයේ ගරු මන්ත්‍රීවරු කිව්වා, මේ අය වැය ලේඛනය ඉතාම හොඳ අය වැය ලේඛනයක්, මේක ඉතාම හොඳට හදපු අය වැය ලේඛනයක් කියලා. මේ අය වැය ලේඛනය හදන්න ආර්ථික ඔස්තාර්ලා ඕනෑ නැහැ, ටිකිරි මොළයක් තිබුණා නම් ඇති. මේ අය වැයෙන් කරලා තිබෙන්නේ, මේ රටේ පාවිච්චි කරන භාණ්ඩ හා සේවාවලට බදු ගහන එකයි. මේ අය වැයේ

[ගරු නිමල් ලාන්සා මහතා]

නිෂ්පාදනය වැඩි කරන්න වැඩ පිළිවෙළක් නැහැ, ආයෝජනය වැඩි කරන්න වැඩ පිළිවෙළක් නැහැ, ප්‍රතිපත්තියක් නැහැ. මේක, ඒ මොකුත් නැති අය වැයක්.

ආර්ථිකය පිළිබඳව දැනුමක් තිබෙන කෙනකු මේ අය වැය හැදුවා නම්, මේ රට යන්න ඕනෑ දිශානතිය තෝරාගෙන යන්න තිබුණාය කියලා මා හිතනවා. අද මේ පාර්ලිමේන්තුවේදීත් කථා කළා, ඇඟලුම් කර්මාන්තවලින් අපනයනය වැඩිවෙලා තිබෙනවාය, "Victoria's Secret" ඇඳුම් අඳින ඒ පිරිමි තමයි මේ අය වැය හදලා තිබෙන්නේ කියලා. මොකද, එහෙම නැත්නම්, මේ අය වැය තුළින් මේ රටේ දුගී දුප්පත් ජනතාව ගොඩ නැඟීම සඳහා මීට වඩා විශාල කාර්ය භාරයක් කරන්න තිබුණා. ඉතිහාසය තුළම රාජාණ්ඩු කාලයේ සිට ගත්තත්, පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි යටත් විජිත කාලයේ සිට ගත්තත්, විවිධ ජනාධිපතිවරු යටතේ ගත්තත් පසුගිය කාලය පුරාම කරපු සංවර්ධන ව්‍යාපෘති, ආර්ථික දර්ශක ආදී මේ සියල්ලක්ම හොඳට තිබුණාය කියලා අපි දන්නවා. හැබැයි මේ සභාවේ කථා කළ කිසිම මන්ත්‍රීවරයෙක් පසුගිය අවුරුදු 4 තුළ කරපු කාර්යභාරය ගැන කිව්වේ නැහැ. "ඉදිරියේදී අපි කරනවා. අපි කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කර තිබෙනවා. ඉදිරියේදී අපි ඒ කටයුතු ආරම්භ කරනවා, ඉදිරියේදී අපි ඒ කටයුතු අවසන් කරනවා"යි කියන එක තමයි එතුමන්ලා කිව්වේ. මේ පාර්ලිමේන්තුවට එතුමන්ලාගේ පස්වන අය වැය ලේඛනය ඉදිරිපත් කරන අවස්ථාවේදී, එතුමන්ලාට බය නැතුව කියන්න පුළුවන් නේ, පසුගිය අවුරුදු හතරේදී ජනතාවට කර තිබෙන වැඩ කටයුතු පිළිබඳව. හැබැයි එකක්වත් කරලා නැහැ. එතුමන්ලාට කියන්න දෙයක් නැහැ. ආර්ථික දර්ශක සියල්ලම පහළට ගිහින් තිබෙනවා. සේවා වියුක්තිය එන්න-එන්න වැඩිවෙලා තිබෙනවා. රැකියා දස ලක්ෂයක් දෙනවාය කියලා තමයි මේ ආණ්ඩුව බලයට පත්වුණේ. මේ ආණ්ඩුව බලයට පත්වුණාම වෑන් දෙන්නම් කිව්වා, බයික් දෙන්නම් කිව්වා, මෝටර් රථ දෙන්නම් කිව්වා, බ්‍රේස්ලට් දෙන්නම් කිව්වා, සාක්කු පුරවනවා කිව්වා. මේ ආණ්ඩුවට ඒ එකක්වත් කරගන්න බැහැ. කරපු දෙයක් කියන්න බැරි නිසා, අවසාන අවුරුද්දේත්, හුස්ම යන අවුරුද්දේත් මේ ආණ්ඩුව කියන්නේ මොකක්ද? "අපි ඉදිරියේදී කරනවා"යි කියලායි කියන්නේ.

මේ අය වැය හොඳ නම්, පසුගිය කාලයේ වැඩ කළා නම්, ඇයි දෙවියනේ මැතිවරණයට බය? බය නැතුව මැතිවරණයකට ඉදිරිපත් වෙන්න පුළුවන් නේ. එක්සත් ජාතික පක්ෂය තරම් මැතිවරණයකට බය පක්ෂයක් ඉතිහාසයේ දැකලා නැහැ. එක්සත් ජාතික පක්ෂයේ හිටපු නායකයෝ, ජේ.ආර්. ජයවර්ධන, ආර්. ප්‍රේමදාස හිටපු ජනාධිපතිතුමන්ලා වැඩ කළා. මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට භාර ගත්තාට පස්සේ, අවුරුදු 30ක් තිස්සේ අවසන් කරන්න බැහැයි කියපු යුද්ධය අවසන් කරලා, මේ රටේ තිබෙන සියලු සාර්ව ආර්ථික දර්ශක සියල්ලම ඉදිරියටම ගෙනාවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව මිනිත්තුවක කාලයක් තිබෙනවා.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
මා එක කාරණයක් නිවැරැදි කරන්න ඕනෑ. මීට පෙර කථා කළ ගරු මන්ත්‍රීවරයෙක් කිව්වා, ව්‍යාපාර කිරීමේ පහසුව වැඩිවෙලාය කියලා. හැබැයි ඒක වැඩිවෙලාද? ඒ දර්ශකයේ අපි 180ට ගිහිල්ලා තිබෙනවා. ඒක අපහසුතාවට පත්වෙලා. අපි ආර්ථික නිදහස පිළිබඳ දර්ශකයේ - Index of Economic Freedom - 112ට ගිහිල්ලා. අපි මානව සංවර්ධනය පිළිබඳ දර්ශකයේ - Human Development Index - 73 සිට 76 දක්වා ගිහිල්ලා. අපි ගෝලීය තරගකාරිත්වය පිළිබඳ දර්ශකයේ 68 සිට 85ට ගිහිල්ලා. අපි දූෂණ ප්‍රත්‍යක්ෂතා දර්ශකයේ- Corruption Perceptions Index - 85 සිට 89 දක්වා ගිහිල්ලා. මේ තුළින් පෙන්වා තිබෙන්නේ මොකක්ද? මේ තුළින් පෙන්වා තිබෙන්නේ, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා මේ රට භාර දුන්නාට පස්සේ පසුගිය අවුරුදු 5ක කාලය තුළ මේ රට මෙපමණ පහළට යැව්වාය කියන එකයි. ඒ නිසා ජනතාව වෙනුවෙන් අපි මේ අය වැයට විරුද්ධව ඡන්දය දෙනවාය කියන එක ප්‍රකාශ කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! ඊළඟට එස්. වියාලේන්දිරන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 4ක කාලයක් තිබෙනවා.

[பி.ப. 4.26]

**ගරු එස්. වියාලේන්දිරන් මහතා**
(மாண்புமிகு ச. வியாழேந்திரன்)
(The Hon. S. Viyalanderan)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய வரவு செலவுத்திட்ட விவாதத்திலே பேச வாய்ப்பளித்தமைக்கு நன்றி கூறுகின்றேன். உண்மையிலே, கடந்த 3 தசாப்த காலமாக யுத்தத்தினால் பாதிக்கப்பட்டிருக்கின்ற, அழிக்கப்பட்ட ஒரு சமூகத்தின் பிரதிநிதிகளாக, ஒழிக்கப்பட்ட ஒரு சமூகத்தின் பிரதிநிதிகளாக, காணாமலாக்கப்பட்டிருக்கின்ற ஒரு சமூகத்தின் பிரதிநிதிகளாக இருக்கின்ற நாம், எங்களுடைய கிழக்கு மகாணத்திலேயிருக்கின்ற தமிழ் மக்கள் வாழ்கின்ற பகுதிகளுக்குத் தேவையான பல்வேறு செயற்திட்ட முன்மொழிவுகளை 2015இலிருந்து 2016, 2017, 2018 என ஒவ்வொரு வருடமும் அரசிடம் முன்வைத்திருக்கின்றோம். செயற்திட்ட முன்மொழிவுகளை முன்வைத்தது மாத்திரமல்ல, அந்த வரவு செலவுத்திட்டங்கள் உட்பட பல்வேறு விடயங்களுக்கும்அரசாங்கத்திற்கு ஆதரவுகளை வழங்கி வந்திருக்கின்றோம். ஆனால், 2015இல் சொல்லப்பட்ட விடயங்கள் 2016இலே நடைபெறவில்லை. 2016இலே சொல்லப்பட்ட விடயங்கள் 2017இல் நடைபெறவில்லை. அதுபோல், 2017இல் சொல்லப்பட்ட விடயங்கள் 2018இல் நடைபெறவில்லை. இவ்வாறுதான் இப்போது சொல்லப்படுகின்ற விடயங்கள் 2019இல் நடக்கப்போவதில்லை. அவை 2019இல் சொல்லப்படுகின்ற விடயம் 2020க்குள் நடக்குமா என்ற சந்தேகம் இருக்கின்றது. இவ்வாறு தொடர்ச்சியாகக் கிழக்கு மாகாணத்திலிருக்கின்ற எமது மக்கள் ஏமாற்றத்திற்குள்ளாகின்ற ஓர் சமூகமாகவே காணப்படுகின்றார்கள். ஒவ்வொரு விடயத்திற்கும் வீதியிலே இறங்கிப் போராடித் தங்களுடைய வாழ்க்கையைக் கொண்டு நடாத்தவேண்டிய மிகப் பயங்கரமான ஒரு துன்பியல் நிகழ்வுக்குள் அவர்கள் தள்ளப்பட்டிருக்கின்றார்கள். இன்று கிழக்கு மாகாணத்தை எடுத்துக்கொண்டால், ஒவ்வொரு விடயத்திலும் எங்களுடைய மக்கள் பாரபட்சமாகக் கருதப்படுவதுடன், எங்களுடைய பகுதிகளிலே மேற்கொள்ளப்படுகின்ற அபிவிருத்திகளும் வெறும் வெற்றுப் பேச்சுக்களாகத்தான் இருப்பதைக் காணமுடிகின்றது.

அங்கு யுத்த காலத்திலே அழிக்கப்பட்ட பல்வேறு தொழிற்சாலைகளில் ஒரு தொழிற்சாலைகூட இந்த அரசின்

காலத்திலே புனரமைப்புச் செய்து திறக்கப்படவில்லை. மட்டக்களப்பிலிருக்கின்ற 4,000 பேருக்கு வேலை கொடுத்த வாழைச்சேனைக் காகித ஆலை தொடர்பாக எத்தனை தடவைகள் நாங்கள் பேசியிருக்கின்றோம்! ஒவ்வொரு முறையும் வாக்குறுதிகள் தரப்பட்டன. வாக்குறுதிகள் வாக்குறுதிகளாக இருக்கின்றனவே ஒழிய, இன்னும் அந்தத் தொழிற்சாலைகளைத் திறப்பதற்கான எந்த நடவடிக்கைகளும் முன்னெடுக்கப்படவில்லை. இந்த வரவு செலவுத்திட்ட அறிக்கையில்கூட, வாழைச்சேனைக் கடதாசி ஆலை தொடர்பாக எந்தவிதமான முன்மொழிவுகளும் இல்லை. மட்டக்களப்பை எடுத்துக்கொண்டால் வாழைச்சேனைக் கடதாசி ஆலை, ஓட்டுத் தொழிற்சாலை, அரிசி ஆலை, அரச அச்சகம் என்று கிட்டத்தட்ட ஆறுக்கு மேற்பட்ட தொழிற்சாலைகள் காணப்படுகின்றன. அவற்றில் ஒரு தொழிற்சாலையைக்கூடத் திறப்பதற்கான எந்த முன் மொழிவுகளும் இல்லை. ஆகவே, இந்த நிலையினைப் பாருங்கள்!

அண்மைக் காலங்களில் இந்த அரசின் பல அமைச்சர்கள் அங்கு வந்து பாலங்களுக்காக அடிக்கற்களை நட்டார்கள். ஆனால், கற்கள் கற்களாகத்தான் இருக்கின்றன. அவர்கள் வந்து கற்கள் வைத்த இடங்களிலே நாங்கள் தென்னம் பிள்ளைகளை நாட்டியிருந்தால், இன்று அந்தத் தென்னைகளிலே நாங்கள் இளநீர் குடித்திருக்க முடியும். அவ்வாறு எந்தவோர் அபிவிருத்தித் திட்டமும் எங்களுடைய பகுதிகளிலே மேற்கொள்ளப்படாத நிலைமை காணப்படு கின்றது.

கிழக்கு மாகாணத்திலுள்ள அதிகளவான பண்ணையாளர் கள் இன்று தங்களுடைய வாழ்க்கையை இழந்து வீதிகளிலே நிற்கின்றார்கள். மாடுகள், ஆடுகள் வைத்திருப்பவர்கள் கூடுதலான பாதிப்புகளுக்கு உள்ளாகியிருப்பதால், அவர்கள் தங்களது வாழ்வாதாரத்தை இழந்து நிற்கின்றார்கள். நேற்றைய தினம் மட்டக்களப்பு மாவட்டத்திலே பாரியளவில் குடிநீர் தட்டுப்பாட்டை எதிர்நோக்குகின்ற மக்கள் வீதியிலே இறங்கிப் போராடினார்கள். இவ்வாறன நிலைமையே எங்களுடைய பிரதேசத்தில் காணப்படுகின்றது. இவ்வாறு பல்வேறு விடயங்களிலும் அவர்கள் கஷ்டங்களை எதிர்நோக்கு கின்றார்கள்.

கல்முனை தமிழ் பிரதேச செயலகப் பிரிவைத் தரம் உயர்த்துவது தொடர்பில் 2015ஆம் ஆண்டிலிருந்து பொய்யான வாக்குறுதிகள் தரப்படுகின்றதே ஒழிய, அது தரம் உயர்த்தப்படவில்லை. நாங்கள் கல்முனை பிரதேச செயலகம் தொடர்பான விடயத்தைப் பேசும்பொழுது, அதிலே ஓர் இன ரீதியான பாரபட்சம் காட்டப்பட்டு, அந்த விடயம் முடக்கப்படுகின்றது. ஒரு நீதியான, நியாயமான, தரவேண்டிய, தரப்படவேண்டிய விடயங்களைப் பற்றிப் பேசும்பொழுது, அதற்கு இனவாத முத்திரை குத்துகின்ற செயற்பாடு நிறுத்தப்பட வேண்டும். கல்முனை தமிழ் பிரதேச செயலகம் தரம் உயர்த்தப்படாவிட்டால், பாரிய போராட்டங்களை நாங்கள் முன்னெடுப்போம் என்பதை இந்த இடத்திலே கூறிக்கொள்ள விரும்புகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. K. Kader Masthan. You have four minutes.

[பி.ப. 4.30]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கா. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கை வரலாற்றில் பல வரவு செலவுத்திட்டங்கள் கடந்துள்ள நிலையில், வரவு செலவுத் திட்டம் என்பது ஒரு கண்துடைப்பு என்று எண்ணும் அளவுக்கு இந்த அரசாங்கம் வரவு செலவுத் திட்டத்தில் வெற்று வாக்குறுதிகளையும் பசப்பு வார்த்தைகளையும் உள்ளடக்கியுள்ளமை மிகவும் கவலைக்கிடமான விடயமாகும். தமது ஆட்சிக் காலத்தில்தான் இந்த நாடு அரிசி உற்பத்தியில் தன்னிறைவு அடைந்ததாக அமைச்சர் கூறினார். அது முழுமையான ஒரு தவறான கூற்றாகும். அரிசியில் தன்னிறைவு பற்றிய புள்ளிவிபரங்களின்படி, 2005ஆம் ஆண்டிலிருந்து 2015ஆம் ஆண்டுவரையான 10 வருடகாலப் பகுதியில் நாம் அரிசியில் தன்னிறைவு கண்டிருக்கின்றோம். 2007ஆம் ஆண்டில் நாட்டில் ஏற்பட்ட வரட்சி நிலை காரணமாக, எமது அரிசித் தேவையில் 96 வீதத்தையே நாம் உற்பத்தி செய்தோம். நிலைமை இவ்வாறு இருக்க, இந்த அரசாங்கம் அரிசியில் தன்னிறைவு அடைந்துள்ளதாகக் குறிப்பிட்டாலும், அரிசி இறக்குமதியானது நாளாந்தம் அதிகரித்தே வருகின்றது. 2006ஆம் ஆண்டில் 11,500 மெற்றிக் தொன்னாக இருந்த அரிசி இறக்குமதி, 2017ஆம் ஆண்டில் 748,000 மெற்றிக் தொன்னாக அதிகரித்துள்ளது. அதாவது, 65 மடங்கு அதிகரித்துள்ளது. இந்த வருடம் பல விவசாயிகளுக்கு நல்ல விளைச்சல் இருந்தாலும், அரிசி இறக்குமதி தொடர்ந்தும் இடம்பெற்று வருகின்றது. எமது பகுதியில் விவசாயிகள்தான் கூடுதலாக இருக்கின்றார்கள். அவர்களுக்குப் பாதிப்பு ஏற்படுத்தும் விதமாக இந்த அரிசி இறக்குமதி இருக்கிறது. எனவே, அதனை உடனடியாக நிறுத்தவேண்டும் என்று நான் இந்தச் சந்தர்ப்பத்தில் கேட்டுக்கொள்கின்றேன்.

நாட்டின் வரவு செலவுத் திட்டத்தில் துண்டுவிழும் தொகை அதிகரிப்பதற்குப் பிரதான காரணங்களாக இருப்பது முறைகேடான வியாபாரமும் அரச வரி மோசடிகளுமாகும். அரச ஆவணங்களைத் தவறாகப் பிரயோகித்து மேற்கொள்ளப்படும் கொட்டைப் பாக்கு மற்றும் மிளகு வியாபார மோசடி காரணமாக நாடு பல கோடி ரூபாயை இழந்திருக்கிறது. அத்துடன், எமது தேசிய உற்பத்திப் பொருட்களுக்குச் சர்வதேச சந்தையில் இருந்த நற்பெயரும் இழக்கப்பட்டுள்ளது. இந்தத் தேசத்துரோகச் செயல்களை நிறுத்தி, தேசியப் பொருளாதாரத்தை மேம்படுத்தும் திட்டங்கள் இந்த வரவு செலவுத் திட்டத்தினூடாக முன்மொழியப் பட்டிருக்க வேண்டும். ஒரு வரவு செலவுத் திட்டமானது பெறுபேற்றை இலக்காகக் கொண்டதாக இருக்கவேண்டும். அதன் முன்மொழிவுகள் தனிநபரிலும் சமூகத்திலும் கிராமத்திலும் நகரத்திலும் நாட்டிலும் மாற்றங்களை ஏற்படுத்துவதோடு, குறுகிய கால மற்றும் நீண்ட கால மாற்றங்களையும் ஏற்படுத்துவனவாக இருக்கவேண்டும். ஆனால், இன்று நிதி அமைச்சர் குறிப்பிடும் விடயங்களில் அபிவிருத்திக்கான முன்மொழிவுகளில் எத்தனை விடயங்கள் அமையப் பெற்றுள்ளன என்பதனை ஆராய்ந்து, அதன் உண்மைத் தன்மையை இந்த உயரிய சபைக்குத் தெரியப்படுத்துவதற்கான ஒரு பொறிமுறை இந்த நாட்டில் இல்லாமையால், இந்த வரவு செலவுத்திட்டம் மக்களின் நம்பிக்கையை இழந்த, வெற்று உறுதிமொழிகளாகவே இருக்கின்றன.

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, 2018ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டத்தில் வன்னி அபிவிருத்திக்காக முன்மொழியப்பட்ட அபிவிருத்தித் திட்டங்களுள் மன்னார் மாவட்டத்தில் வெள்ளிமலையில் 200 மில்லியன் ரூபாய் செலவில் புதிய மீன்பிடித் துறைமுகம் ஒன்று அமைக்கப்படும் என்று கூறப்பட்டிருந்தது. அது நடைபெறவில்லை அதுபோல், மன்னார் மாவட்டத்தில் 250 மில்லியன் ரூபாய் செலவில் நீரியல்வள கைத்தொழில் பூங்காக்களை அமைத்தல் என்று குறிப்பிடப்பட்டிருந்தது. அதுவும் நடைபெறவில்லை. அவ்வாறே, தாழ்வுபாடு கலாசார நிலையத்தைப் புனரமைப்புச் செய்வதற்கு 25 மில்லியன் ரூபாய் ஒதுக்கப்பட்டது. இதுவும் நடைபெறவில்லை. இவ்வாறான முன்மொழிவுகள் கடந்த வரவு செலவுத் திட்டத்தில் உள்ளடக்கப்பட்டு இருந்தாலும், அவை எமது மக்களுக்குக் கிடைக்கப்பெறவில்லை. அல்லிக் கோட்டையும் தாழ்வுபாடு கலாசார நிலையமும் இன்றும் அதே இடிபாடுடன்கூடிய நிலையில்தான் காணப்படுகின்றன.

அதேபோல, உள்நாட்டில் இடம்பெயர்ந்தவர்களை மீள்குடியேற்றுவதற்காக முறையான சுகாதார வசதிகள், சுத்தமான குடிநீர் மற்றும் மின்சாரம் என்பவற்றுடன் மன்னார் மற்றும் முல்லைத்தீவு மாவட்டங்களில் 20,000 வீடுகள் நிர்மாணிக்கப்படும் என்று கூறப்பட்டிருந்தது. இன்றுவரை அது நிறைவு பெறவில்லை என்பதை இங்கே கூறிக்கொள்கின்றேன். எனவே, தொடர்ச்சியாக மக்களை ஏமாற்றும் விதமாக இல்லாமல், அந்தப் பகுதியில் மிகவும் கஷ்டத்தோடு வாழுகின்ற மக்களுடைய கஷ்டங்களை நிவர்த்திசெய்யும் விதமாக இந்த வரவு செலவுத் திட்டம் அமையவில்லை என்பதை இங்கே கூறவேண்டிய சூழ்நிலை இருக்கின்றது எனத் தெரிவித்து, எனது உரையை நிறைவுசெய்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Thank you.

මීළඟට, ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.36]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (විදුලි සංදේශ, විදේශ රැකියා සහ ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - தொலைத்தொடர்புகள், வெளிநாட்டு வேலைவாய்ப்பு மற்றும் விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Telecommunication, Foreign Employment and Sports)

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මා ක්‍රීඩා ඇමති ධුරයත් දරන නිසා අය වැය ගැන කථා කරන්න ඉස්සෙල්ලා, ක්‍රීඩාවෙන් මගේ කථාව ආරම්භ කරන්නම්. පසුගිය කාලයේ මට බලන්න හම්බවුණා, "Fire in Babylon" කියලා චිත්‍රපටයක්. ඒ කාලයේ බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායම මුලින්ම ක්‍රිකට් ගහනකොට එංගලන්තයෙන් විශාල ප්‍රහාර එල්ල වුණා. අපේ ලංකාවේ ක්‍රිකට් කණ්ඩායම ඕස්ට්‍රේලියාවට ගියාම බෝල ඔළුව උඩින් යනවා, ඇඟේ වදිනවා, ඇඟ තුවාල වෙනවා, අත් කැඩෙනවා. ඒ දවස්වල බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායමටත් ඒ වාගේම ප්‍රශ්නයක් තිබුණා. ඔවුන් දිගින්-දිගටම පරදිනවා, මිනිස්සු ඔවුන්ට උසුළු-විසුළු කරනවා, නෝක්කාඩු කියනවා, ඒ රටවල මාධ්‍ය ඔවුන්ට බණිනවා. මේ සියලු දේ සිදුවෙමින් පැවතුණා. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, ඒ කාලයේ සිටියා, Clive Lloyd කියලා ක්‍රිකට් නායකයෙක්. එතුමා මොකක්ද කළේ? එතුමා කෙසේ හෝ බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායමටත්, හොඳට ක්‍රිකට් ගහන්න පුළුවන්, හොඳට හයියෙන් බෝලය විසි කරන්න පුළුවන්, හොඳට හයියෙන් bat කරන්න පුළුවන්, හොඳට field කරන්න පුළුවන් කණ්ඩායමක් සොයා ගත්තා. අවුරුද්දක් ගතවුණේ නැහැ, මේ කණ්ඩායම එංගලන්තයට දුවන්න ගැහුවා. ඊට පස්සේ ලෝක කුසලානයත් දිනුවා. ඊට පස්සේ බටහිර ඉන්දීය කොදෙව් -West Indies- කණ්ඩායමට "රන් කිරුළ දිනන කණ්ඩායම" කියලා නමකුත් ලැබුණා.

මේ කථාව තුළින් මා ගත්ත ආරම්භය මොකක්ද? අපිත් අවුරුදු තුනක් ආණ්ඩු කළා. අපටත් ප්‍රශ්න තිබුණා. වැටුණු wicket, හිල්වුණු wicket තිබුණා. බෝලය ඇඟට එනවා, ඇඟට ගහනවා, උඩින් යනවා, අත් කැඩෙනවා, ඉස්පිරිතාලේ යනවා. අපටත් එහෙම වුණා.

මොකද, කාලා ගිය pitch එකක තමයි අපට bat කරන්න හම්බ වුණේ, එහෙම නැත්නම් ක්‍රීඩා කරන්න; සෙල්ලම් කරන්න හම්බ වුණේ. මේකේ ක්‍රීඩා කරන කොට අවුල් ගොඩක් තිබුණා. දැන්. Pitch එක තලලා, bat කරලා, හිල් ටික වහලා හදාගෙන එනකොට තමයි බේමාගේ පුතා අය වැයක් ඉදිරිපත් කරලා තිබෙන්නේ. මොකද, බේමාගේ පුතාව ප්‍රශ්නයක් කරගෙන තිබෙනවා නේ. බේමාගේ කොලුවා හොඳ කොල්ලෙක්. මොකද, මිනිස්සු ගැන ආදරයක් තිබෙන, මිනිස්සු ගැන කැක්කුමක් තිබෙන හොඳ අය වැයක් ඉදිරිපත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සී.ඩබ්ලිව්.ඩබ්ලිව්. කන්නංගර මැතිතුමා නිදහස් අධ්‍යාපනය මේ රටට ගෙනාවා. පාර්ලිමේන්තුවේ පැය හයහමාරක කථාවක් කරන්නට වුණා, ලංකාවේ නිදහස් අධ්‍යාපනය ස්ථාපිත කර ගන්නට. ගෙදර නොවෙයි, පාර්ලිමේන්තුව තුළ. අපි වැලි පීල්ලෙන් ගල් ලෑල්ලට එනකොට මිනිස්සු විරුද්ධ වුණා. ගල් ලෑල්ලෙන් කොපි පොතට එනකොට මිනිස්සු විරුද්ධ වුණා. දැන් කොපි පොතෙන් iPad එකට යනකොට මිනිස්සු විරුද්ධ වෙනවා. ඒක සාමාන්‍ය දෙයක්, විපක්ෂය කරන දෙයක්.

මම ගරු කරන හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා කියනවා මම අහගෙන හිටියා, අපනයන නැහැලු; ආර්ථිකයක් දියුණු වෙන්නට අපනයන නැහැලු. ස්වාසිලන්තයට අපනයනය කරන්නට බැහැ. අපනයනය කරන්නට වෙළෙඳ ගිවිසුම් ඕනෑ. වෙළෙඳ ගිවිසුමක් ගහපුවාම සිංගප්පූරුව එක්ක; වෙළෙඳ ගිවිසුමක් ගහපුවාම චීනයත් එක්ක, බුද්ධිමත් රටවල් එක්ක වෙළෙඳ ගිවිසුම් ගහනකොට සරම උස්සාගෙන රට වටේ දුවනවා, මෙන්න රට පාවා දෙනවා කියමින්. මම කලින් කිව්ව විධියට, කාලා තිබුණු pitch එකක තමයි අපට සෙල්ලම් කරන්නට වුණේ කියන එක මතක තියා ගන්න.

හැබැයි, අපි මොකක්ද කළේ? අපේ මිත්‍රයාව දකින දකින පාරට අපේ ගම්වල මිනිස්සුන්ට මතක් වෙන්නේ මොකක්ද? හර්ෂ ද සිල්වාට ඕනෑම ගමක ඡන්දය ඉල්ලන්න පුළුවන්. ඇයි ඒ? "සුව සැරිය" වැඩසටහන නිසා. ඒ, "සුව සැරිය" වැඩසටහනෙන් මොකක්ද වුණේ? මම බොරුවට නොවෙයි කියන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඔබතුමාට, මේ කාටත් තමන්ගේ ආසනවලට ගියාම ඒක ජේනවා. ලෙඩෙක් බේරා ගන්න; ලෙඩෙකුට ජීවත් වෙන්න අවස්ථාව ලබා දෙන්න; අපේ අම්ම තාත්තාව බේරා ගන්න විනාඩි පහකින් එන ගිලන් රථයක් තිබෙනවා නම් ඒක ගෙනැල්ලා දුන්නේ මේ ආණ්ඩුව. ඒකට දහස් වාරයක් පින් ලැබෙනවා, ලැබෙනවා, ලැබෙනවාමයි. නිකම් හිතලා බලන්න, පපුවේ අමාරුවක් හැදුනාම කොහේද දුවන්නේ?

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ මහ රෝහලේ Cath lab එකක් තිබුණේ නැහැ. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා අපට Cath lab එකක් දුන්නා, kidney ඒකකයක් දුන්නා. දැන් මුළු පළාතේ තිබෙන උසම building එක වෙන්නේ ඉස්පිරිතාලේ.

දැන් අපෙන් අහනවා මේ අය වැයෙන් මොකක්ද වුණේ කියලා. මේක election budget එකක් කියනවා. [බාධා කිරීමක්] Election budget එකක් වෙන්නේ කොහොමද? මේක election budget එකක් නොවෙයි හදවත අල්ලපු budget එකක්. එක මන්ත්‍රීවරයෙක් කියනවා මම අහගෙන හිටියා, "home sweet home, home sweet home." කියලා. "rain sweet rain, rain sweet rain" කියලා අපටත් කියන්න තිබුණා. අපි එහෙම කියන්නේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, උසුළු විසුළු කරන්නට නරකයි. ගම්වල දෙමවුපියන්ට තිබෙන ලොකුම ප්‍රශ්නය මොකක්ද? තමන් ජීවත් වෙන ගෙදර ළමයි තුන් හතර දෙනෙක් කසාද බැඳගෙන දරු පවුල් හදාගෙන ඉන්නවා. අම්මා, තාත්තා ජීවත්වෙනකම් මැරි මැරී ඉපදෙනවා, ළමයින්ට ගෙවල් හදලා දෙන්නේ කොහොමද කියලා. ඊයේ පෙරේදා තව කෙනෙක් කියනවා මම දැක්කා, විජාතික බලවේගයක්ලු මේක කරගෙන එන්නේ කියලා. මේ ඉඩම් ටික දීලා, ඊට පස්සේ ඉඩම් ටික බැංකුවට අල්ලා ගන්නවා ලු. මේ වාගේ මහා පව කියන මිනිස්සු ඉන්නේ. හැබැයි, මේ කියන කෙනාට උප්පැන්න දෙකක් තිබෙනවා; කියන කෙනාට උප්පැන්න දෙකක් තිබෙනවා. එයාගේ අයියා කෙනෙකුත් ඉන්නවා, එයාගේ මල්ලි කෙනෙකුත් ඉන්නවා. ඉතින් මිනිහාට ණය දෙකක් ගන්න පුළුවන්, ඇත්තට බැලුවොත්. මේ මිනිසුන්ව රවටන කථා ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ අය වැයේ වැදගත්ම යෝජනාව මොකක්ද? මම දැකපු විධියට මේ අය වැයේ තිබෙන වැදගත්ම යෝජනාව මොකක්ද දන්නවාද? අපේ ජීවිතයේ අපි මූලිකවම බලාපොරොත්තු වෙන්නේ මොනවාද? බොන්න වතුර ටිකක්. ඊට පස්සේ කන්න ආහාර ටිකක්. ඊළඟට, විළි වහ ගන්න ඇඳුම් ටිකක්. ඊළඟට, ජීවත් වෙන්න නිවසක්. මොකක්ද මේ අය වැයෙන් ඒ සඳහා කරලා තිබෙන්නේ? මේකට හොඳ නිදසුනක් හැටියට ඌව පළාතම ගන්නම්. 2015 අපේ ආණ්ඩුව එනකොට පයිප්පයකින් වතුර ලැබෙන - නළ ජලය තිබෙන - ගෙවල් තිබුණේ සියයට 20ක් විතරයි. මෙදා පාර මිනිස්සුන්ට නළ ජලය දෙන්න විතරක් රුපියල් බිලියන 45ක් වෙන් කරලා තිබෙනවා. හිතන්න, උදේට නැඟිටලා ගෙදර පයිප්පයකින් මුහුණ හෝදගන්න තරම් පහසුකමක් නැත්නම් මොකක්ද තත්ත්වය කියලා. මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 225 දෙනාගේම ගෙදර වතුර තිබෙනවා නේ. හැබැයි, අපේ පළාතේ ඒ පහසුකම් තිබුණේ සියයට 20කට පමණයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඌව පළාතේ දැන් සියයට 37කට එම පහසුකම් ලැබෙනවා. 2020 වෙනකොට සියයට 60ක් දක්වා එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනවා. දැන් සියයට 40කට නළ ජලය ලබා දීලා තිබෙනවා. උදේ පාන්දර කරාමය ඇරපුවාම නාන්න පුළුවන්, ළමයා ඉස්කෝලේ යන්න ඉස්සෙල්ලා නාවන්න පුළුවන්, රෑට වතුර තිබහක් ඇති වුණාම කරාමය ඇරලා වතුර ටිකක් බොන්න පුළුවන්. ඒ වාගේම, නාන්න ඕනෑ වුණාම ළිඳට, ඇළට, පහළට කළුවරේ යන්න ඕනෑ නැහැ, සර්පයෝ කවාගන්න. වතුර ටික ගෙදර තිබෙනවා. හොඳ නැද්ද දෙවියෝ! මේක නොවෙයිද හොඳ? මේක නොතේරෙන ඊර්ෂ්‍යාකාරයෝ මෙතැන ඉඳගෙන කෑ ගහනකොට නම් අපට මතක් වෙනවා, අතීතයේ සුදු වැන් ආපු ආකාරය. අපි ඒවා දැක්කා නේ.

ඔබතුමන්ලා එක දෙයක් අමතක කරන්න එපා. මේ ආණ්ඩුවට ලැබුණු හොඳම සහතිකය තමයි, අර දින 52ක කාලය තුළ සිද්ධවුණු දේවල්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකෙදි සත්‍යය එළියට ආවා. "අපි මඟුල දික්කසාද කෙරෙව්වා" කියා මහින්ද රාජපක්ෂ මහත්මයා එක තැනකදී කියා තිබෙනවා මම දැක්කා. ඒක ඇත්තයි. මමත් ඒක පිළිගන්නවා. මහින්ද රාජපක්ෂ මහත්මයා කාගේ හෝ ලණුවක් කාලා, එතුමාට යන්න තිබුණු හොඳ ගමන කා ගත්තා. ඒ වෙලාවේ කුමාර වෙල්ගම මහත්මයා විතරයි කෙළින් හිටියේ. අනික් මිනිස්සු බල තණ්හාවට, කැදරකමට ඇමතිකම් ගන්න එක එක පැත්තට පැන්නා. හැබැයි, අන්තිමට මොකක්ද වුණේ? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දැක්කා නේ, අනික් හැම දෙයක්ම මැඬගෙන රටේ ප්‍රජාතන්ත්‍රවාදය ඉස්සරහට ආපු බව. මේක රනිල් වික්‍රමසිංහ මහත්මයාටවත්, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාටවත්, මහින්ද රාජපක්ෂ මහත්මයාටවත් ලැබුණු දෙයක් නොවෙයි, මිනිසුන්ට ලැබුණු දෙයක්. 2015දී අපි ගෙනාපු ආණ්ඩුවේ වටිනාකම ඒ වෙලාවෙදි තේරුණා. ඒ කියන්නේ, යහ පාලනයේ තිබෙන හොඳකම තේරුණා.

මෛත්‍රීපාල සිරිසේන මහත්මයාත්, රනිල් වික්‍රමසිංහ මහත්මයාත් එකතු වෙලා, "යහ පාලනය" කියන දරුවා බිහි කළා. නමුත් මහින්ද මහත්මයා කියන විධියට මෛත්‍රීපාල සිරිසේන මහත්මයා ඒකෙන් දික්කසාද වුණා. අන්තිමට යහ පාලනය කියන දරුවා රනිල් වික්‍රමසිංහ මහත්මයාට අයිති වුණා. Simple. ඔච්චරයි වුණේ. යහ පාලනය අයිති අපටයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "සිහින මාළිගා" කියා ණය යෝජනා ක්‍රමයක් මේ අය වැය තුළින් හඳුන්වා දී තිබෙනවා. අපේ අජිත් පී. පෙරේරා ඇමතිතුමා ඒ ගැන ලස්සනට විස්තර කළ ආකාරය මම දැක්කා. ඒ යෝජනා ක්‍රමය කොච්චර වටිනවාද? ඒක, අපේ මුදල් ඇමතිතුමාට අපි ගෙන ආ යෝජනාවක්. එතුමා එකහෙළා ඒකට කැමැති වුණා. ඇයි, ඒ? හැම මිනිහෙක්ම රට යන්නේ ගේ හදාගන්න නේ. මේවා පසුගිය ආණ්ඩුවලින් සිදු නොවුණු දේවල්. ඒ නිසා මේවා දරාගන්න අමාරුයි. ඒවා දරා ගන්න අමාරුකමට මෙතුමන්ලා නොයෙකුත් දේවල් කියනවා.

ආචාර්ය එන්.එම්. පෙරේරා මහත්මයා 1964 ජූලි 30වන දා අය වැයක් ඉදිරිපත් කළා. අවුරුදු 17ක් දේශපාලනය කරලා, එක පාරට එතුමාට මුදල් ඇමතිකම හම්බ වුණාම තමයි මේ වැඩේ මොන තරම් අමාරුද කියා එතුමා දැන ගත්තේ. එන්.එම්. පෙරේරා මහත්මයා, කිතුල් ගහෙනුයි, පොල් ගහෙනුයි රා මදින්න පුළුවන්ය කියා අය වැයට යෝජනාවක් ගෙන ආවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා දන්නවාද, "දවස" පත්තරෙන් ඒකට ගැහුවා, "පෙරේ රා" කියා. එම නිසා, මේ විවේචන කියන ඒවා සාමාන්‍ය දේවල්. වින්ස්ටන් චර්චිල් මහත්මයා කිව්වා, "බුරන බුරන බල්ලාට නැවතිලා ගල් ගහන්න ගියොත් තමන්ගේ ගමනාන්තය දක්වා යන්න වෙන්නේ නැහැ" කියා. මම නොවෙයි, වින්ස්ටන් චර්චිල් මැතිතුමායි එහෙම කිව්වේ. හැබැයි, මම විශ්වාස කරනවා, බේමාගේ පුතාට ඒක තේරුණා කියා. බේමාගේ පුතා බුරන බල්ලන්ට ගල් ගහන්න ගියේ නැහැ. "අනේ! උඹ බුර බුරා හිටපන්; උඹ ඔතැනමයි" කියා එතුමා කිව්වා. අපි හැම දාම කිව්වේ, "රැල්ලට බය නම් වැල්ලට එන්නේ නෑ" කියායි. ඒ කථාවේ තේරුම මොකක්ද? මම ඒ කථාව දින 51 කාලයේදී කිව්වා. රැල්ල වැල්ලට ගහනවා. අපි වැල්ලේ හිටගෙන හිටියොත් රැල්ල ගිහිල්ලා ආයෙත් වැල්ලට එනවා. ඔය සමහර වෙලාවට එක්කෙනෙක් දෙන්නෙක් රැල්ලට ගහගෙන යනවා. එහෙම කීපදෙනෙක් ගියා. දැන් සුළියට අහුවෙලා ගිලෙන්න ඔන්න මෙන්න තිබෙන තත්ත්වයක තමයි ඉන්නේ. හැබැයි, අපි ඉන්නේ වැල්ලේ; රැල්ලට අනිවාර්යයෙන් වැල්ලට එන්න වෙනවා; අපි එතැනදී මුණ ගැහෙනවා. බය වෙන්නේ නැතිව හරි වෙලාවට හරි අය වැයක් ගෙනෙනවාය කියා ඒ නිසායි අපි කිව්වේ. අපේ මුදල් අමාත්‍යතුමා ඉතාම දක්ෂ විධියට, හොඳ අය වැයක් සකස් කරලා ඉදිරිපත් කර තිබෙනවා.

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය ලේඛනයක් කියන්නේ, ආප්පයේ මිල කීයද, ප්ලේන්ටියේ මිල කීයද, බනිස් ගෙඩියේ මිල කීයද කියලා කියන එකක්ද? නැහැ. මේවා අපි හදලා තිබෙන ආකල්ප විතරයි. අද මොකක්ද වෙලා තිබෙන්නේ? රටේ ළමයින් අවුරුදු 13ක් තිස්සේ අධ්‍යාපනය ලබනවා. ලංකාවේ ළමයි ලක්ෂ හයක් O/Level විභාගයට ලියනවා. එයින් A/Level විභාගය පාස් වෙන්නේ ලක්ෂ දෙකයි. ලක්ෂ හතරක් මහ පාරේ රැකියා නැතිව ඉන්නවා. දරුවන් තමන්ගේ ළමා කාලයේදී පාසල් නොයන එක තමයි, ජනාධිපතිතුමා කියන මේ කුඩු ප්‍රශ්නයට, දූෂණ ක්‍රියා සිදුවීමේ ප්‍රශ්නයට, ගැන්සි ප්‍රශ්නයට හේතුව. මේ අය වැයෙන් වැඩිම මුදලක් වෙන් කර තිබෙන්නේ පාසල් අධ්‍යාපනය සඳහායි.

අපි රැකියා සඳහා ශ්‍රමිකයන් පිටරට යවනවා. අපි ඒ අය යවන්නේ කිසිම වැදගැම්මකට නැති රැකියාවලටයි. මම ඒක පිළිගන්නවා. ගෘහ සේවිකාවන් හැටියටයි යවන්නේ. ඇයි, ඒ? මේ ළමයි අවුරුදු 16 වෙනකොට ඉස්කෝලෙන් අයින් වෙනවා. විභාග හරියට සමත් වෙන්නේ නැහැ. ඉතින් ගෙදර ගිහින් අවුරුදු 17, 18 වෙනකොට කසාදයක් බැඳ ගන්නවා. ඊට පස්සේ දරු මල්ලන් කරේ ගහගන්නවා. ඊට පස්සේ ජීවත් වෙන්න විධියක් නැහැ. නමුත් දරුවා, තමන්ගේ නියමිත වයසේදී පාසල් ගියා නම් මොකක්ද, තිබෙන වටිනාකම? ජීවිතයේ කොතැනටද යන්න ඕනෑ කියා ඒ දරුවා දන්නවා. ඒ සඳහා ඔහු වෘත්තීය සුදුසුකමක් හදා ගන්නවා. ළමයෙක් පාසලින් එළියට එනකොට වෘත්තීමය සුදුසුකමක් හදලායි අපි ඒ ළමයා මහ පාරට දමන්නේ. අන්න ඒකයි වෙනස. ඉතින් ආප්පයේ මිල කීයද, ප්ලේන්ටි එකක කීයකින් වැඩි වුණාද කියා අහන අතීතයක නම් අපි ඉන්නේ, අපි හරියට ළිඳේ වැටුණු ගෙම්බෝ ටිකක් වාගේ තමයි.

ඔබතුමන්ලා මතක තියා ගන්න, මේ අය වැයෙන් සෞඛ්‍ය සේවය ගොඩ නඟන්න සෑහෙන මුදලක් වෙන් කර තිබෙනවා. ලංකාවේ, අවුරුද්දකට ලක්ෂයක පමණ පිරිසකගේ ඇස් පේන්නේ නැතිව යනවා; අන්ධ වෙනවා. අපි ඒ අයට කාච නිකම් දෙනවා. ඇමෙරිකාවේ අවුරුද්දකට 45,000ක් මැරෙනවා, බෙහෙත් නැතිව. ලංකාවේ මිනිසුන් බෙහෙත් නැතිව මැරෙන්නේ නැහැ. අපි බෙහෙත් නොමිලයේ නේ, දෙන්නේ. අපේ රටේ නිදහස් අධ්‍යාපන ක්‍රමයක්, නිදහස් සෞඛ්‍ය සේවාවක් ක්‍රියාත්මක වෙනවා. බත් දුන් පියවරු, පොත් දුන් පියවරු වාගේම, මේ රටට ප්‍රජාතන්ත්‍රවාදය දුන් රනිල් වික්‍රමසිංහ කියන පියා ඉන්නෙත් අපත් සමඟය කියන එකත් ඔබතුමන්ලා හොඳට මතක තබා ගන්න.

මම, අවංකව කථා කරන මිනිහෙක්. මම කථා කරන්න භය වෙන්නේ නැහැ. මට A/Level වලට තිබුණේ "C" දෙකයි, "S" දෙකයි. නාමල් රාජපක්ෂත් එහෙමයි. එතුමාට, ඒක නැහැය කියන්න බැහැ. ජේවීපී එකේ ලාල්කාන්තගේ දරුවෝත්, අනුර කුමාරගේ දරුවෝත් එහෙමයි. පිට රටවලට ගිහින් තමයි ඒ අය ඉගෙන ගත්තේ. අපේ දෙමව්පියන්ගේ වටපිටාවත්, මොකක් හෝ විධියකින් අපට යමක් කමක් කර ගැනීමට තිබුණු හැකියාවත් නිසා තමයි අපි එහෙම කළේ. හැබැයි, අද මොකක්ද කර තිබෙන්නේ? විශ්වවිද්‍යාල වරම් නොලබන හැම දරුවකුටම මෙවර අය වැයෙන් රුපියල් ලක්ෂ 11ක් දක්වා ණය මුදලක් දෙනවා. ඒ, ලංකාවේ හෝ, පිට රටකට හෝ ගිහින් ඕනෑම අධ්‍යාපන කටයුත්තක් කර ගන්නයි. මම කිව්වා නේ, උසස් පෙළ විභාගයට මුහුණ දෙන ලක්ෂ දෙකක පිරිසෙන් විශ්වවිද්‍යාලවලට යන්නේ 25,000ක් බව. මෙරට විශ්වවිද්‍යාලයකට යන්න වරම් නොලබන දරුවන්ට පිට රටකට යන්න ඉඩ දෙනවා නම්, මේ අය වැය හොඳ නැද්ද, දෙවියනේ!

ඊළඟට කාන්තාවෝ ගැන කල්පනා කර බලන්න. අපි ඒ ගොල්ලන් ගැන සොයා බලනවා මදියි කියායි මට නම් හිතෙන්නේ. හැබැයි, බේමාගේ පුතා කාන්තාවන්ට මාස හතරක ප්‍රසූත නිවාඩු දීලා තිබෙනවා. කාන්තාවන්ට සම අයිතිය ගෙනෙන වැඩ පිළිවෙළක්, ශ්‍රම බලකායට කාන්තාව එකතු කරන වැඩ පිළිවෙළක් මේ අය වැයේ තිබෙනවා. රටක විය යුත්තේ මේවා නොවෙයිද? මේ දේවල් හොඳ නැද්ද? මිනිහෙකුගේ පෞද්ගලික දේවල්වලට කෑ ගහමින් මොර දෙන මේ වාගේ අය පිරිමිත් නොවෙයි, ගැහැනුත් නොවෙයි. ඒ අය මොන වාගේ අයද කියලා කියන්න මම දන්නේ නැහැ. හැබැයි, එහෙම කථා කරන මිනිසුන්ට බේමාගේ පුතා හොඳ පිළිතුරක් දෙමින්, කාන්තාවන්ට සම අයිතිය අරගෙන දීලා තිබෙනවා. අන්න ඒකයි වටින්නේ. මේ යහ පාලන ආණ්ඩුවේ පොඩි පොඩි අඩු පාඩු තිබෙන්න ඇති. කාන්තාවන්ට සම නියෝජනයක් දෙන්න අපි උත්සාහ කළේ නැද්ද? පළාත් පාලන මැතිවරණයට අපි මේ වැඩ පිළිවෙළ ගෙනාවේ නැද්ද? තවමත් පාර්ලිමේන්තුව නියෝජනය කරන්නේ කාන්තාවෝ කී දෙනාද? ඒකයි, අපි කාන්තා "ඉන්ඩෙක්ස්" වල නැත්තේ. අපි මේ සඳහා වැඩ පිළිවෙළක් ගෙනාවා. එහෙම වැඩ පිළිවෙළක් මෙතුමන්ලාට තිබුණාද? ඉවසුවා ඇති ලූ. නොදකින් විතරක්! අපි නම් කියන්නේ ඉවසලා ඇතිම ඇති, යන්නම යන්න කියායි. දැන් නම් යන්න කාලය හරියි කියායි අපි කියන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැයේ තිබෙන යෝජනාවක් අනුව, තෝරා ගත් විෂය ක්ෂේත්‍ර සඳහා උසස් පෙළ විභාගයෙන් ඉහළම ලකුණු ගන්නා ළමයි 14දෙනාට ඔක්ස්ෆර්ඩ්, කේම්බ්‍රිජ්, හාවර්ඩ් වැනි විශ්වවිද්‍යාලවට යන්න වරම් ලැබෙනවා. ඒ අනුව, අපේ සිරිනෝරිස්ගේ පුතාටත් හාවර්ඩ් යන්න අවස්ථාව ලැබෙනවා; සෝමාවතී නැන්දාගේ දුවට කේම්බ්‍රිජ් යන්න අවස්ථාව ලැබෙනවා. ඔබතුමන්ලා මේවාට අකැමැතිද? පිට රට විශ්වවිද්‍යාලවලට යන්න ඕනෑ අපේ දරුවෝ විතරද? ඉතින් මේ අය වැය හොඳ නැහැ කියා කියා කියන්න පුළුවන්ද? කට බොරු කිව්වත්, දිව බොරු කියන්නේ නැහැ කියා කියන්නේ මේ නිසායි.

මගේ මිත්‍ර නාමල් රාජපක්ෂ මන්ත්‍රීතුමාත් කිව්වා, "මේ අය වැය හොඳයි, කෙරෙයිද කියා දන්නේ නැහැ" කියා. මේ විධියට හුල්ලමින් බලෙන් ආණ්ඩු ගන්නකොට කෙරෙන්න විධියක් නැහැ නේ. රැට නාන්න යනකොට එක අගමැති කෙනෙක් ඉන්නවා, නාලා එනකොට තව අගමැති කෙනෙක් ඉන්නවා. ඒ වාගේ "ගේම්" ගහනකොට රටක් සංවර්ධනය වෙයිද? රටක සංවර්ධනයක් තියෙයිද?

මට තිබෙන අනික් ලොකුම ප්‍රශ්නය මෙයයි. මම A/Level කළාය කියා කලිනුත් මම කිව්වා. මම ඊට පස්සේ තව තව ඒවා කළා. හැබැයි, මට පෙනෙන විධියට විපක්ෂයේ ඉන්න අය නම් ගණන් ෆේල්. මොකද, "මේක ඔබතුමන්ලාගේ අවසාන අය වැය" කියලා මේ ගොල්ලන් කියනවා. මේ අය වැය අවසාන අය වැය වෙන්නේ කොහොමද? 2020 වසරේ අගෝස්තු මාසය වන තෙක් මේ ආණ්ඩුව තිබෙනවා. මේ අය ගණන් ෆේල්. මේ අයට ඇඟිලි පහ ගණන් කරගන්නත් බැහැ. අවුරුදු එකයි, දෙකයි, තුනයි කියලා ගණන් කරන්න බැරි ඔළමොට්ටළයෝ ටිකක් මේ ආණ්ඩුව භාර ගත්තොත්, ජනතාවට බුදු සරණයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව එක කාරණයක් කියන්න තිබෙනවා. මහින්ද රාජපක්ෂ මහත්මයා අද උදේ කථා කරද්දී කිව්වා, ඒ ගොල්ලන් ආණ්ඩුව කළේ දවස් 19යි, ඒ දවස් 19ට, ඔක්කොම වැරැදි ඔවුන් පිට දමන්න එපාය කියා. එතුමා අවසාන කැබිනට් රැස්වීම -හොර කැබිනෙට්ටුව- පැවැත්වූයේ කවදාද, SriLankan Airlines එකට සභාපතිවරයෙක් පත් කළේ කවදාද, අවසාන වතාවට හෙලිකොප්ටරයෙන් ගියේ කවදාද, STF එකේ 200ක්, 300ක් එක්ක අවසානයට පාරේ ගියේ කවදාද කියා එතුමාගෙන් මම අහන්න කැමැතියි. එම නිසා, ඔබතුමන්ලා අසත්‍ය දේවල් කියන්න එපා. ඔබතුමන්ලා මෙන්න මේ කාරණය මතක

තබාගන්න. රටක් විනාශ වෙන්න අවශ්‍ය එක වැස්සයි. එක වතාවක් මහා වැස්සක් වැස්සොත් රට සුනේ සුන්. පසුගිය දිනවල අන්න ඒ වාගේ අමුතු වැස්සක් වස්සලා විශාල වශයෙන් මේ රට පසුපසට ගෙන ගියාය කියන එක අපට කවදාවත් අමතක කරන්න පුළුවන්කමක් නැහැ.

මම සංඛ්‍යා ලේඛනවලට යන්න කැමැති නැත්තේ මා මිත්‍ර හර්ෂ ද සිල්වා ඇමතිතුමා මේ සංඛ්‍යා ලේඛන ඉතා හොඳින් එක එක්කෙනාට කියා දුන් නිසායි. නමුත්, මේ ගොල්ලන්ට ඉන්න ආර්ථික ඔස්තාර්ලා කියන සංඛ්‍යා ලේඛන වෙනස්. මට මතකයි, විමල් වීරවංශ මහත්මයා 2013 Budget එකේදී ජයසුන්දර මහත්මයාගේ රෙදි ගැලෙව්ව විධිය. "අවුරුදු දෙකකට පස්සේ නොවෙයි, පහකට පස්සේ මේ කැසට් එක ආයෙත් දමන්න" කියා එතුමා කිව්වා. මම ඒ කැසට් එක එතුමාට දෙනවා. එදා එතුමා කිව්වා, "ජයසුන්දරලා එක්ක ගියොත් මේ රට ආයෙත් දවසක වෙන ආණ්ඩුවකට කරන්න ඉඩ තියන්නේ නැහැ" කියා. අද වෙලා තිබෙන්නේ ඒක නොවෙයිද? මේ වෙලාවේ මේ රටේ වැඩිම ණය කන්දරාව ගෙවන්නේ අපි නොවෙයිද? මේ අපි ගත් ණයද? මේ අයට වැසිකිළියක් හදන්න බැරි වුණාට, වතුර ටිකක් දෙන්න බැරි වුණාට, වරායවල්, ගුවන් තොටුපොළවල් හැදුවා. ඒවායේ විපාක සමහර තැන්වලට වැරදි විධියට ගිහිල්ලා ඒවා කෑවේ අපේ රටේ මිනිසුන්. අපේ රටේ ආදරණීය ජනතාවට මම එක දෙයක් කියනවා. රටේ ජනතාව මේ අය වැය විවාදය බලනවා නම්, එක දෙයක් මතක තබා ගන්න. ජනතාවට මම කියනවා, මේ අය වැයෙන් ප්ලේන්ටි එකේ මිල ගැන දැනගන්න බලාපොරොත්තු වෙන්න එපාය කියලා. ඔබ, අනාගතය අල්ලන්න නැඟිටින්න. ඔබේ දරුවාට අධ්‍යාපනය ලැබෙනවා නම්, ඔබට අවශ්‍ය මූලික අයිතිවාසිකම් ටික ලැබෙනවා නම්, නිදහස් සෞඛ්‍ය සේවාව ලැබෙනවා නම්, තවත් වෙන මොන දේවල්ද අවශ්‍ය වන්නේ? නිකම් මේ සුපින් දේවල්වලට, සතයට දෙකට දෙන ලොසින්ජර කන්න තරම් මෝඩ වෙන්න එපාය කියා ලංකාවේ මිනිසුන්ට මම නැවත වතාවක් මතක් කරනවා.

අපේ නිවාස වැඩ පිළිවෙළ ගැනත් කියන්න ඕනෑ. මේ රටේ මේ වනකොට නිවාස විශාල සංඛ්‍යාවක් හැදීගෙන එනවා. ක්‍රීඩාව පැත්තෙන් ගත්තත් දියුණුවක් දකින්න තිබෙනවා. ක්‍රීඩා අමාත්‍යාංශයේ වැය ශීර්ෂය ගැන කතා කරද්දී මා ඒ ගැන කියන්නම්. ක්‍රීඩකයන්ට ආදරෙයි කියා මහා ලොකුවට කයිවාරු ගැහුවාට එදා ක්‍රීඩාව ගැන බැලුවේ නැහැ. බලෙන් ගිහින් හැම ක්‍රීඩාවක්ම කළා. ලංකාවේ synthetic track එකකට තිබෙන්නේ සුගතදාස ක්‍රීඩාංගණය විතරයි. මහින්ද රාජපක්ෂ ක්‍රීඩාංගණය කියා නම දමා ක්‍රීඩාංගණයක් හැදුවා. එහි track එකත් හිල් වෙලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු මංගල සමරවීර අමාත්‍යතුමා අපේ හැම පළාතකටම කෘත්‍රිම track එකක් හදලා දෙන්න කටයුතු කරනවා. බොරළු ගොඩේ දුවපු ළමයින් සුගතදාස ක්‍රීඩාංගණයට ඇවිල්ලා දුවද්දී, කොහොමද timing එන්නේ? වෙසක් මාසයේ ගිහින් රේස් පැදපු එක නොවෙයි එදා කරන්න තිබුණේ. Racing car එකේ බද්ද අඩු කරන්න නොවෙයි තිබුණේ. ඒවා නොවෙයි මහා ලොකුවට කරන්න තිබුණේ. කරන්න තිබුණේ ගමේ දුවන කොල්ලාට කෘත්‍රිම track එකක් ඔහුගේ ගමේ හදා දෙන එකයි. එදා එහෙම කළේ නැහැ. නමුත්, ඔන්න අපි පළාත් නවයේම කෘත්‍රිම ධාවන පථ නවයක් හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊර්ෂ්‍යාව, විවේචනය, කුහකකම කියන්නේ සාමාන්‍ය දෙයක්. "ඉවසුවා ඇති" කියන එකයි මෙතුමන්ලා කියන්නේ. ඔව්, අපිත් ඉවසුවා ඇති. පවුල් පාලනයට, සුදු වෑන් සංස්කෘතියට, දූෂණයට, බල තණ්හාවට, කැදරකමට, පෙරේතකමට, බලයේ රැඳෙන්න ඕනෑකමට කරපු ඒවා දැක දැක අපිත් ඉවසුවා ඇති. ඒ නිසායි දැන් මා කියන්නේ, "යන්න කාලය හරි. ආයෙත් දේශපාලනය කරන්න එපා." කියා. වෙනත් මිනිහෙකුට අවස්ථාව දෙන්න. අර, කුමාර වෙල්ගම තමයි ඉන්නේ. දෙන්නකෝ එතුමාට පක්ෂයේ නායකත්වය. එහෙම දීලා එතුමාව ඔසවාගෙන යන්න කෝ. එක්කෝ මහින්දානන්ද අලුත්ගමගේට දෙන්න. එතුමා කටකාර, වැඩකාර, හැඩකාර තරුණයා. එතුමාට දෙන්න. එතුමාට ඕනෑ ගේමක් ගහන්න පුළුවන්. හැමදාම මේක තියාගෙන ඉඳීමින් ඔබතුමන්ලා ඉවසුවා ඇති නේද? ඔබතුමන්ලාත් කතා කරන්න. අපටම කියන්න එපා කතා කරන්න කියා. අපිත් කතා කරනවා. සමහර තැන්වලදී අපිත් ඉවසුවා ඇති.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා (සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன - சுகாதாரம், போசணை மற்றும் சுதேச மருத்துவ அமைச்சர்)
(The Hon. (Dr.) Rajitha Senaratne - Minister of Health, Nutrition and Indigenous Medicine)
එහෙම කිව්වේ රාජපක්ෂලාට විතරයි.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඔව්, රාජපක්ෂලාටයි එහෙම කිව්වේ.

**ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ராஜித சேனாரத்ன)
(The Hon. (Dr.) Rajitha Senaratne)
ඒ ගොල්ලන්ට බැහැ එන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමාට තවත් මිනිත්තු දෙකක කාලයක් තිබෙනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසාන වශයෙන් මේ කාරණයත් කියන්න ඕනෑ. මේ අය වැයේ තිබෙන දූර කල්පනා කර ඉතාම දක්ෂ ලෙස හදපු වැඩ පිළිවෙළ ගැන අවංක හදවතින් කතා කරන්න. නමුත් ඔබතුමන්ලා නැවත වතාවක් පෙරේතකමින් කියනවා නේ, "නැහැ, මේ අය පරද්දන්න ඕනෑ. මේ අය ගෙදර යවන්න ඕනෑ." කියා. රටේ මිනිස්සුත් ඔබතුමන්ලාට ද්වේශ වෙච්. එහෙම කියන්න හේතුව මා කියන්නම්. නුවර රැස්වීමෙන්ම ඒ තත්ත්වය පොඩ්ඩ පොඩ්ඩ පෙනෙනවා. නුවර රැස්වීමට ගියාම, බඩු බනිස් වීගෙන එනවා. හැබැයි, මහින්දානන්ද මන්ත්‍රීතුමා බොක්ක දාලා වැඩ කළේ. එතුමාගේ රැස්වීම්වල, සාමාන්‍යයෙන් ගමේ -නාවල පිටියේ- රැස්වීම් පැවැත්වූවාම ඊට වඩා සෙනඟ ඉන්නවා. මොකක්ද වෙන්න යන්නේ? ඔන්න පෙර නිමිති පහළ වෙමින් එනවා. "ඉවසුවා ඇති." කියා මිනිස්සු කියනවා. අන්න ඒක තේරුම් ගන්න. මිනිස්සු ටොකු අනිද්දි තේරුම් ගන්න. ප්‍රජාතන්ත්‍රවාදය වළ පල්ලට දැමුවාම වන දේ තේරුම් ගන්න. අපට ලොකුම ජයග්‍රහණය ලබා දුන් ඔබතුමන්ලාට අය වැය විවාදයේදී හෝ ස්තුතිවන්ත වෙන්න ඕනෑ. අපේ වැරැදි පෙන්වා දීලා, අපේ ඇස් ඇරලා, ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරපු මිනිස්සු අප වටා රොක් වුණා. රට වෙනුවෙන් හඬ නඟන්න පුළුවන් පිරිසක් අද රටේ බිහි වී තිබෙනවා. ඒක තමයි මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාත් රනිල් වික්‍රමසිංහ මහත්මයාත් කසාද බැඳපු එකේ ප්‍රතිඵලය වූ දරුවා. මහින්ද මහත්මයා කියපු විධියට, දික්කසාද කරපු නිසා ඒ දරුවා අද අපට අයිති වුණා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු අමාත්‍යතුමාට තවත් මිනිත්තුවක කාලයක් තිබෙනවා.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා අවසාන වශයෙන් වින්ස්ටන් චර්චිල් මහත්මයා කරපු ප්‍රකාශයක් කියවනවා. මෙය කියවද්දී අපේ මුදල් අමාත්‍යතුමා මේ ගරු සභාවේ සිටියා නම් මා වඩාත් කැමැතියි. වින්ස්ටන් චර්චිල් මහත්මයා සඳහන් කර තිබෙනවා, "All great things are simple, and many can be expressed in single words: freedom, justice, honour, duty, mercy, hope." කියා. මම හිතනවා, අප මේ රට වෙනුවෙන් අවශ්‍ය සියලු දේවල් කර තිබෙනවා කියා. අපේ ආණ්ඩුව, රටේ ජනතාවට අවශ්‍ය නිදහස, යුක්තිය, ගරුත්වය, සේවය සහ විශ්වාසය මේ රටට ලබා දුන් ආණ්ඩුවක්. ඉතින්, අපි විශ්වාස කරනවා මෙවර අය වැයට සහයෝගය ලැබේවි කියා. කොන්ද කෙළින් තියාගෙන සිටින, කාටවත් කඩේ නොයන අය මෙතැන සිටිනවා නම්, අප ඒ අයට කියනවා, ඡන්දය දෙන්න බැරි නම් පොඩ්ඩක් එළියට ගිහින් තේ එකක් බීලා ආවාට අපට ප්‍රශ්නයක් නැහැ කියා. හැබැයි මේ රටේ මිනිසුන් වෙනුවෙන්, රටේ අනාගතය වෙනුවෙන් හදපු අය වැයට ඔබගේ ශක්තිය, දායකත්වය ලබා දෙන්න කියමින් මම නිහඬ වෙනවා. ඔබ සියලුදෙනාටම බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට මිනිත්තු 18ක කාලයක් තිබෙනවා.

[අ.භා.4.56]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පක්ෂයේ නායකත්වය යටතේ පවතින ආණ්ඩුව හතරවන අවුරුද්දට පිවිස, පස්වන අවුරුද්දට පිවිසෙන අය වැය ලේඛනයක් ඉදිරිපත් කර තිබෙනවා. සමස්ත වශයෙන් අය වැය දෙස බලන්නට අප යොමු වන්න ඕනෑ කියන කාරණාව මා පළමුවෙන්ම සඳහන් කරන්න කැමැතියි. රජයක් අය වැය ලේඛනයෙන් අය වැය ලේඛනයට පැමිණ පස්වන අවුරුද්දට පිවිසෙන්නේ පස්වන අය වැය ලේඛනය ඉතාම සුවිශේෂ අය වැය ලේඛනයක් හැටියට දකින්නයි. නමුත් එක්සත් ජාතික පක්ෂයේ පසු ගිය අය වැය ලේඛනත් මේ අය වැය ලේඛනයත් අතර දම්වැලේ පුරුක් වාගේ සම්බන්ධයක් නැහැ. කිසිම සම්බන්ධයක් නැති ගමන් මාර්ගයක යමින් තමයි අමාත්‍යවරයා යළිත් වරක් අය වැය ලේඛනයක් අපට ඉදිරිපත් කරන්නේ.

අද උදේ විපක්ෂ නායකතුමා කථා කළා. මම පළමුවෙන්ම සඳහන් කරනවා. "ආණ්ඩුවේ ඉලක්ක වැරැදියි" කියා. ආණ්ඩුවේ හාම්පුතා වන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලම තම වාර්තාවේ කියනවා, "මේ ආණ්ඩුවට සියයට හතරකට අඩු වර්ධන වේගයක් පමණයි ලබා ගත හැක්කේ" කියා. අපි සමස්ත තත්ත්වය අරගෙන බැලුවොත් මෙවැනි අඩු වර්ධන වේගයකින් දැන් කියන කතන්දර ඔක්කොම කරන්න පුළුවන් කියන මිථ්‍යාව දකින්න කැමැති කොටසක් සිටීවි. එහෙම මිථ්‍යාවක් අපි පසු ගිය අය වැය ලේඛනවලදීත් දැක්කා. නමුත් ඒ ඉලක්කවලට රට පැමිණියේ නැහැ. මේ අය වැය ලේඛනයේදීත් අපි පැමිණෙන්නේ එවැනි ඉතා අඩු වර්ධන වේගයකට බව මම කනගාටුවෙන් වුණත් මේ අවස්ථාවේදී කියන්න ඕනෑ.

දෙවැනි කාරණය මෙයයි. මෙය ඡන්දයට බලපාන අය වැයක් නොවෙයි කියන්න ආණ්ඩුව උත්සාහ දැරුවාට, මේ ආණ්ඩුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් -ඔවුන්ගේ හාම්පුතාලාගෙන්ම- ඉල්ලා සිටපු කොන්දේසිවලින් එකක් තමයි, "ඡන්දයක් තිබෙන නිසා මේ ණය ආදිය ගෙවා ගන්න, අභ්‍යන්තර ප්‍රශ්න විසඳා ගන්න අපිට කල් දෙන්න." කියන කාරණය. ඇයි, එහෙම කොන්දේසි ඉල්ලුවේ? ඒ, ඡන්දයකට මුහුණ දෙන්න සිදුවෙලා තිබෙන නිසයි. ඒ හා සම්බන්ධ යෝජනාවන්, විවිධ අලුත් ප්‍රකාශන ඉදිරිපත් කරන අතරේ මම කනගාටුවෙන් වුණත් මේ කාරණයත් කියන්න කැමතියි. ආණ්ඩුවේ මුද්‍රණාලය බිලියන ගණනින් මුදල් නෝට්ටු අච්චු ගහනවා. මේක තමයි යථාර්ථය -සත්‍යය- වන්නේ. මහ බැංකුවේ අධිපතිතුමාට ඇත්ත කථා කරන්න පුළුවන් නම් "මේ අවුරුද්දට විතරක් කොපමණ මුදල් නෝට්ටු අච්චු ගසා තිබෙනවාද?" කියා ප්‍රකාශ කරන්න කියා මම එතුමාට අභියෝග කරනවා. උද්ධමනයෙන් පිරුණු කාල පරිච්ඡේදයකයි අපි දැන් ගමන් කරන්නේ. උද්ධමනයෙන් පිරුණු කාල පරිච්ඡේදයක අපිට ගමන් කරන්න සිදුවෙලා තිබෙන්නේ ඇයි? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එසේ උද්ධමනයෙන් පිරුණු කාල පරිච්ඡේදයක අපිට ගමන් කරන්නට සිදුවෙලා තිබෙන්නේ එක්සත් ජාතික පක්ෂයට තනිවම ආණ්ඩුවක් ගෙනි යන්න පාර්ලිමේන්තුවේ ඡන්ද නැති නිසයි. එය තමයි සත්‍යය. එක්සත් ජාතික පක්ෂයට තනි ආණ්ඩුවක් තියා ගන්න ඡන්දය නැහැ. ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයට සිදුවී තිබෙනවා, ජිනීවා නුවරට ගොස් අපේ රට යළිත් වරක් පාවා දෙන ගිවිසුමකට පිවිසෙන්න. මේ ආකාරයෙන් තමයි ආණ්ඩුව අය වැය ලේඛනයක් සම්මත කර ගැනීමේ උත්සාහයේ යෙදී සිටින්නේ. පසු ගිය කාල පරිච්ඡේදයේ තිබුණු ජාතික ආණ්ඩු ගිවිසුම ඔක්තෝබර් මාසයේ හමාර කර, ඉන් පස්සේ ජනාධිපතිතුමා විරුද්ධ පක්ෂයේ නායකතුමාට ආණ්ඩුවක් බාර ගන්නට ආරාධනය කර, ආණ්ඩුවක් පිහිටෙව්වා. ඒ ආණ්ඩුවේ හා රටේ කටයුතු යළිත් වරක් අඩපණ කළේ තමුන්නාන්සේලා බව අපි කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වනවිට අපේ රටේ ඇති වී තිබුණු ආර්ථික අර්බුදයේ දරුණුකම පිළිබඳව අපි කවුරුත් දන්නවා. එපමණක් නොව, සැප්තැම්බර් මාසය වනවිට අපේ විදේශ ණයගැති භාවය ඉතා උග්‍රම තත්ත්වයකට පරිවර්තනය වී තිබෙනවා. අපිට මේ අවුරුද්දේ ගෙවන්න තිබෙන ණය ප්‍රමාණයත්, ඉදිරි අවුරුදුවලදී ගෙවන්න තිබෙන ණය ප්‍රමාණයත් ගෙවා ගැනීමට හැකි වන්නේ විදේශ විනිමය උපයා ගැනීමෙන් පමණයි. මේ බව මේ ආණ්ඩුව පත් වුණු වෙලාවේ ඉතා පැහැදිලිව අපි ප්‍රකාශ කළා. තේ සහ රබර්වලින් ලබා ගන්න ආදායම අරගෙන බලන්න. අද තේවලින් පමණයි විශාල විදේශ විනිමයක් උපයා ගැනීමට පුළුවන් වී තිබෙන්නේ. අවුරුදු හතරක ආණ්ඩු වැඩ පිළිවෙළ තුළ අද කුරුඳු වැනි අලුත් වගාවන් එකතු වී තිබෙනවා. එවැනි ආදායම් මාර්ග හැර මේ වනකොට තිබෙන්නේ අපේ ආණ්ඩු කාලයේ වර්ධනය කරන ලද ප්‍රධාන ආදායම වූ,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු මයන්ත දිසානායක මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன் பிறகு, மாண்புமிகு மயந்த திசாநாயக்க அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. MAYANTHA DISSANAYAKE *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, අලුතින් විදේශ විනිමයක් උපයා ගැනීමට හැකි ක්ෂේත්‍රය ගැන අවුරුදු හතරහමාරක් තිස්සේ කල්පනා කරමින් මේ ආණ්ඩුව කාලය නාස්ති කළා.

රටේ අනාගතය පිළිබඳ සිතිය යුතු කාලය තමයි එසේ නාස්ති කළේ. අපේ ශ්‍රී ලාංකිකයන් මැද පෙරදිග වේවා, දකුණු ආසියාවේ වේවා, දකුණු යුරෝපයේ වේවා, නැගෙනහිර ආසියාවේ වේවා ගිහින් උපයන විදේශ විනිමයෙන් එදිනෙදා ජීවිතය ගත කළ හැකි තත්ත්වයක් තමයි අද ඇති වෙලා තිබෙන්නේ. ආර්ථිකයට පිවිසෙන්නට පුළුවන් අලුත් ක්ෂේත්‍රයක් මේ ආණ්ඩුව ගොඩනඟා නැහැ. මේ අය වැය ලේඛනයේත් අනාගතය සඳහා වූ එවැනි වැඩ පිළිවෙළක්, ආර්ථිකයට අලුත් ආදායම් මාර්ග උපයා ගත හැකි ක්ෂේත්‍රයක් ප්‍රකාශ වෙන්නේ නැහැ.

අපි දන්නවා, පසුගිය කාල පරිච්ඡේදයේ සිදු කරන ලද ක්‍රියාදාමය සමඟ ආණ්ඩුවේ බදු ප්‍රතිපත්තිය තවම පොදු ජනතාවගේ කරපිටට වැඩියෙනුත්, එනම් අනියම් බදු මඟින් වරප්‍රසාද ලත් සුළු කොට්ඨාසයට සුළුවෙනුත් පනවන බව. එම ප්‍රතිපත්තියේ වෙනසක් මේ වාරයේත් ඇති වෙලා නැහැ. ඒ වාගේම අද සියයට 20ක් වූ වරප්‍රසාද ලත් පන්තිය සියයට 50ට වඩා ආදායමක් මුළු රටේම නේවාසික ආදායම්වලින් භුක්ති විඳිනවා. මේ අසාධාරණය තමයි දිළිඳුභාවයට හේතු වී තිබෙන බරපතළ ප්‍රශ්නය. ඒකයි යථාර්ථය. මාත් එක්ක මේ සම්බන්ධයෙන් ගරු මුදල් ඇමතිතුමා එකඟ නොවේවි. නමුත් දීර්ඝ කාලයක් හැම ආණ්ඩු කාලයක්ම අපි පසු කරලා තිබෙනවා. ආහාර, නිවාස, වස්ත්‍ර කියන මිනිස් මූලික ඉල්ලීම් තුන සපුරාලන්නට බැරි තත්ත්වයකට අපේ ආර්ථිකය අද වැටී තිබෙන බව මා යළිත් ප්‍රකාශ කරනවා.

පසුගිය කාල පරිච්ඡේදය තුළ උතුරුකරයේ නිවාස 50,000කට වැඩිය ගොඩනැඟුණේ නැහැ කියලා උතුරේම මන්ත්‍රීවරුන් ප්‍රකාශ කරනවා. අවුරුදු 4ක් පැවැති මේ ආණ්ඩු කාලය තුළ ඒ නිවාස ගොඩනැඟීමට බැරි වුණේ, ප්‍රධාන වශයෙන් නිවාස ගොඩනැඟීමට බැරිකම නිසා නොවෙයි, ඒ පිළිබඳව තිබුණු ගිවිසුම් හා ජාවාරම්වල ඕනෑකම නිසායි. අද වනවිට රාජ්‍ය මුදල් විශාල ලෙස නාස්ති කිරීමත්, වංචාවට ගොදුරු කිරීමත් නිසා අපේ රටේ අපතේ යන ජාතික ධනය සියයට 40කට කිට්ටු වෙන බව සියලු විචාරකයන්ගේ වාර්තාවලින් කියැවෙනවා.

මේ අවස්ථාවේදී, තේ කර්මාන්තයේ ඉදිරි පෙළින් සිටින අයගේ ප්‍රකාශයක් කියවන්න මා කැමැතියි. ඔවුන් කියනවා, 300 million kg ඉක්මවා යන ඉලක්කය සපුරාලන අලුත් වැඩ පිළිවෙළකට පිවිසෙන්න තවම තේ කර්මාන්තයේ අපේ තිබෙන ජාත්‍යන්තර කීර්ති නාමය පාවිච්චි කරන්නේ නැහැ කියලා. කෙන්යාව වාගේ රටවල් දැන් ඒ ඉලක්ක පසුකර ගිහිල්ලා තිබෙනවා. ඒ, අපට පසුව තේ කර්මාන්තය ආරම්භ කළ රටවල්. එවැනි අලුත් වැඩ පිළිවෙළක් අප රට තුළ නිර්මාණය කර ගැනීමේ ඕනෑකම මේ අය වැය ලේඛනයෙන් ඉදිරිපත් වෙලා නැහැ. "ගම්පෙරළිය", "Enterprise Sri Lanka" ආදි වැඩසටහන් ප්‍රකාශයට පත් කළත්, ඒ සියල්ල ණය පිළිබඳ ප්‍රකාශ කරන කාරණායි ගරු කථානායකතුමනි.

මට වේලාව නැති නිසා මේ කරුණු කෙටියෙන් සඳහන් කරන්න මා කැමැතියි. අපේ රටට පැමිණි එක්සත් ජාතීන්ගේ නියෝජිත පැබ්ලො බොහොස්ලැස්කි -Pablo Bohoslavsky- ප්‍රකාශ කර තිබෙනවා, ක්ෂුද්‍ර මූල ණය දෙන ආයතන සියල්ල වහාම මධ්‍යම බැංකු පාලනයට ගන්න කියලා. මේක අලුත් ප්‍රශ්නයක් නොවෙයි. ගිය අවුරුද්දේ සිට වර්ධනය වෙමින් තිබෙන උග්‍ර ප්‍රශ්නයක්. ගරු ඇමතිතුමනි, මේ වනවිට රුපියල් බිලියන 263ක් ක්ෂුද්‍ර මූල්‍යාණය දී තිබෙනවා, මිලියන 3ක් වූ ජනතාවට. එයින් රුපියල් බිලියන 165කට වැඩි ප්‍රමාණයක් ක්ෂුද්‍ර මූල්‍ය ණය ගොඩට එකතු වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ක්ෂුද්‍ර මූල්‍ය ණය දෙන ඒ ආයතන කිහිපය තවමත් පාලනය කර ගන්නට බැරි තත්ත්වයේ තිබෙන්නේ. උතුරේ ණය කපා හැරීම සිදු වන වනවා. මධ්‍යම බැංකුවේ හරියාකාරව ඉදිරිපත් වෙච්ච වාර්තා අරගෙන බැලුවොත් පෙනේවි, ක්ෂුද්‍ර මූල්‍ය ණය ප්‍රමාණය බිලියන සියයෙන් සියයට 84ක්ම අරගෙන තිබෙන්නේ කාන්තාවන් බව. ගෙයින් ගෙය ණය වී තිබෙන මේ රටට අලුත් විසඳුමක් දීමට ඔබතුමන්ලාගේ අය වැය ලේඛනයට බැරි වී තිබෙනවා. "Enterprise Sri Lanka" ණය වැඩසටහන ගැන, "ගම්පෙරළිය" යනාදි යෝජනා ගැන ඔබ කථා කරනවා. නමුත්, අද ණයවල ගැටිලා, හිර වෙලා ඉන්න සමස්ත ජනතාවට ඒ ණය බරෙන් ගොඩ එන්නට පුළුවන් මාර්ගයක් වෙන්නේ නැහැ. අද නිර්දේශ වී තිබෙන මේ මහා මංකොල්ලය පාලනය කිරීමට පියවර ගැනීම සඳහා වහාම අවතීර්ණ නොවුණොත් අපේ රටේ ග්‍රාමීය ණයගැතිභාවයේ බරපතළම ප්‍රශ්නය වෙනදාටත් වැඩිය උග්‍ර ප්‍රශ්නයක් බවට පත් වනවා. ඒ සමඟම සමාජ අසාධාරණකම, සමාජ තර්ජන වැඩි වී අපේ ග්‍රාමීය හා අනෙකුත් ප්‍රදේශවල ජීවත් වන ජනතාවට සමාදානයෙන් ජීවත් වෙන්නට බැරි අවිනිශ්චිත ජීවිත තත්ත්වයකට පරිවර්තනය වීමේ භයානක ක්ෂේත්‍රයකට හැරෙනවා.

ගරු ඇමතිතුමනි, ණය දීමේ ක්‍රමවේද පාලනය කර ගන්නට අවශ්‍ය පියවර නොගත්තොත් ඔබතුමා විවිධ කාරණා කිව්වාට අපේ රට යළිත් වරක් පත් වෙන්නේ දිළිඳුභාවය වැඩිවීමේ අර්බුදයටයි. ඒ පිළිබඳව වැඩ පිළිවෙළක් නොමැතිව, මේ රට අර්බුදකාරී තත්ත්වයක තිබියදී, අපට මේ අය වැය ලේඛනයට පක්ෂ වෙන්න කියලා කියන කථාවේ අර්ථය කුමක්ද කියලා අපි අහනවා.

ඔබතුමන්ලා රටේ සමස්තය දිහා නොබලා ඉදිරිපත් කරපු හැම අය වැය ලේඛනයෙන්ම විවිධ යෝජනා ඉදිරිපත් කළා. මම ආණ්ඩුවෙන් අහනවා, Sri Lanka Sustainable Development Act, No. 19 of 2017 හි තිබෙන නීති ප්‍රකාරවද, අමාත්‍යාංශ වැඩ කරන්නේ කියලා. අමාත්‍යාංශවලට නියම කරලා තිබෙන ආකාරයටද කටයුතු කරන්නේ? මෙම පනතේ 12 වන වගන්තිය උල්ලංඝනය කරන ආකාරයේ බරපතළ තත්ත්වයකට පත් වී තිබෙනවා, ගරු කථානායකතුමනි.

Section 12 of the Sri Lanka Sustainable Development Act, No. 19 of 2017, states, I quote:

> "12. (1) Every ministry, department, provincial council, provincial ministry and department and local authority shall prepare the Sustainable Development Strategy relevant to the scope of such ministry, department, provincial council, provincial ministry and department and local authority in accordance with the National Policy and Strategy on Sustainable Development within a period of one year from the date of approval under subsection (6) of section 11 by the Parliament."

මේ පිළිබඳ කිසිදු පැහැදිලි සඳහනක් අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කර නැහැ. මෙවර අය වැයෙන් එහෙන් මෙහෙන් විවිධ දේවල් බෙදා දීමට උත්සාහ දැරුවත් පවතින ප්‍රශ්නයට විසඳුමක් දී නැහැ. ඒකෙන් පෙන්නුම් කරන්නේ, විසඳුමක් දෙන්නට හැකියාවක් නොමැති අර්බුදයක ඉන්න බවයි.

අපේ ආනයන වැඩි වී තිබෙන ප්‍රමාණය බලන්න. ගරු කථානායකතුමනි, 2017 වන කොට යූඑස් ඩොලර් මිලියන 21,000කට ආනයන වියදම ඉහළ ගිහින් තිබෙනවා. ඒ අපේ රටේ ආනයනය වියදම. නමුත්, අපට අපනයනය කර ලබා ගන්නට

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

පුළුවන් වෙලා තිබෙන්නේ එයින් හරි අඩක් පමණයි. අනවශ්‍ය ද්‍රව්‍ය අපේ රටට ආනයනය කිරීමෙන් වටිනා විදේශ විනිමය අපට අහිමි වනවා. අය වැය සකස් කිරීමේදී මේ සම්බන්ධව හරියාකාර වැඩ පිළිවෙළක් ඉදිරිපත් කර නැති බව සඳහන් කරන්න ඕනෑ. ඔබතුමන්ලා ගමෙන් ගමට ණය දීමට යෝජනා කරනවා. විවිධ දේවල්වලට ණය දෙන්න යෝජනා කර තිබෙනවා. නමුත්, එහි අවසාන ප්‍රතිඵලය මොකක්ද? අපට ඇති ප්‍රධාන අර්බුදය වන අපේ ආනයන වියදම පියවා ගැනීම සඳහා ණය ගැනීමට සිදු වනවා.

මේ අවුරුද්දෙත් -2019දී- ආණ්ඩුවට දැවැන්ත ණය කන්දරාවක් ලබා ගන්න සිද්ධ වනවා. එන අවුරුද්දේදී -2020දී- මීට වඩා බරපතළ තත්ත්වයකට ණය අර්බුදය පත් වනවා.

මගේ හිතමිත්‍ර හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු වූ ඩිව් ගුණසේකර මැතිතුමාගේ ලිපිය මට කියවන්න වෙලාවක් නැහැ. එම ලිපිය "ඇත්ත" පත්තරයේ පළ වෙලා තිබෙනවා. එතුමා මෙවර අය වැය හඳුන්වා තිබෙන්නේ, "ණය වැයක්" හැටියටයි. එවැනි ණය වැයකින් ගොඩ එන්නට බැරි අර්බුදයකට අද අපි පත් වී තිබෙනවා. එම නිසා මේ අසාර්ථක අය වැය ලේඛනය ප්‍රතික්ෂේප කිරීමෙන්, -[බාධා කිරීමක්] අද, දවස ගණනේ ඇති වෙන ජීවන වියදමේ වැඩිවීමට විසඳුමක් නැති බව ඩොලරයට රුපියල 180ට බාල්දුවීම වේගයෙන් ඔප්පු වී හමාරයි. අපේ විදේශ විනිමය සංචිතයට ඔරොත්තු නොදෙන අර්බුදයකට,ණය උගුලකට මේ ආණ්ඩුව තව තවත් අපේ රට ගෙන යන වැඩ පිළිවෙළක් පමණයි මෙහි තිබෙන්නේ. අද දේශපාලන අස්ථාවරභාවයකට රට පැමිණ තිබෙනවා. ආණ්ඩුවේ අස්ථාවරභාවයෙන් ගොඩ එන්න ප්‍රජාතන්ත්‍රවාදයට තර්ජනය කරන තත්ත්වයකට පරිවර්තනය වී තිබෙනවා. පාර්ලිමේන්තුව දිහා බැලුවත්, අද පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගි වෙන්නේ නැහැ. අද මහජන ඡන්දයක් පවත්වන්නේ නැති, පළාත් සභා රාශියක ඡන්දය පවත්වන්නේ නැති ආණ්ඩුවක් බවට මේ ආණ්ඩුව පත් වෙලා තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදයට ආයුබෝවන් කියන්න සැරසෙන බරපතළ තර්ජනයකට ආණ්ඩුව ගමන් කරන්න පෙර, ආණ්ඩුව ගෙදර යැවීම සඳහා මේ අය වැය ලේඛනය ප්‍රතික්ෂේප කිරීමට අපි කටයුතු කරමුයි කියන එක මම සඳහන් කරන්න කැමතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

බොහොම ස්තුතියි ගරු මන්ත්‍රීතුමා. මීළඟට, ගරු මංගල සමරවීර ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 30ක කාලයක් තිබෙනවා.

[අ.භා.5.14]

**ගරු මංගල සමරවීර මහතා (මුදල් අමාත්‍යතුමා)**
(மாண்புமிகு மங்கள சமரவீர - நிதி அமைச்சர்)
(The Hon. Mangala Samaraweera - Minister of Finance)

ගරු කථානායකතුමනි, අපේ දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා ඇත්තවශයෙන්ම කථා කළේ අවුරුදු පහ හයකට කලින් මැරිලා ඉපදුණු පුංචි බබෙක් වාගේයි. විශේෂයෙන්ම මේ රටේ ක්ෂුද්‍ර මූල්‍ය ණය මාෆියාව ඇති කරපු ඒ ආණ්ඩුවේ හිටපු ප්‍රබල ඇමතිවරයෙක් අද ක්ෂුද්‍ර මූල්‍ය ණය වෙනුවෙන් කිඹුල් කඳුළු හෙළනවා. මම මේ ගැන කියන්න වැඩි වෙලාවක් ගන්න කැමති නැහැ. අපේ ආණ්ඩුව ක්ෂුද්‍ර මූල්‍ය ණය පාලනය කිරීම සඳහා විධිමත් වැඩ පිළිවෙළක් මේ වෙනකොටත් ආරම්භ කරලා තිබෙනවා. තමුන්නාන්සේලාගේ කාලයේ මහ බැංකුවේ අධිපතිව සිටි අජිත් නිවාඩ් කබ්රාල් තමන්ගේ ඥාති හිතමිත්‍රයන්ට, ගෝලයන්ට මේ අවස්ථාව ලබා දීලා මේ රටේ ජීවත් වෙන අහිංසකම කාන්තාවන් ඉතාමත්ම අසීරු තත්ත්වයකට දැම්මා. ඒ නිසා තමයි මීට මාසයකට පමණ ඉස්සෙල්ලා අපි තීන්දුවක් අරගෙන පළමුවෙනි අදියර හැටියට නියභය තිබුණ දිස්ත්‍රික්ක 13ක, විශේෂයෙන්ම දිළිඳුම කාන්තාවන් 45,000කගේ ණය අපි කපා හැරියේ. තමුන්නාන්සේලා අවුරුදු 10ක් මේ රට පාලනය කළා. මම අහන්න කැමතියි, මේ වාගේ දෙයක් කරන්නවත් ඒ කාලයේ තමුන්නාන්සේලා හිතුවාද කියලා. ඒ වාගේම මම කනගාටු වනවා, හිටපු මුදල් ඇමතිතුමා, ඒ වාගේම අර දින 52දීත් බලහත්කාරයෙන් ඇවිල්ලා මගේ පුටුවේ වාඩි වුණු මුදල් ඇමතිතුමා -[බාධා කිරීම්] වර්තමාන විපක්ෂනායකතුමා, අර බලහත්කාරයෙන් අගමැති පුටුවේ වාඩි වෙච්ච මා මිත්‍ර -මම බොහොම ආදරය කරන කෙනෙක්- මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා කථා කරන අවස්ථාවේ මට සභාවේ ඉන්න බැරිවුණා. ඒක අඩුවක්. අද කැබිනට් මණ්ඩල රැස්වීමක් තිබුණ නිසා මම එතැනයි හිටියේ. ඇත්තවශයෙන්ම දිනේෂ් ගුණවර්ධන මැතිතුමාගෙන් මම ඉල්ලා සිටිනවා මීට පස්සේ අපේ හිටපු ජනාධිපතිතුමාගේ -වර්තමාන විපක්ෂනායකතුමාගේ- කථා එතුමාට කියවන්න දෙන්න ඉස්සෙල්ලා හොඳට පරීක්ෂා කර බලන්න කියලා. ලියලා දෙන්නේ කවුද කියලා මම දන්නේ නැහැ. ඔක්කෝම තිබුණේ එතුමාව අමාරුවේ දාන්න පුළුවන් පට්ටපල් බොරු. [බාධා කිරීම්] ඒ සඳහා කවුරු හරි යොදවන්න ඕනෑ. මොකද, ඒක අපටත් ලජ්ජාවක්. අපේ වර්තමාන විපක්ෂනායකතුමා, මොනවා වුණත් මේ රටේ අවුරුදු 9ක් ජනාධිපති වෙලා හිටපු එතුමා හැමදේම කිව්වේ පටලවාගෙනයි. මම ඒ එකින් එකට උත්තර දෙන්න යන්නේ නැහැ. උදාහරණයක් හැටියට කියන්නම්, මේ රටේ විරැකියාව වැඩි වෙලා ලු.

නමුත්, මුලින්ම මම කියන්නම් සේවා නියුක්තිය ගැන. සේවා නියුක්තිය 2015න් පස්සේ මිලියන හතේ සිට අටයි දශම ගණනක් දක්වා වැඩි වෙලා තිබෙනවා.

ඊළඟට රටේ සම්පත් සූරා කාපු, තම සාක්කු පුරවා ගත්ත ගජමිතුරු කල්ලියේ නායකයෝ අද ඇවිල්ලා කියනවා, ආර්ථික වාසි ගන්න අපි රට පාවා දීලා, GSP Plus සහනය යළි වතාවක් ලබා ගත්තා කියලා. ගරු කථානායකතුමනි, සුදු වැන් සංස්කෘතිය නවත්වන එක රට පාවා දීමක්ද කියලා මම අහනවා. ජනමාධ්‍යවේදීන් අමු අමුවේ මරණ එක නැවැත්වීම රට පාවා දීමක්ද කියලා මම අහනවා. මේ රටේ දෙමළ, මුස්ලිම්, සිංහල ජනතාවගේ සමගිය ගැන කථා කිරීම රට පාවා දීමක්ද කියලා මම අහනවා. මොකද, මෙතුමන්ලා නැති කර ගත්ත ඒ GSP Plus සහනය අපට ලබා ගන්න පුළුවන් වුණේ අපි මේ රටට ප්‍රජාතන්ත්‍රවාදය, සංහිඳියාව සහ සංවර්ධනය ගෙනාපු නිසායි. අපි කරපු එකකින්වත් යුරෝපා සංගමයේ කාටවත් වාසියක් වෙලා නැහැ. වාසිය ලැබිලා තියෙන්නේ අපටයි. උදාහරණයක් හැටියට අපි 2015 ආණ්ඩුවට පත් වන කොට ලංකාවෙන් යුරෝපයට මත්ස්‍ය අපනයනය කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරලායි තිබුණේ. නමුත්, අපි සාකච්ඡා කරලා එය යළි ලබා ගත්ත නිසාම ධීවර නිෂ්පාදන ආනයන මේ වසර තුනේදී සියයට 143කින් වැඩි වෙලා තිබෙනවා. මම අහනවා මිත්‍රවරුනි, ධීවර ජනතාවගේ එදිනෙදා ජීවත් වීමේ ක්‍රියාවලිය වඩාත් ශක්තිමත් කිරීම රට පාවා දීමක්ද කියලා. ඒ විතරක් නොවෙයි. පසුගිය කාලය තුළ පිට රටට භාණ්ඩ අපනයනය කිරීම ඉතාම සාර්ථකයි. මට මෙතැනදී ඉදිරිපත් කරන්න සියලු සංඛ්‍යා ලේඛන නැති වුණත්, පසුගිය අවුරුදු දෙක තුළදී විතරක් ජර්මනියට අපනයනය කිරීම් සියයට 14කින් වැඩි වෙලා තිබෙනවා; නෙදර්ලන්තයට අපනයනය කිරීම් සියයට 17කින් වැඩි වෙලා තිබෙනවා.

ගරු කථානායකතුමනි, ඒ වාගේම තවත් විවිධ අදහස්, යෝජනා, චෝදනා මේ දින හය තුළදී ඉදිරිපත් කළා. යෝජනාවක් වුණත්, චෝදනාවක් වුණත් පසුගිය 05වැනි දා අය වැය ඉදිරිපත් කළාට පසු ගත වුණු මේ දින හය තුළදී ආණ්ඩු පක්ෂයේ සහ විපක්ෂයේ අදහස් දැක්වූ සියලු දෙනාටම මම ස්තුතිවන්ත වෙන්න ඕනෑ. මා එකින් එකට උත්තර නොදුන්නත්, පොදු කාරණා කිහිපයකට මම උත්තර දෙන්න කැමැතියි.

විශේෂයෙන් ගරු අනුර දිසානායක විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා -[බාධා කිරීම්]සමා වෙන්න, හිටපු ප්‍රධාන සංවිධායකතුමා. දැන් කවුද? [බාධා කිරීම්] ඔබතුමන්ලා සැරින් සැරේට වෙනස් කරනවානේ. අපේ ජනතා විමුක්ති පෙරමුණේ නායකතුමාත්, දවස් 52කට මගේ පුටුවේ වාඩි වුණු මහින්ද රාජපක්ෂ මැතිතුමාත් කියා තිබුණා, මේ වතාවේ International Sovereign Bond - ISB - එකට අපට තායිලන්තයටත්, ග්‍රීසියටත් වඩා පොලිය ගෙවන්න වුණා කියලා. ඒකේ පොඩි ඇත්තක් තිබෙනවා. මොකද, මහින්ද රාජපක්ෂ උන්නැහේගේ බල කෑදරකම නිසා, අර දවස් 52 කුමන්ත්‍රණය නිසා ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම තුළ ලංකාව පහතට හෙළුවා.

Standard & Poor's, Fitch Group, Moody's කියන ආයතන තුනම, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව, අර හොර ආණ්ඩුව, කුමන්ත්‍රණකාරී ආණ්ඩුව ආපු විගස අපේ ratings පහළ දැම්මා. එහෙම පහළට දමපු ගමන්, ණය ගන්න පොලිය තිබුණාට වඩා සියයට 3කින් විතර වැඩි වුණා. නමුත්, අපේ රජය යටතේ යළි වතාවක් එය සාමාන්‍ය තත්ත්වයට ඇවිල්ලා, මේ වෙන කොට තිබුණු තත්ත්වයට වඩා සියයට එකහමාරක් විතර වැඩියෙන් තිබෙනවා. ඒ දවස් පනස්දෙකේ කුමන්ත්‍රණය නිසා තමුන්නාන්සේලාගේ බලලෝභී, අවස්ථාවාදී කුමන්ත්‍රණය නිසා අපේ රටට බිලියන 6.4ක් දළ වශයෙන් අහිමි වෙලා තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්. හරි නම්, ඒ මුදල අය කරගන්න ඕනෑ. හරි නම් අය කරගන්න ඕනෑ!

ඊට පස්සේ තවත් කාරණා කියා තිබෙනවා. මම ඒ හැම එකක් ගැනම කියන්න යන්නේ නැහැ. හැබැයි, මෙතැනදී මම මේ කාරණය කියනවා. අවුරුදු 9ක් තිස්සේ ආර්ථිකය විනාශ කරපු අපේ විමල් වීරවංශ කථා කළා. "ආර්ථික ඝාතකයා" කියන වචනය එතුමා නිර්මාණය කළා. අන්න ඒ ආර්ථික ඝාතකයෝ ඒ දවස් පනස්දෙකේදී යළි වතාවක් ආර්ථිකය ඝාතනය කරපු හැටි තමයි මම පෙන්වා දුන්නේ. හැබැයි, එතුමා දැන් ඇවිල්ලා බොහොම ලස්සනට අපට බණ කියනවා.

ගරු කථානායකතුමනි, මෙවර අය වැය ඉදිරිපත් කළේ "Vision 2025" - පොහොසත් රටක් යන තේමාව යන සමාජ ආර්ථික සංවර්ධන දැක්මට අනුවයි. එහි තවත් ඉදිරි පියවර විධියට, ව්‍යවසායක හැකියාවෙන් යුක්ත ජාතියක් ලෙස ශ්‍රී ලාංකිකයන්ගේ හැකියාවට අත්වැලක් සැපයීම තමයි අපේ මේ දර්ශනය සහ අය වැයේ ප්‍රධාන අරමුණ වෙන්නේ. පැහැදිලිව කියනවා නම්, මේ රටේ සමස්ත ජනතාව රජයේ හෝ ආණ්ඩුවේ යැපෙන්නන් බවට පත් කරන්න අපට ඕනෑකමක් නැහැ. ඒ නිසා තමයි, සෑම පුද්ගලයෙකුටම ස්වාධීනව ගොඩනැගෙන්න අවශ්‍ය පරිසරයක් නිර්මාණය කරන්නයි අපි උත්සාහ දරන්නේ. මෙය කාට හරි තේරුම් ගන්න බැරි නම්, අපට කරන්න දෙයක් නැහැ. නමුත්, අප රජයේ දර්ශනය වී ඇත්තේ, නොමිලේ කෑමවේලක් දීලා ඔවුන් සතුටු කරනවා වෙනුවට, ඔවුන්ට ජීවන මාර්ගයක් හදා දීලා යම් හැකියාවක් ලබා දීමයි.

රටේ ආර්ථික සංවර්ධනය පිළිබඳ කිසිම දැක්මක් නැති අය කරන චෝදනාවක් තමයි, මෙවර අය වැයේ සහන මල්ලක් නැහැයි කියන එක. ඔව්, ඇත්තටම මේ අය වැයේ සහන මල්ලක් නැහැ. මට ඒ අයට කියන්න තිබෙන්නේ, හාල් සේරුවක් හරි, ටකරමක් හරි දීලා ආර්ථිකය ගොඩගන්න බැහැ කියලායි. අපි අවුරුදු හැත්තෑවක් තිස්සේ දැක්කා, ඒ හදන වහල් මානසිකත්වය නිසා රට කොයිතරම් අගාධයට ගියාද කියලා. අපට වහල් හිමියෝ වෙන්න ඕනෑකමක් නැහැ. අපි "Enterprise Sri Lanka" වැඩසටහන හඳුන්වා දුන්නේ කොන්ද කෙළින් තියාගෙන, කාටවත් සෙකන්ඩ් නොවන, ලෝකයාත් සමඟ ඉදිරියට යන්න පුළුවන් ශ්‍රී ලාංකීය ජාතියක් ඇති කරන්නයි.

විශේෂයෙන්ම පටු ගෙම්බන්ගේ මානසිකත්වයෙන් රට මුදාගෙන, පුංචි ළිඳේ ඉන්න මහ ගෙම්බාගේ මානසිකත්වයෙන් රට මුදාගෙන, මේ රටේ අපේ දූ දරුවන්ට ලැබිය යුතු වාසනාවන්ත අනාගතය ලබා දීමයි මේ අය වැයේ ප්‍රධාන කාරණාව.

ඒ වාගේම, ගොවීන්ට, කෘෂි කර්මාන්තයට, ධීවරයන්ට කිසිවක් ලබා දීලා නැහැ කියා තිබුණා. මේ දින කිහිපය තුළ මේ කාරණය නිතර නිතර පොහොට්ටුවේ මහත්වරුන්ගෙන් කියැවුණු බව මම දැක්කා.

ඒකෙන් කියන්නේ, අඩුම ගණනේ එහෙම කියන්න ඉස්සෙල්ලා මේ අය වැය ලේඛනය කියවලාවත් නැහැ කියන එකයි. මෙවර අය වැයයෙන් කෘෂිකර්මාන්තය හා ධීවර කටයුතු සඳහා බිලියන 87ක් වෙන් කර තිබෙනවා. වාරිමාර්ග සංවර්ධනය සඳහා එයින් බිලියන 65ක ලබා දෙනවා. මම තමුන්නාන්සේලාගෙන් අහනවා, මේ තරම් මුදලක් ගොවියාට වෙන් කළ කාලයක් මීට පෙර තිබිලා තිබෙනවාද කියලා. තියෙනවා නම්, කරුණාකර මේ සභාවට ඇවිත් අපට ඒක පෙන්වන්න.

ඊට අමතරව සුළු පරිමාණයේ ගොවීන්ට උසස් තත්ත්වයේ භෝග වගාවට අවතීර්ණ වීම සඳහා අවශ්‍ය තාක්ෂණය හා දැනුම ලබා දීම පිණිස රුපියල් මිලියන 250ක් වෙන් කර තිබෙනවා. මෙම ගොවීන් සමඟ විශාල සමාගම් සම්බන්ධ කරන අතර, එමගින් එම නිෂ්පාදන දේශීය හා විදේශීය වෙළෙඳපොළට අලෙවි කිරීමේ හැකියාව ඇති කරනවා. අපේ ආණ්ඩුව ඉදිරි කාලයේදී මඩේ ඉන්න ගොවියාගේ ඒ මඩ සෝදා ජාත්‍යන්තර වෙළෙඳපොළේ ව්‍යවසායකයෙක්, ව්‍යාපාරිකයෙක් බවට පත් කරන බව කියන්න ඕනෑ.

අස්වනු ගබඩා කිරීමට පහසුකම් නොමැතිව කෘෂිකාර්මික නිෂ්පාදන විනාශ වීම නිසා ගොවීන්ට විශාල වශයෙන් ආදායම් අහිමි වීමක් සිදු වෙනවා. රජය විසින්, දේශගුණය පාලනය කළ හැකි ගබඩා සැකසීම සඳහා රුපියල් බිලියන 400ක ආයෝජනයක් සිදු කරන අතර, ඒවා කළමනාකරණය සඳහා පෞද්ගලික අංශයට ආරාධනා කරන බව මම එදා අය වැය කථාවේදී කිව්වා. එම නිසා ගොවීන්ගේ අස්වැන්න විනාශ නොවීම හේතුවෙන් අස්වැන්නට හොඳ මිලක් ලබා ගන්නට පුළුවන්.

එසේම "Enterprise Sri Lanka" යටතේ කෘෂිකර්ම ක්ෂේත්‍රයේ ඉන්න ජනතාවට ණය යෝජනා ක්‍රම රාශියක් තිබෙනවා. "රන් අස්වනු" තුළින් සියයට 7 පොලියට වසර 7ක් දක්වා ගෙවීමේ කාලයට යටත්ව රුපියල් මිලියන 5 දක්වා ණය ලබා දෙනවා. ව්‍යාපාරික කෘෂිකර්මාන්තය සඳහා සියයට 7ක පොලියට මිලියන 300 සහ මිලියන 750 දක්වා ණය මුදලක් වසර 7ක් දක්වා ගෙවීමට අපි ලබා දෙනවා. "ගොවි නවෝදා" කුඩා ණය යෝජනා ක්‍රමයෙන් රුපියල් ලක්ෂ 5 දක්වා සියයට තුනහමාරක සහන පොලියක් මත ලබා දීමට කටයුතු කරනවා. ගොවි මහත්වරුන්ගෙන් අහනවා, තමුන්නාන්සේලාට මතක කාලයක මේ තරම් සහන කිසිම ආණ්ඩුවකින් ලබා දුන්නාද කියලා.

ධීවර වරායන් අලුත්වැඩියා කරන්න බිලියන 1.3ක් -මිලියන 1300 ක්, පේදුරුතුඩුවේ සහ පේසාලේ නව වරායන් දෙකක් සහ මන්ඩතිව්හි නව නැව් නැවතුම් තොටුපොළක් ඉදි කරනවා. ඒ වාගේම RSW / CSW ක්‍රම මගින් ධීවර කර්මාන්තයේ යෙදෙන බහුදින ධීවර යාත්‍රා සඳහා උසස් තත්ත්වයේ මත්ස්‍ය ගබඩා ස්ථාපනය කිරීම හා යාත්‍රා අධීක්ෂණය කිරීමේ ආරක්ෂක පද්ධතිය ස්ථාපනය කිරීම සඳහා රජය සියයට 50 ක දායකත්වයක් දරනවා. මේ සඳහා රුපියල් මිලියන 300ක් වෙන් කරන බව එදා මම ප්‍රකාශයට පත් කළා.

[ගරු මංගල සමරවීර මහතා]

ඒ වාගේම, වාහන මිල ඉහළ යෑම ගැනත් විවිධ ආකාරයේ විග්‍රහ තිබුණා. අද සුඛෝපභෝගී වාහනවලට තමයි මේ වැඩිම බලපෑම සිදු වී තිබෙන්නේ. පසුගිය සමයේ පොඩි වාහන 'සුනාමියක්' වාගේ ලංකාවට ආවා. ඒ නිසා traffic වැඩි වුණා. අපේ මුදල් විදේශ වෙත වැඩි වැඩියෙන් ඇදී ගියා. නමුත්, වැඩිම පෞද්ගලික රථ සංඛ්‍යාවක් මිලදී අරගෙන තිබෙන්නේ අපේ ආණ්ඩුව කාලයේ බව මේ සංඛ්‍යාලේඛනවලින් පෙන්වනවා. නමුත් ඒ නිසා රුපියලටත් යම් බලපෑම් ආවා. ඒ නිසා සියයට 200ක cash margin එකක් දාන්න සිද්ධ වුණා. නමුත් මම සතුටුයි කියන්න, ඒ cash margin එක පසුගිය සිකුරාදා සිට යළි වතාවක් සම්පූර්ණයෙන්ම අපි ඉවත් කර තිබෙන බව.

ඒ වාගේම අපි වාහන permit සම්බන්ධයෙනුත් කියන්න ඕනෑ. ඒ වෙලාවේ රුපියල පහත වැටීමේ ප්‍රවණතාව නවත්වාගන්නට permitවලට යම් තහංචියක් දැම්මා. නමුත්, එම තහංචියත් අපි ඉවත් කරන්න ලැහැස්තියි. මොකද, මේ වන විට රුපියල ස්ථාවර වෙලා විතරක් නොවෙයි, යළිත් වතාවක් රුපියල appreciate වෙනවා. මේ මාස දෙකේදී විතරක් රුපියලේ අගය සියයට දෙකහමාරකින් විතර වැඩි වෙලා තිබෙනවා. අන්න ඒ නිසා අපි දාපු තහංචිය,-

As our currency is stabilizing we have decided to relax the restriction of importation of motor vehicles by public servants under the concessionary permit scheme on the following way. Retired public servants who have obtained the concessionary permits will be allowed to import their motor vehicles effective from 1st May.

විශ්‍රාමික permit holdersලාගේ permits මැයි මාසයේ පළමුවැනිදා සිට යළිත් වතාවක් ක්‍රියාත්මකයි. ඒ වාගේම රජයේ සේවයන්ගේ permits ගැනත් කියන්නම්.

Public servants who have obtained the concessionary permits will be allowed to import their respective motor vehicles stage by stage on first come first out basis effecting from 1st June of this year. In this regard my Ministry will issue the guidelines before the end of this month, March 2019.

අන්තර්ජාල වෙළෙඳාම සඳහා සියයට 3.5ක බදු වැඩි කිරීම ගැනත් කියැවුණා. සියයට 3.5ක NBT අය කරනු ලබන්නේ අන්තර්ජාලය භාවිත කරමින් විදේශ රටකින් භාණ්ඩ මිලදී ගැනීම සඳහා පමණයි. උදාහරණයක් විධියට අන්තර්ජාලය හරහා චීනයෙන් භාණ්ඩයක් මිලදී ගත්තොත්, එහෙම නැත්නම් Facebook මඟින් වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය කළොත්, මේ බද්ද අය කරනවා. නමුත්, දේශීය භාණ්ඩ මිලදී ගැනීමේ දී මෙම බද්ද කිසිසේත්ම අය කරන්නේ නැහැ. උදාහරණයක් හැටියට ලංකාවේ තිබෙන Takas.lk වැනි ආයතනයෙන් දුරකථනයක් ගත්තොත් ඒ සඳහා මෙම බද්ද අය කරන්නේ නැහැ. සියයට 3.5ක් වන මෙම NBT බද්ද අය කරනු ලබන්නේ, දැනට විදේශ මිලදී ගැනීම් සඳහා අය කරනු ලැබූ සියයට 2.5ක මුද්දර ගාස්තුව වෙනුවටයි. එබැවින්, මෙම බද්ද නිසා credit cards මඟින් සිදු කරනු ලබන විදේශ මිලදී ගැනීම් සඳහාත් ඇත්තෙන්ම වැඩි වෙන්නේ සියයට 1ක් පමණයි. ඒ වාගේම අපි කියන්න ඕනෑ, ලංකාවේ Uber වගේ taxi සේවා තිබෙනවා. Uber ටැක්සිවල ආදායම කෙළින්ම යන්නේ පිට රටවලට. ලංකාවේ එවැනි ආයතනයක් තිබෙන්නේ PickMe ආයතනය විතරයි. එම නිසා පිට රට යන එම ආදායමෙන් යම් මුදලක් කෙළින්ම අපේ රටට ලබා ගන්නට පුළුවන් වෙනවා.

කාමර 5කට වඩා වැඩි නිවාස පමණක් නවාතැන් සඳහා අන්තර්ජාලය ඔස්සේ සංචාරකයන්ට ලබා දිය හැකි බව කිව්වා. සංචාරක ක්ෂේත්‍රයේ සිදු කරනු ලබන අවිධිමත්භාවයන් ක්‍රමයෙන් විධිමත් කිරීම සඳහා උනන්දු කිරීමක් මෙම යෝජනාව මඟින් සිදු කරනු ලබනවා. 2020 අප්‍රේල් මාසයේ දී කාමර 5කට වඩා වැඩියෙන් තිබෙන හෝටල් අන්තර්ජාලය හරහා වෙන් කිරීම සඳහා ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරියේ ලියා පදිංචි කරනු ඇත. කාමර 5කට අඩු හෝටල් එසේ ලියා පදිංචි කිරීමක් අවශ්‍ය නැහැ. ඒකෙන් කියන්නේ නැහැ, ඒ ගොල්ලන්ට ඔවුන්ගේ හෝටල් කරගෙන යන්න බැහැ කියලා. කාමර 5කට වඩා අඩු නම්, සාමාන්‍ය පරිදි ව්‍යාපාර කරගෙන යන්න පුළුවන්. [බාධා කිරීමක්] ගරු සුමේධා ජී. ජයසේන මන්ත්‍රීතුමියනි, ඔබතුමියටත් හොඳ ලස්සන හෝටලයක් තිබෙනවා. ඒ සඳහාත් අපි උදවු කරන්නම්. Enterprise Sri Lanka හරහා එන්න, අපි උදවු කරන්නම්.

රජයේ සේවකයන්ගේ වැටුප් වැඩිවීම ගැන කොයි තරම් කථා කළත් මදි. තමුන්නාන්සේලා ඒවා ගැන වචනයක්වත් කථා කරන්නේ නැහැ.

මේ රටේ රජයේ සේවකයන්ට තමන්ගේ පඩිය සියයට 107කින් වැඩි වුණු තවත් යුගයක් තිබුණා නම්, කරුණාකරලා කියන්න. වසර තුනකදී සියයට 107කින් වැටුප් වැඩි වුණා. ඒ සියයට 107 වැඩි කරලා, අලුත් කොමිෂන් වාර්තාව සකස් කර සූදානම් වනතුරු, තවත් රුපියල් 2,500ක දීමනාවක් ලබා දෙන්න අපි දැන් යෝජනා කර තිබෙනවා. එදා මම කිව්වා වාගේ කාර්යාල කාර්ය සහයක වැටුප රුපියල් 11,730 සිට 21,740 දක්වා අවුරුදු තුනක් ඇතුළත වැඩි වුණා. ගුරුවරයෙකුගේ වැටුප රුපියල් 16,000 සිට රුපියල් 29,000 දක්වා අවුරුදු තුනක් ඇතුළත වැඩි වුණා. අමාත්‍යාංශ ලේකම්වරයෙකුගේ වැටුප රුපියල් 40,000 පමණ සිට රුපියල් 88,000 දක්වා අවුරුදු තුනක් ඇතුළත වැඩි වුණා.

මම එදා කිව්වා වාගේ තමුන්නාන්සේලා අවුරුදු නවයක්ම කළේ තුන්වේලටම හමුදාව විකුණාගෙන කාපු එකයි. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව පැවතුණේ හමුදාව විකුණාගෙන කාලයි. අදත් විපක්ෂයේ තමුන්නාන්සේලා පැවතෙන්නේ ඒ අය විකුණාගෙන කාලයි. හමුදාවේ කී දෙනෙක් එවකට සිටි ආරක්ෂක ලේකම්වරයා හමුවී කී වතාවක් ඉල්ලුවාද, "අනේ සර්, අපේ මේ දීමනා ටික වැඩි කරලා දෙන්න" කියලා. ඒ අයට ඒවා අමතක නම්, ඒ අය හමු වුණු දින ටික ඉදිරිපත් කරලා මට තවත් දවසක විවාදයක් කරන්න පුළුවන්. අවුරුදු 20ක් තිස්සේ කවුරුවත් මේ අයට ඇහුම් කන් දුන්නේ නැහැ. නමුත්, මම එදාත් කිව්වා වාගේ අද අපි කමාන්ඩෝ දීමනාව රුපියල් 1,000 සිට 5,000 දක්වා, ගෙවල් කුලී දීමනාව සියයට සියයකින්, නිල ඇඳුම් දීමනාව රුපියල් 255 සිට රුපියල් 600 දක්වා, රණවිරු දීමනාව රුපියල් 175 සිට රුපියල් 350 දක්වා වැඩි කරන්නට යෝජනා කරලා තිබෙනවා. මේවාට පිළිතුරු නැති වෙනකොට, ඊළඟට මොකක්ද කිව්වේ? මම මගේ නිල කාමරයේ ඉඳගෙන තමුන්නාන්සේලාගේ කථා දිගටම වාගේ අහගෙන සිටියා. සමහර අය කියන්න පටන් ගත්තා, "අනේ! පොලීසියට මොකුත් දීලා නැහැ නේ" කියලා. ඊට පසුව පොලීසිය වෙනුවෙන් නහයෙන් අඬන්න පටන් ගත්තා. පොලීසියට මේ වතාවේ දුන්නේ නැහැ තමයි. හැබැයි, අපි 2016 වර්ෂයේ දී, දැනට වසර දෙකකට ඉස්සෙල්ලා ඒ අයගේ වැටුප සියයට 40කින් වැඩි කළා. ඒ වැඩි කළේත් අපිමයි. වෙන කවුරුවත් නොවෙයි. ඒ වාගේම 2016දී පොලීසියේ සියලුදෙනාගේම සංයුක්ත දීමනාවත් වැඩි කළා.

" 'එන්ටර්ප්‍රයිස් ශ්‍රී ලංකා' ණය දීමේ ක්‍රමවේදයට ලස්සන, ආකර්ෂණීය නම් ටිකක් දැම්මා පමණයි. රටේ මුදල් ඇමතිවරයා

ඉන්නේ ණය යෝජනා ක්‍රම හදන්නට නොවෙයි" කියලා මේ රටේ බිහි වුණු දූෂිතම මහ බැංකු අධිපති වූ කබ්රාල් කියනවා. දූෂිතම කියලා මම කියන්නේ කරුණු ඇතිවයි. දැන් ඒ ගැන කථා කරන්න බැහැ. අවශ්‍ය නම් අපි ඒ ගැනත් වෙලාවක කථා කරන්න විවාදයක් දෙමු.

ව්‍යාපාර පටන් ගන්න වාණිජ බැංකුවලින් ණය ගත්තාම පොලිය ඉතා ඉහළයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි තුනක කාලයක් තිබෙනවා.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Sir, can I have another few more minutes, please?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Do you want another ten minutes

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
Yes, thank you. ඒ වාගේම දේපළ ඇපයට තියලා තමයි ණය ගන්න වෙන්නේ. බොහෝ බැංකුවලට යන්නත් අපේ තරුණයන් බයයි. ඇතුල් වුණු වේලාවේ ඉඳන් ඒ අයගේ උත්සාහය තිබෙන්නේ බැංකු ණය දෙන්න නොවෙයි, නොදෙන්නයි. අන්න ඒ නිසා තමයි ආණ්ඩුවක් හැටියට අපි ඒ දරුවන්ගේ ණය බරට කර ගහන්නේ. පොලියෙන් සියයට 100 සිට සියයට 75, සියයට 50 දක්වා කර ගහලා මේ රට තුළ අලුත් ව්‍යවසායකයන් ලක්ෂයක් නිර්මාණය කිරීම වරදක්ද කියලා මම අහන්න කැමැතියි.

වැසිකිළි ප්‍රශ්නය ගැන මම නැවත මතක් කරන්නේ නැහැ. ඒ තරම් දියුණු දිස්ත්‍රික්කයක ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් වැසිකිළි නැතිව ඉන්නවා. අපේ හිටපු මුදල් ඇමතිතුමාගේ දිස්ත්‍රික්කය.

හම්බන්තොට දිස්ත්‍රික්කයට බිලියන ගණනක් වියදම් කළා. නමුත්, ඒවාට අපියි මුදල් වෙන් කර තිබෙන්නේ. මනුෂ්‍යයන් ජීවත් වෙන රටකට අනිවාර්යෙන්ම මහ පාරවල් ඕනෑ, අධිවේගී මාර්ග ඕනෑ. නමුත්, ඒ සියල්ලටම ඉස්සර වෙලා සාමාන්‍ය මනුෂ්‍යයාගේ මූලික පහසුකම් ටික ලබා දෙන්න ඕනෑ. බස් නැවතුම්පොළවල්වල, දුම්රිය ස්ථානවල තිබෙන වැසිකිළිවලට ගියාම ඒවා නරකාදි වාගෙයි. තමුන්නාන්සේලා, අපි ගොඩක් කාලෙකින් බස්වල ගියේ නැති නිසා මේවා තේරෙන්නේ නැහැ. නමුත්, හැමදාම බස් එකේ යන මිනිසුන්ට හදිසියකට තමන්ගේ ඒ අවශ්‍යතාව ඉටුකරගන්න යන්න පුළුවන් තැනක් නැහැ. අන්න ඒ නිසා තමයි, බිලියන 9කට ආසන්න මුදලක් මේ සඳහා වෙන් කර තිබෙන්නේ. ඒ කථාව ඇහුවාට පස්සේ, ඊයේ Bar Association එකේ අලුත් සභාපති කාලිංග ඉන්ද්‍රතිස්ස මහත්මයාගේ නියෝජිතයන් ඇවිල්ලා, ඒ අයගේත් ඉල්ලීමක් මට ඉදිරිපත් කළා. ඒ අය කියනවා, "ලංකාවේ උසාවිවල තිබෙන්නේත් ඔය තත්ත්වයමයි" කියා. උසාවියකට ගිහිල්ලා හිටගෙන ඉන්න වුණාම හරි අපහසුයි. මම තවමත් කුරුඳු පොලු නඩුවට මාස 3කට සැරයක් උසාවියට යන නිසා මම ඒ ගැන දන්නවා. මම තවමත් උසාවියේ සාක්ෂි කූඩුවට නඟිනවා. මම නම් ඒ වාගේ දවස්වලට Imodium අරවා මේවා ඔක්කෝම ගහලායි යන්නේ. මොකද, වැරැදිලාවත් bathroom යන්න වුණොත් අමාරුවේ වැටෙනවා. අපේ සාමාන්‍ය ජනතාව අද මේ දුක විඳිනවා. අපේ තලතා අතුකෝරල ඇමතිතුමිය මට අද මුළු ලංකාවේම උසාවිවල ලැයිස්තුව දුන්නා. කාන්තාවන්ට, පිරිමින්ට සහ ආබාධිත පුද්ගලයන්ට ආදී වශයෙන් වෙන වෙනම ඒ උසාවිවලටත් නව වැසිකිළි අපි මේ එක්කම හදනවා.

ඊළඟට, ක්‍රීඩා ක්ෂේත්‍රය ගැන කථා කළා. පසුගිය අය වැය විවාදයේදී මම කළ කථාවේ පොඩි අඩුවක් වුණා. ඒක අය වැයට ඇතුළත් කරන්න බැරි වුණා. ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමා තමන්ගේ කථාවේදී කිව්වා, ලංකාවේ පළාත් නවයට ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණ නවයක් හදනවාය කියා. ඇත්ත වශයෙන්ම ඒ සඳහා වැඩ පටන් ගන්න විතරක් දැනට මිලියන 300ක් වෙන් කර තිබෙනවා. කොලොන්නාවේ වීරසිංහ මල්ලිමාරච්චි ක්‍රීඩාංගණයත්, මාතලේ බර්නාඩ් අලුවිහාරේ ක්‍රීඩාංගණයත් ඒ යටතේ සංවර්ධනය වෙනවා. ඊට අමතරව තවත් රුපියල් මිලියන 700ක් අපි ලබා දීලා තිබෙනවා. නමුත්, ඒක කියැවුණේ නැහැ.

ඊළඟට, ළමා ඉතිරි කිරීම් මත බදු අය කිරීම පිළිබඳවත් දැන් කථා බහක් තිබෙනවා. එම කථාවත් විශාල වශයෙන් විකෘති කරලා දැන් කියනවා, ළමා ඉතිරිකිරීමේ ගිණුම්වලට; රුපියල් 5,000කට වැඩි ඒවාට පොලී අය කරනවාය කියා. ලංකාවේ ගිණුම් ආශ්‍රිත බදු ගණනය කිරීම සිදු වන්නේ මාසික පොලී ආදායම රුපියල් 5,000ට වැඩි නම් විතරයි. මාසික පොලී ආදායම රුපියල් 5,000ට වැඩි වෙන්න නම්, ඒ account එකේ ඒ ගිණුමේ අවම වශයෙන් රුපියල් ලක්ෂ 12ක්වත් තිබෙන්න ඕනෑ. මේක පොහොසත් බබාලාටයි බලපාන්නේ. තමුන්නාන්සේලාගේ බබාලාගේ නම් ගිණුම්වල මුදල් ඇත්තේ ඇමෙරිකන් ඩොලර්වලින් නේ. මාසයකට රුපියල් 5,000කවත් පොලියක් ලැබෙන්න නම්, බැංකු ගිණුමේ ලක්ෂ 12කට වඩා තිබෙන්න ඕනෑ. ඒකෙනුත් අපේ බදු ක්‍රමය අනුව ඉතාම අඩු පොලියක් පැනවෙන්නේ. මේ කථාව දැන් සම්පූර්ණයෙන්ම විකෘති කරලා තිබෙනවා. මේ විධියට, තමුන්නාන්සේලා විවිධාකාර දේවල් කිව්වා.

මම මුලින් කිව්වා වාගේ, මෙතුමන්ලා එල්ල කළ චෝදනා, ඉදිරිපත් කළ යෝජනා ආදී සියල්ලටම මම ස්තුතිවන්ත වෙනවා. තවත් සංශෝධන කීපයක් අය වැය තුන්වන වර කියැවීමේ විවාදයේදී ඉදිරිපත් කරන්න මම බලාපොරොත්තු වෙනවා. එතෙක්, මේ කථාවට සවන් පිළිබඳව තමුන්නාන්සේලා සියලුදෙනාටම මාගේ ස්තුතිය පිරි නමමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
බොහොම ස්තුතියි. විසර්ජන පනත් කෙටුම්පත, 2019 දෙවන වර කියැවීම, සභාව එකඟද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
Divide!

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the division bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මන්ත්‍රීතුමන්ලාට ඡන්දය දීම ආරම්භ කරන්න පුළුවන්. ඡන්දය ලබා දීමට අපහසුතාවක් තිබෙනවා නම් කරුණාකර අත ඔසවන්න. අපි ඒ සම්බන්ධයෙන් පහසුකම් ලබා දෙනවා.

***(මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.)***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර සියලු දෙනාම වාඩි වෙන්න. ඡන්දය දීමට අපහසු වුණු ගරු මන්ත්‍රීතුමන්ලා එක එක්කෙනා ඒ බව සඳහන් කරන්න ඕනෑ. ගරු සාලින්ද දිසානායක මැතිතුමා.

**ගරු සාලින්ද දිසානායක මහතා**
(மாண்புமிகு சாலிந்த திசாநாயக்க)
(The Hon. Salinda Dissanayake)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මැතිතුමා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து)
(The Hon. Johnston Fernando)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ටී.බී. ඒකනායක මැතිතුමා.

**ගරු ටී. බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු එස්.එම්. චන්ද්‍රසේන මැතිතුමා.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මැතිතුමා.

**ගරු ලක්ෂ්මන් යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் யாப்பா அபேவர்தன)
(The Hon. Lakshman Yapa Abeywardena)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විමලවීර දිසානායක මැතිතුමා.

**ගරු ඩී.ටී.ඩබ්ලිව්. විමලවීර දිසානායක මහතා**
(மாண்புமிகு டீ.ரீ.டபிள்யு. விமலவீர திசாநாயக்க)
(The Hon. D.T.W. Wimalaweera Dissanayaka)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පියල් නිශාන්ත ද සිල්වා මැතිතුමා.

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා**
(மாண்புமிகு பியல் நிசாந்த த சில்வா)
(The Hon. Piyal Nishantha De Silva)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මැතිනිය.

**ගරු පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය**
(மாண்புமிகு (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி)
(The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු සම්පන්දන් මැතිතුමා.

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)
ஆம்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා.

**ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා**
(மாண்புமிகு அநுர பிரியதர்ஷன யாப்பா)
(The Hon. Anura Priyadharshana Yapa)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුතු සිවලිංගම් මැතිතුමා.

**ගරු මුතු සිවලිංගම් මහතා**
(மாண்புமிகு முத்து சிவலிங்கம்)
(The Hon. Muthu Sivalingam)
ஆம்.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
මගේ වම් පැත්තේ වෙනත් ගැටලුවක් තිබෙනවාද? නැහැ නේ. මගේ දකුණු අත පැත්තේ ඡන්දය දීමට බැරි වූ අය සිටිනවාද? ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මැතිතුමා.

**ෆීල්ඩ් මාර්ෂල් ගරු සරත් ෆොන්සේකා මහතා**
(பீல்ட் மார்ஷல் மாண்புமிகு சரத் பொன்சேகா)
(Field Marshal Hon. Sarath Fonseka)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ඩී.එම්. ස්වාමිනාදන් මැතිතුමා.

**ගරු ඩී.එම්. ස්වාමිනාදන් මහතා**
(மாண்புமிகு டி.எம். சுவாமிநாதன்)
(The Hon. D.M. Swaminathan)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු කේ.කේ. පියදාස මන්ත්‍රීතුමා.

**ගරු කේ.කේ. පියදාස මහතා**
(மாண்புமிகு கே.கே. பியதாஸ)
(The Hon. K.K. Piyadasa
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු ෆවුසි මැතිතුමා?

**ගරු ඒ.එච්.එම්. ෆවුසි මහතා**
(மாண்புமிகு ஏ.எச்.எம். பௌஸி)
(The Hon. A.H.M. Fowzie)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු පියසේන ගමගේ මැතිතුමා.

**ගරු පියසේන ගමගේ මහතා**
(மாண்புமிகு பியசேன கமகே)
(The Hon. Piyasena Gamage)
පක්ෂයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව-***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***(මේ අවස්ථාවේ පහත සඳහන් නම් සහ ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.)***
*( இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்தின் டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டன.)*
*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 114: විරුද්ධව 73 වැළකී සිටි 0 යනුවෙන් බෙදුණේය.***
*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 114; எதிராக 73; விலகியிருந்தோர் 0.*
*According to Electronic Voting, Parliament divided: Ayes 114: Noes 73: Abstain 0.*

| | |
|---|---|
| G 001. Rauff Hakeem | Yes |
| G 002. Mangala Samaraweera | Yes |
| G 003. Gamini Jayawickrama Perera | Yes |
| G 004. John Amaratunga | Yes |
| G 005. Gayantha Karunatileka | Yes |
| G 006. Lakshman Kiriella | Yes |
| G 007. Ranil Wickremesinghe | Yes |
| G 009. Tilak Marapana | Yes |
| G 010. Wajira Abeywardana | Yes |
| G 011. Ravi Karunanayake | Yes |
| G 012. Rajitha Senaratne | Yes |
| G 013. Rishad Bathiudeen | Yes |
| G 014. Patali Champika Ranawaka | Yes |
| G 015. Kabir Hashim | Yes |
| G 016. Sajith Premadasa | Yes |
| G 017. Akila Viraj Kariyawasam | Yes |
| G 018. Malik Samarawickrama | Yes |
| G 019. Mano Ganesan | Yes |
| G 020. Navin Dissanayake | Yes |
| G 021. J.M. Ananda Kumarasiri | Yes |
| G 022. P. Harrison | Yes |
| G 023. R.M. Ranjith Madduma Bandara | Yes |
| G 024. Arjuna Ranatunga | Yes |
| G 025. Palany Thigambaram | Yes |
| G 026. Chandrani Bandara | Yes |
| G 027. Thalatha Atukorale | Yes |
| G 028. Abdul Haleem | Yes |
| G 029. Sagala Ratnayake | Yes |
| G 030. Harin Fernando | Yes |
| G 031. Daya Gamage | Yes |
| G 032. Ravindra Samaraweera | Yes |
| G 033. Sujeewa Senasinghe | Yes |
| G 034. Harsha De Silva | Yes |
| G 035. Ajith P. Perera | Yes |
| G 036. V.S. Radhakrishnan | Yes |
| G 037. Ruwan Wijayawardene | Yes |
| G 038. Lucky Jayawardana | Yes |
| G 039. Ameer Ali Shihabdeen | Yes |
| G 040. Dilip Wedaarachchi | Yes |
| G 041. Niroshan Perera | Yes |
| G 042. A.D. Premadasa | Yes |
| G 043. Wasantha Aluwihare | Yes |
| G 044. Vijayakala Maheswaran | Yes |
| G 045. Eran Wickramaratne | Yes |
| G 046. Ranjith Aluvihare | Yes |
| G 047. J.C. Alawathuwala | Yes |
| G 048. Vadivel Suresh | Yes |
| G 049. Faizal Cassim | Yes |
| G 050. Ranjan Ramanayake | Yes |
| G 051. Ashok Abeysinghe | Yes |
| G 052. H.M.M. Harees | Yes |
| G 053. Seyed Ali Zahir Moulana | Yes |
| G 054. Ajith Mannapperuma | Yes |
| G 055. Edward Gunasekara | Yes |
| G 056. Anoma Gamage | Yes |
| G 057. Karunarathna Paranawithana | Yes |
| G 058. Palitha Kumara Thewarapperuma | Yes |
| G 059. Nalin Bandara Jayamaha | Yes |

| | |
|---|---|
| G 060. Buddhika Pathirana | Yes |
| G 061. Abdullah Mahrooff | Yes |
| G 063. Piyasena Gamage | Yes |
| G 064. Lakshman Senewiratne | Yes |
| G 065. Wijith Wijayamuni Zoysa | Yes |
| G 068. Vasantha Senanayake | Yes |
| G 069. Indika Bandaranayake | Yes |
| G 070. Palitha Range Bandara | Yes |
| G 071. M.S. Thowfeek | Yes |
| G 072. Manusha Nanayakkara | Yes |
| G 073. Sirinal de Mel | Yes |
| G 074. Anura Sidney Jayarathne | Yes |
| G 076. Lakshman Ananda Wijemanne | Yes |
| G 077. A. A. Wijethunga | Yes |
| G 078. Hector Appuhamy | Yes |
| G 079. Sisira Kumara Abeysekara | Yes |
| G 080. Thushara Indunil Amarasena | Yes |
| G 081. A. Aravindh Kumar | Yes |
| G 082. Velu Kumar | Yes |
| G 083. Nalaka Prasad Colonne | Yes |
| G 084. Chandima Gamage | Yes |
| G 085. Kavinda Heshan Jayawardana | Yes |
| G 086. Mylvaganam Thilakarajah | Yes |
| G 087. Mayantha Dissanayake | Yes |
| G 088. Sujith Sanjaya Perera | Yes |
| G 089. Hirunika Premachandra | Yes |
| G 090. Bandula Lal Bandarigoda | Yes |
| G 091. M. Ibrahim Muhammad Mansoor | Yes |
| G 092. S.M. Marikkar | Yes |
| G 093. Imran Maharoof | Yes |
| G 094. Ishak Rahuman | Yes |
| G 095. Mujibur Rahuman | Yes |
| G 096. Harshana Rajakaruna | Yes |
| G 097. Thusitha Wijemanna | Yes |
| G 098. Rohini Kumari Wijerathna | Yes |
| G 099. Chaminda Wijesiri | Yes |
| G 100. Hesha Withanage | Yes |
| G 101. Sandith Samarasinghe | Yes |
| G 102. Chathura Sandeepa Senaratne | Yes |
| G 103. Wijepala Hettiarachchi | Yes |
| G 104. Ashu Marasinghe | Yes |
| G 105. Jayampathy Wickramaratne | Yes |
| G 106. Mohamadu Nazeer | Yes |
| G 107. S.M. Mohamed Ismail | Yes |
| G 115. Indika Anuruddha Herath | No |
| O 002. Sumedha G. Jayasena | No |
| O 003. W.D.J. Senewiratne | No |
| O 005. Dinesh Gunawardana | No |
| O 007. Chamal Rajapaksa | No |
| O 008. Mahinda Rajapaksa | No |
| O 010. Arumugan Thondaman | Yes |
| O 011. Pavithradevi Wanniarachchi | No |
| O 012. Salinda Dissanayake | No |
| O 013. Wimal Weerawansa | No |
| O 015. A.D. Susil Premajayantha | No |
| O 016. Gamini Lokuge | No |
| O 017. Rajavarothiam Sampanthan | Yes |
| O 018. Mavai S. Senathirajah | Yes |
| O 019. Anura Dissanayake | No |
| O 022. Anura Priyadharshana Yapa | No |
| O 023. Bandula Gunawardana | No |
| O 026. Janaka Bandara Tennakoon | No |
| O 027. C.B. Ratnayake | No |
| O 029. Mahinda Yapa Abeywardena | No |
| O 030. Dilan Perera | No |
| O 031. Keheliya Rambukwella | No |
| O 032. Kumara Welgama | No |
| O 033. Dullas Alahapperuma | No |
| O 034. Johnston Fernando | No |
| O 037. Dharmalingam Sithadthan | Yes |
| O 039. Nihal Galappaththi | No |
| O 040. Vijitha Herath | No |
| O 041. S.M. Chandrasena | No |
| O 042. Mahindananda Aluthgamage | No |
| O 044. Piyankara Jayaratne | No |
| O 045. Vasudeva Nanayakkara | No |
| O 046. Lakshman Yapa Abeywardene | No |
| O 048. Rohitha Abeygunawardana | No |
| O 050. Chandima Weerakkody | No |
| O 053. Udaya Prabhath Gammanpila | No |
| O 054. Susantha Punchinilame | No |
| O 056. Premalal Jayasekera | No |
| O 057. K. Thurairetnasingam | Yes |
| O 058. Seeniththamby Yoheswaran | Yes |
| O 059. Sunil Handunnetti | No |
| O 060. Bimal Rathnayake | No |
| O 063. Sudarshini Fernandopulle | No |
| O 065. Sriyani Wijewickrama | No |
| O 067. Siripala Gamalath | No |
| O 068. Duleep Wijesekara | No |
| O 069. S.C. Mutukumarana | No |
| O 070. Lakshman Wasantha Perera | No |
| O 071. Nishantha Muthuhettigamage | No |
| O 073. Arundika Fernando | No |
| O 074. Tharanath Basnayake | No |
| O 075. Nimal Lanza | No |
| O 076. Anuradha Jayaratne | No |
| O 077. S. Shritharan | Yes |
| O 079. M.A. Sumanthiran | Yes |
| O 080. Nalinda Jayathissa | No |
| O 084. Ananda Aluthgamage | No |
| O 085. S. Viyalanderan | No |
| O 088. Jayantha Samaraweera | No |
| O 089. P. Udayashantha Gunasekara | No |
| O 090. Dilum Amunugama | No |
| O 091. Mohan Priyadarshana De Silva | No |
| O 092. T. Ranjith De Zoysa | No |
| O 093. Ramesh Pathirana | No |

| | |
|---|---|
| O 094. Vijitha Berugoda | No |
| O 095. Roshan Ranasinghe | No |
| O 096. Lohan Ratwatte | No |
| O 097. Kaveendiran Kodeeswaran | Yes |
| O 098. I. Charles Nirmalanathan | Yes |
| O 100. S. Sivamohan | Yes |
| O 101. Namal Rajapaksa | No |
| O 102. Janaka Wakkumbura | No |
| O 103. Vidura Wickramanayaka | No |
| O 104. Thenuka Vidanagamage | No |
| O 105. Shehan Semasinghe | No |
| O 106. Kanaka Herath | No |
| O 107. D.V. Chanaka | No |
| O 108. Sisira Jayakody | No |
| O 110. Sanath Nishantha Perera | No |
| O 111. S. Premarathna | No |
| O 112. Tharaka Balasuriya | No |
| O 113. Shanthi Sriskandarasa | Yes |
| O 114. Prasanna Ranatunga | No |
| O 115. Prasanna Ranaweera | No |
| O 116. Kachana Wijesekara | No |

*Electric Voting Results*

| | |
|---|---|
| YES | 114 |
| NO | 73 |
| ABSTAIN | 00 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Order, please! ගරු මන්ත්‍රීතුමන්ලා කිව්වා, "නම් සඳහන් වුණේ නැහැ." කියා. එයින් බොහෝ නම් ගණනක් සඳහන් වෙලා තිබෙනවා. නම් සඳහන් නොවී තිබුණේ, ටී.බී. ඒකනායක මැතිතුමා. [ඝෝෂා කිරීම්] Order, please! පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. නම් සඳහන් වෙලා තිබුණේ නැත්තේ, විරුද්ධව ඡන්දය දුන් ගරු ටී.බී. ඒකනායක මැතිතුමා; ගරු විමලවීර දිසානායක මැතිතුමා; ගරු පියල් නිශාන්ත මැතිතුමා සහ පක්ෂව ඡන්දය දුන් ගරු මුතු සිවලිංගම් මැතිතුමා; ගරු සරත් ෆොන්සේකා මැතිතුමා; ගරු ඩී.එම්. ස්වාමිනාදන් මැතිතුමා; ගරු කේ.කේ. පියදාස මැතිතුමා සහ ගරු ඒ.එච්.එම්. ෆවුසි මැතිතුමාගේයි. අනෙක් සියලු දෙනාගේම නම් සඳහන් වෙලා තිබුණා.

ඒ අනුව එම මන්ත්‍රීතුමන්ලාගේත් ඡන්ද ඇතුළත්ව පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 119යි; විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 76යි. [ඝෝෂා කිරීම්] Order, please! කරුණාකර වාඩි වෙන්න. [ඝෝෂා කිරීම්] Order, please! ඒ අනුව දෙවැනි වර කියැවීම සම්මතයි.

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙ වන වර කියවන ලදී.***
*சட்டமூலம் இதன்படி, இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Bill accordingly read a Second time..*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු මුදල් ඇමතිතුමා.

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)

ගරු කථානායකතුමනි, "විසර්ජන පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාරක සභාව කවදාද?

**ගරු මංගල සමරවීර මහතා**
(மாண்புமிகு மங்கள சமரவீர)
(The Hon. Mangala Samaraweera)
2019 මාර්තු 13 වන බදාදා.

***පනත් කෙටුම්පත, අංක 57දරන ස්ථාවර නියෝගය යටතේ, 2019 මාර්තු මස 13 වන බදාදා පවත්වන පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී.***
*சட்டமூலம், நிலைக்கட்டளை இல. 57இன்படி, 2019 மார்ச் 13, புதன்கிழமை நடைபெறவிருக்கும் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்பட்டது.*
*Bill committed to a Committee of the whole Parliament under Standing Order No. 57 for Wednesday, 13th March, 2019.*

# කල්තැබීම
# ஒத்திவைப்பு
# ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය"යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 6.09ට, 2019 මාර්තු 9වන දින සභා සම්මතිය අනුව, 2019 මාර්තු 13 වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*அதன்படி பி. ப. 6.09 மணிக்கு பாராளுமன்றம், அதனது 2019 மார்ச் 9ஆந் திகதிய தீர்மானத்திற்கிணங்க, 2019 மார்ச் 13, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*
*Parliament adjourned at 6.09 p.m. until 9.30 a.m. on Wednesday, 13th March, 2019, pursuant to the Resolution of Parliament of 9th, March, 2019.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau at the Department of Government Information, No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.